**320 වන කාණ්ඩය - 02 වන කලාපය**
**தொகுதி 320 - இல. 02**
**Volume 320 - No. 02**

**2025 ජූලි 09 වන බදාදා**
**2025 யூலை 09, புதன்கிழமை**
**Wednesday, 09th July, 2025**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රතිඥාව:**
ගරු උස්හෙට්ටිගේ දොන් නිශාන්ත ජයවීර මහතා [තීරුව 179]

**නිවේදන:**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වාර්තාව [තීරුව 179]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 183]

**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරු 185-204]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 204-230]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
වී මිලදී ගැනීම සහ සහල් ආනයනය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති [තීරුව 231]
යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණ දෙන ගැටලු [තීරුව 236]

**වරප්‍රසාද:**
2025.05.28 දින "අද" පුවත් පත් වාර්තාව [තීරුව 240]

**රබර් පාලන (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 244]

**කල්තැබීමේ යෝජනාව:**
2019.04.21 දින සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය [තීරු 252- 354]

# பிரதான உள்ளடக்கம்

**உறுதிப்பிரமாணம்:**
மாண்புமிகு உஸ்ஹெட்டிகே தொன் நிசான்த ஜயவீர [ப: 179]

**அறிவிப்புகள்:**
அரசியலமைப்புப் பேரவையின் அறிக்கை [ப: 179]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 183]

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்** [ப: 185-204]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 204-230]

**தனி அறிவித்தல் மூல வினா:**
நெல் கொள்வனவு மற்றும் அரிசி இறக்குமதி தொடர்பான அரசாங்கத்தின் கொள்கை [ப: 231]
யாழ்ப்பாண மாவட்ட விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள் [ப: 236]

**சிறப்புரிமை:**
2025.05.28ஆந் திகதிய “அத” பத்திரிகை அறிக்கை [ப: 240]

**இறப்பர் கட்டுப்பாடு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 244]

**ஒத்திவைப்புப் பிரேரணை:**
21.04.2019 அன்று இடம்பெற்ற உயிர்த்த ஞாயிறு தாக்குதல் [ப: 252-354]

# PRINCIPAL CONTENTS

AFFIRMATION:
Hon. Ushettige Don Nishantha Jayaweera [Col. 179]

ANNOUNCEMENTS:
Report of the Constitutional Council [Col. 179]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 183]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols.185-204]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 204-230]

QUESTION BY PRIVATE NOTICE:
Government Policies on Purchase of Paddy and Import of Rice [Col. 231]
Issues Faced by Farmers in Jaffna District [Col. 236]

PRIVILEGE:
News Report in "Ada" Newspaper of 28.05.2025 [Col. 240]

RUBBER CONTROL (AMENDMENT) BILL:
Read the First Time [Col. 244]

ADJOURNMENT MOTION:
Easter Sunday Attack on 21.04.2019 [Cols. 252-354]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ජූලි 09* වන බදාදා**
*2025 யூலை 09, புதன்கிழமை*
*Wednesday, 09th July, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,

MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ප්‍රතිඥාව: ගරු උස්හෙට්ටිගේ දොන් නිශාන්ත ජයවීර මහතා
## உறுதிப்பிரமாணம்: மாண்புமிகு உஸ்ஹெட்டிகே தொன் நிசாந்த ஜயவீர
## AFFIRMATION: HON. USHETTIGE DON NISHANTHA JAYAWEERA

***ගරු උස්හෙට්ටිගේ දොන් නිශාන්ත ජයවීර මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.***
*மாண்புமிகு உஸ்ஹெட்டிகே தொன் நிசாந்த ஜயவீர சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.*
*The Hon. Ushettige Don Nishantha Jayaweera made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.*

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වාර්තාව
### அரசியலமைப்புப் பேரவையின் அறிக்கை
### REPORT OF THE CONSTITUTIONAL COUNCIL

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිව්වැනි වාර්තාව (2024 ජුනි මාසය සිට 2024 දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා) මම ඉදිරිපත් කරමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Performance Report of the Judicial Service Commission Secretariat for the year 2023; and

(ii) Annual Performance Report of the Commission to Investigate Allegations of Bribery or Corruption for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the -

(i) Performance Report of the Department of Management Services for the year 2024;

(ii) Performance Report of the Department of Trade and Investment Policy for the year 2024; and

(iii) Performance Report of the Department of Fiscal Policy for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(i) 2024 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2024 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉඩම් අංශයේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම, පශු සම්පත් අංශ සහ පෙර පැවති වැවිලි කර්මාන්ත අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2024 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා පෙර පැවති ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා අම්පාර, කොළඹ, කළුතර, නුවරඑළිය, රත්නපුර, කෑගල්ල, හම්බන්තොට, මොනරාගල, ගාල්ල, පුත්තලම, මාතර, ත්‍රිකුණාමලය, අනුරාධපුර, පොළොන්නරුව, යාපනය, ගම්පහ, මහනුවර, වවුනියාව, මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය, කුරුණෑගල, මාතලේ, බදුල්ල සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,-

(i) 2022 සහ 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තා;

(ii) 2021 සහ 2023 වර්ෂ සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තා; සහ

(iii) 2022 සහ 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කඩවත, මහර, එක්සත් මාවත, අංක 148 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ. විජය ලක්ෂ්මී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අවිස්සාවේල්ල, සීතාගම, 11 බී දරන ස්ථානයෙහි පදිංචි වයි.කේ. ශ්‍රියාලතා එදිරිසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු කථානායකතුමනි, කළුතර, වස්කඩුව, මානන්දුව පාර, පනාපිටිය, "ප්‍රසාද්" යන ලිපිනයෙහි පදිංචි එච්.එස්.ආර්. ෆොන්සේකා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මාතලේ උකුවෙල, අලුපොතුවල, 12/2 A දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්. රංජිත් බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කෝට්ටගොඩ, පාතේගම උතුර, කජුගස්වත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්ලිව්. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතර, බතුතා පාර, අංක 17 දරන ස්ථානයෙහි පදිංචි එම්. අබ්දුල් රවුෆ් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු කථානායකතුමනි, හඟුරන්කෙත, මාදන්වල, කොටුවේගෙදර දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. නෙත්මි චමත්කා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කටුගස්තොට, කොණ්ඩදෙණිය, දන්තුරේවත්ත, අංක 329/3 දරන ස්ථානයෙහි පදිංචි එච්.කේ.ජී. කාව්‍යා ස්වර්ණමාලි ගුණසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මහනුවර, වැරැල්ලගම, තිත්තපජ්ජල, අංක 243/1/සී දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එච්.එම්.ඩී.ඩබ්ලිව්.එස්.බී. විජේකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කඩවත, පහළ බියන්විල, පුෂ්පාරාම මාවත, අංක 145 දරන ස්ථානයෙහි පදිංචි එල්.පී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මීගොඩ, පුවක්වත්ත, පරණ පාර, අංක 197/3 දරන ස්ථානයෙහි පදිංචි නයනා සජීවනී හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කරන ප්‍රශ්න.

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රතිසංස්කරණ සමඟ ඩිජිටල් පරිවර්තනයක් සිදුවිය යුතු බව ඔබතුමිය පිළිගන්නේද?

i. ඩිජිටල් පරිවර්තනය සිදු කිරීම සඳහා මේ වන විට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ii. එමඟින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු කවරේද?

iii. එම අරමුණු ළඟා කර ගැනීමට කොපමණ කාලයක් ගතවන්නේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

i. ඔව්.

අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය සිදු කිරීම සඳහා මේ වන විට අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම් ඇතුළුව බහුපාර්ශ්වීය නියෝජිතයන්ගෙන් සමන්විත 30දෙනෙකු ගෙන් යුත් කාර්ය සාධක බලකායක් ස්ථාපිතකොට ඇත. නියෝජිතයන්ගේ නාමලේඛනය ඇමුණුම 01 ලෙස දක්වා ඇත.

**Meeting on Establishment of Task Force on Digital Transformation of Education**

Chairman - Mr. Pradeep Saputhanthri, Secretary to the Prime Minister

| | Task Force Members |
|---|---|
| 1. | **Mr. K.M.G.S.Nalaka Kaluwewa** **Secretary,** Ministry of Education, Higher Education and Vocational Education |
| 2. | **Mr. T.R.W.S.Dhanapala** (Acting Secretary), Ministry of Digital Economy |
| 3. | **Dr. Hans Wijayasuriya** Chief Advisor to the President of Sri Lanka on Digital Economy |
| 4. | **Mr. A.B.M.Ashraff** Additional Secretary to the Prime Minister |
| 5. | **Ms. Vasana Edirisuriya** Additional Secretary /Ministry of Education, Higher Education and Vocational Education |
| 6. | **Ms. N.H. M.W.W.N. Herath** Additional Secretary (Development) /Ministry of Women and Child Affairs |
| 7. | **Dr. Manodha Gamage** Advisor to the Minister of Digital Economy |
| 8. | **Prof. A. S Ananda** Chairman/ National Education Commission |
| 9. | **Prof. Manjula Vithanapathirana** Director General/ National Institute of Education |
| 10. | **Mr. Udesh I.W. Seneviratna** Additional Director General, Department of Information Technology Management |
| 11. | **Ms. S.D. Kasthuriarachchi** Director of Education |
| 12. | **Mrs. A.K.S. Indika Kumari Liyanage** Commissioner General of Examinations |
| 13. | **Eng. Z.A.M Nawzar** Deputy General Manager) Sri Lanka Telecom |
| 14. | **Mr. Thevathas Theivendren** Deputy Director of Education, Department of Education, Northern Province |
| 15. | **Dr. Dayan Rajapakse** Chairman, The Federation of Information Technology Industry of Sri Lanka |
| 16. | **Mr. Nishan Mendis** Chairman, Sri Lanka Association for Software and Services Companies |
| 17. | **Mr. Vajeendra S Kandegamage** Chairman, British Computer Society of Sri Lanka |
| 18. | **Mr. Heshan Karunaratne** President / Computer Society o of Sri Lanka (CSSL) |
| 19. | **Mr. Indika De Zoysa** Vice President of the Computer Society of Sri Lanka |
| 20. | **Mr. S.J.A.Karunasena** Deputy Director of Education /Zonal Education Office/ Walasmulla |
| 21. | **Ms. Vishaka Nanayakkara** Senior Lecturer, Faculty of Engineering, University of Moratuwa |
| 22. | **Dr. J.A.D.J. Jayalath** Senior Lecturer /University of Vocational Technology |
| 23. | **Dr. Ruvan Weerasinghe** Dean (Academic) /School of Computing Informatics Institute of Technology |
| 24. | **Dr Uthayasanker Thayasivam** Head of the Dept of Com Science, University of Moratuwa |
| 25. | **Mr. Supun Weerasinghe** Group Chief Executive Officer / Dialog Axiata PLC |
| 26. | **Mr. Fadhil Bakeer Markar** Team Leader, Strategic Engagement, Digital and Innovation, UNDP |
| 27. | **Mr. Ananda Galappatti** Medical Anthropologist/ Co-Director, MHPSS.net |
| 28. | **Mr. Ashoka Bandula Weerawardhana** Accessibility and Usage Consultant /World Intellectual Property Organization |
| 29. | **Mr. Kalum Prasanna Soorige** Teacher, St. Sylvester's Collage, Negombo. |

මෙම බලකාය ස්ථාපිත කිරීම සඳහා 2025.05.28 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර 2025.06.02 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. මෙම ඩිජිටල් පරිවර්තන බලකාය වෙත සංවර්ධන හවුල්කරුවන්, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සම්බන්ධ වෙමින් ඉදිරි වර්ෂ 03ක් ඇතුළත කටයුතු කිරීමට අධිකාරී බලය පවරා ඇත.

දීර්ඝකාලීනව පවතින ගුරු හිඟය, ඩිජිටල් ප්‍රවේශයේ විෂමතා සහ අධ්‍යාපනයේ තාක්ෂණ වර්ධනය යන කාරණා හේතුවෙන් මුහුණ දෙන අභියෝග සඳහා විසඳුම් වශයෙන් ව්‍යුහගත සහ අනාගතයට සූදානම් අධ්‍යාපන ප්‍රවේශයකට අවතීර්ණ වීමටත්, දෙමුහුන් අධ්‍යාපන බෙදාහැරීම් ක්‍රම - blended learning - හඳුන්වා දීමටත්, ඩිජිටල් අන්තර්ගත ප්‍රමිති, මාර්ගගත ආරක්ෂාව, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහාත්, ආපදා තත්ත්ව හමුවේ ඉගෙනුම් අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහාත් ජාතික රාමුවක් සංවර්ධනය කිරීමට මෙම බලකාය පිහිටුවන ලදී.

ඒ අනුව, අධ්‍යාපන ඩිජිටල් පරිවර්තනය පිළිබඳ කාර්ය සාධක බලකාය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු 07ක් හඳුනාගෙන ඇති අතර, එම අරමුණු පහත පරිදි වේ.

(i) දැනට පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කරන තෙක් තාවකාලික විසඳුමක් ලෙස ඩිජිටල් මෙවලම් භාවිත කිරීමේ ශක්‍යතාව සොයා බලා අවශ්‍ය පිළියම් යෙදීම.

(ii) වර්තමාන සහ අනාගත අධ්‍යාපන අවශ්‍යතා සමඟ අනුගත වන ඩිජිටල් විෂය පථය නවීකරණය කිරීම

(iii) හදිසි අවස්ථාවලදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි අඛණ්ඩතාව සහතික කිරීම

(iv) සිසුන් සඳහා ඩිජිටල් සාක්ෂරතාව සහ මාර්ගගත ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම

(v) තොරතුරු තාක්ෂණ ඒකාබද්ධතාව සඳහා යටිතල පහසුකම් සහ පද්ධති සූදානම වැඩිදියුණු කිරීම

(vi) අධ්‍යාපනික විශිෂ්ටත්වය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පෙර සූදානම සහතික කිරීම

(vii) අධ්‍යාපන නවෝත්පාදනය සඳහා තිරසර රාමුවක් ගොඩ නැගීම

ගරු කථානායකතුමනි, ඊට අමතරව අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් මේ වෙනකොට ක්‍රියාත්මක කරනවා. සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයකට ලක් කිරීමට අදාළවත්, classroom solutions දීම සඳහාත් ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. Blended learning ප්‍රවර්ධනය කිරීම සඳහාත් කටයුතු කරනවා. ඒ වාගේම පාසල් 1,000කට සුහුරු පුවරු සහ අනෙකුත් තොරතුරු තාක්ෂණ උපකරණ ලබා දීමටත් යෝජනා කර තිබෙනවා. ඒ වෙනුවෙනුත් කැබිනට් අනුමැතිය ලබා දීලා තිබෙනවා. මේ වෙනකොට සුහුරු පුවරු 1,900ක් පාසල් 1,500ක් වෙත බෙදා දීමට නියමිතව තිබෙනවා.

ඊට අමතරව, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු ආයතන/මට්ටම් ආවරණය වන පරිදි ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීමටත්, Clean Sri Lanka වැඩසටහන යටතේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ තාක්ෂණික සහාය ඇතිව ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ මූලික වැඩ කටයුතුත් ආරම්භ කර තිබෙනවා. 2026 වර්ෂය අවසාන වනවිට සියලු ද්විතීයික පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීමට අපේක්ෂිතයි. රුපියල් 5,000ක අසීමිත දත්ත පැකේජයකුත් පාසල්වලට හඳුන්වා දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ විධියට පියවර කිහිපයක් අරගෙන තිබෙනවා. මම බොහොම සන්තෝෂ වෙනවා මේ ප්‍රශ්නය අද අහපු එක ගැන. අද Gallery එක වටේම ඉන්නේ පාසල් ශිෂ්‍යයන්. ඒ ළමයින්ට බලපාන ප්‍රශ්නයකට ඔවුන් ඉදිරියේදීම උත්තර දෙන්න ලැබීම පිළිබඳ මම සන්තෝෂ වෙනවා. ඒ සඳහා පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. එම සවිස්තරාත්මක විස්තර ඇතුළත් පිළිතුර මම **සභාගත*** කරනවා.

තොරතුරු තාක්ෂණය වෙනුවෙන් පරිවර්තනය වීමේදී ගුරුවරුන්ට ඩිජිටල් අධ්‍යාපනය සම්බන්ධව කුසලතා සංවර්ධනයට ප්‍රමුඛ ස්ථානයක් ගැනීම අවශ්‍යයි. මේ සඳහා ICT පුහුණුවක් නැති ගුරුවරුන්ට ICT skills develop කිරීම සඳහාත් පුහුණු වැඩසටහන් ආරම්භ කර තිබෙනවා. මේ වෙනකොට ගුරුවරුන් 300ක් පුහුණු කර තිබෙනවා. තවද, e-තක්සලාව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා මෙය වැඩිදියුණු කිරීමටත් බලාපොරොත්තු වෙනවා. 2025 වර්ෂයේ සිටම Teacher Digital Competency Curriculum එක හඳුන්වා දීලා එය ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ii. ගරු කථානායකතුමනි, මේ යටතේ, අධ්‍යාපනයේ digital transformation එකෙන් බලාපොරොත්තු වන අරමුණු තමයි අහලා තිබෙන්නේ. මම ඒවාත් කියන්නම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

- ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය වැඩි කිරීම.
- විෂයමාලා සංවර්ධනය සඳහා යොදා ගැනීම.
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ඇගයීම් යන්ත්‍රණය විධිමත් කිරීම.

iii. ඉදිරි වසර 5 තුළ අධ්‍යාපනයේ දැවැන්ත ඩිජිටල් පරිවර්තනයක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. මට අතුරු ප්‍රශ්නයක් යොමු කරන්න තිබෙනවා. ඩිජිටල් අධ්‍යාපන පරිවර්තනය වෙනුවෙන් අදාළ ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වන ක්‍රියාවලිය මේ වනවිට ආරම්භ කරලා තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, National Continuous Professional Development Programme එක යටතේ අදාළ පුහුණු වැඩසටහන ආරම්භ කරලා තිබෙනවා. ඒ කියන්නේ, දැනට service එකේ ඉන්න ගුරුවරුන්ට පුහුණුව ලබා දීම ආරම්භ කර තිබෙනවා. නමුත් අපි ගුරු පුහුණු පාඨමාලාවම සමාලෝචනය කරලා ඒක විද්‍යා පීඨවලටත්, B.Ed. උපාධි පාඨමාලාවලටත් හඳුන්වා දීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් අපි නිරීක්ෂණය කරපු දෙයක් තමයි, පාසල්වලට මේ යටිතල පහසුකම් ලබා දීලා තිබුණාට, විද්‍යා පීඨවලට ඒවා තවම ලැබිලා නැහැ කියන එක. ඒ නිසා අපි විශේෂ ව්‍යාපෘතියක් හරහා විද්‍යා පීඨවලටත් මේ තාක්ෂණ පරිවර්තනයට සූදානම් වෙන්න පුළුවන් විධියට යටිතල පහසුකම් ලබා දීමට මේ වෙනකොට වැඩසටහන ආරම්භ කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා.

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පාසල් අධ්‍යාපනය සමඟ ඒකාබද්ධ කිරීමට ඔබතුමියගේ අමාත්‍යාංශය විසින් මෙතෙක් ගෙන ඇති පියවරයන් මොනවාද?

i. ඉදිරි වසර 5 තුළ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය නඟාසිටුවීම වෙනුවෙන් සැලසුම් සකස් කර තිබේද? එසේ නම් ඒවා මොනවාද?

ii. එම සැලසුම් යටතේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන් පුහුණු කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මේක අතිශයින්ම වැදගත් ප්‍රශ්නයක්.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

අපි 2026දී ක්‍රියාත්මක කරන්න සිටින අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මූලික කාර්යයක් තමයි මේ වෘත්තීය අධ්‍යාපනය නඟාසිටුවීම.

i. ඉදිරියේදී පාසල් අධ්‍යාපනය තුළ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය නඟා සිටුවීමට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විෂයමාලා සංශෝධනය සිදු කිරීමට නියමිත අතර, පාසල් අධ්‍යාපනයෙන් පසු තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය නඟාසිටුවීමටද සැලසුම් සකස් කර ඇත.

- පාසල් අධ්‍යාපන පද්ධතිය වෙත වෘත්තීය අධ්‍යාපනය හඳුන්වා දෙමින් උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව 2018 වර්ෂයේ සිට වර්තමානය දක්වා ක්‍රියාත්මක වේ. 2025 වර්ෂය වන විට මෙම විෂය ධාරාව පාසල් 609ක් දක්වා ව්‍යාප්ත කර ඇත.

ඒ අනුව සියලුම පළාත් සහ අධ්‍යාපන කලාප ආවරණය වන පරිදි තෝරා ගත් පාසල්වල සංඛ්‍යාත්මක ව්‍යාප්තිය පහත පරිදි වේ.

| පළාත | පාසල් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර පළාත | 132 |
| මධ්‍යම පළාත | 84 |
| දකුණු පළාත | 59 |
| උතුරු පළාත | 47 |
| නැගෙනහිර පළාත | 68 |
| වයඹ පළාත | 69 |
| උතුරු මැද පළාත | 46 |
| ඌව පළාත | 55 |
| සබරගමුව පළාත | 49 |
| **සමස්ත සංඛ්‍යාව** | **609** |

මෙම පාසල් තුළ වෘත්තීය විෂයන් ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය විෂයන් 28ක් සඳහා පළාත් සහ ජාතික මට්ටමින් ගුරු භවතුන් 1,250ක් බඳවාගෙන ඇති අතර, එක් ගුරු භවතෙකුට වෘත්තීය විෂයයන් 3ක් ඉගැන්විය හැකි වන පරිදි ජාතික අධ්‍යාපන ආයතනය හරහා ඔවුන් පුහුණු කර ඇත.

පාසල් තුළ මෙම විෂය ධාරාව ක්‍රියාත්මක කිරීම පහසු වන පරිදි සුහුරු පන්ති කාමර ගොඩනඟා පරිගණක, ලැප්ටොප්, සුහුරු පුවරු, අන්තර්ජාල පහසුකම් සහ පන්ති කාමර උපකරණ ලබා දී ඇති අතර, අඛණ්ඩව ප්‍රායෝගිකව විෂය ධාරාව පාසල් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් පාදක මූල්‍ය ප්‍රදාන ලබා දේ.

මෙම විෂය ධාරාව යටතේ අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නොසලකා සිසුන් 12 ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අතර, මෘදු කුසලතා සංවර්ධනය කිරීම සහ වෘත්තීය විෂයයන්හි මූලික හඳුන්වා දීම සිදු කෙරෙන මාස හයක පාසල් අධ්‍යයන කාල සීමාවකින් අනතුරුව සිසුන් NVQ 4 වෘත්තීය පුහුණු පාඨමාලා 154ක් සඳහා රජයේ වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කරනු ලැබේ. වෘත්තීය පුහුණුව සහ රැකියාගත පුහුණුව අවසානයේ ඔවුන් ජාතික වෘත්තීය නිපුණතා ඇගැයීමට මුහුණ දිය යුතු අතර, අවසානයේ NVQ 4 සහතිකය ලබා දෙනු ලැබේ.

මම දැන් විස්තර කළේ, 13 වසරක අධ්‍යාපනය යටතේ මෙතෙක් ක්‍රියාත්මක වෙන ක්‍රමය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මේ විෂය ධාරාව - ඒ කියන්නේ skills stream එක - 10 සහ 11 ශ්‍රේණි සඳහා හඳුන්වාදීමට නියමිත අතර, එහිදී සෑම පාසලකම 10, 11 ශ්‍රේණිවල සිසුන් සඳහා කාණ්ඩ විෂයක් ලෙස මෙම වෘත්තීය විෂයන් හඳුන්වා දීම සිදු කිරීමට නියමිතය.

ඒ කියන්නේ, භේදයක් නැතිව සියලු දරුවන්ට මේ skills sector එකේ විෂයයන් හඳුන්වා දෙන්න නියමිතයි. ඒ සඳහා විෂය මාලාව සහ මොඩියුලර් ජාතික අධ්‍යාපන ආයතනය විසින් මේ වෙනකොට සංවර්ධනය කරමින් පවතිනවා.

තවද, උසස් පෙළ සඳහා වෘත්තීය විෂයන් ක්‍රියාත්මක කරන පාසල් සංඛ්‍යාව 609 සිට 1,000 දක්වා වර්ධනය කිරීමටද කටයුතු යොදා ඇත.

එතකොට 10 ශ්‍රේණියේ ඉඳන් අඛණ්ඩව අවුරුදු 4ක් තුළ ඒ skills sector එක හඳුන්වා දෙන්නත්, ඊට පස්සේ තෘතීයික අධ්‍යාපනයේදීත් ඒ path එක හඳුන්වා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මේ skills sector එක තමයි අනාගතයේදී දියුණු විය යුත්තේ කියලා අපි විශ්වාස කරනවා. ඒකට අපි විශාල වශයෙන් අවධානය යොමු කරනවා.

- පාසල් අධ්‍යාපනයෙන් පසු තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා දැනට තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන අංශයට අදාළව, ආසියානු සංවර්ධන බැංකුවේ ද සහාය ඇතිව උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට - TVET sector එකට - අදාළ සියලුම පාර්ශ්වකරුවන් සමඟ රැස්වීම් පවත්වා මූලික කෙටුම්පතක් සකස් කරමින් පවතින අතර, 2025 සැප්තැම්බර් වන විට සම්පූර්ණ කෙටුම්පත සකස් කිරීම අවසන් කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වනවා.

ii. එම සැලසුම් යටතේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන් පුහුණු කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් පාසල් අධ්‍යාපනය සඳහා,

- 10/11 ශ්‍රේණිවල වෘත්තීය විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු විද්‍යාල හරහා ගුරු භවතුන් බඳවා ගෙන පුහුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

- තවද, දැනට වෘත්තීය විෂය ධාරාව සඳහා පත්කර ඇති ගුරු භවතුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයේ සහයෝගය ඇතිව විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන්හි කාලීන ප්‍රවණතා සහ ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් මාලාවක් ඉදිරි අවුරුදු 5 දක්වා වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- එමෙන්ම, වෘත්තීය ක්ෂේත්‍රයේ කාලීන ප්‍රවණතා අනුව වෘත්තීය විෂය ධාරාවේ විෂය සන්ධාරය සමාලෝචනය කර මොඩියුලර් සඳහා අවශ්‍ය වෙනස්කම් ඇතුළත් කිරීම 2026-2027 කාලය තුළ අවසන් කිරීමට නියමිතය.

ගුරුවරුන් පුහුණු කිරීම සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු කිරීම් ක්ෂේත්‍රයේ - TVET sector එකේ - ගුරුවරුන් පුහුණු කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත පැවරී ඇත.

ඒ අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මේ වන විටත් පුහුණුකරුවන් පුහුණු කිරීමේ කාර්යය සිදු කරන අතර, එම ක්‍රියාවලිය විධිමත් ක්‍රමවේදයකින් යුතුව අඛණ්ඩව හා ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන යොමු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ වාගේම TVET ක්ෂේත්‍රයේ ගුරුවරුන් පුහුණු කිරීම සම්බන්ධව දීර්ඝ කාලීනව ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට Korea University of Technology and Education මඟින් මේ වෙලාවේ අපට යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ වෙලාවේ අපි ඒ සාකච්ඡාවත් දියත් කරලා තිබෙනවා.

ඒ පිළිබඳවත් විස්තරාත්මක කරුණු ගණනාවක් තිබෙනවා. මම ඒ විස්තරය **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:**
*Rest of the Answer tabled:*

- තවද, ශ්‍රී ලංකාව ද සාමාජිකත්වය දරන 1973 වසරේ ස්ථාපිත පිලිපීනයේ මැනිලාහි පිහිටි කොළඹ ක්‍රම මාණ්ඩලික විද්‍යාලය - Colombo Plan Staff Collage - CPSC - , TVET ක්ෂේත්‍රයට අදාළව ගුණාත්මක මානව සම්පත් සංවර්ධනය කිරීම සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කරයි. එම වැඩසටහන සමඟ ඒකාබද්ධව වසරකට TVET ක්ෂේත්‍රයේ 80දෙනෙකු පමණ දේශීයව හා මාර්ගගත ක්‍රමය ඔස්සේ ද, 05දෙනෙකු පමණ විදේශ පුහුණු අවස්ථා සඳහා ද අමාත්‍යාංශය විසින් යොමු කරනු ලබයි.

- එමෙන්ම TVET ක්ෂේත්‍රයේ ගුරුවරුන්ගේ පුහුණු කිරීම් කටයුතු දීර්ඝ කාලීනව අතපසු වී ඇති කටයුත්තක් වන අතර ක්ෂේත්‍රයට අනන්‍ය වූ ගුරු පුහුණු හා ව්‍යවහාරික පර්යේෂණ විද්‍යාලයක් පිහිටුවීම සඳහා Korea University of Technology and Education මඟින් අමාත්‍යාංශය වෙත යෝජනාවක් ඉදිරිපත් වී ඇත. ඒ අනුව කොරියානු රජයේ EDCF සහනදායී ණය යටතේ සියලු පහසුකම්වලින් පරිපූර්ණ ගුරු පුහුණු හා ව්‍යාවහාරික පර්යේෂණ විද්‍යාලයක් පිහිටුවීමට යෝජනා වී ඇත. එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් පත් කර ඇති කමිටුව මඟින් TVET ක්ෂේත්‍රයේ ගුරු පුහුණු විද්‍යාල සහ ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය සඳහා සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම සිදු වෙමින් පවතී. එමඟින් TVET ක්ෂේත්‍රයටම ආවේණික වූ සියලු පහසුකම්වලින් පරිපූර්ණ ගුරු පුහුණු හා ව්‍යවහාරික පර්යේෂණ විද්‍යාලයක් පිහිටුවීමට කටයුතු කරනු ලැබේ.

  තවද, ඉදිරි වර්ෂ 5 තුළ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා කාලීන අවශ්‍යතා හඳුනාගෙන නිපුණ ශ්‍රම බලකායක් ඇති කිරීමට පහත ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය වෙත ඉදිරිපත් කර ඇත.

  * කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක නුවරඑළිය කාර්මික විද්‍යාලයේ වැඩහල් හා පන්ති කාමරවලින් සමන්විත තට්ටු 4කින් යුත් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම.

  * තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් මාර්ගගත දැනුම තක්සේරු කිරීමේ මධ්‍යස්ථානය - Online Knowledge Assessment Centre - ස්ථාපිත කිරීම.

  * සෑම පළාතකම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ එක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් - Centre of Excellence - බවට උසස් කිරීම.

  * නිපුණතා ආංශික සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන Skills Development System Transformation වැඩසටහන.

  * ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - SLGTI - යටතේ ක්‍රියාත්මක කිලිනොච්චි මධ්‍යස්ථානයේ තුන් මහල් පිරිමි නේවාසිකාගාරයේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීම.

  * ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - බොරැල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය පුළුල් කිරීම හා නවීකරණය සඳහා Techno-Commercial Sales Management පාඨමාලාව හඳුන්වා දීම.

  * ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව, SLGTI - කිලිනොච්චි හා යෝජිත හම්බන්තොට පුහුණු මධ්‍යස්ථානය - Solar Park - සමඟ ඒකාබද්ධව පුනර්ජනනීය බලශක්ති පිළිබඳ පුහුණු මධ්‍යස්ථානය - ACET -Asian Centre for Energy Transition- ස්ථාපිත කිරීම.

ඉහත ව්‍යාපෘති යෝජනා මඟින් සුදුසු පුහුණු පරිසරයක් ඇති කිරීමට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් ලබා දී ඇත. එමෙන්ම යෝජිත නව පාඨමාලා හඳුන්වා දීමේදී ඊට අදාළව පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමටත්, දේශීයව මෙන්ම විදේශීයව ගුරුවරුන් පුහුණු කිරීමටත් සැලසුම් කර ඇත.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු අගමැතිතුමියනි, ඔබතුමිය මීට කලින් වාරයේ ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම පිළිබඳව මට උත්තර දෙන්න කල් ලබා ගත්තා. ගරු කථානායකතුමනි, මේ කාර්ය පටිපාටිය යටතේ සාමාන්‍යයෙන් මට නැවත ඒ ප්‍රශ්නය අහන්න බැහැ. එතකොට ඔබතුමියට යුතුකමක් තිබෙනවා, ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම පිළිබඳව එම කරුණු ඉදිරිපත් කරන්න. එදා ඒ ගැන අධ්‍යයනය කරන්න කල් ගත්ත එක හරි. නමුත් ඇයි තවමත් ඒකට පිළිතුරක් නැත්තේ? ඒකට උත්තර දෙන්න අමාරුද? ගැටලුවක් තිබෙනවාද? තවමත් ඒක ගැන අධ්‍යයනය කරනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, උත්තර දෙන්න කිසිම අමාරුවක් නැහැ. එතැන ප්‍රශ්නයක් නැහැ. මම ඇත්තටම අද තිබෙන ප්‍රශ්න අවසන් වෙලා ඒකට ප්‍රතිචාර දක්වන්න බලාගෙන හිටියේ. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ටිකක් කලබල වෙලා, ගරු කථානායකතුමනි. නමුත් ඒ දිනට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා යොමු කරපු ප්‍රශ්නයට අදාළව මේ වෙලාවේ අධිකරණයේ නඩු කටයුත්තක් පවතිනවා. ඒ නිසා මේ වෙලාවේ ඒ ප්‍රශ්නයට උත්තර දීමට නොහැකි බව මම දන්වා සිටිනවා. මම කොහොමටත් ඒක කියන්නයි හිටියේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මගේ නම කියපු නිසා මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තමයි අගමැතිතුමිය ඔය පිළිතුර ලබා දුන්නේ. ඔබතුමා අහපු ප්‍රශ්නයට ඔබතුමාගේ නම කියලා තමයි පිළිතුරු ලබා දුන්නේ. *[බාධා කිරීමක්]* ගරු සමන්ත රණසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඇත්තටම අපේ රටේ වෘත්තීය අධ්‍යාපනය යම් ප්‍රමාණයකට තිබෙනවා. අද රැකියා වෙළෙඳ පොළට පුහුණු ශ්‍රමිකයන් නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒ වාගේම දරුවන්ට සහ දෙමව්පියන්ට ඒ සම්බන්ධව අවධානයක් යොමු නොවීමේ ගැටලුවකුත් තිබෙනවා. පසුගිය 4වැනි දා "ශ්‍රම මෙහෙයුම" කියලා වැඩසටහනක් කළා, ලංකාවේ සියලු වෘත්තීය අධ්‍යාපන ආයතන සම්බන්ධ කරගෙන. ඒකට මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒකට විශාල පිරිසක් සහභාගි වුණා. එවැනි වැඩසටහන් ඉදිරියටත් කරන්න සූදානමක් තිබෙනවාද? ඔබතුමියගෙන් මම ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් මාස 6කට සැරයක්වත් එවැනි වැඩසටහන් කරන්න කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඒක අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු නලින් හේවගේ මැතිතුමාගේ නායකත්වයෙන් කෙරුණු වැඩසටහනක්. ඒක දිගටම කරන්න අපි බලාපොරොත්තු වනවා. ගරු මන්ත්‍රීතුමා කියපු විධියට අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා මේකට අපි විශාල අවධානයක් දීලා තිබෙනවා. අපි එහෙම කරන්නේ, අපේ මානව සම්පත වැඩ ලෝකයට සූදානම් කිරීම සඳහායි.

මේ රටේ මානව සම්පත බිහි කිරීමට අත්‍යවශ්‍ය කාර්යයක් පාසල් පද්ධතිය තුළ සිදු විය යුතුයි කියන එකත් සමඟ වෙන දේවල් කරන්න බැරි වීම නිසා, වෘත්තීය සහ skills sector එකට ඉතුරු වෙන අය යනවා වෙනුවට ඇත්තටම පිළිගත්, තෝරා ගත්, දැනුවත්ව enter වෙන ක්ෂේත්‍රයක් බවට අපි මේ ක්ෂේත්‍රය පත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් අපි පාසල් පද්ධතිය තුළ වෙනසක් ඇති කරනවා වාගේම සමාජ කතිකාවක් ඇති කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ නිසාම තමයි ශ්‍රම මෙහෙයුම අතිශයින්ම වැදගත් වුණේ. මේ ක්ෂේත්‍රයට අවධානය යොමු කරලා, මේ ක්ෂේත්‍රය පිළිබඳව සමාජය තුළ තිබෙන සෘණාත්මක ආකල්ප වෙනස් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ගරු ජනාධිපතිතුමා එක්කත් අපි ඊයේ ඒ ගැන සාකච්ඡා කළා. එතුමාගේත් අවධානය මේ කාරණය කෙරෙහි යොමු වුණා. එතුමා අපට කිව්වේත් මේ සමාජ කතිකාව වහාම ඇති කරන්න කියන එකයි, ගරු කථානායකතුමනි.

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
මම ගරු අග්‍රාමාත්‍යතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි, තව පොඩි කාරණයකට. දැනට ඒ දරුවන්ට ලබා දෙන පහසුකම් ගත්තොත්, විශේෂයෙන් ගමනාගමන මණ්ඩලයෙන් සීසන් ගැනීම සම්බන්ධයෙන් වාගේම ලබා දෙන පොඩි දීමනාව සම්බන්ධයෙනුත් සමහර තැන්වල ගැටලු තිබෙනවා. ඒවා ගැනත් විශේෂ අවධානය යොමු කරලා, ඒ දරුවන්ට ආකර්ෂණීය පරිසරයක් හදන්න ඔබතුමිය මැදිහත් වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඒ යෝජනාව අපි භාර ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මම ගරු අගමැතිතුමියගෙන් අහන ප්‍රශ්නය,-

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුව මෙහෙයවන අවස්ථාවේදී, ගරු අගමැතිතුමියගෙන් ගරු මන්ත්‍රීවරයෙකු ප්‍රශ්නයක් අහලා ඒකට අතුරු ප්‍රශ්න අහන්න මන්ත්‍රීවරයාට ස්ථාවර නියෝග අනුව අයිතිය තිබියදී තමයි ඔබතුමා point of Order එකට ඉඩ දුන්නේ. Point of Order එකක් ඉල්ලන්න පුළුවන් තමයි. නමුත් මන්ත්‍රීවරුන් හැටියට අපට වගකීමක් තිබෙනවා, ප්‍රශ්නයක් අහපු මන්ත්‍රීවරයාට තිබෙන ඒ Standing Ordersවලින් ලබා දී තිබෙන අයිතියට ගරු කරමින් ඒ කටයුත්ත කරන්න. නැත්නම් ඒ flow එකත් නැති වෙනවා; ඒක බිඳෙනවා. ඒ කාරණය මම ඔබතුමාගේ සහ මන්ත්‍රීවරුන්ගේ අවධානයට ලක් කරනවා. සදාචාර සම්පන්නකමකුත් අවශ්‍යයි, point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙන අයිතිය වාගේම. අනෙක් කාරණය තමයි, ඒක point of Order එකකුත් නොවීම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 යටතේ මට රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු අගමැතිතුමියගෙන් මගේ ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය අසන ප්‍රශ්නය සඳහා උත්තර දීමේදී, 2020.01.01 දිනෙන් පසු,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් ගරු අගමැතිතුමියගෙන් අහන්නේ කාලීන සහ වැදගත්කමකින් යුතු ප්‍රශ්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

හැබැයි, න්‍යාය පත්‍රයෙන් පිට නම් එය පහදා දෙන්න පුළුවන්. ඒක තමයි මේ ස්ථාවර නියෝගයෙන් කියන්නේ. ඒ කියන්නේ, පාර්ලිමේන්තු කටයුතුවලින් බැහැර වෙලා යනවා නම් එලෙස බැහැර වන ඕනෑම අවස්ථාවකදී මන්ත්‍රීවරයාට නැඟිටීමේ ඇති රීති අයිතිය පිළිබඳව තමයි මම කිව්වේ. ඒ රීති අයිතිය අනුව තමයි මම ඔබතුමාගෙන් අවසරය ඉල්ලුවේ. ඒ බැහැර වීම පැහැදිලි කරන්න මට ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද බැහැර වීම කියන්නේ?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ඔබතුමා මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 224දෙනාගේකථානායකද,159කගේ කථානායකද කියන්නකෝ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම ඔබතුමාට පැහැදිලිව කිව්වා,- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඔබතුමා 159දෙනාගේ කථානායක නම් අපි නිහඬ වෙලා, නැඟිටින්නේ නැතුව ඔහේ ඉන්නම්. ඔබතුමා 224දෙනාගේ කථානායක නම් අපට කථා කරන්න ඉඩ දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු සභානායකතුමාත්, ගරු අගමැතිතුමියත් දැන් මේ ප්‍රශ්න අහන වෙලාවේ කියනවා, සදාචාර, ශීලාචාර වෙන්න කියලා. හැබැයි, එසේ කියන සභානායකතුමාගේ කට්ටිය ශීලාචාර වුණා නම් ඊට වඩා හොඳයි. ඔබතුමා ඊයේත්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක point of Order එකක් නොවෙයි. Point එකට කථා කරන්නකෝ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම පැහැදිලි කරලා දෙන්න හදන්නේ ඒකයි. පොඩ්ඩක් ඉන්නකෝ. එක පාරම ඔබතුමන්ලා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නකොට male nursesලා රට හැංගෙන කථාව කියනවා වාගේ මේක එහෙම අහන්න බැහැ. පොඩ්ඩක් ඉඩ දෙන්න, අපේ කථාව කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ඉදිරිපත් කරන්නේ point of Order එකක් නම්, ඒක කියන්න. You are beating around the bush.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් ගරු අගමැතිතුමියගෙන් අහන වැදගත් ප්‍රශ්නයකදී ඒකට යෝජනා ඉදිරිපත් කිරීම සාධාරණ වෙන්නේ නැහැ, පාර්ලිමේන්තුවේ කාලය ගත වනවාය කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එය point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]* He is beating around the bush. - *[Interruption.]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මා අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

වත්මන් රජයේ පළමු අය වැයෙන් රාජ්‍ය සේවකයන්ට වැටුප වැඩි කළ ක්‍රමවේදයට අනුව 2020 වසරේ සිට 2024 වසර දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූවන් විශාල පිරිසක් අසාධාරණයට ලක් වූ බවට චෝදනාවක් ඇත. එබැවින්,

01. රාජ්‍ය සේවක වැටුප ඉහළ දැමීම මත 2025.01.01 දින සිට විශ්‍රාම යන රාජ්‍ය සේවකයන්ට 2027 වැටුපට ගැළපීම මත හා 2019.12.31 දින දක්වා විශ්‍රාම වැටුප් ඉහළ දැමීමට කටයුතු කිරීම මත 2020 - 2024 වසරවල විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතාවක් හටගෙන තිබේද?

02. මෙලෙස විශ්‍රාම වැටුප් විෂමතාව බලපා ඇති විශ්‍රාමිකයන් සංඛ්‍යාව කොපමණද?

03. ඒ අනුව, මෙලෙස කොපමණ මුදලකින් හා ප්‍රතිශතයකින් විශ්‍රාම වැටුප් විෂමතාව ඇතිව තිබේද?

04. එම විෂමතාව ඉවත් කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද?

05. එම විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේ නම්, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කෙරෙන ආකාරය මේ ගරු සභාවට පැහැදිලි කරන්නේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. i. මේ සඳහා පිළිතුරු සැපයීමේදී 2020.01.01 දිනෙන් පසු 2024.12.31 තෙක් කාල සීමාව තුළ විශ්‍රාම ගොස් ඇති රාජ්‍ය නිලධරයන්ගේ විශ්‍රාම වැටුපෙහි විෂමතාව පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කරගැනීම අවශ්‍ය වේ.

ii. ඒ සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

a. අප රජය බලයට පත් වන අවස්ථාව වන විට රට තුළ සිටි විශ්‍රාමිකයන් ඔවුන් ලබමින් සිටි විශ්‍රාම වැටුප අනුව පහත පරිදි කණ්ඩායම් කිහිපයකට අයත් විය.

2016 වර්ෂයේදී රාජ්‍ය සේවය සඳහා සිදු කළ වැටුප් සංශෝධනය පරිදි,

* 2017.01.01 දිනට අදාළ වැටුප අනුව විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයන්;
* 2018.01.01 දිනට අදාළ වැටුප අනුව විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයන්;
* 2019.01.01 දිනට අදාළ වැටුප අනුව විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයන්;
* 2020.01.01 දිනට අදාළ වැටුප අනුව විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයන්.

b. ඒ අනුව සමස්ත විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුපෙහි විෂමතාවක් පවතින බවත්, එය 2017 වර්ෂයේ සිට නොවිසඳී පවතින බවත් අප රජය විසින් නිරීක්ෂණය කරන ලදී. 2025 අය වැය යෝජනා යටතේ මෙම විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කිරීමට රජය විසින් තීරණය කරන ලදී.

c. ඒ අනුව 2020.01.01 දිනට පෙර විශ්‍රාම ගොස් ඇති සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප 2016 වර්ෂයේදී සිදු කළ වැටුප් සංශෝධනයෙහි ඇතුළත් 2020.01.01 දිනට අදාළ වැටුප අනුව සංශෝධනය කිරීමට අප රජය විසින් තීරණය කරන ලදී. මෙම සංශෝධනය අදියර 03ක් ඔස්සේ සිදු කරනු ලබන අතර, 2018.01.01 දිනට අදාළ වැටුප මත විශ්‍රාම වැටුප සංශෝධනය 2025.07.01 දින සිටද, 2019.01.01 දිනට අදාළ වැටුප මත විශ්‍රාම වැටුප සංශෝධනය 2026.07.01 දින සිටද, 2020.01.01 දිනට අදාළ වැටුප මත විශ්‍රාම වැටුප සංශෝධනය 2027.07.01 දින සිටද සිදු කරනු ලැබේ.

d. ඉහත පරිදි සංශෝධන සිදු කිරීමෙන් පසුව 2024.12.31 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් ඇති සියලුම විශ්‍රාමිකයන් 2016 වර්ෂයේදී සිදු කළ වැටුප් සංශෝධනයෙහි 2020.01.01 දිනට නියමිත වැටුප අනුව විශ්‍රාම වැටුප් ලබන අය බවට පත් වේ.

iii. මෙම ප්‍රශ්නය සඳහා ඉලක්කගත කණ්ඩායම වන 2020 -2024 කාලසීමාව තුළ විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයින්ද 2016 වර්ෂයේ දී සිදු කළ වැටුප් සංශෝධනය තුළින් 2020.01.01 දිනට නියමිත වැටුප අනුව මේ වන විට විශ්‍රාම වැටුප් ලබමින් සිටින අය වේ. 2025 අය වැය යෝජනා අනුව 2020.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් ඇති සියලු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප අදියර 03කින් සංශෝධනය කිරීමෙන් පසුව 2027.07.01 දින වන විට එම සියලු විශ්‍රාමිකයින් 2016 වර්ෂයේ දී සිදු කළ වැටුප් සංශෝධනයෙහි 2020.01.01 දිනට නියමිත වැටුප අනුව විශ්‍රාම වැටුප් ලබන අය බවට පත් වේ. එබැවින් 2020.01.01 දින හෝ ඊට පෙර සහ 2020-2024 කාලසීමාව තුළ විශ්‍රාම ගොස් ඇති කෙනෙකුගේ වැටුපෙහි විෂමතාවක් තිබෙනවාද කියන එක ගැන කිව්වොත්, එහෙම විෂමතාවක් මේ වෙනකොට නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

iv. මීළඟට සලකා බැලිය යුතු වන්නේ 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය සිදු කිරීම මඟින් 2020-2024 කාලසීමාව තුළ විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුපට බලපෑමක් සිදු වනවාද, නැද්ද කියන එකයි. මෙම වැටුප් සංශෝධනය අදාළ වන්නේ 2025.01.01 දින ද සේවයේ සිට ඉන් පසුව සේවයෙන් විශ්‍රාම යන රාජ්‍ය සේවකයන්ට පමණි. මෙම වැටුප් සංශෝධනය අදියර 03ක් යටතේ ක්‍රියාත්මක වුවත් එකී කාලසීමාව තුළ විශ්‍රාම යන නිලධරයන්ට සම්පූර්ණ වැටුප් වැඩිවීම මත පදනම්ව විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සිදු කෙරේ. වැටුප් සංශෝධනය වීම මත එම නිලධරයන්ට සාපේක්ෂව වැඩි විශ්‍රාම වැටුපක් හිමිවීම සිදු වන අතර, එය රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයකදී සිදු වන සාමාන්‍ය තත්ත්වයක් වන අතර, එය වැටුප් විෂමතාවක් ලෙස අර්ථකථනය කිරීම සුදුසු නැහැ, ගරු කථානායකතුමනි.

v. නමුත් විශ්‍රාමික ප්‍රජාවගේ ගැටලුවලට සවන් දෙන රජයක් වශයෙන් 2020-2024 කාලසීමාව තුළ විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයින්ට යම් අසාධාරණයක් සිදු වී ඇති ද යන්න සම්බන්ධයෙන් මේ වෙනකොටත් රාජ්‍ය

පරිපාලන අමාත්‍යාංශයෙන් ඔවුන් සමඟ සාකච්ඡා කරමින් 2026 අය වැය තුළින් යම් විධියකට ඒකට මැදිහත් වෙන්න පුළුවන්ද කියන සාකච්ඡාව මේ වෙනකොටත් ගනිමින් ඉන්නවා. ගරු කථානායකතුමනි, ඒක විෂමතාවක් නිසා හට ගත් තත්ත්වයක් නොවෙයි. නමුත් පොදුවේ 2020-2024 විශ්‍රාමිකයන්ට යම් අසාධාරණයක් සිදු වේ නම්, ඒ පිළිබඳව අපි සාකච්ඡා කරමින් ඒකට යම් විසඳුමක් හොයන්න මේ වෙලාවේ උත්සාහ ගන්නවා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හැටියට ඒ සාකච්ඡාව ආරම්භ කරලා තිබෙනවා.

02. එම නිසා 2020-2024 කාලය තුළ විෂමතාවකට ලක් වුණු කණ්ඩායමක් කියලා කොටසක් මේ වෙලාවේ නැහැ. නමුත්, විශ්‍රාමිකයන් වර්ගය සහ විශ්‍රාමිකයන් සංඛ්‍යාව මම ඔබතුමියට දැනුම් දෙන්නම්. සිවිල් විශ්‍රාමිකයන් සංඛ්‍යාව 104,354යි, සන්නද්ධ හමුදා විශ්‍රාමිකයන් සංඛ්‍යාව 42,002යි, වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාමිකයන් ගණන 9,260යි. එකතුව 155,616යි.

03. මෙම ප්‍රශ්නයටත් ඒ පිළිතුරමයි ලබා දෙන්න තිබෙන්නේ. විශ්‍රාම වැටුප් විෂමතාවක් නොවෙයි තිබෙන්නේ. මේ කණ්ඩායම ගැනම සලකා බලා යම් මැදිහත් වීමක් කරන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.

04. නැවත වතාවක් කියන්න තිබෙන්නේ පැවැති විශ්‍රාම වැටුප් විෂමතාව අපි විසඳුවා කියන එකයි. දැන් එවැනි විශ්‍රාම වැටුප් විෂමතාවක් නැහැ. විශ්‍රාමිකයන්ට පොදුවේ ලැබිය යුතු සහනයක් ලබා දීම සඳහා තමයි අපි මේ වෙලාවේ කටයුතු කරන්නේ.

05. මෙම ප්‍රශ්නයටත් ඉහත පිළිතුරම අදාළයි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි, ගරු අගමැතිතුමියනි. ගරු කථානායකතුමනි, මම විනාඩි දෙකක කාලයක් ඔබතුමාගෙන් ඉල්ලනවා.

ගරු අගමැතිතුමියනි, ඔබතුමිය දන්නවා, රජයේ සේවකයින් ගත්තාම, 1997 බී.සී. පෙරේරා වැටුප් කොමිසමේ ඉඳලාම ඇතැම් ගැටලුකාරී තත්ත්වයන් තිබෙන බව. විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අය නැතුව අනෙකුත් රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම ආදී වශයෙන් ගත්තාම විවිධ අවස්ථාවල විවිධ දේවල් සිද්ධවෙලා තිබෙනවා. ඒ අයට 2022 වර්ෂයේදී, වැටුප් විෂමතාවෙන් තුනෙන් එකක් ලබා දුන්නා. තව පිරිසකට එය ලැබුණේ නැතුව විශ්‍රාම යන්න සිදු වුණා. මේ විධියට ගත්තාම, ඒ විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා. හැබැයි 2020ට පෙර ඇති වුණු වැටුප් විෂමතා සම්බන්ධයෙන් මේ ආණ්ඩුව වග කියන්න අවශ්‍ය නැහැ. නමුත්, යම් විධියකින් ඒකට මැදිහත් වීමක් සිදු කරපු එක හොඳ කාරණාවක් හැටියට මා දකිනවා. හැබැයි, ඒක මහා විෂමතාවක් බවට පත් කළේත් මේ ආණ්ඩුවයි කියලා මම කියනවා. මොකද, රජය වෙනුවෙන් සමාන සේවයක් කරලා විශ්‍රාම ගිය දෙදෙනෙකුට දෙවිධියක විශ්‍රාම වැටුපක් ලැබෙනවා නම්, සමානයන්ට අසමාන ලෙස සැලකීම කියන එක මෙතැනදී සිද්ධ වෙනවාය කියන එක මම කියනවා. ඒ සඳහා මම ඔබතුමියට උදාහරණ කිහිපයක් කියන්නම්. 2020-2024 කාලය ඇතුළත; 2024 දෙසැම්බර් 31 දින විශ්‍රාම ගිය කෙනෙකුගේ විශ්‍රාම වැටුපත්, 2025 ජනවාරි 1වැනි දා විශ්‍රාම ගිය කෙනෙකුගේ විශ්‍රාම වැටුපත් අතර විශාල පරතරයක් තිබෙනවා, ගරු අගමැතිතුමියනි.

රුපියල් 20,000 සිට රුපියල් 80,000 දක්වා පරතරයක් ඒ ඒක් එක් ක්ෂේත්‍රවල තිබෙනවා. සියයට 70 සිට සියයට 120ක වාගේ පරතරයක් අපට ඒවායේ පෙනෙනවා. මේ විස්තර ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එම ලේඛනයට අනුව, ප්‍රාථමික සේවාවල නුපුහුණු කාණ්ඩයට අයත් අයගේ වැටුප ගත්තොත්, 2025.01.01 දිනට පසු සාමාන්‍ය උපරිම විශ්‍රාම වැටුප, රුපියල් 55,692යි; 2025.01.01 දිනට පෙර විශ්‍රාම යනවා නම්, ඒ අයගේ සාමාන්‍ය උපරිම විශ්‍රාම වැටුප රුපියල් 32,769යි. ඒ අනුව, රුපියල් 22,923ක වෙනසක් තිබෙනවා. ඊළඟට ලේකම්වරුන්ගේ කාණ්ඩය ගත්තොත්, ඒ අය 2025ට පසුව විශ්‍රාම ගියොත් ලැබෙන විශ්‍රාම වැටුප රුපියල් 202,810යි; 2025ට කලින් විශ්‍රාම ගොස් තිබුණා නම් රුපියල් 113,688යි. ඒ අතර පරතරය රුපියල් 89,123යි. මම මේ උදාහරණ කිහිපයක් ගත්තේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, අතුරු ප්‍රශ්නය අහන්න. දැනටමත් විනාඩි දෙකහමාරක් ගතවෙලා තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ප්‍රශ්නය අහන්න නම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ නේ, ගරු කථානායකතුමනි. මට තවත් විනාඩියක කාලයක් දෙන්න. ගුරු සේවයේ එකම කාණ්ඩයේ දෙදෙනෙකු ගත්තොත්, ඒ දෙදෙනා දෙසැම්බර් 31වන දා pension ගියා නම් විශ්‍රාම වැටුප විධියට ලැබෙන්නේ එක වැටුපක්, ජනවාරි 01වන දා හෝ ඊට පසුව දා විශ්‍රාම ගියොත් ලැබෙන්නේ තවත් වැටුපක්. වෛද්‍යවරුන් දෙදෙනෙකු ගත්තත් එහෙමයි; හමුදා සේවයේ අය ගත්තත් එහෙමයි; පොලිස් සේවයේ අය ගත්තත් එහෙමයි; කම්කරු සේවයක අය ගත්තත් එහෙමයි. එහෙම නම්, මෙතැන යම්කිසි පරස්පරයක් තිබෙන බව ඔබතුමියට වැටහෙනවා ඇති කියලා මම විශ්වාස කරනවා. ඒ අයට 2020-2024 කාලය තුළ කිසිම වැටුප් වැඩිවීමක් සිදු වුණේ නැහැ. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේදී රජයේ සේවකයන්ට රුපියල් 5,000ක් වැටුපට එල්ලා තිබුණා කියන කථාව තමයි කියන්නේ. එය විශ්‍රාමිකයන්ට රුපියල් 3,000ක් විධියට තිබුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ප්‍රශ්නය අහන්න. දැනටමත් විනාඩි තුනක් ගතවෙලා තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
හොඳයි, මම ප්‍රශ්නය අහන්නම්.

ගරු අගමැතිතුමියනි, ඉතිහාසයේ කිසිම දවසක අනාගතයට බලපාන විධියට විශ්‍රාම වැටුප් හදලා නැහැ. නමුත් මම හිතනවා, රාජ්‍ය සේවය හකුළුවන්න IMF එකත් එක්ක තිබෙන යම්කිසි එකඟතා මත විශ්‍රාමිකයන් දිරිගන්වන්නට එහෙම දෙයක් කළා වෙන්න පුළුවන් කියලා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2017, 2018, 2019 වැටුප් පියවරට අනුව අවම විශ්‍රාම වැටුපක් ලබමින් සිටි කාණ්ඩ තුනෙහි විශ්‍රාම වැටුප අර ඔබතුමිය ඉස්සර වෙලා කියපු විධියට 03/2016 චක්‍රලේඛයට අනුව 2020 පියවරට ගළපන්න ආණ්ඩුව තීරණය කරපු එක හොඳයි. මොකද, රජයේ සේවකයන් කියන්නේ බොහොම අසරණ අය. මේ අයටත් 2020 වැටුප ගන්න වෙලා තිබෙන්නේ පියවර තුනකින්, 2027දී. ඒ කියන්නේ, අවම විෂමතාවක් තිබුණු අයත් මහා විෂමතාවක වින්දිතයන් බවට පත් වෙලා තිබෙනවා. ඒ වැටුප් වැඩි කිරීම ගැන මම සතුටු වෙනවා. අපි පක්ෂයක් හැටියටත්, විපක්ෂය හැටියටත් ඒ ගැන සතුටු වෙනවා.

නමුත්, 2020ට පෙර විශ්‍රාම ගත් අයට 2020 පියවරට ගළපන වැටුප ගන්න 2027 වෙනකල් අවුරුදු 7ක් බලාගෙන ඉන්න සිදු වෙලා තිබෙනවා. අවුරුදු 60 එක්කෙනාට අවුරුදු 67 වෙනකල් බලාගෙන ඉන්න වෙනවා. ඒ අය ඒ වෙනකල් ජීවත් වේවිද දන්නේත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, කරුණාකර ප්‍රශ්නය අහන්න. දැනටමත් විනාඩි 5ක් ගතවෙලා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අහන්නේ, ඒ වනකල් කල් ගත්තු එක සාධාරණද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මෙච්චර කාලයක් මේ රටේ අසාධාරණයන් ගණනාවක් සිදු වෙලා තිබෙනවා. විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව අවුරුදු ගණනාවකින් විසඳුණේ නැහැ. නමුත් අප ඉදිරිපත් කරපු පළමුවෙනි අය වැය තුළම අපි ඒ විෂමතාව නිවැරදි කළා. අවුරුදු ගණනක් තිස්සේ රාජ්‍ය සේවය තුළ ඇති වෙලා තිබුණු විෂමතා, අසාධාරණකම් ගැන කථා කරනවා නම්, අපට ඒ වෙනුවෙන් වෙනමම දවස් දෙකතුනක් කථා කරන්න පුළුවන්. මොකද, මෙච්චර කාලයක් පැවැති හැම ආණ්ඩුවක්ම කරලා තිබුණේ ඒ ඒ මොහොතට පැන නඟින ප්‍රශ්නවලට මොනවා හරි විසඳුම් ලබා දීලා, අර්බුද ගණනාවක් නිර්මාණය කර තිබෙන එකයි. ගරු කථානායකතුමනි, මේ ගරු මන්ත්‍රීතුමියත් හොඳටම දන්නවා, ඒ හේතුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අද වන විට ඇති වෙලා තිබෙන අහිතකර තත්ත්වයන්, මේ මොහොත වන විට පවතින විෂමතා කොච්චරක්ද කියලා. ඒ නිසා තමයි අපි ඒ ඒ මොහොතට පැලැස්තර විසඳුම් දෙමින් යන්නේ නැතුව ප්‍රතිපත්තියක් හැටියට කාණ්ඩ වශයෙන් වෙන වෙනම අරගෙන, පද්ධතියක් හැටියට අරගෙන ඒවාට විසඳුම් ලබා දෙන්නේ. මොකද, අප විශ්වාස කරන්නේත්, අපේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේත් ඒකයි. රාජ්‍ය සේවය කියන එක ගෞරවාන්විතව, ශක්තිමත්ව පවත්වා ගෙන යෑමේ වැදගත්කම තේරුම් ගත් ආණ්ඩුවක් අපි. ඒ නිසා අපි පැලැස්තර විසඳුම් දෙන්නේ නැහැ. පවතින ආර්ථික තත්ත්වය තුළ අපේ රටේ තිබෙන ආර්ථික හැකියාව, ශක්තිය අනුව අසාධාරණයක් සිදු නොවන විධියටත්, ඉදිරියට විෂමතා නිර්මාණය නොවන විධියටත් පද්ධතිය දිහා බලා තමයි අපි මේ වනකොට විසඳුම් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අනුව තමයි කාලයක් තිස්සේ නිර්මාණය වෙලා තිබුණු විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්නයටත් අප මේ වනකොට විසඳුමක් ලබා දීලා තිබෙන්නේ. 2025 සිට රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩිවීම පිළිබඳව තමයි මම විස්තර කළේ. ඒක විෂමතාවක් නොවෙයි, ගරු කථානායකතුමනි. මීට පෙර අරගෙන තිබුණු පියවර හරහා තමයි ඒ සම්බන්ධ අර්බුදයක් පැන නැඟී තිබෙන්නේ; කතිකාවක් ඇති වී තිබෙන්නේ.

වැටුප් වැඩි වන හැම අවස්ථාවකම ඒ වැටුපට හරියන විධියට විශ්‍රාම වැටුප හදන්න බැහැ, ගරු කථානායකතුමනි. ඒක ලෝකයේ කොහේවත් සිද්ධ වෙන්නේ නැහැ. විශ්‍රාමිකයන් බලා ගන්න ඕනෑ කියන එක වෙනම කථාවක්. විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑ කියන එක වෙනම වැඩක්. ඒ වෙනුවෙන් අපි අනිවාර්යයෙන්ම වැඩ කටයුතු කරනවා. ජීවන වියදම වැඩි වනවාට සාපේක්ෂව ආර්ථික තත්ත්වය ශක්තිමත් කරන්න, විශ්‍රාමිකයන්ට ලැබිය යුතු සේවාවන් සලසන්න සහ ලැබිය යුතු විශ්‍රාම වැටුප සංශෝධනය කරන්න අපි වෙනම වැඩසටහනක් කරනවා.

නමුත්, දැන් පවතින්නේ විෂමතාවක් නොවෙයි. ඒක හරියට තේරුම් ගන්න ඕනෑ. වැටුප් වැඩි වන වැඩි වන වෙලාවට ඒකට සරිලන විධියට ඊට කලින් විශ්‍රාම ගිය අයගේ වැටුප් සංශෝධනය කරන්න අපට බැහැ. ඒක ප්‍රතිපත්තිමය වශයෙන් විශාල ගැටලුවක්. මේ, කණ්ඩායම් දෙකක්. රාජ්‍ය සේවයේ පිහිටුවා රාජ්‍ය සේවයට හරියන වැටුපක් දීම සහ ඔවුන්ට විශ්‍රාම වැටුප හරියට හදන එක එකක්. කලින් විශ්‍රාම ගිය අය බලා ගැනීම තව වැඩක්. ඒ දෙකම අපේ රජය කරනවා. අපි වැඩ කරන්නේ, යම්කිසි පද්ධතියක් දිහා බලලා ඒ පද්ධතියට හානියක් නොවන විධියට, පද්ධතියේ අවශ්‍යතාව සහ විශේෂයෙන්ම රාජ්‍ය සේවය රැක ගැනීමේ අරමුණින් වාගේම රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමේ අරමුණින්. ඒ මිස, අනාගතයට ප්‍රශ්න නිර්මාණය වන විධියට නම් නොවෙයි, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු අගමැතිතුමියනි, ඔබතුමිය ඒකට 'විෂමතාව' කියන්නේ නැත්නම්, 'අර්බුදයක්' තිබෙනවා යැයි කියමුකෝ. ඒ අර්බුදය හැදෙන්නේ මෙහෙම නේ. පසුගිය අය වැය මඟින් 2025 රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීමට සමගාමීව විශ්‍රාමිකයන්ට -2025.01.01 දින සිට විශ්‍රාම යන රජයේ සේවකයන්ට- 2027 වැටුපට ගළපලා විශ්‍රාම වැටුප ඉහළ දැමීම කළා නේ. ගරු අගමැතිතුමිය, ඒ තුළ තමයි 2020-2024 විශ්‍රාම ගිය කණ්ඩායම ඔබතුමිය කියන විෂමතාවට නොවෙයි නම්, ඔය කියන අර්බුදයට පත් වුණේ. එහෙම නම්, ඒ අර්බුදය හදලා තිබෙන්නේ අන්තිමට ගෙන ආ අය වැයෙන් ගත්තු තීරණය මතයි. නමුත්, ඒ වැඩි කිරීම ගැන මම සතුටු වෙනවා. කොයි ආණ්ඩුවෙන් වුණත් විශ්‍රාමිකයෙකුට හොඳට සලකනවාට මම කවදත් කැමැතියි. මොකද, ඒ අය රම්පේ, කරපිංචා හැටියට විසි කරන තත්ත්වයක් තිබෙන්නේ. උද්ඝෝෂණයක් කළාට වැඩකුත් නැහැ. ඒ අය දැන් ඔබතුමියලාට, කැබිනට් මණ්ඩලයට, ජනාධිපතිතුමාට -හැමෝටම වාගේ- ලියා ඉල්ලා තිබෙනවා, සාකච්ඡාවකට දිනයක් දෙන්න කියලා. පස්වෙනි මාසයේ දෙවැනි දා විරෝධතාවකුත් කරලා තිබෙනවා. නමුත්, ඒ අය කියනවා දිනයක් ලැබුණේ නැහැ කියලා. මම ඔබතුමියට කියනවා ඒ විෂමතාව -ඒ 'විෂමතාව' හෝ 'අර්බුදය'- හැදුවේ ඔබතුමියලා බව.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශ්‍රාමිකයන් සම්බන්ධව ගත්තාම, ගරු ජනාධිපතිතුමාගේ විශ්ලේෂණය අනුව කාණ්ඩ දෙකක් ඉන්නවා. 2020ට පෙර විශ්‍රාම

ගිය සහ 2025ට පසු විශ්‍රාම ගිය අයගේ විෂමතාව විසඳලා ඉවරයි කියලා එතුමා වේදිකාවේ සහ ඇතැම් තැන්වල කියනවා මම දැක්කා. හැබැයි, එතැනදී 2020-2024 විශ්‍රාම ගිය කණ්ඩායම අමතක වෙලා තිබෙනවා. 2020ට පෙර සහ 2025න් පසු විශ්‍රාම ගිය අය ගැනයි කියලා තිබෙන්නේ. නමුත්, 2020-2024 විශ්‍රාම ගිය කණ්ඩායම අමතක වෙලා තිබෙනවා.

අගමැතිතුමිය හැටියට ඔබතුමියත්, කම්කරු නියෝජ්‍ය ඇමතිතුමාත් සමහර තැන්වල පිළිගන්නවා වාගේ පෙණුනා, මෙතැන යම් කිසි ගැටලුවක් තිබෙනවා කියලා. ඔබතුමිය ඉස්සෙල්ලාත් මේ ගැන කිව්වා. ඔබ දෙපළවත් ඒ විධියට හිතන එක ගැන සතුටුයි. හැබැයි, ජනාධිපතිතුමා එකක් කියනවා, අගමැතිතුමිය හා කම්කරු නියෝජ්‍ය ඇමතිතුමා තව එකක් කියනවා. මට දැනගන්න පුළුවන්ද මොකක්ද මේ පරස්පරය කියලා? ජනාධිපතිතුමා එක දෙයක් කියනවා, අගමැතිතුමිය සහ කම්කරු නියෝජ්‍ය ඇමතිතුමා තව දෙයක් කියනවා. මේ කියන හැටියට විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් '2020ට පෙර' සහ '2025ට පසු' කියලා කාණ්ඩ දෙකද ඉන්නේ? එතකොට අනෙක් කණ්ඩායමට මොකද වෙන්නේ?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මේකටත් මට කලින් දීපු පිළිතුරම තමයි දෙන්න වෙන්නේ. ඒ නිසා මම ආයෙත් ඒක කියන්න යන්නේ නැහැ. මෙතැන කිසිම පරස්පරයකුත් නැහැ, ප්‍රශ්නයකුත් නැහැ. මේ වෙනකොට විෂමතාවක් නැහැ. 2020-2024 කාලය තුළ නිර්මාණය වෙච්ච විෂමතාවට මේ ආණ්ඩුව විසඳුමක් දීලා තිබෙන්නේ. ඒක, එකක්. විශ්‍රාමිකයන් බලා ගැනීම, විශ්‍රාමිකයන්ට මොකක් හරි අර්බුදයක් තිබෙනවා නම් ඒ සඳහා මැදිහත් වීම තමයි දෙවැනි කාරණය. ඒ කාරණයටත් මේ ආණ්ඩුව මැදිහත් වෙනවා. ගරු රාජ්‍ය පරිපාලන ඇමතිතුමා ඒ සඳහා සාකච්ඡා දීලාත් තිබෙනවා. ඔවුන් සමඟ දිගටම සාකච්ඡා කරගෙනත් යනවා. ඉල්ලපු හැම සාකච්ඡාවක්ම දීලා තිබෙනවා. ඒ නිසා මෙතැන ප්‍රශ්නයක් නැහැ. මට තව විස්තර කරන්න අලුත් තොරතුරක් නැහැ. මම කියන එක අතිශයින්ම පැහැදිලියි. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු ඩී. චානක මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

රටක ආර්ථික වර්ධනය කෙරෙහි සෘජු විදේශ ආයෝජන ඉතාම තීරණාත්මක කාර්යභාරයක් මෙන්ම බලපෑමක් සිදු කරයි. රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගෙන තිබෙන ගිවිසුම අනුව ණය ගෙවීමේ ශක්‍යතාව ගොඩ නඟා ගැනීමට අවශ්‍ය ඉහළ ආර්ථික වර්ධන වේගය සඳහා ද එය දැඩි බලපෑමක් සිදු කරයි. නමුත්, මෑත කාලීන සෘජු විදේශ ආයෝජන පිළිබඳ මාධ්‍ය මඟින් මෙන්ම ආර්ථික විශේෂඥයන් ද විවිධ මත සහ විශ්ලේෂණ ඉදිරිපත් කර සිටී. ඒ අනුව,

(අ) 2005 වර්ෂයේ සිට 2025 මැයි මාසය දක්වා ශ්‍රී ලංකාවට ලැබුණු සෘජු ආයෝජන ප්‍රමාණය වාර්ෂිකව කොපමණද? ඒ මොනවාද?

(ආ) එම ආයෝජනවල වටිනාකම වෙන වෙන් වශයෙන් කොපමණද?

(ඇ) 2011-2012 කාලයේදී සුප්‍රීම් ග්ලෝබල් හෝල්ඩින්ග්ස් ආයතනයට අනුබද්ධිත සුප්‍රීම් සැට් සමාගම විසින් දියත් කළ සන්නිවේදන චන්ද්‍රිකාව සඳහා එම ආයතනය විසින් ආයෝජනය කර ඇති මුළු මුදල කොපමණද?

(ඈ) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් මුදල් ආයෝජනය කර තිබේද? එසේ තිබේ නම්, එය කොපමණද?

(ඉ) එම සන්නිවේදන චන්ද්‍රිකාව මඟින් මේ වනවිට ශ්‍රී ලංකාවට මූල්‍ය ප්‍රතිලාභයක් හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභයක් ලැබෙන්නේද? ලැබෙන්නේ නම් එහි වර්ෂික වටිනාකම කොපමණද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මැතිතුමා විසින් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට සවිස්තරාත්මක තොරතුරු ලබා ගත යුතු අතර, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බැවින් සති දෙකක කාලයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම්: අනවසර පදිංචිකරුවන්
### கண்டி தேசிய வைத்தியசாலைக்குச் சொந்தமான காணிகள்: சட்டவிரோத குடியிருப்பாளர்கள்
### LANDS BELONGING TO NATIONAL HOSPITAL, KANDY: UNAUTHORIZED OCCUPANTS

614/2025

**1. ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර ජාතික රෝහල සතු සමස්ත භූමි ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට විවිධ රජයේ ආයතන හා විවිධ පුද්ගලයන් විසින් එම රෝහල සතු ඉඩම් නීති විරෝධී ලෙස අත්පත් කර ගෙන සිටින බව දන්නේද;

(iii) එම තත්ත්වය රෝහලේ ඉදිරි සංවර්ධන කටයුතුවලට බාධාවක් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி தேசிய வைத்தியசாலைக்குச் சொந்தமான மொத்த நிலப்பரப்பு எவ்வளவு என்பதையும்;

(ii) பல்வேறு அரச நிறுவனங்கள் மற்றும் பல்வேறு தனிநபர்களால் இன்றளவில் மேற்படி வைத்திய

[ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය]

சாலைக்குச் சொந்தமான காணிகள் சட்ட விரோதமாகக் கைப்பற்றப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி நிலைமை வைத்தியசாலையின் எதிர்கால அபிவிருத்தி நடவடிக்கைகளுக்குத் தடையாக அமைவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) அவ்வாறாயின், அது குறித்து எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the total extent of the lands in possession of the Kandy National Hospital;

(ii) whether he is aware that various government institutions and individuals have unlawfully acquired the lands in possession of the aforesaid hospital at present;

(iii) whether he admits that this situation is a hindrance to the future development activities of that hospital; and

(iv) if so, the action that will be taken in that regard?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි

(අ) (i) මහනුවර ජාතික රෝහල සතු සමස්ත භූමි ප්‍රමාණය අක්කර 58.4කි. (හෙක්ටෙයාර 23.637)

(ii) ඔව්.

(iii) රෝගී සත්කාර සේවාව පුළුල් කිරීමට අවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රෝහල් පිඹුරේ කැබලි අංක 01 සහ 19 කොටස් වැනි ප්‍රදේශ අත්‍යවශ්‍ය නමුත් අනවසර පදිංචිකරුවන් සහ ව්‍යාපාර හේතුවෙන් එම ප්‍රදේශ භාවිත කිරීමට නොහැකි වී ඇත.

ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ දෙවැනි ජාතික රෝහල හැටියට තමයි මහනුවර රෝහල දියුණු කරමින් පවතින්නේ. ඇත්තටම එය අපි කඩිනම් සැලසුමක් ඇතිව සංවර්ධනය කළ යුතුව තිබෙනවා. නමුත්, මේ ගැටලුව අපට දැන් ප්‍රධාන වශයෙන් බලපා තිබෙනවා.

(iv) **1. ඉඩම් පැවරීම සහ ගැසට් කිරීම.**

ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර නොමැති රෝහල් ඉඩමේ කැබලි අංක 1,2,5,6,7,8 යන කොටස් රජයට පවරා ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය හරහා පියවර ගනිමින් සිටී.

**2. නෙරපීම් නඩු පැවරීම.**

2018 වසරේදී අනවසර පදිංචිකරුවන් විසිහත්දෙනෙකුට එරෙහිව මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ නෙරපීම් නඩු පවරා ඇත. එයින් දසදෙනෙකුට නෙරපීම් නියෝග ලබා දී ඇති අතර, දෙදෙනෙකුගේ දේපළ රෝහලට ආපසු අත්පත් කරගෙන ඇත. තවත් නෙරපීම් නියෝග 08ක් නිකුත් කර ඇති අතර, ඒවා අධිකරණ පිස්කල් මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති අංශයේ නීතිඥවරුන්ගේ සහාය ඇතිව ඉතිරි නඩු සඳහා අවශ්‍ය නීතිමය පියවර ගනිමින් සිටී. නීතිඥ සහාය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ද ඉල්ලීම් යොමු කර ඇත.

Kandy Temple View City Hotel ලැගුම්හල, මිඩ්ලන්ඩ් ගොඩනැඟිල්ල, වසන්ත රුද්‍රිගෝගේ දෙමහල් නිවස, එන්. දිනේෂ් කුමාර් සහ නුවර මල්ශාලාව වැනි තවදුරටත් ඉදි කිරීම් කරන අනවසර ඉදිකිරීම් සඳහා ද නෙරපීම් නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**3. ඉඩමේ මායිම් වැටක් ඉදි කිරීම.**

වෛද්‍ය තිලක් අබේසේකර වකුගඩු ඒකකයේ සිට හන්තාන මාර්ගය ඔස්සේ රෝහල් ඉඩම හන්තාන මාර්ගයට මායිම් වන පරිදි ආරක්ෂිත වැටක් ඉදි කර ඇත.

**4. අනවසර ඉදිකිරීම් සහ ව්‍යාපාර ඉවත් කිරීම.**

මහනුවර නාගරික කොමසාරිස්වරයා සමඟ සාකච්ඡා කර, අනවසර පදිංචිකරුවන්ට රෝහල් ඉඩමේ නව වරිපනම් අංක ලබා නොදීමට, ජල/ විදුලි සැපයුම් ලබා දීම අනුමත නොකිරීමට, නිවාස/ ගොඩනැඟිලි ඉදි කිරීම් අනුමත නොකිරීමට සහ වෙළෙඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා නොදීමට/ අලුත් නොකිරීමට එකඟතාවක් ලබාගෙන ඇත.

**5. අධිකරණ ක්‍රියාමාර්ග සහ නීති ආධාර.**

අනවසර පදිංචිකරුවන් විසින් ඉහළ අධිකරණවලට (දිසා අධිකරණය, මහාධිකරණය සහ අභියාචනාධිකරණය) අභියාචනා කර ඇති නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව/ රජයේ අධිනීතිඥවරුන් සමඟ නීතිමය පියවර ගනිමින් සිටී.

**6. අනවසර පදිංචිකරුවන්ගේ තොරතුරු රැස් කිරීම.**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් සහ රෝහල් නිලධාරීන් ඇතුළු කණ්ඩායමක් මඟින් අනවසර පදිංචිකරුවන්ගේ තොරතුරු රැස් කිරීමට පියවර ගෙන ඇත. නමුත් තොරතුරු ලබාදීමේදී පදිංචිකරුවන්ගෙන් විරෝධතා එල්ල වී ඇත.

කෙසේ වෙතත්, 2023.10.18 දින ප්‍රාදේශීය ලේකම් විසින් අනවසර පදිංචිකරුවන් 181දෙනෙකුගේ නාමලේඛනයක් ලබා දී ඇති අතර, 2024.01.04 දින එම ගණන 270 ලෙස සංශෝධනය කර තොරතුරු ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු (උදා: පවුලේ සාමාජිකයන් ගණන, රැකියාව, නිවාසවල

ස්වභාවය, ඉඩම් ප්‍රමාණය, ඉවත්ව යෑමට මනාපය) ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

**7. ඉඩම් කමිටුවක් පත් කිරීම.**

2022.08.17 දින මහනුවර ජාතික රෝහල තුළ ඉඩම් කමිටුවක් පත් කර ඇති අතර, එමඟින් රෝහලට අයත් ඉඩම් නිසි ලෙස පවරා ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

**8. බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත දැනුම් දීම.**

රෝහලට අයත් ඉඩම් කොටස් මහනුවර බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් නාථ දේවාලයට අයත් බවට පවසමින් බදු දීම වැළැක්වීම සඳහා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත ලිපි මඟින් දැනුවත් කර ඇත.

**9. රෝහල් භූමිය තුළ අලුතින් අනවසර ඉදිකිරීම් සිදු කිරීමට ඉඩ නොදී, එවැනි අනවසර ඉදිකිරීම් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.**

(ආ) පැන නොනඟී.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා සඳහන් කළ ආකාරයට අද වෙනකොට පවුල් 100කට අධික ප්‍රමාණයක් මහනුවර මහ රෝහල අසල බෝගම්බර ප්‍රදේශයේ පරම්පරා ගණනාවක් තිස්සේ පදිංචි වෙලා සිටිනවා. මේ ගොඩක් ගෙවල් සඳහා වරිපනම් ගෙවනවා. නමුත් අද වෙනකොට ඒ අයගේ දරුවා පාසලකට යවා ගන්න ලිපිලේඛන ලබා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ පවුල් තමන්ගේ මුදල් භාවිත කරලා තමයි ඒ ගෙවල් හදලා තිබෙන්නේ. මෑතක් වනතුරුම කිසිම විරෝධතාවක් තිබුණේ නැහැ, ඒවායේ පදිංචිවීම සම්බන්ධයෙන්. මේ ප්‍රශ්නය විසඳීමට කඩිනම් පියවරක් ගන්න කියලා තමයි මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මහනුවර ජාතික රෝහල සංවර්ධනය වැදගත් වෙන්නේ මහනුවරට විතරක් නොවෙයි, රටටම. ඒ නිසා අපි රෝහලේ සංවර්ධනය ගැනත් බලනවා. ඒ පදිංචිකරුවන් පරම්පරා ගාණක් තිස්සේ පදිංචි වෙලා ඉන්න එකත් ඇත්ත. ඒ අයගේ පදිංචිය සහ ඒ අයගේ ජීවත්වීම සම්බන්ධ ගැටලුවත් සලකමින් තමයි අපි මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නේ.

විශේෂයෙන්ම ඔබතුමිය දන්නවා ඇති, මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත්, ඒ හරහා ක්‍රියාත්මක කරන මහනුවර නගර සංවර්ධන සැලැස්මේදීත් මේ පිළිබඳව අවධානය යොමු කර තිබෙන බව. ජනතාවගේ ජීවත් වීම සඳහා වන අවස්ථාවත්, අනෙක් පැත්තෙන් රටට වැදගත් වන රෝහලේ සංවර්ධනයත් කියන දෙකම අපි සමබරව, උපරිම වශයෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා විසින් අසනු ලබනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපට මතකයි, කෙහෙළිය රඹුක්වැල්ල සෞඛ්‍ය ඇමතිතුමා හිටපු කාලයේ මහනුවර මහ රෝහලේ විශේෂයෙන්ම radiology කාමරයේ A/C පද්ධතිය වැඩ කළේ නැහැ කියලා ඒ යන්ත්‍රෝපකරණ භාවිතාවට ගත්තේ නැති බව. මම ඔබතුමාට කියා සිටිනවා, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. ඔබතුමා දන්නවා, රෝග විනිශ්චය සඳහා MRI scannersවල, CT scannersවල තිබෙන වැදගත්කම. මට ජාතික රෝහලෙන් තොරතුරු ලැබුණා, ඒ දත්ත පද්ධතිය updtate කරපු නැති නිසා neurology unit එකට films ලබා ගැනීමේ අපහසුතාවක් තිබෙනවා කියලා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ජාතික රෝහලේ පවතින PACS එක පිළිබඳව මම මීට කලිනුත් මේ සභාවේදී කිව්වා. ඇත්තටම, 2017 අවුරුද්දේදී රෝහල් 5ක් සඳහා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේක ආරම්භ කරපු විධිය, පවත්වා ගෙන ගිය විධිය, ඩොලර් මිලියන 3ක් ගෙවපු විධිය සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඊට අදාළ විගණන සිද්ධ වෙනවා. අල්ලස් කොමිසමේ මේ සම්බන්ධයෙන් කටයුතු සිදුවෙමින් පවතිනවා. PACS එකක් දෙන්න ඕනෑකම තිබෙනවා. ජාතික රෝහලේ තමයි මේ ප්‍රශ්නය මූලිකව පැන නැඟිලා තිබෙන්නේ. CT, MRI scans කරන්න ගැටලුවක් නැහැ. දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ, එහෙම නැත්නම් උතුරු කොළඹ ශික්ෂණ රෝහලේත් CT, MRI image එක අරගෙන කරන කටයුත්තක් තිබෙනවා. ඒකට PACS එක නැහැ. ඒකෙනුත් මේ කටයුත්ත කරගෙන යන්න පුළුවන්. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, මේ කටයුත්ත කරපු විධිය අනුව කාටවත් ඊළඟ වාරික ගෙවන්න අනුමත කරන්න බැහැ. ඒ, ඩොලර් මිලියන 33ක ව්‍යාපෘතියක්. ඒවා පටන් ගන්නකොට විනිවිදභාවයෙන් යුතුව කළා නම් රටට පහසුයි. ඊළඟ වාරික ගෙවන්න ඒ සමාගමත් එක්ක අපි සාකච්ඡා කරගෙන යනවා. මේක බරපතළ ගැටලුවක්. දැන් මම කමිටු කිහිපයක් පත් කරලා තිබෙනවා. හැබැයි, කාටවත් ඒකේ වගකීම භාරගන්න බැරි තැනට ඇවිල්ලා තිබෙනවා. මේ කටයුත්ත කෙරුණු විධිය කිසිවෙකුට සාධාරණීකරණය කරන්න බැහැ. ඒක තමයි ගරු කථානායකතුමනි, තිබෙන ප්‍රශ්නය.

## 2015 සිට මාළු අස්වැන්න, ආනයනය සහ අපනයනය: විස්තර

2015 முதல் மீன் அறுவடை, இறக்குமதி மற்றும் ஏற்றுமதி: விபரம்

CATCH, IMPORT AND EXPORT OF FISH SINCE 2015: DETAILS

637/2025

**2. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ මාළු අස්වැන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

(ii) එම කාලය තුළ මාළු අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලය තුළ ශ්‍රී ලංකාවට මාළු ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ මාළු අස්වැන්න ඉහළ නංවා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் தற்போதுவரை இலங்கையின் மீன் அறுவடை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) அக்காலப்பகுதியில் மீன் ஏற்றுமதிமூலம் ஈட்டிய வருமானம் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காலப்பகுதியில் இலங்கைக்கு மீன் இறக்குமதி செய்வதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) இலங்கையின் மீன் அறுவடையை அதிகரிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House the -

(i) fish catch in Sri Lanka from the year 2015 to date, separately in respect of each year;

(ii) income earned from fish exports during the aforesaid period, separately in respect of each year;

(iii) amount spent by Sri Lanka on fish imports during the aforesaid period, separately in respect of each year; and

(iv) steps that are being taken to increase the fish catch of Sri Lanka ?

(b) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**

(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)

(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, அந்த வினாவுக்கான விடை பின்வருமாறு:

(அ) (i)

| கடல் மீன் உற்பத்தி (மெற்றிக்தொன்களில்) | | | | | |
|---|---|---|---|---|---|
| வருடம் | கரையோர பிராந்தியம் | ஆழ்கடல் / கரைக்கு அப்பால் | அனைத்து கடல் மீன் உற்பத்தி | நன்னீர் மற்றும் நீர்வாழின உற்பத்தி | அனைத்து மீன் உற்பத்தி |
| 2015 | 269,020 | 183,870 | 452,890 | 67,300 | 520,190 |
| 2016 | 274,160 | 182,830 | 456,990 | 73,930 | 530,920 |
| 2017 | 259,720 | 189,720 | 449,440 | 81,870 | 531,310 |
| 2018 | 249,020 | 190,350 | 439,370 | 87,690 | 527,060 |
| 2019 | 242,580 | 172,910 | 415,490 | 90,340 | 505,830 |
| 2020 | 182,560 | 144,370 | 326,930 | 101,810 | 428,740 |
| 2021 | 178,260 | 153,415 | 331,675 | 104,235 | 435,910 |
| 2022 | 149,440 | 131,170 | 280,610 | 116,620 | 397,230 |
| 2023 | 164,995 | 128,950 | 293,945 | 113,125 | 407,070 |
| 2024 | 165,040 | 143,390 | 308,430 | 102,330 | 410,760 |
| 2025 சனவரி - மார்ச் | 49,000 | 42,325 | 91,325 | 12,400 | 103,725 |

(ii)

| வருடம் | ரூபாய் மில்லியன் | அமெ. டொலர் மில்லியன் |
|---|---|---|
| 2015 | 24,716.1 | 181.8 |
| 2016 | 26,801.6 | 184.1 |
| 2017 | 39,229.7 | 257.3 |
| 2018 | 47,948.9 | 295.0 |
| 2019 | 53,482.9 | 299.2 |
| 2020 | 39,874.0 | 214.9 |
| 2021 | 63,222.5 | 317.9 |
| 2022 | 97,242.8 | 302.2 |
| 2023 | 99,118.0 | 302.7 |
| 2024 | 86,240.9 | 285.2 |
| 2025 சனவரி - மார்ச் | 18,247.7 | 61.6 |

(iii)

| வருடம் | ரூபாய் மில்லியன் | அமெ. டொலர் மில்லியன் |
|---|---|---|
| 2015 | 30,729.0 | 226.1 |
| 2016 | 35,172.0 | 241.6 |
| 2017 | 33,969.0 | 222.8 |
| 2018 | 32,726.4 | 201.3 |
| 2019 | 38,952.4 | 217.9 |
| 2020 | 35,504.3 | 191.4 |
| 2021 | 25,080.0 | 126.1 |
| 2022 | 21,664.2 | 70.3 |
| 2023 | 26,733.7 | 82.2 |
| 2024 | 36,671.7 | 121.6 |
| 2025 சனவரி - மார்ச் | 8,500.2 | 28.7 |

(iv) கடல் மீன் உற்பத்தி

- மீன்பிடித் துறைக்கான கரையோர கடல்சார் சுற்றுச்சூழல் தொகுதியில் கடல் பல்லுயிர் இனப்பெருக்கத்தை மேம்படுத்துவதற்கு கரையோரக் கடற்பரப்பில் செயற்கை அடிமூலக்கூறுகள் நிறுவப்பட்டுள்ளன. இதனூடாக மீன் இனப்பெருக்கச் சூழலை ஏற்படுத்தி கரைக்கு அருகே மீன் வளத்தை அதிகரிக்கும் நோக்குடன், 2021, 2022, 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளில் பயன்படுத்தி அகற்றப்பட்ட பன்னாள் மீன்பிடிப் படகுகள், பேருந்து அடிச்சட்டத் தொகுதிகள் போன்ற மீன்களை ஒன்றுசேர்க்கும் பொறிகள் பெருமளவு சூழலுக்குப் பாதிப்பை ஏற்படுத் தாது தேர்ந்தெடுக்கப்பட்ட இடங்களில் செயற்கை அடிமூலக்கூறுகளாகத் தாபிக்கப் பட்டுள்ளன. இந்த வருடத்திலும் கொக்கல, திருகோணமலை, கொழும்பு மற்றும் நீர்கொழும்பு ஆகிய மாவட்டங்களில் தேர்ந்தெடுக்கப்பட்ட பிரதேசங்களில் இந்தச் செயற்கை அடிமூலக்கூறுகளை நிறுவுவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன.

- ஆழ்கடலில் மிக ஆழமான பகுதிகளில் நீள்தூண்டல் முறையைப் பயன்படுத்தி,  அஸ்கெடி கெலவல்லன் மீன் அறுவடைக் கான முன்னோடித்திட்டம் உலக உணவு மற்றும் விவசாய அமைப்பின் தொழில்நுட்ப உதவியுடன் செயற்படுத்தப்பட்டு வருகின்றது. இந்த வருடத்திலும் இந்த முன்னோடித்திட்டம் செயற்படுத்தப்பட உள்ளது.

- இலங்கையில் கடனீரேரிகளில் மீன் மற்றும் இறால்களின் குடித்தொகையை அதிகரிப் பதற்கு தேசிய நீர்வாழ் உயிரின வளர்ப்பு அதிகாரசபையும் தேசிய நீர்வளங்கள் ஆய்வு மற்றும் அபிவிருத்தி முகவராண்மை நிறுவனமும் ஒருங்கிணைந்து நீர்நிலைகளில் மீன் குஞ்சுகள் மற்றும் இறால் குஞ்சுகளை விடுவிக்கும் நிகழ்ச்சித்திட்டத்தைச் செயற் படுத்தி வருகின்றன.

- கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களமும் தேசிய நீர்வளங்கள் ஆய்வு மற்றும் அபிவிருத்தி முகவராண்மை நிறுவனமும் ஒருங்கிணைந்து ஆழ்கடலில் மீன்களின் குடித்தொகை குறித்த தரவுகளை மீனவ சமூகத்துக்கு வழங்குவதற்கு நடவடிக்கை எடுத்து வருகின்றன.

**நன்னீர் மீன் மற்றும் நீர் வாழின உற்பத்தி**

- கனமழை காரணமாக வாவிகளில் நீர் நிரம்பி வழியும்போது வாவிகளின் பாதுகாப்புக்கான கதவுகள் திறக்கப்படுகின்றன. இதன்போது மதகுகள் மற்றும் கதவுகளின் வழியாக தப்பியோடும் மீன்களின் தொகை 40% என மதிப்பிடப்பட்டுள்ளது. இவ்வாறு வெளியேறுவதைத் தடுப்பதற்கு வான்கதவுகள் மற்றும் மதகுகளுக்கு அருகிலும் வாவிகளுக்கு நீர் வரும் வழித்தடங்களிலும் தடுப்பு வலைகளைப் பயன்படுத்தி பாதுகாப்பதற்குத் திட்டமிடப் பட்டுள்ளது. (இதற்கு ஒரு வாவிக்கு அண்ணளவாக 700,000 ரூபாய் வரை செலவாகுமென மதிப்பிடப்பட்டுள்ளது. இந்தத் தடுப்பு வலைகளை நிறுவுவதன்மூலம் இழக்கப்படும் மீன் அறுவடையில் கணிசமான அளவைச் சேமிக்க முடியும்)

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමනි, පිළිතුරේ ඉතිරි කොටස සභාගත කරන්න. ඔබතුමා මම අහලා නැති ගොඩක් කාරණා ගැනත් කියාගෙන යනවා. ඔබතුමා පිළිතුරේ ඉතිරි කොටස සභාගත කරන්න, මම ඒක අධ්‍යයනය කරන්නම්.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු කථානායකතුමනි, පිළිතුරේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:*
** Rest of the Answer tabled:*

- வாவிகளின் மீன் தொகையை அதிகரிப்பதற்கு மீன் குஞ்சுகள் வைப்பிடும் நடவடிக்கை கடந்த வருடத்தின் நவம்பர் மாதம் வரை மேற்கொள்ளப்பட்டது. இது ஒழுங்கற்ற செயன்முறையாக இருந்தது. 2025ஆம் ஆண்டு தொடக்கம் வருடத்துக்கு 100க்கும் 120க்கும் இடைப்பட்ட குளங்கள் வீதம் தேர்ந்தெடுக்கப்பட்டு மாதாந்தம் மீன் குஞ்சுகள் வைப்பிடும் நிகழ்ச்சித்திட்டம் தயாரிக்கப்பட்டு, மீன் குஞ்சுகள் வைப்பிடும் செயற்பாடு முறையாக ஆரம்பிக்கப்பட்டுள்ளது.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

- இதன்மூலம் ஒரு வருடத்துக்கு 20,000 மெற்றிக்தொன் வீதம் அறுவடையை அதிகரிப்பதற்கு எதிர்பார்க்கப்பட்டுள்ளது. இதற்கு வருடாந்தம் மீன் குஞ்சுகளின் உற்பத்தியை 150 மில்லியன் வீதம் அதிகரிக்க வேண்டும். இதற்கு களுகங்கை, மொரகஹகந்த மற்றும் இங்கினிமிட்டிய வாவிகள் சார்ந்து எதிர்வரும் 5 வருடங்களுக்குள் 3 புதிய இனப்பெருக்க நிலையங்களை நிர்மாணிப்பதற்கும் சகல வாவிகளிலும் மீன் குஞ்சுகளை அதிகரிப்பதற்கு குளத் தொகுதிகள் வீதம் நிர்மாணிப்பதற்கும் திட்டமிடப்பட்டுள்ளது.

- மேற்குறித்த நடவடிக்கைகள்மூலம் அதிகரிக்கும் மீன் அறுவடையின் அறுவடைக்குப் பிந்திய இழப்பைக் குறைத்து அதன் நன்மை நுகர்வோரைச் சென்றடைவதை உறுதிசெய்வதற்கு மீனவக் குடும்பங்களின் பெண்களை முதன்மைப்படுத்தி பெறுமதிசேர் நிகழ்ச்சித்திட்டங்கள் பல திட்டமிடப்பட்டுள்ளன.

(ஆ ) ஏற்புடையதன்று.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ඇමතිවරයාට ලොකු වෙලාවක් දුන්නා. හැබැයි, අපි අතුරු ප්‍රශ්නයක් අහන්න ගියාම ලොකු බැරියර් එකක් දාන්න එපා කියලා බොහොම කරුණාවෙන් ඔබතුමාගෙන් මම ඉල්ලනවා. ඒ මොකද දන්නවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න සඳහා විනාඩි දෙකයි වෙන්ව තිබෙන්නේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමා කියපු ඒ දේවල්වලින් අතුරු ප්‍රශ්න අහන්නත් බැහැ. මොකද, එතුමා කරකවලා අත්හැරලා වාගේ වැවේ දොරටුවක් කඩන එකක් ගැනත් කියනවා. *[බාධා කිරීමක්]* යකා ගහන එකක් ගැනත් කියනවා. ඔක්කෝම කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ මාළු අස්වැන්න ගැන කියනකොට 2015 සිට 2024 දක්වා කාලය තුළ මාළු අස්වැන්න අඩු වෙලා තිබෙනවා. මේ මාළු අස්වැන්න අඩු වීම පිළිබඳ කාරණාව ගත්තොත්, ඒ අඩුවීමේදී කරදිය සහ මිරිදිය කියන මාළු වර්ග දෙකේම අස්වැන්න අඩු වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරෙන් කියනවා, අලුත් යෝජනා පිළිබඳව. පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ ධීවර කර්මාන්තය කරන ධීවරයෝ විශාල පිරිසක් ඉන්න ප්‍රදේශයක්. අපි දැක්කා, අය වැයෙනුත් ඒ දිස්ත්‍රික්කයට ශත පහක්වත් වෙන් කරලා තිබුණේ නැති බව. ඒ වාගේම දැනුත් ඔබතුමා මාළු අස්වැන්න වැඩි කර ගැනීම වැනි දේවල් ගැන කථා කරද්දී පුත්තලම දිස්ත්‍රික්කය ගැන කථා කරන්නේම නැහැ. හැබැයි කළපුව එක්ක, ගංගා, ඇළ දොළ එක්ක, මුහුදත් එක්ක වැඩිපුර රැකියා කරන්නේ ඒ දිස්ත්‍රික්කයේ අය.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු ඇමතිතුමනි, මම තවම මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවර නැහැ. ඒ නිසා ඔබතුමා දැන්ම පිළිතුරු දෙන්න එපා. ඔබතුමා දැන්ම පිළිතුරු දෙන්න පටන් ගත්තොත්, තව සෑහෙන වෙලාවක් යයි. ඒ නිසා මට පළමුව අවස්ථාව දෙන්න.

එක පැත්තකින්, එම දිස්ත්‍රික්කයේ ධීවරයින්ට එහෙම අවස්ථාවක්වත් දීලා නැහැ. මම අනෙක් අවුරුදු ටික කියන්නේ නැතුව 2024 වර්ෂය ගැන විතරක් කියන්නම්. ඔබතුමා කියපු විධියට 2024 වර්ෂයේ විතරක් රුපියල් මිලියන 39,000ක මාළු ආනයනය කළා. අපේ රට වටේම තිබෙන්නේ මුහුද. සමහර වෙලාවට අපට ගොඩබිමට වඩා යම් ප්‍රදේශයක් මුහුදෙන් අයිතිව තිබෙනවා. ඒ නිසා අපට මේ සඳහා යම් වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. මේ සමස්ත මුහුද පාවිච්චි කරලා මාළු අස්වැන්න වැඩි කරගනිමින්, ධීවර කර්මාන්තයට අලුත් තාක්ෂණය පාවිච්චි කරමින් මාළු අස්වැන්න ලබා ගන්න අවශ්‍ය දැනුම ඒක රාශි කරගන්න ඒ අදාළ ආයතනත් එක්ක එකතුව අපට යම් වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්, ධීවර කර්මාන්තය මීට වඩා ගොඩක් දියුණු කරන්න. අපට මෙහෙම මාළු ආනයනය කරන්න ඕනෑ නැහැ. ඇයි අපි මෙහෙම මාළු ආනයනය කරන්නේ, දූපතක් විධියට තිබෙන රටක් හැටියට? ඒ නිසා කරුණාකරලා එතැනට යන්න. දැන් ලෝකය එතැනට ගිහිල්ලා තිබෙන්නේ.

කරදිය ධීවර කර්මාන්තයට අමතරව මිරිදිය ධීවර කර්මාන්තය ගත්තාමත් අපේ ප්‍රධාන ට්‍රෝලරය වෙලා තිබෙන්නේ බෝට්ටු. ඒ සම්බන්ධව විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙන්නේත්, මාළු මිල පිළිබඳව ප්‍රශ්නය එන්නේත් අපට බොහෝ තැන්වල chilled baths නැති නිසායි. අපට ඒක බරපතළ ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මටත් විනාඩියක් විතර ඉඩ දෙන්න. මොකද, අපට ප්‍රශ්නයක් අහන්න හම්බ වෙන්නේත් මාස තුන හතරකට පස්සේ.

ඇමතිතුමාට විතරක් එහෙම කියන්න පුළුවන්, මට කියන්න බැහැ. ඒක අසාධාරණයි නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එහෙම නම් අපි ඇමතිවරුන්ට කියන්නම්, තනි වාක්‍යයෙන් උත්තර දෙන්න කියලා. මෙතැනදී භාෂාමය පැත්තකුත් තිබෙනවා. මම හිතනවා, ඔබතුමන්ලා ඒක හාස්‍යයට ලක් නොකරයි කියලා. එතුමා මව් භාෂාවෙන් කථා කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ භාෂාව ඔබතුමාට නොතේරෙන්න පුළුවන්. මට හිතුණා, එහෙම hint එකකුත් තිබුණාද කියලා. *[බාධා කිරීමක්]* ඔබතුමාගෙන් නොවෙයි. දැකපු දේ මම කිව්වේ. අපි ඇමතිවරුන්ට කියන්නම්, තනි වාක්‍යයෙන් උත්තර දෙන්න කියලා. මොකද, ඇමතිවරයෙකු සවිස්තරාත්මක පිළිතුරක් ලබා දෙන්නේ සද්භාවයෙන්. තමන්ටත් විශාල කාලයක් ගන්න ඒ අවස්ථාව උපයෝගී කර ගන්නවා නම් ආණ්ඩු පක්ෂය විධියට අපට ඒකට ඉඩ දෙන්න බැහැ. ඔබතුමා ගරුත්වයෙන් වැඩ කරන මන්ත්‍රීවරයෙක්. අපි ඒකට respect කරනවා. ඔබතුමා නරක ආශ්‍රයට ලක් වෙන්න එපා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මට නරක ආශ්‍රයට යන්න එපා කියලා නරක උපදේශයක් දුන්නේ. ඒක වැරදියි නේ. නරක උපදේශයක් දෙන්න හොඳ නැහැ. මම එතුමාගේ භාෂාව නිසා තමයි ඉතාම, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න. අපට කාලය කළමනාකරණය කර ගැනීමට අවශ්‍යයි නේ. ඒ නිසා කරුණාකරලා ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

එහෙම නම් මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. මම අහන්නේ මේකයි. පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ, සම්පත් ගොඩක් තිබෙන දිස්ත්‍රික්කයක්. මේ දිස්ත්‍රික්කය තුළ කළපු සංවර්ධනය සහ මිරිදිය මත්ස්‍ය සම්පත වැඩි කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ වාගේම කරදිය මත්ස්‍ය සම්පත නෙළා ගන්න අවශ්‍ය ට්‍රෝලර් යාත්‍රාත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, අලුත් තාක්ෂණයත් පාවිච්චි කරලා, මේ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවටත් හඳන්න පුළුවන්ද, බැරිද කියන එක තමයි පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම අහන්නේ.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ உறுப்பினர் அவர்களே, எனது தாய்மொழி தமிழ்! இந்தச் சபையில் வாய்மூல வினாவொன்று கேட்கப் படும்போது, அதற்கு விளக்கமானதொரு விடையளிக்கப்பட வேண்டும் என்பது உங்களுக்குத் தெரியும்! அந்த அடிப்படையில்தான் நான் எனது தாய்மொழியான தமிழ் மொழியில் விடையளித்தேன். எனக்குக் கவலை என்னவெனில், நான் தமிழ்மொழியில் விடையளிப்பதைப் பார்த்து இன்று எதிர்க்கட்சியினர் எள்ளி நகையாடியதுதான். மேலும், அவர்கள் தமிழ் மொழியைக் கொச்சைப் படுத்துகின்றவர்களாக, இழிவுபடுத்துகின்றவர்களாக மாறியிருக்கிறார்கள் என்று சொல்லிக்கொண்டு, நீங்கள் கேட்ட மேலதிக வினாவுக்கான விடையை அளிக்கின்றேன். ஐயா, எங்கள் எல்லோருக்குமே தெரியும்! *[இடையீடு]* கொஞ்சம் இருங்கள்! கொஞ்சம் இருங்கள்! இந்த நாட்டைச் சுற்றி கடல் இருப்பது உண்மை! கடந்த 76 வருடங்களாக *[இடையீடு]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා, අදාළ අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ சபாநாயகர் அவர்களே, இன்று கடற்றொழில் அமைச்சின்கீழ் இருக்கின்ற அனைத்து நிறுவனங்களும் நாசமாக்கப்பட்டு இருக்கின்றன. எனினும், அவற்றுக்கு காப்பீடு கிடையாது. அதுமாத்திரமல்ல, இன்று எங்களுடைய CFC நிறுவனமானது 1,600 மில்லியன் ரூபாய் நட்டத்தில் இயங்கும் ஒரு நிறுவனமாக மாற்றப்பட்டு இருக்கின்றது. அதேபோல், நன்னீர் மீன்பிடித் துறையிலும் பாரிய நெருக்கடி இருக்கின்றது. நெருக்கடியில் இருந்து இவற்றை மீட்பதற்கு நாங்கள் நடவடிக்கை எடுத்து வருகின்றோம். இதன்போது புத்தளம் மாவட்டம் தொடர்பிலும் கூடுதல் கவனத்தைச் செலுத்தியுள்ளோம். கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய புத்தளம் மாவட்டத்தை நாங்கள் கைவிடவில்லை. மேலதிகமாக ஏதாவது தேவை இருந்தால், நீங்கள் அது தொடர்பில் என்னோடு தனிப்பட்ட ரீதியாகக் கதைக்கலாம். நீங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற புத்தளம் மாவட்டத்தில் எங்களுடைய கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களும் இருக்கின்றார்கள். அவர்கள் எங்களிடம் பல்வேறு கோரிக்கைகளை முன்வைத்து இருக்கின்றார்கள். நாங்கள் புத்தளம் மாவட்டத்தில் கடற்றொழிலையும் நன்னீர் மீன்பிடித்துறையையும் இறால் உற்பத்தியையும் மேம்படுத்துவதற்கு பல்வேறு நடவடிக்கைகளை எடுத்து வருகின்றோம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පෙර මම මේ කාරණය කියන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මෙතැන විශේෂ වගකීමක් තිබෙනවා. දැන් එතුමා ජාතිවාදී කථාවක් ගැන කිව්වා. ඒක මගේ වරප්‍රසාදවලට විශාල පහරක්. එහෙම දෙයක් වෙන්න ඉඩ දෙන්න බැහැ. අපි මෙතැන දෙමළ භාෂාව කථා කරන අයත් එක්ක හොඳට ඉන්නවා. දෙමළ භාෂාවෙන් කථා කළා කියලා එතුමාට කවුරුවත් යමක් කිව්වාද? එහෙම කවුරුවත් මුකුත් කිව්වේ නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා කරුණාකරලා ඒක නිවැරදි කරන්න. මොකද, එහෙම වෙන්න ඉඩ දෙන්න බැහැ. එතුමා ද්‍රවිඩ භාෂාවෙන් කථා කළා කියලා කවුරුවත් ඒ ගැන ප්‍රශ්න මතු කළේ නැහැ.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

එතුමා එහෙම කියපු එක වැරැදියි. ඒක අයින් කර ගන්න. විපක්ෂයේ කවුරුවත් එහෙම කථාවක් කිව්වේ නැහැ. මම භාෂා පරිවර්තනය අහගෙනයි ඉන්නේ. මම ඒ ගැන වචනයක්වත් කිව්වේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමේ හැසිරීමෙන් පෙන්නුම් කළේ ඒක තමයි. වෙන මුකුත් නොවෙයි. ඔබතුමන්ලාගේ ඇහැවුම තිබුණේ එතැන. පාර්ලිමේන්තුව තුළ එවැනි දේවල්වලට ඉඩ දෙන්න බැහැ. ඒකට විරුද්ධව තමයි එතුමා කථා කළේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එහෙම මත ගැන කරන ප්‍රකාශ අසාධාරණයි. කරුණාකරලා ඒක නිවැරැදි කරලා දෙන්න. ඒකෙන් එතුමාට අසාධාරණයක් වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඒක තමයි අපට දැනුණු සහ පෙනුණු දේ. ඒක ගරු ඇමතිතුමා නොවෙයි, මමයි ඉස්සෙල්ලාම කිව්වේ. අපි ඒක දැක්කා. ඒක ඔබතුමාගේ කටහඬින් දැනුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. නමුත් ඒ හැසිරීමෙන් අපට ඒ බව දැනුණා. අපි ඒක පැහැදිලිව කියනවා. අපට දැනිච්ච දේ අපි කියනවා. ඔබතුමන්ලා එහෙම තමයි හැසිරුණේ. එහෙම තමයි mock කළේ. They were mocking.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, ඔබතුමා මෙතැන ස්වාධීන කථානායකතුමා. මමයි ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නය ඇහුවේ. එතුමා ගොඩාක් විස්තර කරපු නිසායි මම ඒ කථාව කිව්වේ. මොකද, ඔබතුමාට කාලය ඉතුරු කරලා දෙන්න ඕනෑ නිසායි මම එහෙම කිව්වේ. ඔබතුමා හැම තිස්සේම කියනවා, කාලය ඉතුරු කරන්න කියලා. ඒක නිසා මම එතුමාට කිව්වා, "ඒක සභාගත කරන්න, මම ඒක බලාගන්නම්" කියලා. හැබැයි, මම ඒක එතුමාට ගෞරවයෙන් කිව්වේ. ද්‍රවිඩ භාෂාවට අපි තුළ විශාල ගෞරවයක් තිබෙනවා. ද්‍රවිඩ භාෂාව කථා කරන අය තමයි අපි වැඩිපුර ආශ්‍රය කරන්නේ. අපි හැම දාම කටයුතු කළේ එහෙමයි. කවදාවත් අපි ඒ අයට අපහාස වන විධියේ වැඩ කරලා නැහැ. ඒ නිසා ඒක නිවැරැදි කරන්න කියලා ඉතාම කාරුණිකව මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் இவ்விடயம் சம்பந்தமாக கூடுதலாகப் பேச விரும்பவில்லை. நானும் இந்தப் பாராளுமன்றத்தில் பல வருடங்கள் உறுப்பினராக இருந்திருக்கின்றேன். சிலருடைய நடவடிக்கைகளைப் பார்க்கும்போது, குறிப்பாக சிரிப்பைப் பார்க்கும்போது, ஏன் சிரிக்கின்றார்கள்? நக்கலைப் பார்க்கும்போது, எதற்காக நக்கல் செய்கிறார்கள்? என்பது எனக்கு விளங்கும். அதுகூட புரியாத பாப்பாக்கள் அல்ல நாங்கள்! அதனால் நான் தனிப்பட்ட ஒரு நபருக்குச் சொல்லாமல், பொதுவாக எதிர்க்கட்சியினரிடம் ஒரு விடயத்தைச் சொல்கின்றேன். அதாவது, கௌரவ உறுப்பினர் கேட்ட வினாவுக்கான விடையைச் சிங்கள மொழியில் அளித்திருந்தாலும் இதேயளவு நேரம் எடுத்திருக்கும்; இதே வகையில்தான் சொல்லியிருக்க வேண்டும். அதனால்தான் நான் தமிழில் விடையளித்தேன். நான் தமிழில் விடையளிப்பதைக் கொச்சைப் படுத்துபவர்களாக எதிர்க்கட்சியினர் இருப்பதையிட்டு வெட்கப்படுகின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, ඔබතුමා ආණ්ඩු පක්ෂය පැත්තට විතරක් ඇහුම්කන් දුන් එක ගැන මම කනගාටු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, මම දෙපැත්තටම ඇහුම්කන් දුන්නා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මම කියන්නේ, ද්‍රවිඩ භාෂාවට අපහාසයක් කළා කියලා එතුමා කියපු එක අයින් කර ගන්න කියායි. එහෙම දෙයක් සිදු වුණේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක විවාදයක් කරගෙන අනවශ්‍ය ප්‍රශ්නයක් නිර්මාණය නොකර ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මම ඔබතුමාගෙන් නැවතත් ඒ කාරණය ඉල්ලුවා. ඔබතුමා කැමති දෙයක් කරන්න. හැබැයි, විපක්ෂයේ කවුරුවත් එතුමාට අපහාසයක් කළේ නැහැ. ද්‍රවිඩ භාෂාවෙන් කථා කළා කියලා ඇහෙන්වත්, ඉඟියෙන්වත්, අතින්වත්, පයින්වත්, මුහුණෙන්වත්, ඇස්වලින්වත් එතුමාට අපහාසයක් කළේ නැහැ. අනෙක් කාරණය මේකයි. කවුරු හෝ හිනා වෙනවා දැකලා කාටවත් තීන්දු කරන්න බැහැ, මේ කාරණය නිසායි හිනා වෙන්නේ කියලා. මම කිව්වේ, එහෙම කථාවක් නොවෙයි. එක දිගට එතුමා කථා කළ නිසා ඒ ගැන මම කිව්වා විතරයි. ඒ නිසා කරුණාකරලා ඒ වාගේ වැඩ කරන්න එපා. ඒවා ජාතිවාදී වැඩ. ඒ වාගේ දේවල් කරන්න එපා. ඒවා හොඳ නැහැ.

මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න අපේ ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු කථානායකතුමනි, අපේ ගරු ධීවර ඇමතිතුමාට යොමු කරන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය දින කිහිපය තුළ දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ලේත්, දෙවුන්දරත්, කළුතරත්, බේරුවලත් බහුදින යාත්‍රා 4ක් විනාශයට පත් වුණා. ඒ වාගේම කුඩා බෝට්ටු 2ක් විනාශයට පත් වුණා. එහිදී ජීවිත කිහිපයක් අතුරුදන් වුණා. ඒ බෝට්ටු සොයා ගැනීමට ධීවර අමාත්‍යාංශයෙන් විශාල සේවාවක් ඉෂ්ට කළා. මේ අතුරුදන් වුණු ජීවිත වෙනුවෙන් ධීවර අමාත්‍යාංශය හරහා රක්ෂණ සමාගමෙන් වන්දි මුදල් ලැබෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිවරයා විධියට හිටපු අවස්ථාවේදී බහුදින ධීවර යාත්‍රාවක් විනාශයට පත් වෙලා, එහි ගමන් ගත් ධීවරයන් 6දෙනාගෙන්, 5දෙනෙකු ජීවිතක්ෂයට පත් වුණා. ඒ මොහොතේ අපි එතුමාට කථා කරලා ජීවිතක්ෂයට පත් වුණු එම ධීවර ජනතාවගේ දරු පවුල්වල නඩත්තුව සඳහා ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 5 බැගින් වන්දියක් ලබා දුන්නා. මමත් මේ අවස්ථාවේදී යෝජනා කරන්නේ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ඒ මුහුදු ගිහිල්ලා ජීවිතක්ෂයට පත් වුණු ධීවරයන්ට ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 5ක මුදලක් ලබා දුන්නා වාගේ ඔබතුමන්ලාගේ රජයෙනුත් ඒ ආකාරයට ජීවිතක්ෂයට පත් වෙන ධීවර ජනතාවට ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 5ක වන්දි මුදලක් ලබා දෙන්න කියලායි. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. கொஞ்சம் இருங்க!

ඒ වාගේම තව කාරණයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න අවශ්‍යයි. බහුදින ධීවර යාත්‍රා විනාශයට පත් වුණාම රක්ෂණ සමාගමෙන් වන්දි මුදල් ගෙවන්නේ ඒ බෝට්ටුව සහමුලින්ම විනාශ වුණොත් විතරයි. දැන් බෝට්ටු දෙකක් පෙරළිලා ගොඩට ගෙනාවා. ඒ ගොඩට ගෙනාපු බෝට්ටු දෙක භාගෙට විනාශ වෙලා. නමුත්, දැන් රක්ෂණ සමාගමෙන් ඒ වන්දි මුදල් ගෙවන්නේ නැහැ. එදා ඉඳලා මේ ප්‍රශ්නය තිබෙනවා. දැන්වත් ඒ ගැන අවබෝධ කරගන්නයි මම මේක කියන්නේ. ධීවර ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, ධීවර අමාත්‍යාංශයෙන් රක්ෂණ සමාගම් දැනුවත් කරලා මේ යාත්‍රා රක්ෂණය කරනකොට අර්ධ හානියට පත් වන බෝට්ටුවලටත් ඒ වන්දි මුදල් ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඒ වාගේම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. දැන් තෙල් සහනාධාරය ලැබෙනවාද?

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
එහෙම ඕනෑ ඕනෑ විධියට ඔබතුමාට ප්‍රශ්න අහන්න පුළුවන්ද? ඔබතුමා එළියට එන්න මම උත්තර දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ திலிப் வெதஆரச்சி அவர்கள் கேட்ட வினாவில் ஒருசில விடயங்கள் இருக்கின்றன. அண்மையில் தென்பகுதியிலுள்ள மீனவர்கள் கடலில் விபத்து உள்ளிட்ட பல்வேறு நெருக்கடியான நிலைமைகளைச் சந்தித்தார்கள். இன்று மீனவர்களுக்கென இருக்கின்ற காப்புறுதித் திட்டத்தை எடுத்துக்கொண்டாலும் சரி, அவர்களுக்கென இருக்கின்ற பாதுகாப்பு முறைமையை எடுத்துக்கொண்டாலும் சரி, அவற்றில் பல்வேறு பிரச்சினைகள் இருக்கின்றன. நீங்கள் ஆட்சியில் இருந்த காலத்திலும் இவ்வாறான பிரச்சினைகள் ஏற்பட்டன. ஆனாலும், அவற்றைத் தீர்ப்பதற்கான உருப்படியான வேலைத்திட்டம் ஒன்றை உருவாக்கவில்லை என்பது உங்களுக்கும் நன்றாகத் தெரியும்! இப்பொழுது நாங்கள், மீனவர்களுக்கான காப்புறுதித் திட்டம், ஓய்வூதியத் திட்டம், விபத்துகளில் சிக்கும் மீனவர்களைப் பாதுகாக்கும் முறை சம்பந்தமாக நல்ல முறையில் ஆய்வொன்றைச் செய்து, அதன் அடிப்படையில் விஞ்ஞான ரீதியான வேலைத்திட்டம் ஒன்றை முன்னெடுத்து வருகின்றோம். அதுமாத்திரமன்றி, இது சம்பந்தமாக நாங்கள் தனியான committee ஒன்றைக்கூட அமைத்திருக்கின்றோம். அந்தக் committeeஇன் கருத்துகளையும் ஆலோசனைகளையும் பெற்று, பாதிக்கப்பட்டுள்ள மீனவர்கள் தொடர்பில் நாங்கள் உரிய நடவடிக்கைகளை எடுப்போமென இந்தச் சபைக்கு உறுதியளிக்கின்றோம்.

## රාගම-පේරලන්ද වැව සංවර්ධනය කිරීම: විස්තර
ராகம - பேரலந்த வாவி அபிவிருத்தி: விபரம்
DEVELOPMENT OF RAGAMA-PERALANDA TANK: DETAILS

651/2025

**3. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාඇල ප්‍රාදේශීය සහා බලප්‍රදේශයේ රාගම-පේරලන්ද වැව තිබෙන බව දන්නේද;

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

(ii) එම වැව `භූ දර්ශන ව්‍යාපෘතිය' ලෙස සංවර්ධනය කිරීම සඳහා තෝරා ගන්නා ලද දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිය මේ වන විට නවතා ඇති බව දන්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஜா-எல பிரதேச சபை ஆளுகைப் பிரதேசத்தில் ராகம - பேரலந்த வாவி உள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி வாவி ஒரு 'நிலத்தோற்றக் கருத்திட்டமாக' அபிவிருத்தி செய்யப்படுவதற்குத் தேர்ந்தெடுக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்தின் உத்தேச நோக்கங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்துக்கு இதுவரை செலவு செய்யப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(v) மேற்படி கருத்திட்டம் தற்போது நிறுத்தப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(vi) அவ்வாறாயின், அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether he is aware that the Ragama-Peralanda Tank is situated in the Ja-Ela Pradeshiya Sabha area;

(ii) the date on which the tank concerned was chosen to develop as the 'Landscape Project';

(iii) the expected objectives of the project mentioned above;

(iv) the amount of money spent on the said project, as at present;

(v) whether he is aware that the above-mentioned project has been halted by now; and

(vi) if so, the action that will be taken in that regard?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**

(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)

(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 2020.10.12 දින.

(iii)
- රාගම-පේරලන්ද ආශ්‍රිත ප්‍රදේශයේ ඇති වන ක්ෂණික ගංවතුර පාලනය හා කළමනාකරණය.
- තෙත් බිම් පද්ධතිය හා විවෘත අවකාශයක් වශයෙන් පාරිසරිකව ඇති වැදගත්කම ආරක්ෂා කිරීම.
- ජෛව විවිධත්වය වැඩිදියුණු කිරීම.
- අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් පාලනය.
- කැළි කසළ හා ඉවත් කරන ගොඩනැඟිලි අබලි ද්‍රව්‍ය වැව හා ආශ්‍රිත තෙත් බිම් ප්‍රදේශයට දැමීම පාලනය කිරීම.
- අධික ජන ඝනත්වයක් සහිත රාගම ප්‍රදේශයේ ජනතාවගේ මානසික හා ශාරීරික සෞඛ්‍ය වැඩි වන සේ ශරීර සුවතා මංතීරු ඉදිකිරීම.
- විවෘත ආසන, ළමා උද්‍යාන, රුක් රෝපණ ආදිය මඟින් ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරීම සහ විනෝදාස්වාදය ලබා ගත හැකි පරිසරයක් නිර්මාණය කිරීම.
- ආපන ශාලා, කුඩා වෙළෙඳ සැල් ආදිය මඟින් ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම තුළින් ආර්ථික සංවර්ධනය ඇති කිරීම.

(iv) රුපියල් මිලියන 233ක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ වාගේම, නාගරික සංවර්ධන අධිකාරිය ඉදිකිරීම් සඳහා මේ වන විට රුපියල් 199,863,870.31ක් වියදම් කර තිබෙනවා. (අදියර I සහ II)

(v) මේ ව්‍යාපෘතිය අදියර IIIකින් නිම වෙන්න නියමිතව තිබුණා. ව්‍යාපෘතියේ අදියර I සහ II ට අදාළ වැඩ අවසන් කර ඇත. ඒ අදියර I සහ II යටතේ පැවති වැවෙහි රොන් මඩ ඉවත් කිරීම, වැව වටා ඇවිදින මංතීරුවක් සකස් කිරීම, අවශ්‍ය තැන්හි ගේබියන් පැති බැම් මඟින් ශක්තිමත් කිරීම, අත් වැටවල් - handrails - සවි කිරීම, වැවෙහි පිටවාන හා පාලම් 2ක් ඉදිකිරීම, කාණු පද්ධතිය ඉදිකිරීම් හා විදුලි ආලෝකකරණ පද්ධතිය සවි කර මහ ජනතාවට භාවිත කළ හැකි පරිදි වැඩ අවසන් කර ඇත.

අදියර III සඳහා විශේෂයෙන්ම වැව වටා ආරක්ෂිත බැම්මක් ඉදිකරන්නත්, ඒ වාගේම පාලමේ බැම්මක් ඉදිකරලා ඒ අවශ්‍ය කටයුතු කිරීම සඳහා මේ වසරේදී අය වැයෙන් රුපියල් මිලියන 5ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම මට දැනගන්න ලැබිලා තිබෙනවා, පළාත් සභා අරමුදලෙන් තවත් රුපියල් මිලියන 2ක් මේ සඳහා වෙන් කර තිබෙන බව. එතකොට මේ වසරේ III වන අදියරේ වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 7ක් වෙන් කර තිබෙනවා.

(vi) ව්‍යාපෘතියේ III වන අදියර සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අරමුදල් වෙන් කර තිබෙනවා. මේ III වන අදියර සම්පූර්ණ කළාට පස්සේ මේක පවත්වාගෙන යෑම සහ කළමනාකරණ කටයුතු කිරීම සඳහා ජාඇල ප්‍රාදේශීය සභාව වෙත ලබා දෙන්න කටයුතු කරනවා. ඒ සඳහා දැනටමත් අපි ජාඇල ප්‍රාදේශීය සභාවට දන්වා තිබෙනවා, ව්‍යාපෘතිය බාර ගන්න කියලා.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

රුපියල් මිලියන 230ක් කියන්නේ රටේ බදු ගෙවන අහිංසක ජනතාවගේ බදු මුදල්. විශේෂයෙන් රාගම කියන තදාසන්න ප්‍රදේශයේ රාගම රෝහල පවතිනවා, රාගම දුම්රිය පොළ - Ragama Railway Station - තිබෙනවා. ඒ වාගේම, බස් නැවතුම් පොළ තිබෙනවා. එවැනි තදාසන්න ප්‍රදේශයක තමයි මේ වැව පිහිටලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මේ වැව සංවර්ධනය කරන්න, ප්‍රතිසංස්කරණය කරන්න තමයි මේ ව්‍යාපෘතිය ආරම්භ කළේ. ගරු ඇමතිතුමනි, මම දන්නේ නැහැ ඔබතුමා මේ ස්ථානයට ගිහිල්ලා තිබෙනවා ද කියලා. ඔබතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ පළමු අරමුණ වෙන්නේ මේ ප්‍රදේශය ගංවතුරින් ආරක්ෂා කර ගැනීමයි. හැබැයි, දැනටත් වැස්සොත් රාගම ප්‍රදේශය, විශේෂයෙන්ම වැව ආශ්‍රිත ප්‍රදේශය යට වෙනවා.

මුලින්ම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද? මොකද, රොන් මඩ ඉවත් කළා කිව්වාට දැන් ඒකේ රොන් මඩ පිරිලා. වැවේ නඩත්තු කටයුතු - maintenance - සිදු වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ වැවෙන් කොටසක් ගොඩ කරලා තමයි වැව ප්‍රතිසංස්කරණය කළේ. ඒකෙදි වුණේ වැව කුඩා වීම. අනෙක් කාරණය තමයි, ඇවිදින මංතීරුවක් වැව වටේ නැහැ. කවුරුත් වැව වටේ ඇවිදින්නේ නැහැ. ඒ ව්‍යාපෘතිය ආරම්භ කරපු ක්‍රමවේදය සහ ක්‍රියාත්මක කරපු ක්‍රමවේදයම මම හිතන විධියට අසාර්ථක වෙලා තිබෙනවා. එහෙම තියෙද්දී එම ව්‍යාපෘතියටම තවදුරටත් මුදල් යොදවන එකේ ප්‍රයෝජනයක් තිබෙනවාද, එම ව්‍යාපෘතිය ජනතාවට ප්‍රයෝජනයක් වන විධියට ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියන කාරණා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේම එවැනි ව්‍යාපෘතියකට මිලියන 233ක් වාගේ මුදලක් ඇස්තමේන්තු කිරීම සහ ඒ සඳහා මිලියන 199.8ක් වාගේ මුදල් ප්‍රමාණයක් වියදම් කරලා කරන ලද කාර්යය සම්බන්ධයෙන් අපටත් ගැටලුවක් තිබෙනවා. එම ව්‍යාපෘතිය සඳහා මහජන මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. ව්‍යාපෘතිය සාර්ථක නොවුණත් ඉතිරි ප්‍රමාණය සම්පූර්ණ කිරීම සඳහා තමයි අපි මේ මුදල වෙන් කළේ. විශේෂයෙන් ඒ වැව වටා තිබෙන ආරක්ෂිත වැට සහ අබලන් වෙලා තිබෙන පාලමේ ඉදිරි කටයුතු සම්පූර්ණ කරන්න තමයි මේ මුදල වැය කරන්න සිද්ධ වුණේ. බොහෝ ව්‍යාපෘතිවල අපට තිබෙන ගැටලුව තමයි, මූලික සැලැස්මේ ඉඳලා ව්‍යාපෘති අසාර්ථකයි. නමුත් ප්‍රශ්නය තමයි, ඒ සඳහා විශාල මහජන මුදලක් වෙන් වෙලා තිබීම. දැන් අපට තිබෙන ප්‍රශ්නය තමයි, ඒ වෙන් වෙලා තිබෙන සහ වැය කරලා තිබෙන මුදල නිසා ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අතහැර දමනවාද, නැත්නම් අසාර්ථකත්වය මධ්‍යයේ වුවත් යම් සාර්ථකත්වයක් අත්පත් කර ගන්න කටයුතු කරනවාද කියන එක. ඒ සඳහා අපි දෙවන option එක තෝරගෙන කටයුතු කරනවා, මේ ව්‍යාපෘතියට වාගේම බොහෝ ව්‍යාපෘතිවලට.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන් රාගම-පේරලන්ද වැවට ඒ කලාපයේ ප්‍රධාන භූමිකාවක් තිබෙනවා. ජලය බැසීම වාගේම ඔබතුමා කිව්වා වාගේ විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට බලපානවා ඇවිදින මංතීරුවක් හැදීම කියන කාරණා. එහිදී වැදගත්ම කාරණයක් බවට පත් වෙන්නේ ගරු ඇමතිතුමනි, ආර්ථිකය. මොකද, ඒ වැවත් එක්ක බැඳුණු ආර්ථිකයක් තිබුණා. ගරු ඇමතිතුමනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ඇමතිවරයා හැටියට ඔබතුමාගේ අවධානය යොමු කරලා, එම ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය කරන කඩ සාප්පු දමා ගන්න හෝ parking area ඇති කරන්න හෝ එම වැව ආශ්‍රිතව ආර්ථිකය දියුණු කරගන්න මොකක් හෝ වැඩ පිළිවෙළක් හදන්න ඒ ජනතාවට සහයෝගය ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාවට ස්තුතියි.

ඇත්තටම අපේ බලාපොරොත්තුව තමයි එම කටයුතු සම්පූර්ණ කරලා ජාඇල ප්‍රාදේශීය සභාවට භාර දෙන එක. ඔබතුමා ඉදිරිපත් කරපු යෝජනා ගැන අපි ජාඇල ප්‍රාදේශීය සභාවත් එක්ක සාකච්ඡා කරලා ඔවුන්ගේ කළමනාකාරිත්වය යටතේ ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන්න පියවර ගන්නම්.

## 2020-2024 කාලය තුළ දේශපාලනඥයින්ට සහ රාජ්‍ය නිලධාරින්ට එරෙහිව CIABOC විසින් ගොනු කරන ලද නඩු: විස්තර

### அரசியல்வாதிகள் மற்றும் அரச அலுவலர்களுக்கு எதிராக 2020-2024 வரை CIABOCஇனால் தாக்கல் செய்யப்பட்ட வழக்குகள்: விபரம்

### CASES FILED AGAINST POLITICIANS AND PUBLIC OFFICIALS DURING 2020-2024 BY CIABOC: DETAILS

712/2025

**4. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2015 වර්ෂයේ සිට 2019 දක්වා කාල පරිච්ඡේදයේදී සිදු වී ඇති වංචා, දූෂණ සහ සාතන සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දේශපාලකයන්ට සහ රාජ්‍ය නිලධාරින්ට එරෙහිව 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වන විට නඩු කටයුතු අවසන් වී ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු කවරේද;

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

(iv) ඉහත (i)හි සඳහන් නඩු අතරින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම නඩු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் இடம்பெற்ற மோசடிகள், ஊழல்கள் மற்றும் கொலைகள் தொடர்பாக இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவால் அரசியல்வாதிகள் மற்றும் அரச அலுவலர்களுக்கு எதிராக 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் தாக்கல் செய்யப்பட்ட வழக்குகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இன்றளவில் அவற்றுள் எத்தனை வழக்குகள் நிறைவடைந்துள்ளன என்பதையும்;

(iii) அவ்வழக்குகள் யாவை என்பதையும்;

(iv) மேற்படி (i)இல் குறிப்பிடப்பட்டுள்ள வழக்குகளில் மீளப் பெறப்பட்டுள்ள வழக்குகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(v) அவ்வழக்குகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of cases that have been filed by the Commission to Investigate Allegations of Bribery or Corruption against politicians and public officials during the period from 2020 to 2024 in relation to fraud, corruption and murder incidents which occurred during the period from 2015 to 2019;

(ii) the number of cases, of which prosecutions have been concluded by now, out of the aforesaid cases;

(iii) those cases;

(iv) the number of cases that have been withdrawn, out of the cases mentioned in (i) above; and

(v) those cases?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත 2015-2019 කාල පරිච්ඡේදයේදී දේශපාලනඥයන්ට හා රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව වාර්තා වූ පැමිණිලි අතරින් 2020-2024 කාලය තුළ පවරා ඇති නඩු සංඛ්‍යාව - 157කි.

(ii) මේ වන විට නඩු කටයුතු අවසන් වී ඇති නඩු සංඛ්‍යාව 65කි. එක් එක් වර්ෂය අනුව ඒවා පහත පරිදි වේ.

| අ/අ | නඩු පවරන ලද වර්ෂය | වර්ෂයට අදාළ නඩු ප්‍රමාණය |
|---|---|---|
| 01. | 2020 වර්ෂය | 20 |
| 02. | 2021 වර්ෂය | 20 |
| 03. | 2022 වර්ෂය | 15 |
| 04. | 2023 වර්ෂය | 07 |
| 05 | 2024 වර්ෂය | 03 |

(iii)

| අනු අංකය | නඩු අංකය | නඩු පවරණ ලද වර්ෂය | චූදිතයාගේ නම/තනතුර | නඩුවේ තීරණය |
|---|---|---|---|---|
| 1 | B/35/2020 | 2020 | පොලිස් පරීක්ෂක, ස්ථානාධිපති | නිදොස් කොට නිදහස් |
| 2 | B/37/2020 | 2020 | ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | චූදිතයා මියගොස් ඇති බැවින් නඩුව අවසන් කර ඇත |
| 3 | B/38/2020 | 2020 | පොලිස් කොස්තාපල් | වරදකරු |
| 4 | B/39/2020 | 2020 | පොලිස් සැරයන් | නිදොස් කොට නිදහස් |
| 5 | B/41/2020 | 2020 | විදුහල්පති | නිදොස් කොට නිදහස් |
| 6 | B/42/2020 | 2020 | කෘෂිකර්ම උපදේශක | නිදහස් |
| 7 | B/43/2020 | 2020 | කාර්මික නිළධාරී | වරදකරු |
| 8 | B/45/2020 | 2020 | උප පොලිස් පරීක්ෂක | වරදකරු |
| 9 | HCB 48/20 | 2020 | සැලසුම් නිළධාරී | නිදොස් කොට නිදහස් |
| 10 | HCB 49/2020 | 2020 | ග්‍රාම නිළධාරී | වරදකරු |
| 11 | HCB 50/2020 | 2020 | කා.කා.ස. | චූදිතයා මියගොස් ඇති බැවින් නඩුව අවසන් කර ඇත |
| 12 | HCB 53/2020 | 2020 | ප්‍රාදේශීය සභා ලේකම් - ලග්ගල | නිදොස් කොට නිදහස් |
| 13 | HCB 55/1620 | 2020 | සහකාර විදුහල්පති | චූදිතයා මියගොස් ඇති බැවින් නඩුව අවසන් කර ඇත |
| 14 | B0057/2020 | 2020 | පොලිස් කොස්තාපල් | වරදකරු |
| 15 | B61/2020 | 2020 | එම්.එම්. දිනේෂ්- අඹගමුව ප්‍රාදේශීය සභාව, හිටපු සභාපති | නිදොස් කොට නිදහස් |
| 16 | B62/2020 | 2020 | ඒකක කළමණාකරු - මහවැලි අධිකාරිය | නිදහස් |
| 17 | HCB 66/2020 | 2020 | කා.කා.ස. - ලංචිම | වරදකරු |
| 18 | B 72/2020 | 2020 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-අම්පාර ජනපද නිළධාරී | වරදකරු |
| 19 | HCB 73/2020 | 2020 | පරිපාලන ග්‍රාම නිළධාරී | නිදොස් කොට නිදහස් |
| 20 | 36882/01 | 2020 | පොලිස් සැරයන් | වරදකරු |
| 21 | HCB/79 | 2021 | ජ්‍යෙෂ්ඨ නියාමක | වරදකරු |
| 22 | HCB/80 | 2021 | පොලිස් සැරයන් | චූදිතයා මියගොස් ඇති බැවින් නඩුව අවසන් කර ඇත |
| 23 | HCB/82 | 2021 | විදුහල්පති | නිදොස් කොට නිදහස් |
| 24 | HCB/84 | 2021 | පොලිස් කොස්තාපල් | නිදොස් කොට නිදහස් |
| 25 | HCB/87 | 2021 | සංවර්ධන නිලධාරී | වරදකරු |
| 26 | HCB/88 | 2021 | පොලිස් සැරයන් | චූදිතයා මියගොස් ඇති බැවින් නඩුව අවසන් කර ඇත |
| 27 | HCB/89 | 2021 | වනරක්ෂන සහකාර | නිදොස් කොට නිදහස් |
| 28 | HCB/94 | 2021 | විමර්ශන නිලධාරී | නිදහස් |
| 29 | HCB/95 | 2021 | ග්‍රම නිලධාරී | නිදහස් |
| 30 | HCB/103 | 2021 | ඒකක කළමණාකරු-මහවැලි අධිකාරිය | වරදකරු |
| 31 | HCB/104 | 2021 | ස්ථානාධිපති - පොලිස් | නිදහස් |
| 32 | HCB/105 | 2021 | සංවර්ධන නිලධාරී | පැමිණිල්ල ඉල්ලා අස්කරගන්නා ලදි |
| 33 | HCB/108 | 2021 | කාර්යාල කාර්ය සහයක | වරදකරු |
| 34 | HCB/109 | 2021 | පාසල් මුරකරු | වරදකරු |
| 35 | HCB/111 | 2021 | ග්‍රම නිලධාරී | නිදොස් කොට නිදහස් |
| 36 | HCB/115 | 2021 | සහකාර රේගු අධිකාරී/රේගු අධිකාරී | වරදකරු |
| 37 | HCB/117 | 2021 | එස්.එම්. රංජිත් සමරකෝන්-ප්‍රධාන අමාත්‍ය උතුරු මැද පළාත් සභාව, ශාන්ති චන්ද්‍රසේන-පුද්ගලික ලේකම් උතුරු මැද පළාත් සභාව | වරදකරු |
| 38 | HCB/127 | 2021 | ජනපද නිලධාරීන් | පැමිණිල්ල ඉල්ලා අස්කරගන්නා ලදි |
| 39 | MC 48332/01/2 | 2021 | පොලිස් කොස්තාපල් | නිදොස් කොට නිදහස් |
| 40 | 14891/01/2021 | 2021 | පොලිස් කොස්තාපල් | නිදොස් කොට නිදහස් |
| 41 | HCB/141 | 2022 | පොලිස් සැරයන් | නිදහස් |
| 42 | HCB/156 | 2022 | සජින් ද වාස් ගුණවර්ධන, මිහින් ලංකා සභාපති/ අධීක්ෂණ මන්ත්‍රී | නිදහස් |
| 43 | HCB/163 | 2022 | සහකාර හිමිකම් නිලධාරී | වරදකරු |

| අනු අංකය | නඩු අංකය | නඩු පවරණ ලද වර්ෂය | චූදිතයාගේ නම/තනතුර | නඩුවේ තීරණය |
|---|---|---|---|---|
| 44 | HCB/165 | 2022 | හිටපු අමාත්‍ය - ජොන්ස්ටන් ප්‍රනාන්දු , එරාජ් ප්‍රනාන්දු, මොහිදීන් මොහොමඩ් හාතීර් | නිදහස් |
| 45 | HCB/176 | 2022 | කාර්යාල කාර්ය සහයක | වරදකරු |
| 46 | HCB/178 | 2022 | ධාවන කළමනාකරු | වරදකරු |
| 47 | HCB/179 | 2022 | දෙල්වත්තකඩ ලියනගේ චන්ද්‍රපාල - අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රීලංකා රූපවාහිනී සංස්ථාව, විමලසේන රූබසිංහ - සභාපති ශ්‍රීලංකා රූපවාහිනී සංස්ථාව | නිදහස් |
| 48 | HCB/186 | 2022 | පතිරාජ මුදියංසේලාගේ ජයසුමන චන්ද්‍රවංස පතිරාජ-සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති | නිදහස් |
| 49 | HCB/187 | 2022 | පතිරාජ මුදියංසේලාගේ ජයසුමන චන්ද්‍රවංස පතිරාජ-සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති | නිදහස් |
| 50 | HCB/194 | 2022 | කාර්යාල කම්කරු | වරදකරු |
| 51 | HCB/196 | 2022 | තාක්ෂණ නිළධාරී | නිදොස් කොට නිදහස් |
| 52 | HCB/198 | 2022 | ජ්‍යොෂ්ඨ තක්සේරුකරු | චූදිතයා මියගොස් ඇති බැවින් නඩුව අවසන් කර ඇත |
| 53 | MC 62833/01/2 | 2022 | පාදුක්ක විදානෙලාගේ ප්‍රියන්ත උදය කුමාර - ප්‍රාදේශීය සභා හිටපු සභාපති - දෙහිඹටවිට ප්‍රාදේශීය සභාව | වරදකරු |
| 54 | 70764/01/2022 | 2022 | පොලිස් කොස්තාපල් | වරදකරු |
| 55 | 71310/01/2022 | 2022 | පොලිස් ආධුනික සහයක, පොලිස් සැරයන් | නිදොස් කොට නිදහස් |
| 56 | HCB/218 | 2023 | හිටපු ලේඛන සහකාර | පැමිණිල්ල හා නඩුව ඉල්ලා අස්කරගන්නා ලදී |
| 57 | HCB/226 | 2023 | පොලිස් කොස්තාපල් | වරදකරු |
| 58 | HCB/228 | 2023 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | නිදහස් |
| 59 | HCB/243 | 2023 | සිවිල් ආරක්ෂක | නිදොස් කොට නිදහස් |
| 60 | HCB/255 | 2023 | උප පොලිස් පරීක්ෂක | නිදහස් |
| 61 | HCB/263 | 2023 | උප පොලිස් පරීක්ෂක | නිදහස් |
| 62 | 22429/01/23 | 2023 | පොලිස් කොස්තාපල් | වරදකරු |
| 63 | HCB/271 | 2024 | අජිත් නිවාඩ් ලෙස්ලි කබ්රාල් - මහබැංකු අධිපති, ධර්මසේන වීරසිංහ - නියෝජ්‍ය මහබැංකු අධිපති, වසන්ත ආනන්ද සිල්වා, චන්ද්‍රසිරි ජයසිංහ - නියෝජ්‍ය මහබැංකු අධිපති, අරංකහ ආරච්චිලාගේ කරුණාරත්න - නියෝජ්‍ය මහබැංකු අධිපති | නිදහස් |
| 64 | HCB/275 | 2024 | විදුහල්පති | වරදකරු |
| 65 | HCB/305 | 2024 | ආර්ථික සංවර්ධන නිළධාරී | වරදකරු |

(iv) 03කි.

(v)

| අනු අංකය | නඩු අංකය | නඩුව පවරණ ලද වර්ෂය | චූදිතයාගේ නම/ තනතුර | නඩුවේ තීරණය |
|---|---|---|---|---|
| 1 | HCB/ 105 | 2021 | සංවර්ධන නිලධාරි | ඉල්ලා අස්කර ගන්නා ලදී. (පළමුවන සාක්ෂිකරු විදේශගතව සිටීම මත.) |
| 2 | HCB/ 127 | 2021 | හිටපු ජනපද නිලධාරි | ඉල්ලා අස්කර ගන්නා ලදී. (පළමුවන සාක්ෂිකරු අසනීප වීම හේතුවෙන් අධිකරණයට කැඳවීමට නොහැකි වීම මත.) |
| 3 | HCB/ 218 | 2023 | හිටපු ලේඛන සහකාර | ඉල්ලා අස්කර ගන්නා ලදී. (පළමුවන හා දෙවන සාක්ෂිකරු විදේශගතව සිටීම මත.) |

(ආ) අදාළ නොවේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2020 සිට 2024 දක්වා පවරා ඇති නඩු අතරින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද, ගරු අගමැතිතුමියනි?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ඉල්ලා අස්කර ගත් නඩු සංඛ්‍යාව 03යි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

2015-2019 කාලයේදී දමපු නඩු ප්‍රමාණයෙන් 159ක් සඳහා තීන්දු ලබා දීලා තිබෙනවා කියලා ඔබතුමිය කිව්වා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

පවරා ඇති නඩු සංඛ්‍යාව 157යි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

තීන්දු ලබා දීලා තිබෙන ප්‍රමාණය කීයක්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

65යි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ඒ තීන්දු ලබා දීලා තිබෙන 65න් කීයක විත්තිකරුවන් වරදකරුවන් හැටියට නම් කරලා තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ඒ තොරතුරු මා ඉහතින් සභාගත කළ ඇමුණුමෙහි සඳහන්ව තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

## වේලනෙයි ප්‍රා.ලේ. කොට්ඨාසය: තැපැල් කාර්යාලය
## வேலணை பிரதேச செயலாளர் பிரிவு: தபால் அலுவலகம்
VELANAI DS DIVISION: POST OFFICE

950/2025

5. **ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටුවා ඇති තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති බැවින් එම තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බව දන්නේද;

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

(ii) එසේ නම්, ඉහත තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(iii) එම ගොඩනැඟිල්ල ඉදිකරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாண மாவட்டத்தின் வேலணை பிரதேச செயலாளர் பிரிவில் நிறுவப்பட்டுள்ள தபால் அலுவலகத்துக்கு நிரந்தரக் கட்டடமொன்று இல்லாத காரணத்தால், மேற்படி தபால் அலுவலகம் தற்காலிக கட்டடமொன்றில் இயங்குகின்றதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி தபால் அலுவலகத்துக்கு நிரந்தரக் கட்டடமொன்றை நிர்மாணிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) அக்கட்டடம் எக்காலகட்டத்தில் நிர்மாணிக்கப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that the post office established in the Velanai Divisional Secretary's Division of the Jaffna District is operated in a temporary building as there is no permanent building for the post office;

(ii) if so, whether steps will be taken to construct a permanent building for the said post office; and

(iii) the time within which the said building will be constructed;

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. වේලනෙයි තැපැල් කාර්යාලය කුලී පදනම මත පෞද්ගලික ගොඩනැඟිල්ලක පවත්වාගෙන යනු ලබයි.

(ii) ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට සුදුසු, තැපැල් දෙපාර්තමේන්තුවට විධිමත් ලෙස පැවරුණු ඉඩම් කොටසක් දැනට වේලනෙයි ප්‍රදේශයේ නොමැත.

(iii) වේලනෙයි ප්‍රදේශයේ සුදුසු ඉඩම් කොටසක් තැපැල් දෙපාර්තමේන්තුවට විධිමත්ව පවරා ගැනීමට හැකියාව ලැබුණොත්, අපි ඒ ප්‍රදේශයේ ස්ථිර නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට බලාපොරොත්තු වෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இதேபோன்று வேறு இடங்களிலும் குறிப்பாக, அச்சுவேலி, அனலைதீவு, கைதடி, காங்கேசன்துறை, Kayts, கொடிகாமம், கொக்குவில், கோப்பாய், மானிப்பாய், நைனாதீவு, பண்டத்தரிப்பு, Point Pedro, புங்குடுதீவு, தெல்லிப்பளை, உரும்பிராய், வல்வெட்டித்துறை, வண்ணார்பண்ணை, வசாவிளான், கரவெட்டி போன்ற இடங்களிலுள்ள தபால் நிலையங்களுக்கும் நிரந்தரக் கட்டிடங்கள் இல்லை. ஆனால், கைதடி, பண்டத்தரிப்பு, Point Pedro, Kayts, காங்கேசன்துறையிலுள்ள தபால் நிலையங்களுக்கு காணிகள் காணப்பட்டபோதும் நிரந்தரக் கட்டிடங்கள் இல்லை.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඇත්තටම උප තැපැල් කාර්යාලවලට පසුගිය කාලයේදී එහෙම රජයේ ස්ථිර ගොඩනැඟිලි ඉදි කරලා තිබුණේ නැහැ. මෙවර අය වැයෙන් අපි රුපියල් මිලියන 600ක් වෙන් කර තිබෙනවා. නමුත් ඒ සියල්ල සම්පූර්ණ කරන්න බැහැ. ඉඩම් තිබෙන පරිදි සහ අවශ්‍යතාව පරිදි ඉදිරියේදී ඒ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

யாழ். போதனா வைத்தியசாலையானது, வடக்கு மாகாணத்தில் காணப்படுகின்ற ஒரேயொரு போதனா வைத்தியசாலையாகும்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මුල් ප්‍රශ්නයට අදාළ පිළිතුර සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීම සඳහා පමණක් අතුරු ප්‍රශ්න අහන්න.

ගරු අමාත්‍යතුමා කැමැතිද, පිළිතුර ලබා දෙන්න?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ලබන 12වන දා මම එහේ යනවා. එතකොට යාපනය රෝහලේ ඔය කියන ප්‍රශ්නය ගැන කථා කරන්න පුළුවන්.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න. විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## වී මිලදී ගැනීම සහ සහල් ආනයනය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති
## நெல் கொள்வனவு மற்றும் அரிசி இறக்குமதி தொடர்பான அரசாங்கத்தின் கொள்கை
## GOVERNMENT POLICIES ON PURCHASE OF PADDY AND IMPORT OF RICE

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා විසින් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

මෙරට පාරිභෝගික ජනතාවට අවම මිලකට තමන්ගේ වාර්ෂික සහල් අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට සහ ගොවීන්ගේ සුරක්ෂිතභාවය උදෙසා පැවැති රජයන් විසින් සෑම වසරකදීම සහතික මිල සහ ආනයන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබුවා. ප්‍රමාණාත්මකව ගත්තොත්, ලක්ෂ 18ක පමණ පිරිසක් වී ගොවිතැනෙහි නියැළෙනවා. සමස්ත ජනතාව - පාරිභෝගික ප්‍රජාව - ලක්ෂ 220කට ආසන්න වනවා. නමුත්, වත්මන් රජය බලයට පත්වීමට පෙර පොරොන්දු වූ පරිදි සහතික මිලක් සිය වී අස්වනු සඳහා මේ වන විට නොලැබෙන බවට ගොවීන් විසින් මැසිවිලි නඟනු ලබනවා. එබැවින්, මෙරට වී නිෂ්පාදන මිලදී ගැනීම් සහ ආනයන ප්‍රවණතා සම්බන්ධව රජයේ ප්‍රතිපත්ති පිළිබඳ විමසීම සඳහා මම පහත සඳහන් ප්‍රශ්න යොමු කරනවා.

01. මෙරට වාර්ෂික සහල් අවශ්‍යතාව කොපමණද? අද වන විට සහල් මෙට්‍රික් ටොන් කොපමණ ප්‍රමාණයක් රජයේ ගබඩා සතු වේද?

02. යල කන්නය මඟින් රජය අපේක්ෂිත සමස්ත වී අස්වනු ප්‍රමාණය දිස්ත්‍රික් මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් දක්වන්නේද?

03. වී කිලෝවක් සඳහා වැය වන සමස්ත පිරිවැය -බිත්තර වී, තෙල්, පොහොර, කෘෂි උපකරණ ඇතුළත්ව- කොපමණද යන්න දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කළ හැකි වන්නේද?

04. රජය මෙවර වී කිලෝවක් සඳහා ලබා දෙන සහතික මිල කවරේද? එය නාඩු, සම්බා, කීරි සම්බා සහ තෙත වී වශයෙන් වෙන් වෙන්ව දක්වන්නේද?

05. වී කිලෝවක් සඳහා වැයවන පිරිවැය සලකා බැලූ විට රජය ලබාදීමට තීරණය කර ඇති සහතික මිල ප්‍රමාණවත් යැයි රජය සිතන්නේද? එසේ මිලට ගනු ලබන වී මඟින් නිෂ්පාදනය කරන සහල් කිලෝවක මිල කොපමණ විය හැකිද?

06. මෙවර යල කන්නයේ ලැබෙන සමස්ත අස්වනු ප්‍රමාණයෙන් කොපමණ ප්‍රතිශතයක් රජය විසින් මිලදී ගැනීමට කටයුතු කරන්නේද?

07. අස්වනු මිලදී ගැනීම සඳහා රජය විසින් වෙන් කර ඇති සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද? එය යල කන්නයේ වී අස්වැන්න මිලදී ගැනීමට ප්‍රමාණවත්ද?

08. රජය මේ වසරේදී කොපමණ සහල් මෙට්‍රික් ටොන් ප්‍රමාණයක් ආනයනය කර තිබේද? ඒ සඳහා වැය වූ මුදල කොපමණද? ඉදිරි මාස කිහිපය තුළදී ද සහල් ආනයනය කිරීමට රජය අපේක්ෂා කරන්නේද? මේ වන විට මෙරට ඇතැම් ප්‍රදේශවල වී අස්වනු නෙළීම ආරම්භ කර ඇති පසුබිමක මෙලෙස සහල් ආනයනය තුළින් ගොවීන්ට සිය අස්වනුවලට සරිලන මිලක් ලබා ගැනීමට නොහැකි වන බව රජය පිළිගන්නේ ද?

09. වගා හානි සඳහා සුවිශේෂී රක්ෂණ ක්‍රමවේදයක් දියත් කිරීම පිළිබඳව රජයේ අවධානය යොමු කර තිබේද? නැතහොත්, වගා හානි අවම කර ගැනීම සඳහා රජයේ නිශ්චිත වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු කථානායකතුමනි, මෙය ඉතාම වැදගත් ප්‍රශ්නයක්. මම කැමැතියි, පුංචි විග්‍රහයකුත් කරන්න, මෙය ඉතාම වැදගත් ප්‍රශ්නයක් වන නිසා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉතාම කෙටියෙන් කියන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම කෙටියෙන් කියන්නම්.

ඇත්තවශයෙන්ම වසරකට අපේ රටේ සහල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් ලක්ෂ 24යි. එනම්, සහල්වලට අදාළව පාරිභෝජන අවශ්‍යතාව මෙට්‍රික් ටොන් ලක්ෂ 24යි. යල මහ දෙකන්නයේම වගා කරනවා, අක්කර 1,250,000ක්. සාමාන්‍යයෙන් මහ කන්නයේ සියයට 65ක අවශ්‍යතාවක් සහ යල කන්නයේ සියයට 35ක අවශ්‍යතාවක් තිබෙනවා. 2024 ගත්තොත්, අපේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් ලක්ෂ 28යි. ඒ කියන්නේ අතිරික්තයකුත් තිබෙනවා. ඔබතුමා දන්නවා, වී කිලෝ 100කින් දළ වශයෙන් සහල් කිලෝ 60ක්, 65ක් නිෂ්පාදනය වන බව. මෙවන් තත්ත්වයක් තුළ අපේ රටේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එක්කෝ, වී පිළිබඳව ඇති දත්තවල ලොකු ගැටලුවක් තිබෙනවා. ඒක එක කාරණාවක්. එහෙම නැත්නම්, මනුෂ්‍ය පරිභෝජනයට අමතරව තවත් වෙන වෙන කටයුතුවලටත් යොදාගන්නවාදෝ කියන සැකය අපට තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමා, මම ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වන අතරතුර ඔබතුමාට වැඩි පහසුවටයි මේ කාරණාව කියන්නේ.

අපි අහලා තිබෙනවා, බියර් නිෂ්පාදනයට, එහෙම නැත්නම් සත්ත්ව ආහාරවලට ආදී වශයෙන් සහල් යොදා ගන්නවා කියලා. දත්ත අනුව, අතිරික්තයක් තිබියදී සහල් මෙට්‍රික් ටොන් 40,000ක් ආනයනය කිරීමට යොමු වෙනවා. ඔබතුමාම කියලා තිබෙනවා - රජයම කියලා තිබෙනවා- පිටකොටුවේ තොග මුදලාලිලාගේ සහල් මාෆියාවක් තිබෙනවා කියලා. එතකොට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, බෙදා හැරීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැතිකමයි. හැබැයි, ඒකට විසඳුම් සොයන්නේ නැතුව ඔබතුමන්ලා සහල් ආනයනය කිරීම නිසා ගොවියාට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කියනවා, දැන් වීවල සහතික මිල රුපියල් 120යි කියලා. නමුත්, අද වී අස්වනු නෙළන අවස්ථාවේ වී කිලෝවක් විකිණෙන්නේ රුපියල් 85ට, 90ට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව විනාඩියයි ගන්නේ, ගරු කථානායකතුමනි. ඉතාම වැදගත් නිසායි මම මෙය කියන්නේ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. එක පැත්තකින්, ඔබතුමන්ලාගේ සැලසුම් දුර්වලයි. අනෙක් පැත්තෙන්, මේ කියන ආනයනය තුළ ඔබතුමන්ලා ලොකු බදු ආදායමක් උපදවනවා. මේ කරන්නේ එයයි. බදු ආදායම වැඩි කර ගැනීමට IMF එක දීලා තිබෙනවා නේ, target එකක්, කොන්දේසියක්? *[බාධා කිරීමක්]* බදු ආදායම වැඩි කර ගැනීමට සහල් ආනයනය කිරීම සිදු වනවා දෝ කියන එක බරපතළ ගැටලුවක්. ගරු ඇමතිතුමනි, අපේ රටේ වීවල ස්වයංපෝෂිත-භාවයක් තිබෙන විට, අතිරික්තයක් තිබෙන විට මෙසේ සහල් ආනයනය කරන්නේ කොහොමද?

ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. මොකද, මේක වැදගත් ප්‍රශ්නයක්. ගිය අවුරුද්දේ සහල් හිඟයක් තිබෙන වෙලාවක ඔබතුමන්ලා සහල් මිල රුපියල් 220 සිට රුපියල් 230 දක්වා වැඩි කරලා සති දෙකක් යනකොට තීන්දු කරනවා, සහල් මෙට්‍රික් ටොන් 167,000ක් ආනයනය කරන්න. ඒකෙන් මොකක්ද සිද්ධ වෙන්නේ? ඒකට ගහන ආනයන බද්ද අඩු කරන්නේත් නැහැ. රාජ්‍ය ආදායම ඉපැයීමක් තමයි ඒකෙන් ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා එක පැත්තකින් පාරිභෝගිකයාට හානියක් සිද්ධ වෙනවා, අනෙක් පැත්තෙන් වී ගොවියාටත් බරපතළ හානියක් සිද්ධ වෙනවා. ඔබතුමන්ලා දන්නවාද, මෑත කාලයේ - 2000 වර්ෂයෙන් පස්සේ- වාර්තාගත බඩ ඉරිඟු ප්‍රමාණයක්, ඒ කියන්නේ වැඩිම ප්‍රමාණය ආනයනය කරලා තිබෙන්නේ ඔබතුමන්ලාගේ කාල වකවානුව තුළ බව? ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් ලක්ෂ 3ක්. කොරෝනා කාලයේදීත්, බරපතළ ප්‍රශ්නයක් නිර්මාණය වුණු ඒ කාලයේදීත් අපේ රටට ගෙන්වලා තිබෙන්නේ බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 178,000යි. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ස්වයංපෝෂිතභාවය තහවුරු කරලා අතිරික්තයකුත් තිබෙන මොහොතක ඒවා ආනයනය කිරීම තුළින් ඔබතුමන්ලා කරන්නේ එක පැත්තකින් වී මිල අඩු වීම නිසා ගොවි ජනතාවගේ බඩට ගහන එක. අනිත් පැත්තෙන්, පාරිභෝගිකයා බලාපොරොත්තු වන පරිදි සාධාරණ මුදලට සහල් ටික ලබා ගන්නටත් බැහැ. හැබැයි, එක දෙයක් නම් සිද්ධ වෙනවා. අපනයන, ආනයන ක්‍රමය තුළ බදු ආදායම වැඩිවෙලා තිබෙනවා.

මම මේ අහපු සියලු ප්‍රශ්නවලට විධිමත් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කරන ලද මේ ප්‍රශ්නය අපේ අමාත්‍යාංශයට ලැබුණේ ඊයේ සවස 3ට කියලා තමයි අපේ අමාත්‍යාංශයේ නිලධාරින් වාර්තා කළේ.

එතුමා ප්‍රශ්නය යොමු කරලා, ප්‍රශ්නයට අදාළ විග්‍රහයකුත් කළා. එම විග්‍රහය ඇතුළේත් එතුමාගේ ප්‍රශ්නවලට උත්තර තිබුණා. හැබැයි, මට ප්‍රශ්නයක් ආවා. මොකද, පසුගිය කාලයේ කිරිබත් කන්නත් සහල් නැහැ කියපු විපක්ෂ නායකතුමා තමයි සහල් අතිරික්තයක් තිබෙනවාද කියලා දැන් මගෙන් ප්‍රශ්නයක් ඇහුවේ. එතකොට ඔබතුමාටම තේරෙන විධියට මේ ප්‍රශ්නය ඇතුළේ බොහෝ දේවල් තිබෙනවා උත්තර දෙන්න.

ඔබතුමා ඇහුවා, සහල් පරිභෝජනය කොච්චරද කියලා. ඔව්, ඔබතුමා කිව්වා වාගේ ලක්ෂ 24ක් කියලා තමයි කියන්න තිබෙන්නේ. ඒ වාගේම, මේ ආශ්‍රිතව තවත් කර්මාන්ත ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. මොකද, පසුගිය යල කන්නයේ සහ පසුගිය මහ කන්නයේ වී නිෂ්පාදනය කොච්චරද කිව්වොත්, මේ යල කන්නයේ අස්වැන්න නෙළන්න අපි දැන් පටන් අරගෙන තිබෙනවා. මේ මහ කන්නයේ තමයි මෑත ඉතිහාසයේ වැඩිම භූමි ප්‍රමාණයක් වගා කරලා තිබෙන්නේ. එම ප්‍රමාණය හෙක්ටෙයාර 530,000ක්. එහි අපේක්ෂිත අස්වැන්න පිළිබඳ තොරතුරු ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ගන්න ඕනෑ. වී කිලෝ එකක නිෂ්පාදන පිරිවැය කොච්චරද කියලාත් ඔබතුමා අහලා තිබෙනවා. ඒ ප්‍රශ්නයට උත්තර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණායතනයෙන් ගන්න ඕනෑ. ඒ වාගේම කොච්චර වී තොග තිබෙනවාද කියලා ඔබතුමා අහලා තිබෙනවා. ඒ පිළිබඳ තොරතුරු වී අලෙවි මණ්ඩලයෙන් සහ සතොසෙන් -CWE එකෙන්- ගන්න ඕනෑ.

ඒ වාගේම අපි කරපු ආනයනය පිළිබඳ විස්තර මට ඔබතුමාට මතකයෙන් කියන්න පුළුවන්. මේ අවුරුද්දේ මුල මෙට්‍රික් ටොන් 178,000ක් ආනයනය කළා. ඒ වාගේම කීරි සම්බාවල ප්‍රශ්නයක් ආපු නිසා මෙට්‍රික් ටොන් 40,000ක් ආනයනය කරන්න ආහාර සුරක්ෂිතතා කමිටුව තීරණය කරලා තිබෙනවා. නමුත්, අපි තවම ඒ සඳහා අවසර දීලා නැහැ.

ඒ එක්කම ඔබතුමා බඩ ඉරිඟු සම්බන්ධයෙන් කියපු කථාව වැරැදියි. ගිය අවුරුද්දේත් බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 278,000ක් ආනයනය කරලා තිබෙනවා. දේශීය පරිභෝජනයට සහ අපේ රටේ විවිධ කර්මාන්තවලට, විශේෂයෙන් කුකුළු මස්, බිත්තර, ඒ වාගේම සත්ව ආහාර, මාළු නිෂ්පාදනය සඳහාත් මේවා අවශ්‍ය වෙනවා. ගරු විපක්ෂ නායකතුමා ඇහුවා වාගේ බියර්වලට මෙට්‍රික් ටොන් 19,800ක් අවශ්‍යයි කියලා එම ආයතන විසින් අපට තොරතුරු වාර්තා කරලා තිබෙනවා. ඒ වාගේම, සකේ හදන්න තවත් සහල් මෙට්‍රික් ටොන් 10,000ක් අවශ්‍යයි කියලා ඒගොල්ලෝ ඉල්ලීම් කරලා තිබෙනවා. ඒ වාගේම බඩ ඉරිඟුවලින් එතනෝල් නිෂ්පාදනය කරනවා. ගරු විපක්ෂ නායකතුමා මේ තොරතුරුවලට අදාළව ප්‍රශ්න විශාල ප්‍රමාණයක් විමසුවා. එම නිසා මට ඔබතුමාට කියන්න තිබෙන්නේ මෙයයි. මේ ප්‍රශ්නය ඊයේ හවස ලැබුණු නිසා, මා සතුව තිබෙන තොරතුරු ඔබතුමාට ලබා දෙන්න පුළුවන් වෙන්නේ අදාළ ආයතනවලින් විධිමත් ලෙස තහවුරු කරලා අරගෙනයි. එම නිසා මේ ප්‍රශ්නය මම ඊයේම අදාළ

ආයතනවලට යොමු කළා. ඒ අනුව ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළව විධිමත් පිළිතුරක් කඩිනමින් ලබා දෙන්නම්.

ඒ අතරමැද ඔබතුමාට දැනගන්න මොනවා හෝ තිබෙනවා නම් මට ඒ තොරතුරු කියන්න පුළුවන්, ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරපු නිසා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sajith Premadasa.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා සඳහන් කළා ආයතන ගණනාවකින් විස්තර ලබාගන්නට අවශ්‍යයි කියලා. විශේෂයෙන්ම මම එතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. දැන් ඔබතුමන්ලා තීන්දු කරලා තිබෙනවා නේ වී කිලෝවකට රුපියල් 120ක සහතික මිලක් ලබා දෙන්න. ඔබතුමාගේ කථාවේදීම කිව්වා නිෂ්පාදන පිරිවැය පිළිබඳව අහවල් ආයතනයෙන් තොරතුරු ලබාගන්නට ඕනෑ, මේ ආයතනයෙන් තොරතුරු ලබාගන්න ඕනෑ, තවත් ආයතන ගණනාවකින් තොරතුරු ලබාගන්න ඕනෑය කියලා. එතකොට ඔය තොරතුරු නැතිවද ඒ රුපියල් 120ක නිශ්චිත මිල ගණනය කළේ? *[බාධා කිරීමක්]* ඇත්තවශයෙන්ම ගරු අමාත්‍යතුමනි, මේ රුපියල් 120 තීන්දු කරන්නට ඔබතුමන්ලා සතුව මේ දත්ත ටික තිබෙන්නට ඕනෑ. *[බාධා කිරීමක්]* තිබෙනවා නම් ඇයි දැන් ඉදිරිපත් නොකරන්නේ? ඔබතුමා දැන් මට කිව්වා නේ, ඒ ඒ ආයතනවලට කථා කරලා විස්තර ටික ලබාගන්න කාල වේලාව අවශ්‍යයි කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ලිඛිතව මේ ප්‍රශ්නය යොමු කළේ ඊයේ හවස 3.00ට. ඒ අදාළ අමාත්‍යාංශ, ආයතන නිලධාරින් මේ ප්‍රශ්නයට අදාළ පිළිතුර මට සකස් කරලා දෙන්න ඕනෑ. ඒ ලබා දෙන තොරතුරුවලට අදාළ ආයතන තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළව වී නිෂ්පාදනය පිළිබඳ තොරතුරු තිබෙනවා. ඒක ඔබතුමා දන්නවා. ඒ වාගේම, වී අලෙවි මණ්ඩලය සතුව ගබඩා කිරීම් සහ රැස්කිරීම් පිළිබඳ තොරතුරු තිබෙනවා. ඒ වාගේම, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය තමයි ගරු විපක්ෂ නායකතුමනි, වී කිලෝවක පිරිවැය හදන්නේ. ඒක හදලා තිබෙනවා. අපේ කෘෂි කර්මාන්තයේ නියැළුණු ගොවි සංගම්වල නායකයොත් මෙතැන ඉන්නවා. රුපියල් 96ක පිරිවැයක් යනවා. රුපියල් 96ක පිරිවැයට, තුනෙන් එකක් වැඩි කරලා වැඩි කරලා තමයි රුපියල් 120ක් ලෙස වී කිලෝවක මිල තීරණය කළේ. මට ඒක ඔබතුමාට කියන්න පුළුවන්. හැබැයි, ඔබතුමා කියනවා නේ සවිස්තරාත්මක පිළිතුරක් ඕනෑ කියලා. ඒ අදාළ ආයතනවලින් සවිස්තරාත්මක පිළිතුර ලිඛිතව ගෙනැත් දෙන්න තමයි මම ඔබතුමාගෙන් කාලය ඉල්ලුවේ. නැත්නම් මට ඔබතුමා අහපු ඔක්කොම ප්‍රශ්නවලට මතකයෙන් පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් අවස්ථාව ලබා දෙන්න. මේ ප්‍රශ්නය ගැන නොවෙයි මම කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let us stick to the Question under Standing Order 27(2), please.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක ඉතාම වැදගත් කාරණයක්, ගරු කථානායකතුමනි. අපේ රටේ රාජ්‍ය සේවය තුළ කීර්තිමත් සේවාවක් ඉටු කරපු දේශමාන්‍ය බුඩ්මන් වීරකෝන් මැතිතුමා අද අවසන් ගමන් යනවා. එතුමා අගමැතිවරු කීප දෙනෙකුගේම ලේකම්වරයා විධියට වාගේම, දිවංගත රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ උපදේශකවරයකු හැටියටත් කෘතහස්ත සේවාවක් ඉටු කළා. අද එතුමා අවසන් ගමන් යන දිනය. ඒ නිසා පක්ෂ භේදයෙන් තොරව නායකයන් ගණනාවක් වෙනුවෙන් එවන් කෘතහස්ත, විශිෂ්ට, කාර්යක්ෂම සේවාවක් ඉෂ්ට සිද්ධ කරපු එතුමා පාර්ලිමේන්තුව හැටියට අපි දැවැන්ත ඇගයීමකට ලක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම එතුමා කරපු ඒ විශිෂ්ට සේවාව තුළ අපේ රටේ රාජ්‍ය සේවයටත්, රාජ්‍ය පාලනයටත් විශේෂ ශක්තියක් ලැබුණා. ඒ කරපු සේවාව මේ අවස්ථාවේ මතක් කරමින්, අනුස්මරණය කරමින් අපි එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next Question under Standing Order 27(2) to be raised by the Hon. Sivagnanam Shritharan.

## II

## යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණ දෙන ගැටලු
### யாழ்ப்பாண மாவட்ட விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள்
### ISSUES FACED BY FARMERS IN JAFFNA DISTRICT

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கௌரவ வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி!

விவசாய மாவட்டமான யாழ்ப்பாணத்தில் நெற்செய்கைக்கு மேலதிகமாக உப உணவுப் பயிர்களான சின்ன வெங்காயம், வேதாளக்காய் வெங்காயம், உருளைக்கிழங்கு, திராட்சை, கரட், கரணைக்கிழங்கு, பீற்றூட், வாழை, மரவெள்ளி, மிளகாய் போன்றன வலிகாமம் வடக்கு, வலிகாமம் கிழக்கு, வலிகாமம் மேற்கு, வடமராட்சி தெற்கு - மேற்கு, வடமராட்சி கிழக்கு, தீவகம், தென்மராட்சி போன்ற பெரும் பிரதேசங்களின் பேரூர்களில் செய்கை பண்ணப்பட்டு வருகின்றன.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

சின்ன வெங்காய அறுவடைக் காலத்தில் இறக்குமதி வரி விதிப்பு செய்யப்படுவது வழமையாக இருந்து வந்தபோதிலும், கடந்த மூன்று வருடங்களாக அந்த வரி விதிப்பு நடைமுறைப்படுத்தப்படவில்லை. காலநிலைத் தாக்கத்தால் வெங்காயத்தின் உற்பத்தித் தரம் குறைவடைந்ததன் அடிப்படையில், யாழ்ப்பாணச் சின்ன வெங்காயத்துக்கான கேள்வியும் சந்தையில் குறைவடைந்துள்ளது. இதனால் வருடத்தில் மூன்று தடவை செய்கை பண்ணப்படும் வெங்காயம் தற்போது ஒருமுறை மட்டுமே செய்கை பண்ணப்படுகின்றது. இதனால் உற்பத்தியையும் அதிகரிக்க முடியாமல் விற்பனைமூலம் இலாபத்தையும் பெறமுடியாமல் தமது ஒட்டுமொத்த மூலதனத்தையும் இழந்து யாழ்ப்பாண மாவட்ட வெங்காயச் செய்கையாளர்கள் மிக மோசமாகப் பாதிப்படைந்துள்ளனர்.

யாழ்ப்பாணத்தில் உற்பத்தி செய்யப்படும் சின்ன வெங்காயத்தில் பார உலோகம் நிறைந்துள்ளதாகக் கூறப்படுகின்றபோதும், ஏனைய நாடுகளிலிருந்து இறக்குமதி செய்யப்படும் வெங்காயத்தில் பார உலோகம் உண்டா, இல்லையா என்பதை உறுதிசெய்வதற்கான பொறிமுறைகள் எதுவும் உரிய திணைக்களத்தால் நடைமுறைப் படுத்தப்படவில்லை.

தம்புள்ளையில் உற்பத்தி செய்யப்படும் மற்றும் ஏனைய நாடுகளிலிருந்து இறக்குமதி செய்யப்படும் சின்ன வெங்காயத்துக்கு கழிவு நடைமுறை பின்பற்றப்படாத சமநேரத்தில், வடக்கு மாகாணத்தில் மட்டும் சின்ன வெங்காயம் உள்ளிட்ட உற்பத்திப் பொருட்களுக்கு 10:1 என்ற அடிப்படையில் கழிவு செய்யப்படுகின்றமை ஏற்கனவே பல்வேறு பாதிப்புகளின் விளிம்பிலுள்ள விவசாயிகளை மேலும் பாதிப்பதாக அமைந்துள்ளது. தினக்கூலித் தொழிலாளர்களுக்கான நாளாந்தச் சம்பளம் ஆண்களுக்கு 3,500 ரூபாயும் பெண்களுக்கு 2,300 ரூபாயும் என்ற அடிப்படையில் அதிகரிக்கப்பட்டுள்ளதுடன், கமநல சேவைகள் திணைக்களம் ஊடாக வழங்கப்படும் விவசாய உள்ளீடுகளின் விலையும் மூன்று மடங்காக அதிகரிக்கப்பட்டுள்ளது. இந்நிலையில், இந்த உற்பத்திச் செலவினங்களை ஈடுசெய்யும் வகையில் முடிவுப் பொருட்களை விற்பனை செய்ய முடியாதுள்ளமை விவசாயிகளின் பாதிப்பின் தன்மையை மேலும் அதிகரித்துள்ளது.

விவசாய நிலங்களில் ஊடுருவியுள்ள பாதினியத்தின் பரவலால் ஏற்பட்டுள்ள பாதிப்பு, மண் - நீர் பரிசோதனை மேற்கொள்ளப்படாமை, தென்னை, வாழை, வெங்காயம், வெற்றிலை உள்ளிட்ட பயிர்களுக்கு ஏற்படும் நோய்த்தாக்கம், அவற்றுக்கான நட்டஈடுகளோ, கட்டுப்படுத்தல் பொறிமுறைகளோ கைக்கொள்ளப்படாமை உள்ளிட்ட காரணங்களால் விவசாயத் திணைக்களம்மீது பாதிக்கப்பட்ட விவசாயிகள் அதிருப்தி அடைந்துள்ளனர். ஏற்கனவே, மிளகாய், தென்னை, வாழை மற்றும் வெற்றிலை உள்ளிட்ட பயிர்ச்செய்கையில் இலாபமீட்ட முடியாத நிலை, நோய்த்தாக்கம், வெங்காயத்தின் கேள்வியில் ஏற்பட்ட சடுதியான வீழ்ச்சி, இறக்குமதிக்கான வரி விதிப்பு இன்மை என்பவற்றோடு கடந்த இரண்டு வருடங்களுக்கும் மேலாக மானிய அடிப்படையிலான விதை உருளைக்கிழங்கை யாழ்ப்பாணத்தில் பெற்றுக்கொள்ள முடியாமை உள்ளிட்ட காரணங்களால் யாழ்ப்பாண மாவட்டத்தின் உப உணவுப் பயிர்ச்செய்கை வீழ்ச்சியடைந்து வருவதுடன், விவசாயிகளின் வாழ்வாதாரமும் முற்றாகப் பாதிப்படைந்து வருகின்றது.

இயற்கைப் பேரிடர்கள் மற்றும் நோய்த் தாக்கங்களால் ஏற்படும் பாதிப்புகளுக்கு ஏனைய மாகாணங்களில் நட்டஈடு வழங்கப்படுகின்றபோதும், வடக்கில் குறிப்பாக யாழ்ப்பாண விவசாயிகளின் பாதிப்புகளுக்கேற்ற மாற்று நடைமுறைகள் குறித்து தொடர்புடைய திணைக்களங்கள் கரிசனை கொள்வதில்லை என்பதே பாதிக்கப்பட்ட மேற்படி விவசாயிகளின் ஆதங்கமாக உள்ளது. இவற்றின் அடிப்படையில் நான் பின்வரும் வினாக்களை கேட்கின்றேன்.

01. சின்ன வெங்காயம் அறுவடை செய்யப்படும் காலத்தில், விவசாயிகளைப் பாதுகாக்கும் வகையில் அரசால் இறக்குமதிக்கு வரி விதிக்கப்படுமா? என்பதையும், கடந்த மூன்று ஆண்டுகளாக ஏன் இந்த வரி விதிப்பு நடைமுறைப்படுத்தப்படவில்லை என்பதையும் அமைச்சர் அறிவிப்பாரா?

02. இவ்வருடம் தொடர் மழை காரணமாக சின்ன வெங்காயச் செய்கையில் ஈடுபடும் விவசாயிகள் தங்கள் மூலதனத்தை முழுமையாக இழந்துள்ளதுடன், உற்பத்திப் பொருளின் தரமும் குறைந்துள்ளது. இத்தகைய பாதிப்பை எதிர்கொண்டுள்ள விவசாயிகளின் வாழ்வாதாரத்தை மீளமைக்கும் வகையில் நட்டஈடு வழங்கும் திட்டம் அரசிடம் உள்ளதா?

03. காலாகாலமாக யாழ்ப்பாண மாவட்டத்தில் சிறப்பாக உற்பத்தி செய்யப்பட்டு வந்த உருளைக்கிழங்குச் செய்கை பாதிப்படையும் வகையில், மானிய அடிப்படையிலான விதைக் கிழங்கு கிடைக்கப் பெறாமைக்கும், தரமான புதிய இனங்கள் அறிமுகம் செய்யப்படாமைக்கும் காரணம் என்ன என்பதை அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

04. பார உலோகம் நிறைந்துள்ளதாகக் கூறப்படுவதன் அடிப்படையில் கிருமிநாசினிப் பயன்பாடு குறைவடைந்துள்ள நிலையில், இறக்குமதி செய்யப்படும் வெங்காயத்தில் பார உலோகம் உண்டா, இல்லையா என்பதை மக்களுக்கு எவ்வாறு தெளிவுபடுத்துவது என்பதற்கு அசைச்சரின் பதில் என்ன?

05. வடக்கு மாகாணத்தில் மட்டும் இவ்வுற்பத்திப் பொருட்களுக்கு 10:1 என்ற அடிப்படையில் கழிவு செய்யப்படுகின்றது. ஆனால், இந்தக் கழிவுமுறை தம்புள்ளையில் உற்பத்தி செய்யப்படும் மற்றும் இறக்குமதி செய்யப்படும் வெங்காயத்துக்கு ஏன் பின்பற்றப்படுவதில்லை என்பதை அமைச்சர் இந்தச் சபைக்கு அறிவிப்பாரா?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය අපට ඊයේ සවස තමයි යොමු කර තිබුණේ. විශේෂයෙන්ම උතුරේ අර්තාපල් වගා කිරීම පිළිබඳව වාගේම රතු ලූනු මිල පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නයෙන් විමසා තිබෙනවා. මේ පිළිබඳව ආහාර සුරක්ෂිතතා කමිටුවේදී සාකච්ඡා කළා. ඒ වාගේම එම සාකච්ඡාවේදී රතු ලූනු, ලොකු ලූනු, අර්තාපල් වැනි දේශීය භෝග නිෂ්පාදනය ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීමටත් අපි තීරණ ගත් බව ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ජනාධිපති ලේකම් කාර්යාලයේ තමයි එම කමිටුව පවත්වන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට ලබන සිකුරාදා දක්වා කාලය ඉල්ලා සිටිනවා. සිකුරාදා දින මම මේ ප්‍රශ්නයට අදාළව ඔබතුමාට පිළිතුරු ලබා දෙනවා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, நான் அண்மையில் யாழ்ப்பாண மாவட்டத்திலுள்ள அச்சுவேலி, பத்தமேனி பகுதிகளிலுள்ள விவசாயிகளைச் சந்தித்தேன். அப்பொழுதுதான் அவர்கள் தங்களது இந்த ஆதங்கத்தை தெரியப்படுத்தி இருந்தார்கள். யாழ்ப்பாண மாவட்டத்தில் பெரும்பாலான பகுதிகளில் இந்த உப உணவுப் பயிர்ச்செய்கை முக்கியத்துவம் பெறுகிறது என்பது உங்களுக்குத் தெரியும்! நீங்கள் எதிர்வருகின்ற வெள்ளிக்கிமை தருகின்ற பதிலானது, இந்த உடனடி வரி விதிப்பின்மூலம் அவர்களுடைய பொருட்களுக்கு ஒரு மாற்றத்தைத் தரக்கூடிய வகையில் அமைய வேண்டும். கடந்த காலங்களில் அந்த மாவட்டத்தில் உற்பத்தி செய்யப்படுகின்ற விவசாய உற்பத்திப் பொருட்கள் சாதாரணமாக ஒரு நாளைக்கு 40 லொறிகளில் தென் பகுதிக்கு ஏற்றப்பட்டன. இப்பொழுது ஒரு நாளைக்கு ஒரு லொறியில்கூட ஏற்றமுடியாத அளவுக்கு அங்கு விவசாயம் பின்னடைந்துள்ளது. தயவுசெய்து இந்த விடயங்களைக் கருத்திற்கொண்டு, நீங்கள் உங்களுடைய ஆக்கபூர்வமான பதிலை எதிர்வரும் வெள்ளிக்கிழமை வழங்க வேண்டுமென நான் எதிர்பார்க்கின்றேன்.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රීතරන් මන්ත්‍රීතුමා විමසා සිටිනවා වාගේම විශේෂයෙන්ම උතුරේ වාගේම මුළු රටේම ගොවි ජනතාවගේ දේශීය නිෂ්පාදන පිළිබඳව අප සැලකිලිමත් වෙනවා. විශේෂයෙන්ම ලොකු ලූනු, අර්තාපල්, රතු ලූනු වාගේ භෝග නිෂ්පාදනය කරන්නේ විශේෂ දිස්ත්‍රික්ක කිහිපයක පමණයි. ඒ ගොවි ජනතාව ගොවිතැනින් ඈත් වෙන එක වළක්වන්න තමයි අපට විශේෂ බදු පනවන්න වෙන්නේ. මොකද, මේ වනවිටත් අපි රතු ලූනු, ලොකු ලූනු - ගරු මන්ත්‍රීතුමා බැර ලෝහ සහිත ලූනු ගැනත් අසා තිබුණා. ඒක විශේෂයෙන් විමසිය යුතු කාරණයක්.

සාමාන්‍යයෙන් දේශීයව ලූනු කිලෝ එකක් නිෂ්පාදනය සඳහා අපට රුපියල් 95ක විතර පිරිවැයක් දරන්න වෙනවා. හැබැයි, වෙළෙඳ පොළේ ලොකු ලූනු සිල්ලර මිල රුපියල් 130ටත් තිබෙනවා. රුපියල් 10ක බද්දක් තමයි තිබෙන්නේ. මේ වනවිට අපේ ලූනු අස්වැන්න එනවා. අල කිලෝ එක රුපියල් 150ට, 160ට වෙළෙඳ පොළේ තිබෙනවා. දේශීයව නිෂ්පාදනය කරන අල කිලෝ එකකට රුපියල් 250ක මිලක්වත් ගොවියාට දෙන්න ඕනෑය කියලා අපේ මන්ත්‍රීවරුන් සඳහන් කර තිබෙනවා. හැබැයි, අල නිෂ්පාදනය ගත්තත්, ලොකු ලූනු නිෂ්පාදනය ගත්තත්, රතු ලූනු නිෂ්පාදනය ගත්තත් අපේ රටේ සමස්ත පරිභෝජනයට අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 10ක වාගේ ප්‍රමාණයක් තමයි ලූනු තිබෙන්නේ. අල තිබෙන්නේ සියයට 15ක් වාගේ ප්‍රමාණයක්. අවශ්‍ය ඉතුරු ප්‍රමාණය පිට රටින් ගෙනෙනවා. එහෙම වුණත්, සියයට 15ක් හෝ වගා කරන ගොවියා අනාරක්ෂිත කරමින් ගොවියාට සාධාරණ මිලක් නොලැබෙන විධියට අපි කටයුතු කරන්නේ නැහැ. එහිදී ගොවි ජනතාවත් ආරක්ෂා කරගෙන, පාරිභෝගිකයාත් ආරක්ෂා කරගෙන ගන්න පුළුවන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම තමයි ආණ්ඩුව විසින් කරන්නේ. මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක පිළිතුරක් ගරු මන්ත්‍රීතුමාට සිකුරාදා දිනයේදී අප ලබා දෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Question of Privilege to be raised by the Hon. Nalin Hewage.

## වරප්‍රසාද: 2025.05.28 දින "අද" පුවත් පත් වාර්තාව
## சிறப்புரிமை: 2025.05.28ஆந் திகதிய "அத" பத்திரிகை அறிக்கை
## PRIVILEGE: NEWS REPORT IN "ADA" NEWSPAPER OF 28.05.2025

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම වරප්‍රසාද ප්‍රශ්නය නැඟීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍යයෙහි නියැළෙන මාධ්‍යවේදීන් ලෙසින් ඔවුන්ගේ සමාජ යුතුකම හා වගකීම සමාජ ප්‍රගමනයට තමන්ගේ මාධ්‍ය භාවිතය හැසිරවීම යැයි අප උදක්ම විශ්වාස කරමු. එවන් උත්තුංග අරමුණින් මාධ්‍ය භාවිතයෙහි නියැළෙන සාතිශය බහුතරයක් මාධ්‍යවේදීන් අතර තම ස්වාමියාගේ හෙවත් මාධ්‍ය ප්‍රාග්ධන හිමියාගේ පදයට නටන, ඔවුන්ගේ දේශපාලන මඩ ගොහොරුවේ ලගින සහ එහිම නිදන, එම අසූචි වළෙන්ම ස්වකීය උදර පෝෂණය කර ගන්නා මාධ්‍යවේදීන් ලෙසින් පෙනී සිටින ප්‍රතිගාමීත්වයට පාර කපන සුළු පිරිසක් නැතුවාද නොවේ.

උත්තුංග ජනමාධ්‍යකරණය ස්වකීය උදර පෝෂණය උදෙසා ජඩ මාධ්‍යකරණයට ලක් කළ කිහිප දෙනෙකුගේ නොහොබිනා ක්‍රියා කරණකොටගෙන, මාගේ වරප්‍රසාද උල්ලංඝනය වීමකට අදාළව සාධාරණයක් අපේක්ෂාවෙන් මෙම ප්‍රකාශය අද මෙහි සටහන් කරනවා.

ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා ලෙසින් මා සඳහන් කළා යැයි පවසා 2025.05.28 දින "අද" පුවත් පතෙහි පළ කර තිබෙන අසත්‍ය පුවත් පත් දැන්වීම මම **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එම අසත්‍ය පුවත පදනම් කරගෙන ඊට පසු දින - 2025.05.29 වන දින - උක්ත පුවත් පතෙහිම, එනම් "අද" පුවත් පතෙහි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් උක්ත අසත්‍ය ප්‍රකාශයට අදහස් විමසමින් සම්බන්ධීකරණ කමිටුවේදී මා විසින් ප්‍රකාශ කළා යැයි කියන දේ බොරුවක් යැයි පවසා තවත් පුවතක් ද පළ කරන ලදී. එම පුවත් පත් දැන්වීම ද මම **සභාගත*** කරනවා.

උක්ත සම්බන්ධීකරණ කමිටුවෙහි හඬ පටයට සවන් දීමේදී එහි නොමැති කාරණා මතු කරමින්, චේතනාන්විතවම අපහාස කිරීමේ අරමුණින් මාධ්‍ය භාවිතයෙහි නියැළී ඇති බව එම පුවත් දෙක තුළින්ම මනාවට ප්‍රදර්ශනය වෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන් නොනවතින මෙම මඩ මාධ්‍ය භාවිතය 2025.06.01 ඉරිදා "අරුණ" පුවත් පතෙහි උපුල් ගලප්පත්ති නම් වූ මාධ්‍යවේදියා විසින් ගවේෂණාත්මක ලිපියක් සම්පූර්ණ පිටුවක් පුරා ලියමින් මා තදබල ලෙස අසත්‍ය ප්‍රකාශ කරන්නෙක් ලෙසින්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නලින් හේවගේ මහතා]

දීර්ඝව අසත්‍ය කරුණු රාශියක් හෙළිදරව් කර ඇත. කිසිදු සත්‍ය ගවේෂණයක නොයෙදෙමින්, අසත්‍ය කරුණු ගෙනහැර පාමින් ඉරිදා "අරුණ" පුවත් පතෙහි උපුල් ගලප්පත්ති නම් මාධ්‍යවේදියා තම ස්වාමියාගේ දේශපාලනය පිනවීමට පිටුවක් පුරා තබන ලද මඩ සටහන තරයේ ප්‍රතික්ෂේප කරන අතර, එය හුදෙක්ම චරිත ඝාතනයට දරන ලද උත්සාහයක් බව තරයේ ප්‍රකාශ කරන්නෙමි. 2025.06.01 ඉරිදා "අරුණ" පුවත් පත් දැන්වීමත් මම **සභාගත*** කරනවා.

ඉන් නොනැවතෙන ඔවුන්, එම පන්නයේම අශීලාචාර මාධ්‍යකරණයක නියැළෙන "හිරු" රූපවාහිනී නාළිකාවේ 2025.06.01 දින "පත්තරේ විස්තරේ" වැඩසටහනින් විනාඩි දෙකහමාරකට අධික කාල අවකාශය තුළ ද අසත්‍ය කරුණු එකතු කරමින් චරිතය කෙලෙසීමේ නිහීන උත්සාහයක මධුශාන් ද සිල්වා නම් වූ පුවත් පත් කියවන්නා නියැළුණි. "අද" පුවත් පතේ පළ කරන ලද බොරුවකින් ඇරඹී එය ඉරිදා "අරුණ" පුවත් පතෙහි සම්පූර්ණ පිටුවක් පුරා මෙන්ම, රූපවාහිනී අවකාශයෙහි වෙන් කරන ලද ඉඩ හරහා චරිතය කෙලෙසීමේ නිහීන උත්සාහයක නියැළීම පිළිකුලෙන් යුතුව හෙළා දකිමින්, මේ පිළිබඳ විධිමත් විමර්ශනයක් හරහා මාහට සාධාරණයක් ඉටු කර දෙන මෙන් ඔබතුමා හරහා ගරු කථානායකතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලමි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Nalin Hewage, your Question of Privilege will be referred to the Hon. Speaker. -*[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Hon. Deputy Speaker, I also have submitted a Question of Privilege. I gave it yesterday; ඊයේ භාර දුන්නේ. ඊයේ හවස මගේ අතින්මයි ගිහිල්ලා භාර දුන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
But, it is not here on the Table, Hon. Member.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමාගේ කාර්යාලයට ගිහිල්ලා භාර දුන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It is not here; I do not see it here.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
That is not my problem, anyway. But, I have already given it to the Hon. Speaker's office.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I am told that it will be forwarded to the IGP for a clarification.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, may I speak?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, without getting a clarification from the IGP, first, we must have the right to raise that issue in Parliament. After that, you can send it to the IGP and get a clarification from him. But, before that, I have a right to raise this Question of Privilege; it is my Privilege issue.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I think I will have to discuss it with the Hon. Speaker himself, personally.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක IGP කරන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් විධියටයි වෙන්නේ. මොකද, මේක දිගින් දිගටම කෙරෙනවා. ගරු මුජිබුර් රහුමාන් මැතිතුමාව කැඳවලා තිබෙනවා, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මැතිතුමාව කැඳවලා තිබෙනවා, ගරු අර්ච්චුනා මැතිතුමාව කැඳවලා තිබෙනවා, අපේ කවින්ද ජයවර්ධන මැතිතුමාව කැඳවලා තිබෙනවා. මේ වාගේ, මන්ත්‍රීවරුන් ගණනාවක් දැන් CID එකෙන් දවස ගණනේ කැඳවනවා. මොකක්ද, හේතුව? එළියේ පුවත් පත් සාකච්ඡාවක් කිරීම සම්බන්ධව තිබෙන කාරණාවක්. ගරු කථානායකතුමනි, අපේ කථා කිරීමේ නිදහස සම්පූර්ණයෙන් වළක්වන වැඩ පිළිවෙළක් මේ යන්නේ. මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගිහිල්ලා පුවත් පත් සාකච්ඡාවකදී මොනවා හෝ ප්‍රකාශයක් කරපු ගමන් කවුරු හෝ කෙනෙක් ගිහිල්ලා CID එකට පැමිණිල්ලක් කළාම අපව කැඳවනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් තිබෙන නීතිය අනුව මේ සම්බන්ධව කාට හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔවුන්ට පුළුවන් එන්තරවාසියක් එවලා අපට විරුද්ධව නඩු දාන්න. ඒක සාමාන්‍යයෙන් තිබෙන නීතිය. නමුත්, දැන් මේ අපරාධ නීතිය යටතේ මේවා ක්‍රියාත්මක කරනවා කියන්නේ CID එක සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණය වෙලා තිබෙන්නේ. ෂර්ලොක් හෝම්ස් වාගේ ඉතා දක්ෂ පරීක්ෂකවරයෙක් තමයි මේකේ ප්‍රධානියා වෙලා ඉන්නේ. ඒ, ශානි අබේසේකර මැතිතුමා. එතුමාවත් දේශපාලනීකරණයට ලක් කරවලා තිබෙන්නේ. අපි මේ කන්ටේනර් 323 ගැන කරුණු ඉදිරිපත් කළාම ඒ සඳහා අවශ්‍ය තීරණ අනෙක් පැත්තෙන් ගන්න ඕනෑ. එහෙම නොකර තමයි මේ ක්‍රියාවලිය කරන්නේ.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I understand your concern, Hon. Member. I will bring it to the notice of the Hon. Speaker. I was told that the reply from the IGP would be received today. So, it could be raised, probably, on Friday.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chief Government Whip.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුවත් පත් සාකච්ඡාවක් පැවැත්වූවා කියලා කිසිම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු CID එකට කැඳවනවා කියලා මම හිතන්නේ නැහැ. එහෙම නම් ඉතින් ගොඩක් මන්ත්‍රීවරුන් පුවත් පත් සාකච්ඡා පවත්වනවා නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නිශ්චිතව කිව්වා නම් හරි, මොන කාරණය මත පදනම් වෙලාද මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ කියලා. මම හිතන විධියට, ජාතික ආරක්ෂාවට තර්ජනයක් වුණාය කියලා කන්ටේනර් ප්‍රශ්නය ගැන තොරතුරු සොයන්න තමයි එන්න කියන්න ඇත්තේ. එහෙම නැත්නම් හිතනවා, පුවත් පත් සාකච්ඡා පැවැත්වූවාම CID එකට කැඳවනවා කියලා. එහෙම දෙයක් වෙන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා අහපු නිසා මම කියන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Shall we not make it a point for debate, Hon. Member?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙන ඒවා නිදහස් කරපු අයව තමයි මේ ප්‍රශ්නය අහන්න CID එකට කැඳවන්න ඕනෑ. කාගෙන්වත් අහන්නේ නැතිව මේවා නිදහස් කළාය කිව්වා, අපේ වරාය නියෝජ්‍ය අමාත්‍යතුමා. ඊළඟට බිමල් රත්නායක ඇමතිතුමා මේවා නිදහස් කළාය කියනවා. අනුර දිසානායක මැතිතුමා මේ අමාත්‍යාංශයේ ඇමතිවරයා. ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් තිබෙනවාද කියලා ඉස්සෙල්ලා ඒ අයගෙන් අහන්න. අපෙන් අහලා වැඩක් නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. Hon. Member, shall we proceed with the Business of the House?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, what is your point of Order?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

It is on the same matter, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I will give you one minute, Hon. Member.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, ඔබතුමා කරුණාකරලා ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්න එතුමාට ඉඩ දෙන්න. ඒක වරප්‍රසාද කමිටුවට යොමු කරලා ඊට පසුව පොලිස්පතිතුමාගෙන් අහන්න. මේක ඒ මන්ත්‍රීවරයාගේ වරප්‍රසාදයක්. එතුමාට ඕනෑම වෙලාවක වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට අයිතිය තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I do not have his Question of Privilege on the Table here. It had been given to the Hon. Speaker. I will refer this to the Hon. Speaker.

Now, shall we proceed with the Business of the House?

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### රබර් පාලන (සංශෝධන) පනත් කෙටුම්පත
### இறப்பர் கட்டுப்பாடு (திருத்தம்) சட்டமூலம்
### RUBBER CONTROL (AMENDMENT) BILL

"රබර් පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

*පිළිගන්වන ලද්දේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා විසිනි.*

***2025 ජූලි 23වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர் மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 யூலை 23, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. K.V. Samantha Viddyarathna, Minister of Plantation and Community Infrastructure; to be read a Second time upon Wednesday, 23rd July, 2025*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, what is your point of Order? Make it very short; for one minute, please.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Okay, Sir.

මම මේ පාර්ලිමේන්තුව ඇතුළේ කරපු කථාව විතරයි තිබෙන්නේ. මම පුවත් පත්වලට මොකුත් කියලාත් නැහැ. මම එළියට ගිහින් මේ ගැන කටවත් ඇරියේ නැහැ. පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරපු එකට මාව CID එකට ගෙන්වා ගත්තා. මම ඒක complaint එකක් විධියට Hon. Speakerට ලියලා දුන්නා. Hon. Speaker ඒකට උත්තර දුන්නා, ඒකේ කොහේවත් 323 කියලා සටහන් වෙලා නැහැ කියලා. නමුත් CID එකෙන් මට කියනවා, පාර්ලිමේන්තුව ඇතුළේ මම කරපු කථාව ඔවුන්ට පැහැදිලි කරලා කියන්න කියලා. කොහේද මේක යන්නේ? Parliament (Powers and Privileges) Act කියලා එකක් මේ රටේ නැද්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Archchuna, I believe you have raised this issue before also.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාම සතුව තිබෙන අවස්ථාවක් තමයි, තමන්ගේ වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කිරීම. වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කිරීම පිටස්තර ආයතනයකට හෝ කණ්ඩායමකට අභියෝගයට ලක් කරන්නට බැහැ. මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි කියන්නේ, Parliamentary sovereignty කියන්නේ අන්න ඒකයි. එතකොට, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කඩ කිරීමක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න එතුමාට මේ සභා ගර්භය තුළ අවස්ථාවක් නොලැබීම එතුමාගේ අයිතිය අහිමි කිරීමක්. මහජන ඡන්දයෙන් පත් වෙලා ජනතා පරමාධිපත්‍යය මුදුන්පත් කරගෙන පාර්ලිමේන්තුවේ ස්වෛරීත්වය ස්ථාපනය වුණු අවස්ථාවක ඒකට කාටවත් අභියෝග කරන්න බැහැ. ඔය මන්ත්‍රීතුමාට මේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පුළුවන්ද, බැරිද කියලා අහවලාගෙන් අහලා කියන්නම්, අර ආයතනයෙන් අහන්නම් කියලා, එහෙම කටයුතු කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමා සභාවේ නැති අවස්ථාවේදී ඔබතුමා තමයි ප්‍රධාන බලධාරියා. ඔබතුමාගේ වගකීම තමයි පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීම හා අයිතිය ආරක්ෂා කිරීම. දැන් කියපු ආකාරයට මන්ත්‍රීවරු ගණනාවක් - මුජිබුර් රහුමාන් මැතිතුමා, කවින්ද ජයවර්ධන මැතිතුමා, චිත්‍රාල් ප්‍රනාන්දු මැතිතුමා, රාමනාදන් අර්චුනා මැතිතුමා - කැඳවලා තිබෙනවා, විශේෂයෙන්ම පාර්ලිමේන්තු සභා ගර්භය තුළ සාකච්ඡාවට භාජන වුණු කන්ටේනර් ප්‍රශ්නය පිළිබඳව ප්‍රශ්න කරන්න. මමත් ස්ථාවර නියෝග 27(2) යටතේ ඒ ගැන ප්‍රශ්නයක් ඇහුවා. එහෙම නම් දැන් අපිවත් කැඳවයිද දන්නේ නැහැ, ඒ කන්ටේනර් ප්‍රශ්නය ගැන පාර්ලිමේන්තුවේදී කථා කළාය කියලා. එහෙම කරන්න පුළුවන්ද?

මම ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ වෙනුවෙන් මැදිහත් වෙලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිය ආරක්ෂා කරන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භාෂණයේ නිදහස කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු වන මූලික අයිතිවාසිකමක්. පාර්ලිමේන්තුව ඇතුළේත් මන්ත්‍රීවරුන්ට මූලික අයිතිවාසිකම අහිමි කරනවා නම් මේ පුරවැසියන් ලක්ෂ 220ට යන කල මොකක්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, I got your concern loud and clear. This issue has already been handed over to the Hon. Speaker, and he has referred it to the IGP. There is nothing I can do above that because - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, let me present it and you take a decision.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

No, Hon. Member, I cannot take a decision once he has referred it to the IGP.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, let me present it. After that, you can decide.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, this is already in the hands of the Hon. Speaker. This is not something you have brought up now. It has already been submitted to the Hon. Speaker, and he has referred it the IGP. So, I cannot go and sort of veto that.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Chief Government Whip?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කියන්නේ, වරප්‍රසාද ප්‍රශ්නයට එතුමාට අවස්ථාව දෙන්න ඕනෑ. ඒක හරි. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. මම මේ කියන්න හදන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවම බලය උත්පාදනය වෙන්නේ ජනතාවගෙන් කියන එකයි. විශේෂයෙන් ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය බලපාන්නේ සමස්ත මහ ජනතාවට. පාර්ලිමේන්තුවේදී හෝ පිටතදී, ඔබතුමන්ලා අතේ තිබෙන තොරතුරු අනුව ඒ කන්ටේනර්වල ජාතික ආරක්ෂාවට බලපාන දේවල් තිබෙනවාය කියලා ප්‍රකාශ කරලා තිබෙනවා. එහෙම නම් ජාතික ආරක්ෂාවට වග කියන ආයතනවලට වගකීමක් තිබෙනවා, ඔබතුමන්ලා ගෙන්වලා ඒ තොරතුරු ටික ඔබතුමන්ලාගෙන් ලබා ගන්න. CID එක ඇතුළු පොලීසිය කරලා තිබෙන්නේ,- *[බාධා කිරීමක්]* කොහේට එන්න කිව්වත්, ඒ තොරතුරු ලබා ගන්න තමයි ඔබතුමන්ලාට එන්න කියන්න ඇත්තේ. ඒකට භය වෙන්න එපා. ඔබතුමන්ලා ළඟ තිබෙන තොරතුරු එතැනට ගිහිල්ලා කියන්න. ඒක ජාතික ආරක්ෂාවට වැදගත් වේවි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, take just five seconds please.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියන කාරණය හරි. මම ඒ කාරණය පිළිගන්නවා. හැබැයි, අපි නොවෙයි, ඉස්සෙල්ලාම ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න තිබෙනවාය කිව්වේ, රේගු නිලධාරින්ගේ සංගමය. ඊට පස්සේ අපි ගිහිල්ලා මේ ගැන කිව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, shall we proceed with today's Business of the House?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඊට පස්සේ අපි කිව්වා, ඒවායේ තිබෙන තත්ත්වයන් අනුව ඒවා නිදහස් කරපු, ඒ සඳහා නියෝග දුන්නු බිමල් රත්නායක ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, අනුර දිසානායක ජනාධිපතිතුමාත් ගෙන්වලා කටඋත්තර ගන්න කියලා. මොකද, ඒගොල්ලන් තමයි දන්නේ මේවා ඇතුළේ මොනවාද තිබුණේ කියලා. මොකද, අපි ඒ ගැන දන්නේ නැහැ. අපට ඉස්සෙල්ලා මේ ගැන ප්‍රකාශ කළේ රේගු නිලධාරින්ගේ සංගමය, ගරු ඇමතිතුමනි. රේගු නිලධාරින්ගේ සංගමය කිව්වා, මේකේ අන්තරායකාරී ඖෂධ තිබෙනවාය කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, I think your message is clear.

Next, Item No. 2 under Notice of Motions, the Hon. Chief Government Whip.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2025 ජූලි 11 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය. "

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rajaputhiran Rasamanickam to move the Adjournment Motion.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, before that, I want to raise a matter.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rasamanickam, you move your Adjournment Motion now. Then, you can speak.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, before I move the Adjournment Motion, I want a clarification. Now, we are going to debate a very controversial matter, which is the Easter Sunday attack.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
So, shall we start the Debate, Hon. Member?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, please hear me out. Before I move this Motion, I need an assurance from you that we would be protected under the Parliament (Powers and Privilege) Act because this is a very controversial Debate. If you all are unable even to let a Member raise a matter of Privilege on what he had to undergo over something he had mentioned in Parliament, within this House, you are setting a wrong precedent. In some way, we are being threatened saying, "Look, whatever you raise will be questioned". So, could you give us the assurance that we would be protected under the Parliament (Powers and Privileges) Act after speaking on this matter? Will you give us that assurance as the Deputy Speaker? I want an assurance because in what I say, there might be a lot of controversial things.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Shanakiyan Rasamanickam, I have taken note of that and it will also be recorded in Hansard. Shall we start the Debate now?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, first, will you give an assurance that our Parliamentary Privileges would be protected? That is all I am asking.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Parliamentary Privileges themselves assure your concern.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
So, my Privileges would be protected and I would not be summoned to the CID to question on this, is it?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
According to the Standing Orders of the House, it is assured.

Hon. Shanakiyan Rasamanickam, would you move your Adjournment Motion now?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. Please give me only 20 seconds.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. (Dr.) Ramanathan Archchuna, make it ten seconds, please.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු අමාත්‍යතුමා කියනවා, පාර්ලිමේන්තුව ඇතුළේ අපි මේක ගැන කථා කළොත් අපිව CID එකට ගෙන්වනවා කියලා. එතකොට කොහොමද අපි කථා කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, that is not a point of Order. That may be a private explanation.

Hon. Shanakiyan Rasamanickam, would you please move the Adjournment Motion? - *[Interruption.]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, could you control the House before I speak? There are so many Members trying to speak. So, how can I speak?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Members, would you take your seats, please?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Thank you, Sir

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

This is a very important Motion, as mentioned by Hon. Shanakiyan Rasamanickam who is due to move it. So, please save the time.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, the Hon. (Dr.) Kavinda Jayawardhana is going to second the Motion. He also has a concern. So, before I move the Motion, let him clarify that concern. Otherwise, I will have nobody to second my Motion.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Kavinda Jayawardhana, what is your concern? Could you please state it quickly?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එළියේදී කියපු කාරණයකට අපි CID එකට ගෙන්වනවා නම් ප්‍රශ්නයක් නැහැ. අපි ඒවාට භයත් නැහැ. අපි CID එකට යන්නම්; ඒවාට මුහුණ දෙන්නම්. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී කෙනෙක් වරප්‍රසාද ප්‍රශ්නයක් ඇහුවාම ඒක CID එකට refer කරන ඉතිහාසයක් අපි දැකලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

මෙතැනදී අපේ තවත් මන්ත්‍රී කෙනෙක් මාධ්‍ය ආයතනයක් පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒක "හිරු" නාළිකාවෙන් ඇහුවේ නැහැ නේ; ඒක පත්තරෙන් ඇහුවේ නැහැ නේ. ඒ නිසා මෙහෙම කරන්න එපා. ඔබතුමන්ලා වැරදි ක්‍රියාමාර්ගයක් මේ පාර්ලිමේන්තුවේ,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I have made it clear to the Hon. Member who had that same concern and he accepted what I said.

Hon. Shanakiyan Rasamanickam, Please move your Adjournment Motion. Your time starts now. You have 20 minutes.

## 2019.04.21 දින සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය
## 21.04.2019 அன்று இடம்பெற்ற உயிர்த்த ஞாயிறு தாக்குதல்
## EASTER SUNDAY ATTACK ON 21.04.2019

[12.05 p.m.]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, I move the following Adjournment Motion:

"It has been 6 years, 2 months, and 18 days since the Easter Sunday terrorist attack had taken place as of today, July 9, 2025, when this Debate is taking place. The current Government received the people's mandate not merely to investigate corruption and fraud.

Among the main promises given to the people in the Election Manifesto "A Thriving Nation, a Beautiful Life" of the National People's Power was the commitment to ensure justice for human rights violations, including immediately revealing the truth about the Easter attack.

The Government has failed to ensure justice for the massive human rights violations that occurred from the Easter attack to the recent mass murders revealed through the Chemmani mass grave. The Government has also avoided its responsibility as a government in this regard. By now, several reports have been submitted, including the Presidential Commission Report on the Easter Attack, the Malalgoda Report and the investigation report on the programme broadcast on "Channel 4". None of these reports have been presented to Parliament so far. Additionally, although the Government promised to implement the recommendations of the Presidential Commission Report on the Easter attack, this promise has not been fulfilled to date.

The National People's Power must clarify to this august Assembly why it has failed to fulfil the pledges and promises given to the international community, His Eminence Cardinal Malcolm Ranjith and the victims of the Easter attack. Therefore, I expect answers from the Government to the following questions that have arisen and remain unanswered regarding the Easter attack:

1. According to a statement made by His Excellency the President Anura Kumara Dissanayake, which appeared in an article published in 'Economy Next' magazine on February 12, 2021, the Presidential Commission Report on the Easter Attacks should be immediately presented to Parliament. "

That was stated in his statement, as reported in the "Economy Next" article of 12th of February, 2021.

"Although four years have passed since this proposal of His Excellency the President, why has this report not been presented to this House yet?

2. Did the Attorney-General's Department intervene to grant bail to Sivanesathurai Chandrakanthan alias Pillayan, who was identified by the Minister of Public Security as the mastermind of the Easter Sunday attack in this august Assembly? Was this prevented due to the objections of the Criminal Investigation Department?

3. How many DNA reports of Sara Jasmine were submitted? Will you specify the dates on which these reports were submitted, separately? Do institutions in our country possess the necessary facilities to conduct such DNA testing again?

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

4. Is there a confirmed report regarding the disappearance of a firearm revealed during investigations related to this attack, its recovery and whether the recovered firearm was the same firearm that disappeared previously? Will you inform this House about who made this confirmation?

5. Through this Motion, I propose to this House that a special prosecutor's office with international assistance be established to conduct these investigations independently, in order to ensure justice for all parties who were victims of the Easter attack, which remains an unresolved issue, and to provide necessary measures to ensure national security."

Sir, this Motion is moved two days after the President had gone on record to say that it is difficult for the Government to investigate the Government. At His Eminence Malcolm Cardinal Ranjith's 50th Anniversary of being in service to the Catholic Church, the President himself had gone on record to say that the Government finds it difficult to investigate the Government. So, it is in that background that I am moving this Motion.

I would like to start with some historical evidence on this matter, Sir.

මේ සම්බන්ධයෙන් රටේ ජනාධිපතිවරයා දවස් දෙකකට පෙර කියලා තිබෙනවා, ආණ්ඩුව විසින් ආණ්ඩුව පරීක්ෂා කිරීමේ යම් අපහසුතාවක් තිබෙනවා කියලා. එතකොට මේක ඉතා පැහැදිලියි. *[බාධා කිරීමක්]* You respond in your speech, Hon. Minister, if you want to. මතක තියාගන්න, අද ජූලි 09වන දා. මට බාධා කරන්න එපා. මේ විධියට මන්ත්‍රීවරුන්ගේ කථාවලට බාධා කළ හිටපු නායකයා -ගෝඨාභය රාජපක්ෂ- රටෙන් පළවා හැරපු දවස අද; ජූලි 09වන දා. ඒ නිසා මට බාධා කරන්නේ නැතුව අහගෙන ඉඳලා ඔබතුමන්ලාගේ වෙලාවේදී උත්තර දෙන්න. මේකත් මතක තියාගන්න, අද ජූලි 09වන දා. අද හොඳ දවසක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ප්‍රහාරය සිදු වෙන්න පෙර එහි පසුබිම ගැන අපි බලන්න ඕනෑ. මොකද, රජය මේ කටයුත්තට සම්බන්ධයි කියන එකට අනන්ත අප්‍රමාණ evidence තිබෙනවා. ඒක දැන් ආණ්ඩුවේ ජනාධිපතිතුමාත් කියලා තිබෙනවා. ආණ්ඩුව පරීක්ෂා කරන්න ඕනෑ කියලා ආණ්ඩුවේ ජනාධිපතිතුමා කියා තිබෙනවා. ඒ කියන්නේ, ආණ්ඩුවක් තමයි මේක කරලා තිබෙන්නේ. මේකේ ඉතිහාසය ගත්තොත්, -මම නවවැනි පාර්ලිමේන්තුවේත් මේ කරුණු කියා තිබෙනවා- 2004 කාලයේ සිට හමුදා බුද්ධි අංශවලින් මේ රට තුළ; විශේෂයෙන්ම නැඟෙනහිර පළාතේ මඩකලපුවේ කණ්ඩායම් නිර්මාණය කළා. ඒ දවස්වල එරාවූර්වල 17දෙනෙක්, කාත්තන්කුඩිවල 17දෙනෙක්, ඕට්ටමාවඩිවල 63දෙනෙක් -ඕට්ටමාවඩි සහ වාලච්චේන ප්‍රදේශ දෙකම එකතු කරලා 63දෙනෙක්- වශයෙන් කණ්ඩායම් නිර්මාණය කළා. ඒ කණ්ඩායම් තුනේ leadersලා හැටියට හිටියේ, සමාඩ්, ෆායිස් සහ කලීල් කියන අය. ඔවුන් තමයි ඒ ගම් තුනේ හිටපු ඒ කණ්ඩායම් තුන lead කළේ. ඒ කණ්ඩායම්වල සාමාජිකයන්ට ඒ දවස්වල Identity Cards දීලා තිබෙනවා. මා ළඟ තිබෙනවා, ඒ Identity Card එකක photograph එකක්. මේ තමයි, ෆායිස් කියන පුද්ගලයා. ඊට අමතරව මෙතැන තිබෙනවා, Identity Cards. මේ මගේ අතේ තිබෙන්නේ, 2007 වර්ෂයේ දුන්නු තාවකාලික හැඳුනුම්පතක්. මේක අත්සන් කර තිබෙන්නේ කවුද කියලා බැලුවොත්, "බුද්ධි නිලධාරි 232 බ.සේ.මූ" කියලා සඳහන් වනවා. මේ තිබෙන්නේ, මේ පුද්ගලයාට 2007දී දුන්නු Identity Card එක. මේ, තාවකාලිකව බුද්ධි සේවාවේ හිටපු පුද්ගලයෙක්. ඒ වාගේම 2010 වෙනකොට මේ පුද්ගලයාටම දීලා තිබෙනවා, හැඳුනුම්පතක්. ඒ හැඳුනුම්පත දෙන්නේ, අධ්‍යක්ෂ ජනරාල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින්. මා ළඟ මේ පුද්ගලයාගේ photograph එකක් සහ Identity Cardsවල ඡායා පිටපත් තිබෙනවා. එතුමාට අසාධාරණයක් නොවෙන්න මා මේ **සියල්ල සභාගත*** කරනවා.

2004දී ආරම්භ කළ, මම මේ කියපු සිය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ඇතුළේ හිටපු එක පුද්ගලයෙකුගේ Identity Cards තමයි මම සභාගත කළේ. මා ළඟ තවත් ඡායාරූප තිබෙනවා. ඒවා පෙන්වන එක එතරම් සුදුසු නැහැ. ඔබතුමන්ලා පරීක්ෂා කරනවා නම් ඒවා ලබා ගන්න. මේ පුද්ගලයා දැනටත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් පඩි ගන්නවා. මෙගොල්ලන්ට 2008-2009 අවුරුද්දේදී රුපියල් 17,600ක පඩියකුයි, ration pack එකකුයි ලබා දුන්නා. 2004දී ආරම්භ කරපු මේ කණ්ඩායමට පාස්කු ප්‍රහාරය එක්ක තිබෙන සම්බන්ධය මොකක්ද කියලා ඇහුවොත්,- ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2008දී මොහොමඩ් රසාක් කියලා පොලිස් නිලධාරියෙක් හිටියා. එතුමා OICගේ cook හැටියට තමයි ඉඳලා තිබෙන්නේ. ඒ, එරාවූර් පොලිසියට අනුයුක්ත පුද්ගලයෙක්. 2008දී එතුමාගේ තුවක්කුව අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ නිසා එතුමා පරීක්ෂාවට ලක් කර තිබෙනවා. තුවක්කුව නැති වෙච්ච නිසා එතුමාට ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒ තුවක්කුව ගැන හොයාගෙන යනකොට එය 2008 වර්ෂයේදී සජීක් කියලා පුද්ගලයෙක් - එතුමාගේ ඥාතියෙක් - විසින් 2004 කාලයේදී ආරම්භ කරපු මේ group එකට අදාළ Islamic Centre කියන ආයතනයේ ලේකම් හැටියට ඉන්න පුද්ගලයෙකුට විකුණපු බවට ඒ අවස්ථාවේ අනාවරණය වෙලා තිබෙනවා. හැබැයි, එතැනින් එහාට ඒ තුවක්කුව පිළිබඳව කවුරුත් සොයලා නැහැ. ඒ තුවක්කුව නැති වුණා. ඒ තුවක්කුව නැතිවෙච්ච නිසා මොහොමඩ් රසාක් කියන පුද්ගලයාට නඩු දමා තිබුණා. ඔහු හිරේ ගියාද මම දන්නේ නැහැ. මා ළඟ ඒ නඩු වාර්තාව නැහැ. හැබැයි, ආණ්ඩුවට පුළුවන් මේ සම්බන්ධයෙන් හොයලා බලන්න. රසාක් කියන පුද්ගලයාගේ තුවක්කුව නැති වුණා. ඊට පසුව සයින්දමරුදුවලදී safe house එකක් ඇතුළට ගිහිල්ලා කණ්ඩායමක් අත්අඩංගුවට ගන්නකොට රිල්වාන් ඇතුළු ඒ කණ්ඩායම භාවිත කර තිබුණේ, 2008දී නැති වෙච්ච ඒ තුවක්කුව. ඒක එරාවූර් පොලිසියේ stock එකේ තිබෙන්න ඕනෑ තුවක්කුවක් බව අනාවරණය වෙලා තිබෙනවා.

ඒ තුවක්කුව එතැනින් ගියේ කොහොමද කියලා බලමු. මේ හා සම්බන්ධ; සහරාන්ගේ කණ්ඩායමත් එක්ක සම්බන්ධ 63දෙනෙක් නුවරඑළියේ training එකකට ගියා. ඒ 63දෙනාගේම ලැයිස්තුව මා ළඟ තිබෙනවා. ඒ ගියපු 63දෙනා අතරේ ඉන්නවා තව රසාක් කෙනෙක්. ඔහුගේ නමත් රසාක්; තව රසාක් කෙනෙක් ඉන්නවා. මම හිතන විධියට, මේ රසාක් කියන පුද්ගලයා - ඒ, නුවරඑළියේ training ගිය පුද්ගලයා - අත්අඩංගුවට අරගෙන ඇප මත නිදහස් වෙලා ඉන්නවා. මේවා ඔක්කෝම යම් යම් කාලවකවානුවල යම් යම් පුද්ගලයන් විසින් ජනාධිපති කොමිසමේදී සඳහන් කරලා තිබෙනවා. මගේ මේ Motion එකේ 4වැනි කාරණය විධියට මම ඉතා ඕනෑකමින් අහන්නේ මේ තුවක්කුව පිළිබඳව මේ වනකල් පරීක්ෂණයක් කරලා තිබෙනවාද කියලායි. මම මේ කාරණය පිළිබඳව වැඩිදුර විස්තර කියන්න කැමැති නැහැ. මේ තුවක්කුව පිළිබඳව පරීක්ෂණයක් කර තිබෙනවාද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඊළඟ කාරණය මේකයි. ඒ පාස්කු ප්‍රහාරය සිදු වෙච්ච දවසේම නියාස් කියලා පුද්ගලයෙකුට point-blank වෙඩි තියලා තිබෙනවා. සයින්දමරුදුවලදී එයාගේ body එක හම්බ වෙනවා. ඒ නියාස් කියන පුද්ගලයා Nintavur safe house එකේ ඉන්නවා කියලා බුද්ධි තොරතුරක් හරි මොනවා හරි තොරතුරක් ලැබිලා තිබෙනවා. දැන් ඉන්න ආණ්ඩුවේ අය මේකට කලබල වෙන්න ඕනෑ නැහැ. දැන් ඉන්න ආණ්ඩුවේ අය නොවෙයි කළේ. වෙච්ච දෙයක් මම මේ කියන්නේ. ඒ නියාස් කියන පුද්ගලයා Nintavur safe house එකේ ඉන්නවා කියලා කිව්වාම Nintavur safe house එක ගැන ඒ තොරතුරු දුන්නු මනුස්සයා බස් එකේයි ගෙන්වාගෙන තිබෙන්නේ. සාමාන්‍යයෙන් කාගෙන් හරි තොරතුරක් හම්බ වුණාම එයාව වාහනයක දාගෙන safe house එක තිබෙන තැනට ගිහිල්ලා බලලා නේ අවශ්‍ය පියවර ගන්නේ. නමුත්, ඒ මනුස්සයාව බස් එකේයි ගෙන්වාගෙන තිබෙන්නේ. ඊට පස්සේ මහදි නවත්තලා, motorbike එකක අරන් ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ ඒ නියාස් කියන පුද්ගලයා නින්දවූර්වලදි අත්අඩංගුවට ගන්න එකට ඒ අවස්ථාවේ හිටපු පොලීසිය හෝ බුද්ධි අංශ එකඟ වුණේ නැහැ. ඊට පස්සේ ඒ නියාස් කියන පුද්ගලයා මැරිලා සයින්දමරුදුවලදී තමයි body එක හම්බ වෙන්නේ. එතකොට මේක ගැන අපිට විශාල සැකයක් ඇති වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ආණ්ඩුවේ මැදිහත්වීමකින් සිදු වෙච්ච එකක්. එහෙම නැත්නම් කොහොමද ඒ පුද්ගලයා එතැනට එන්නේ? මේ වාගේ කාරණා ගොඩක් මතු කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි, සාරා ජෙස්මින් ගැන කියනකොටත්. සාරා ජෙස්මින්ගේ DNA testsවලට අදාළව, තුන්වෙනි පාර තමයි එය සාරා ජෙස්මින්ගේ බව කියන්නේ. සාරා ජෙස්මින්ගේ body එක පිච්චුනා කියලා කියනවා. හැබැයි අප්‍රේල් මාසයේ 25වැනි දා සාරා ජෙස්මින්ගේ Identity Card එක උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, සාරා ජෙස්මින් පිච්චෙනකොට, Identity Card එක ඒ අවස්ථාවේ - බිල්ඩිම කුඩුවෙන කොට - කොහේ හරි පිච්චෙන්නේ නැති තැනක පරිස්සමෙන් තිබ්බාද කියලා; එහෙම තියලාද සාරා ජෙස්මින් නැති වුණේ කියලා. මගේ Motion එකේ තිබෙන ප්‍රශ්නයක් තමයි තුන්වැනි පාරටත් DNA test එක කළා නම් එය සනාථ කරන්නේ කොහොමද, ඒ DNA test එක කරපු දින වකවානු දෙන්න පුළුවන්ද කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිට මේ පිළිබඳව විශාල විශාල විශාල ප්‍රශ්න කිහිපයක් මතු වෙනවා.

මේ ආණ්ඩුව කරගෙන යන යම් ප්‍රගතිශීලී වැඩ කටයුතු පිළිබඳවත් මම සුබ පතන්න ඕනෑ, ප්‍රශංසා කරන්න ඕනෑ. පිල්ලෙයාන්, ඉනියභාරතී ඇතුළු කණ්ඩායම අත්අඩංගුවට ගැනීම, ඇත්තටම we welcome that. මොකද, පසුගිය කිසිම රජයක් පිල්ලෙයාන් හෝ ඉනියභාරතී වැනි පුද්ගලයන් arrest කළේ නැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ ඒ අය arrest කරලා තිබෙනවා; පරීක්ෂණ පවත්වාගෙන යනවා. අපි ඇත්තටම ප්‍රශංසා කරනවා, මේ ආණ්ඩුවේ ඒ ක්‍රියාවලියට. මේ පිල්ලෙයාන්ලා අත්අඩංගුවට අරගෙන ඉන්න කොට ගරු ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "මහ මොළකරු පිල්ලෙයාන්" කියලා. දැන් අපිට ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ ඒකයි. ඒ නිසා පිල්ලෙයාන් සම්බන්ධයෙන් පාස්කු ප්‍රහාරයට පිළිබඳව පවත්වාගෙන යන විමර්ශන පිළිබඳව අපිට අනාවරණයක් අවශ්‍යයි. පිල්ලෙයාන් පහුගිය කාලයේ කරපු තව වැරදි තිබෙනවා. ජෝසප් පරරාජසිංහම් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට වෙඩි තියලා ඝාතනය කරපු එක පිළිබඳව මම කලින් සඳහන් කරපු, 2004දී පාච්චිච් කරපු ඒ කණ්ඩායමේ කලීල් කියන පුද්ගලයාව අත්අඩංගුවට ගත්තා. සමාඩ්, ෆායිස්, කලීල් කියන පුද්ගලයෝ තුන්දෙනා තමයි ඒ කණ්ඩායම run කළේ. ඒ කලීල් කියන පුද්ගලයා ජෝසප් පරරාජසිංහම්ගේ murder case එකේදි arrest වුණා. එයා පිල්ලෙයාන් එක්ක හිරේ ඉඳලා පිල්ලෙයාන් එක්කම නිදහස් වුණා. හැබැයි අදටත් එයා ඉන්නවා, එළියේ. එයාත් එක්ක වැඩ කරන මුසම්මිල් කියලා තව පුද්ගලයෙක් තවම එළියේ ඉන්නවා. අදටත් ඒගොල්ලන් හමුදාවේ බුද්ධි අංශයට, Civil Defence Force එකට උදව් කරනවා වෙන්න පුළුවන්. මම ගාව photograph එක තිබෙනවා. මම ඒක එවන්නම්. ඒ කලීල් කියන පුද්ගලයා අද වෙනකල් අත්අඩංගුවට අරගෙන නැත්තේ ඇයි? එයාත් ජෝසප් පරරාජසිංහම්ගේ ඝාතනයට සම්බන්ධ පුද්ගලයෙක්. මේ ඔක්කෝම සිදු වෙන අතරතුරේ පිල්ලෙයාන්ට ඇප දෙන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ වුණා කියලා අපිට දැනගන්න ලැබෙනවා. හැබැයි ඒකට CID එක object කළා කියලාත් දැනගන්න ලැබෙනවා. අපි දන්නේ නැහැ මේකේ ඇත්ත නැත්ත. මම ඉංග්‍රීසියෙනුයි සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළේ. එහි තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න.

ඒ වාගේම, මම මේ කාරණයත් කියන්න ඕනෑ. මඩකලපුව, වාකරේ ප්‍රාදේශීය සභාව පිහිටුවීමේදී ඔබතුමන්ලාගේ පක්ෂයේ ඒ ප්‍රදේශය නියෝජනය කරන පුද්ගලයෙක් වාකරේ ප්‍රාදේශීය සභාවේ පිල්ලෙයාන්ගේ කෙනෙක් සභාපති හැටියට පත් කරන්න සහයෝගය දෙන්න කියන ඉල්ලීම එතැනට ඇවිල්ලායි කළේ. එක් පැත්තකින් පිල්ලෙයාන්ට ඇප දෙන්න හදනවා. ඒ වාගේම පිල්ලෙයාන් එක්ක එකතු වෙලා සභා පිහිටුවනවා. ඉතින් මේවා පිළිබඳව අපිට බරපතළ ගැටලුවක් තිබෙනවා. මොකද, 2024 ජනාධිපතිවරණය කාලයේදී පිල්ලෙයාන් කිව්වා, ජේවීපී එකෙන් තමන්ගෙන් weapons ඉල්ලුවා, තමන් ඒ weapons දෙන්න බැහැ කිව්වා කියලා. එහෙම නම්, මේ ඔක්කොම අහනකොට රටේ ජනතාවට යම් සැකයක් ඇති වෙනවා.

පිල්ලෙයාන් පසුගිය කාලයේ කරපු දේවල් ගැන පරීක්ෂණ කරගෙන යනවා. අපි ඒකට ප්‍රශංසා කරනවා, අපි ඒකට support කරනවා. තව පරීක්ෂණ පවත්වන්න. අපි උදවු කරන්නම්. අපි දන්නා කාරණාත් දෙන්නම්. අපි දෙන සාක්ෂිකරුවන්ගේ, අපි දෙන විත්තිකරුවන්ගේ ආරක්ෂාවත් ඔබතුමන්ලා සපයන්න ඕනෑ. මොකද, එතුමන්ලාගේ ආරක්ෂාව ඉතාම වැදගත්. නැත්නම් එතුමන්ලා ඉදිරියට සාක්ෂි දෙන්නේ නැති වෙයි. ඔබතුමන්ලා ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් මේ ගරු සභාවට කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කොහෙන් හරි මේකේ ඇත්ත හොයන්න එපායැ. Not just with regard to this case - the Easter Sunday attack is only one incident - but there are many other crimes on which we are pursuing for justice and accountability. For justice and reconciliation to take place, accountability and finding out the truth are absolutely important. But, why is the Government not moving on with certain cases when it could? As you know, Asad Moulana has given a full statement to the UN. When the UN High Commissioner visited, why were you not able to speak to him and obtain that full statement? Now that the law had been amended by the Hon. Minister of Justice and National Integration, where statements given by witnesses on a case overseas could be taken up here, why are we not trying to record his statement from wherever he is at the moment? එයා ලංකාවට ගෙන්වාගන්න එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා කියලා අපට ආරංචියක් තිබෙනවා. ඉතින්, නීතියත් amend කරලා තිබෙන නිසා UN High Commissioner ආවම එය ඉල්ලා ගන්න තිබුණා. ඇයි, ආණ්ඩුව තවම ඒකට මැදිහත් වෙන්නේ නැත්තේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව වාර්තා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා තමයි, මලල්ගොඩ වාර්තාව,

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව, පාස්කු ප්‍රහාරය පිළිබඳව "Channel 4" එකේ ගිය ඒ documentary එක පිළිබඳ වාර්තාව. ඇයි, මේ කියන වාර්තා තවම පාර්ලිමේන්තුවේ සභාගත කරලා නැත්තේ? මේවා සභාගත කරන්න කියන ඉල්ලීම මම නොවෙයි ඉස්සෙල්ලාම කළේ. මේ ඉල්ලීම කරලා තිබෙන්නේ අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වෙන්න පෙර. එතුමා 2021 පෙබරවාරි 12වන දින කියලා තිබෙනවා, පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව මේ ගරු සභාවේ සභාගත කරන්න කියලා. මේ ජනාධිපතිතුමා එදා කරපු ඒ ඉල්ලීම තමයි මම නැවත වාරයක් ඔබතුමන්ලාගෙන් කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Sir.

Winding up, I would like to say that these are concerns that have come up in the past as well. The Easter Sunday attack is a six-year-old matter. But, we are also still struggling to find justice for crimes that were committed, maybe, in the '90s. The matter of the Chemmani mass graves is another example. By moving on that matter, you can prove to the people of this country that your Government is serious on accountability and reconciliation. Human skeletons have been unearthed at the Chemmani mass graves based on a statement made by a convict of the murder of Krishanthi Kumaraswamy; based on that convict's statement is how those mass graves are now being exhumed. Sir, in 1998 or 1999, 15 skeletons were exhumed. What we heard last about those skeletons was that they are kept in Glasgow in Scotland; that is what we heard last, that those exhumed skeletons were taken to Glasgow. So, it is very clear that this Government does not have the technical expertise to pursue investigations on the skeletons that are being exhumed in Jaffna at the moment. The case that was filed on the skeletons of those 15 people in 1998/1999 is still pending in Colombo! That case was initially started in Jaffna. Then, it was cited that there was no safety in travelling to Jaffna and it was later moved to Anuradhapura. That case, Hon. Minister of Justice, is still pending in the Colombo Court. So, why do we not restart that case? Those skeletons that were identified in 1998/1999 were found in a place adjacent to where the excavations are happening right now. The 15 skeletons are now in Glasgow. I saw a statement by the -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could you please wind up? Your time is up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir. Please give me one more minute.

Sir, I would like to read a statement made by Uma Kumaran, MP in the British Parliament, which she has also published on her "X" account. There, she has tagged the Foreign Secretary of the British Parliament. In her statement, she states, I quote:

> "In today's @CommonsForeign , I asked the Foreign Secretary what steps the UK is taking to ensure accountability and about referral to the ICC.
>
> I very much welcome his confirmation that he's happy to look at what further technical expertise the UK can provide."

That is about the mass graves in Chemmani and she has said that in the British Parliament. I also **table*** the letter she has sent to the Foreign Secretary as well.

So, what I say, Sir, is that to have meaningful reconciliation in this country, accountability is the key. Let it be the Easter Sunday attack, the Chemmani mass graves or the other mass graves that were found in Kokkuthoduvai and even in Matale or let it be the murders of Krishanthi, Premini, Vijitha in Batticaloa or the murder of Rifaya in Batticaloa, but accountability is the key. So, Sir, this is a good opportunity. The President has also said that it is difficult for the Government to investigate the government. We all know that. The deep state's involvement, any government would struggle to investigate.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have far exceeded your time. Please wind up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

Therefore, what I am suggesting to this House is that we must start a special prosecutor's office with international involvement so that people would come forward to give evidence.

Then, there will be trust in it. I am sure this is what the Catholic Church would also tell you, if you would really ask them because unless there is an international investigation on this matter, we would never find justice. Justice would not be served, if we do not have an international mechanism. Therefore, the Government

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

must immediately take action to start an international investigation, not only on the Easter Sunday attack, but also on all the atrocities committed against the people of Sri Lanka.

Thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana to second the Adjournment Motion. You have seven minutes.

[අ.භා. 12.25]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මැතිතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය කියන්නේ ඉතාම බිහිසුණු, ම්ලේච්ඡ ප්‍රහාරයක්. විශේෂයෙන්ම මේ ප්‍රහාරයට ලක් වුණු අහිංසක ජනතාවට යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරනවා කියලා තමයි වර්තමාන රජය බලයට ආවේ. කිසිදු රජයක්, කිසිදු ජනාධිපතිවරයෙක්, කිසිදු පක්ෂයක් කරපු නැති දෙයක් වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා කළා. ඒ තමයි, පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයේ පළමුවෙනි බෝම්බය පත්තු වූ කටුවාපිටිය දේවස්ථානයට ගිහිල්ලා ඒ වින්දිතයන් ඉදිරිපිට, ගරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඉදිරිපිට, කතෝලික පූජකවරුන් ඉදිරිපිට, විශේෂයෙන්ම අපේ අල්තාරයේ ඉඳගෙන දෙවියන් වහන්සේ ඉදිරිපිට පොරොන්දුවක් දුන්නා, මේ ප්‍රහාරය කාලයේ වැලි තලාවට යට වෙන්න දෙන්නේ නැහැ කියලා. හැබැයි, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මොකක්ද වෙලා තිබෙන්නේ? අද වනකොට මේ පරීක්ෂණවල ප්‍රගතිය ගරු පාර්ලිමේන්තුවටවත්, රටේ ජනතාවටත් දැන ගන්න තියන්නේ නැහැ. එහෙම කටයුතු කරලා නැහැ.

ඒ විතරක් නොවෙයි. ඉස්සර කිව්වා, මේකට දේශපාලන අධිකාරිය සම්බන්ධ වෙලා හිටියා, මේකට රාජපක්ෂවරු සම්බන්ධ වෙලා හිටියා, බුද්ධි අංශ, හමුදාව මේ පිළිබඳව දැනගෙන හිටියා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව - CID එක - මේ ම්ලේච්ඡ ප්‍රහාරය වළක්වාගන්න කටයුතු කළේ නැහැ, ඒ අය තමන්ගේ රාජකාරිය කළේ නැහැ, දේශපාලන අධිකාරිය තමන්ගේ වගකීම් ඉෂ්ට කළේ නැහැ කියලා. හැබැයි, වර්තමාන ජනාධිපතිවරයා 2025 හත්වෙනි මාසයේ 7වැනි දා අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ පූජක දිවියට වසර 50ක් පිරීම - golden jubilee එකට- නිමිත්තෙන් වූ උපහාර උත්සවයට ඇවිල්ලා කිව්වා, රජයට රජය පරීක්ෂා කරන්න අපහසුයි, ඒක නිසා අපහසුතාවට ලක් වෙලා තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අවුරුද්දේ අප්‍රේල් 21වැනි දා වෙනකොට මේකේ මහ මොළකරු ඉදිරිපත් කරනවා කියලා ගරු ජනාධිපතිතුමා කිව්වා. හැබැයි, කළේ මොකක්ද? CID එකට ජනාධිපති විමර්ශන කොමිෂන් වාර්තාව ලබා දීම තමයි කළේ. ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාව නීතිපතිවරයාට ලබා දීලා තිබුණා. දප්පුල ද ලිවේරා නීතිපතිවරයා කිව්වා, "මේකේ කුමන්ත්‍රණයක් තිබෙනවා" කියලා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තොරතුරු ලබා දීලා නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙන්නේ, ගරු නීතිපතිවරයාට. මේක රහස්‍ය ලියවිල්ලක් නොවෙයි. ඒකට නිලධාරීන් හතර දෙනෙකු පත් කරලා තිබෙනවා. පිටු 65,000ක් තිබෙන මේ ලියවිල්ල තවම කියනවා ඇති, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ රටේ අහිංසක මිනිස්සු මරණයට පත් වෙලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි අහනවා, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මාස 10කට වැඩි කාල සීමාවක් තුළ මේ ජනාධිපති විමර්ශන කොමිසම නිර්දේශ කරලා තිබුණු එක නිර්දේශයක් ක්‍රියාත්මක කරලා තිබෙනවාද කියලා? පුළුවන් නම්, එක නිර්දේශයක් ඉදිරිපත් කරන්න, "මෙන්න, ජනාධිපති විමර්ශන කොමිෂන් වාර්තාවේ නිර්දේශ" කියලා. "මේකේ එක, දෙක, තුන, හතර, පහ වශයෙන් කරුණු හත්සියයක් තිබෙනවා. අපි මේකෙන් මෙන්න මේ දේ ක්‍රියාත්මක කරලා තිබෙනවා" කියලා ඉදිරිපත් කරන්න.

මම දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ සභාගත කළා, "The National Catholic Committee for Justice to Easter Sunday Attack Victims"හි මෙන්න මේ ලියවිල්ල. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ආවාට පස්සේත් මම මේක සභාගත කළා. හැබැයි, මේ සභාගත කරපු ලිපිය අතිගරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් -මට පෙනෙනවා, අපේ රොෂාන් සිල්වා පියතුමා මෙතැනට ඇවිල්ලා ඉන්නවා- ඇතුළු පියතුමන්ලා අත්සන් කරපු ලියවිල්ල මේ ආණ්ඩුව තඹ සතයකට ගණන් අරගෙන තිබෙනවාද කියන එක පිළිබඳ සාධාරණ ප්‍රශ්නයක් තිබෙනවා. FBI එක හරහා ලබා දුන් ඒ IP address එකෙන් අත්අඩංගුවට ගත්ත පුද්ගලයා ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා කියලා බ්‍රිගේඩියර් චූලා කොඩිතුවක්කු-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Kavinda Heshan Jayawardhana, you have only two more minutes.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ප්‍රධාන විපක්ෂයේ සංවිධායකතුමනි, මට තව මිනිත්තු දෙකක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඔහුව නිදහස් කරනවා. ඒක කොතැනද තිබෙන්නේ? ඒක, ශානි අබේසේකර මහත්තයාගේ මානව හිමිකම් පැමිණිල්ලේ දාලා තිබෙනවා. ශානි අබේසේකර මහත්තයා තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වර්තමාන ප්‍රධානියා. පොලිස් පරීක්ෂක බණ්ඩාර කියන පුද්ගලයා දිගින් දිගටම සම්බන්ධතා පවත්වාගෙන ගිය "පොඩි සහරාන්", එහෙම නැත්නම් "මාතලේ සහරාන්" පිළිබඳව පරීක්ෂණ කරන කොට "සොනික්, සොනික්" කියන එක්කෙනා පිළිබඳව හෙළිදරවු වෙනවා. "සොනික්, සොනික්" කියන පොලිස් පරීක්ෂක බණ්ඩාර තමයි එදා අබු බකර් අල්-බග්දාදිට එහෙම නැත්නම් ISIS සංවිධානයට බෝම්බ ප්‍රහාරය

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ක්‍රියාත්මක කළා කියලා වගකීම් භාර ගන්න කියපු කෙනා. කවුද ඒක කියන්නේ? ඒක කියපු පුද්ගලයන් පිළිබඳව අද පරීක්ෂණ කරන්න පුළුවන්. ඇයි, මේ ආණ්ඩුව එහෙම කරන්නේ නැත්තේ? ඒ විතරක් නොවෙයි, අබුහින්ද් ගැන කථා කරනවා. අබුහින්ද් ගැන කථා කරන කොට, සහරාන්ට ඉහළින් හිටියේ අබුහින්ද් කියන එක ජනාධිපති විමර්ශන කොමිසමට ප්‍රකාශ කරන්නේ, රවි සෙනෙවිරත්න මහත්තයා. එතුමා අද මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්තුමා. ඒ තොරතුරු ලබා දුන්නු එතුමාට ඇයි බැරි, මේ පරීක්ෂණ කරලා, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ පිටුපස හිටපු අබුහින්ද්ලා අත්අඩංගුවට ගන්න?

ඒ විතරක් නොවෙයි, ජමීල් පිළිබඳව හෙළිදරවු වෙනවා. ජමීල් තමයි "Tropical Inn" එකේ බෝම්බය පුපුරුවා ගත්තේ. "Channel 4" වැඩසටහනේදී අසාද් මවුලානා කියන පුද්ගලයා කියනවා, දුරකථන ඇමතුමක් දීලා සලේ කියන නිලධාරියා තමයි මෙයා අරගෙන යන්න කියන්නේ කියලා. ඇයි මේ කට්ටිය ගෙනැල්ලා කටඋත්තර ගන්නේ නැත්තේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ප්‍රංශයේ ඉඳලා අසාද් මවුලානා ගෙන්වා ගන්න බැරි නම්, ප්‍රංශයට නිලධාරීන් කණ්ඩායමක් යවලා ඒ පිළිබඳව විමර්ශනය කරන්න ඇයි බැරි ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඇයි මේ ආණ්ඩුව තවම ප්‍රමාද? කවුරුද මේ ආරක්ෂා කරන්නේ? රජයේ කවුද ඉන්නේ මේ අය ආරක්ෂා කරන්න?

ඒ වාගේම මේකේ සඳහන් වෙනවා, "හමුදා බුද්ධි නිලධාරින් මේ පුද්ගලයාගේ නිවසට ගියා. එයාගේ අම්මාගේ නිවසට ගියා" කියලා. ඇයි මේ නිලධාරින් ගෙනැල්ලා ප්‍රශ්න කරන්නේ නැත්තේ?

ඊළඟට, සාරා ජස්මින් ගැන කථා කරනවා. එවකට හිටපු මන්ත්‍රීවරුන් - දැන් ආණ්ඩු පක්ෂයේ ඉන්න අය - කිව්වා, සාරා ජස්මින් ගැන.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Kavinda Heshan Jayawardhana, your additional time has also been exhausted.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
සාරා ජස්මින්ගේ DNA පරීක්ෂණ තුනක් තිබුණා. ඒ තුනෙන් එකකින් තමයි සාරා ජස්මින් කියලා තහවුරු වුණේ. අපි ඒක පිළිගන්නේ නැහැ. ඇයි ආණ්ඩුවට තව DNA පරීක්ෂණයක් කරන්න බැරි කියලා අපි අහනවා.

ගැලනිගම සිද්ධිය පිළිබඳව මට කියන්න වේලාව නැහැ. මම ඒ සිද්ධියට අදාළ ලේඛන මීට කලින් සභාගත කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒක නිසා, "The National Catholic Committee for Justice to Easter Sunday Attack Victims"හි මෙන්න මේ ලියවිල්ල අනුව කරුණාකර යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් පවත්වන්න කියන ඉල්ලීම අපි කරනවා. ඒ වාගේම, ජනාධිපති විමර්ශන කොමිෂන් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීමත් අපි කරනවා. අතිඋතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් ඇතුළු අගරදගුරුතුමන්ලා විශාල පිරිසක් මේ වෙනුවෙන් අත්සන් කරලා තිබෙනවා. අද මේ මොහොතේ මේ සභාවේ මහජන ගැලරියේ ඉන්න අපේ රොහාන් සිල්වා පියතුමනි, ඔබවහන්සේත් මේකට අත්සන් කරලා තිබෙනවා. එම නිසා මේ ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, මේ අහිංසක කතෝලික ජනතාව ඇතුළු අපේ රටේ මැරිච්ච අහිංසක මිනිස්සු වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන්න. අපි දන්නවා, මේගොල්ලන්ට යුක්තිය ඉෂ්ට කරන්න බැහැ කියලා. හැබැයි, මේ අපරාධය කළේ කවුද කියලා හෙළි කරන්න. එසේ කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister Ananda Wijepala. You have 18 minutes.

[අ.භා. 1.00]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වසර 6කට පෙරාතුව සිදු වූ පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් තමයි අද දින මේ විවාදය පැවැත්වෙන්නේ. විශේෂයෙන්ම විවාදය සඳහා යෝජනාව ඉදිරිපත් කරමින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ප්‍රකාශයක් නිවැරදි කරමින්ම මගේ කථාව පටන් ගන්න කැමැතියි. එතුමා, විශේෂයෙන්ම කාදිනල් හිමිපාණන්ගේ 50 වසරක සේවය ඇගයීම සඳහා පැවැත්වූ උත්සවයේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් කරන ලද ප්‍රකාශයක් විකෘති කිරීමක් සිද්ධ කරනු ලැබුවා. අපේ ජනාධිපතිතුමා එහිදී ප්‍රකාශ කළේ, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශන රජය විසින්, රජය පරීක්ෂාවට ලක් කරන තත්ත්වයක් දක්වා ඇවිල්ලා තිබෙනවා. ඒක කොතරම් අසීරු වුණත් අපි එය ඉෂ්ට කරනවා කියන කාරණය තමයි කිව්වේ. නමුත්, ජනාධිපතිතුමාගේ එම කථාව එතුමා විකෘති කරමින්, "ඒක අපහසුයි, ඒක අතහැර දැම්මා" වාගේ අදහසක් නිර්මාණය වන විධියේ ප්‍රකාශ මේ සභාවට ඉදිරිපත් කළා. එම නිසා මම ඒ වැරදි ප්‍රකාශය නිවැරදි කරමින්ම අද මේ විවාදයට එකතු වෙන්න අදහස් කරනවා.

2019.04.21වන දින සිදු වූ මෙම ප්‍රහාරය තුළින් විශේෂයෙන්ම කතෝලික දේවස්ථාන, හෝටල් සහ තවත් ස්ථාන පාදක කර ගනිමින් පිපිරීම් සිද්ධීන් 8ක් සිදු වුණා. මේ සිද්ධීන්වලින් විදේශිකයන් 42ක් ඇතුළුව පුද්ගලයන් 274දෙනෙක් මියගියා. ඒ වාගේම, මෙම ප්‍රහාර මාලාවෙන් පුද්ගලයන් 592කට බරපතළ තුවාල සිද්ධ වුණා. ඊට අමතරව කොළඹ කොච්චිකඩේ

ශාන්ත අන්තෝනි දේවස්ථානයට, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට, මඩකලපුව සියෝන් දේවස්ථානයට, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට, ෂැන්ග්‍රි-ලා හෝටලයට, කිංස්බරි හෝටලයට, දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයට, දෙමටගොඩ මහවිල ගාර්ඩ්න් නිවාසවලට මේ ප්‍රහාරයෙන් බරපතළ දේපළ හානි සිද්ධ වුණා. මේ සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනය කොළඹ අපරාධ කොට්ඨාසයටත්, ඉන් අනතුරුව විශේෂයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් - CID එකටත් - බාර වුණා. ඒ මූලික විමර්ශනවලදී සැකකරුවන් 747ක් අත්අඩංගුවට ගෙන තිබුණා. වැඩිදුර විමර්ශන සිදු කර ගැනීමෙන් පසුව සැකකරුවන් 101කට අධිචෝදනා ඉදිරිපත් කරමින් නඩු 42ක් පවරා තිබෙනවා.

මේ නඩු සම්බන්ධ වාර්තාව ඇමුණුම 1 ලෙස මම මේ ගරු සභාවේ **සභාගත*** කරනවා.

ඊට අමතරව, පැවති රජය විසින් මේ සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු විජිත් මලල්ගොඩ සහ හිටපු පොලිස්පති එන්.කේ. ඉලංගකෝන්, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ හිටපු ලේකම් පද්මසිරි ජයමාන්න යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් 2019.04.22 දින විමර්ශන කමිටුවක් පත් කර තිබෙනවා. එම විමර්ශන කමිටු වාර්තාව එවකට හිටපු ජනාධිපතිවරයාට බාර දීලා තිබෙනවා. මේ විමර්ශන කමිටුව බාර දුන් විමර්ශන වාර්තාව ප්‍රසිද්ධියට පත් කරලා නැහැ. අපි ඉදිරියේදී එම විමර්ශන වාර්තාව විමර්ශනය සඳහා CID එකට බාර දෙන්නත්, අවශ්‍ය නම් පාර්ලිමේන්තුවේ සභාගත කරන්නත් සූදානම්. ඉන් අනතුරුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් 2019 ජූලි මස මුලදී පත් කළා. එහිදී සාක්ෂි විභාග කර නිරීක්ෂණ, නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රනිල්-මෛත්‍රී සහ සජිත් ප්‍රේමදාස ආණ්ඩුව කාලය තුළදී තමයි මේ සිද්ධිය වුණේ. එවකට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා 2019.09.21 වැනි දින විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මහතාගේ සභාපතිත්වයෙන්, අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මහතා, විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මහතා, විශ්‍රාමික මහාධිකරණ විනිසුරු බන්දුල කුමාර අතපත්තු මහතා සහ විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. අධිකාරි යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විශේෂ ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කරනු ලැබුවා. පාස්කු ඉරු දින ප්‍රහාරය හේතු කොටගෙන ඇති වූ සිද්ධි දාමයට ඍජුව, වක්‍රව සම්බන්ධතා ඇතැයි සැලකෙන හෝ එකී සිද්ධි දාමය සම්බන්ධයෙන් වැරදි ලෙස සහ බලය හෝ අධිකාරිය අනිසි ලෙස හෝ අයුතු ලෙස යොදා ගැනීම, මහ හැරවීම්, අතපසුවීම්, නොසැලකිලිමත්කම්, අකාර්යක්ෂමතාව හා වගකීම් පැහැර හැරීම් ආදී සිදු වී ඇතැයි සැලකෙන ක්‍රියාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා දැනට සිටින තැනැත්තන්ට හෝ වෙනත් තැනැත්තන්ට එරෙහිව ඔවුන්ගේ ක්‍රියාකාරකම් නොතකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි, තොරතුරු හා වෙනත් සාක්ෂි කැඳවීම සඳහා, ඒවා ලබා ගැනීම සඳහා කොමිෂන් සභාවක් පත් කරනු ලැබුවා. ඒ කොමිෂන් සභා වාර්තාව පිටු 67,738කින්, වෙළුම් 87කින් සමන්විතයි. එම වාර්තාව 2021.01.31වැනි දින හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට පිළිගන්වා තිබෙනවා. නමුත් එම වාර්තාව පිළිබඳව එතුමා කිසිදු හෙළිදරව්වක් කළේ නැහැ.

විදේශගතව සිටින හිටපු නැගෙනහිර පළාත් මහ ඇමති සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන්ගේ මාධ්‍ය ලේකම් වන අසාද් මවුලානා විසින් පාස්කු ඉරු දින ප්‍රහාරයේ කුමන්ත්‍රණය පිළිබඳව බරපතළ, සංවේදී හෙළිදරව්වක් විදේශ රූපවාහිනී නාළිකාවක් වන "Channel 4" නාළිකාවට කරලා තිබුණා. අසාද් මවුලානා විසින් හෙළිදරව් කරන ලද තොරතුරු පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන ලෙසට කතෝලික සභාව විසින්ද, අති උතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් ඇතුළු විවිධ පාර්ශ්ව විසින්ද ඉල්ලීම් කරන ලද අතර, ඒ පිළිබඳව එවකට පැවැති රජය විසින් කිසිදු පරීක්ෂණයක් සිදු කළේ නැහැ. විශේෂයෙන්ම අති උතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් ඇතුළු කතෝලික සභාව, විවිධ පාර්ශ්ව අසාද් මවුලානාගේ ප්‍රකාශය, නැත්නම් එම වීඩියෝ පටය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඉල්ලා සිටියත් කිසිදු පරීක්ෂණයක් පවත්වන්නට කිසිදු රජයක් ඉදිරිපත් වුණේ නැහැ; ඒ සඳහා කටයුතු කළේ නැහැ. ඒ වෙනුවට 2023.09.15වැනි දින විශ්‍රාමික විනිසුරු එස්.අයි. ඉමාම් මහතාගේ ප්‍රධානත්වයෙන් පරීක්ෂණ කමිටුවක් පත් කළා. ඊට අමතරව අසාද් මවුලානාගේ හෙළිදරව් කිරීම විමර්ශනය කිරීම සඳහා 2024.06.12වැනි දින විශ්‍රාමික මහාධිකරණ විනිසුරු ජයකි ද අල්විස් මහත්මිය යටතේ තවත් පරීක්ෂණ කමිටුවක් පත් කළා. එම පරීක්ෂණ කමිටු දෙකම පත් කළේ, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින්. කතෝලික සභාවත්, අති උතුම් මැල්කම් රංජිත් කාදිනල්තුමාත් විසින් එම කමිටුව කිසිදු විශ්වාසයක් නැති, පූර්ණ විශ්වාසයක් නැති කමිටුවක් බවත්, එහි තීරණ පිළිනොගන්නා බවත්, එහි තීරණ ප්‍රතික්ෂේප කරන බවත් ප්‍රකාශ කරන ලද අතර, ඒ කමිටු වාර්තාව හිටපු ජනාධිපතිවරයාට භාර දීමට කටයුතු කරලා තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, මේ රටේ සමස්ත ජනයාත් දන්නවා, අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා පසුගිය මැතිවරණයේදී සිය මැතිවරණ ප්‍රකාශයේත් මේ පිළිබඳව සඳහන් කළ බව. පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් කරන්න අවශ්‍යයි; මේ රටේ ජනයාට යුක්තිය ඉෂ්ට කරන්න අවශ්‍යයි; කතෝලික ජනයාට, මුළුමහත් සමාජයට යුක්තිය ඉෂ්ට කරන්න අවශ්‍යයි; වැරදිකරුවන් නීතියේ රැහැනට හසුකර ගන්න අවශ්‍යයි කියලා එතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම කටුවාපිටිය දේවස්ථානයේ දීත් ඒ ප්‍රකාශය කළා. ඒ වාගේම අපේ මැතිවරණ ප්‍රකාශවලත් ඒ ගැන සඳහන් කළා. අපි මේ වෙනකොට ඒ ආකාරයෙන්ම විධිමත් පරිදි විමර්ශන ආරම්භ කරලා තිබෙනවා. මෙතැන කථා කරන බොහෝ අය කථා කරන්නේ, පාස්කු ඉරිදා ප්‍රහාරය හරියට අපේ කාලයේදී සිද්ධ වුණා වාගේයි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ දී ගොළුවන්, බිහිරන් සේ හිටපු අය අද තමන් කොතැනද ඉන්නේ කියලා දන්නේ නැතුව; කොතැනද හිටියේ කියලා දන්නේ නැතුව විවිධ ප්‍රකාශ කරනවා. එය පුදුමයට කාරණාවක්; කනගාටුවට කාරණාවක්.

අපේ ජනාධිපතිතුමා ප්‍රකාශ කළා සේම, ජනතාවට පොරොන්දු වුවා සේම, කතෝලික සභාවටත් අති උතුම් කාදිනල් හිමිපාණන් වහන්සේටත් ප්‍රකාශ කළා සේම, අපි මේ විමර්ශන විධිමත් අයුරින් ආරම්භ කරලා තිබෙනවා, එම විමර්ශන ඉතා ම සාර්ථකව ඉදිරියට යමින් පවතිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම විමර්ශන කටයුතුවලට බාධා වන නිසා සමහර කාරණා මෙම ගරු සභාවට හෙළි කරන්න මම කැමැති නැහැ. එහෙත්, හෙළි කළ හැකි සෑම කරුණක්ම මෙම ගරු සභාවට හෙළි කරන්න මා සූදානම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආනන්ද විජේපාල මහතා]

විශේෂයෙන් 2019.04.21 දින සිදු වූ පාස්කු ප්‍රහාරයේ විමර්ශන එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාර්ථකව ඉදිරියට ගෙන ගියද, 2019.11.18වන දින සිදු වූ ආණ්ඩු මාරුවෙන් පසුව -ඒ කියන්නේ, ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පත් වීමෙන් පසුව- එම විමර්ශන නිසි ලෙස සිදු කිරීමට අවශ්‍ය පහසුකම් ලබා නොදී, එම බලයට පැමිණි රජය විසින් හිතාමතාම එම විමර්ශන දුර්වල කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන භාරව සිටි නිලධාරින් ඉවත් කළා. විශේෂයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ එම විමර්ශන සිදු වුණා. එම නිලධාරින් ස්ථාන මාරු කරලා යැව්වා. ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත්තා. ඔවුන් ඒ විමර්ශනවලින් ඉවත් කරලා බාධා කළා. විමර්ශනය අවසන් කළා.

2024.09.21වන දින පැවැත්වූ ජනාධිපතිවරණයෙන් අනුර කුමාර දිසානායක මහතා ජයග්‍රහණය කිරීමෙන් පසුව, 2024.09.23 ඉඳලා ජනාධිපතිවරයා දිවුරුම් දීමෙන් පසුව සත්‍ය ලෙසම එම විමර්ශනය නැවත ආරම්භ කරන්න කටයුතු කළා. දැන් එම විමර්ශන කටයුතු සාර්ථකව ඉදිරියට යමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024.09.23වන දින නව ජනාධිපතිවරයා බලයට පත්වීමෙන් පසු පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශන සඳහා 2019 වසරේ සිට කටයුතු කරන ලද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉවත් කරන ලද සමහර නිලධාරින් නැවත CID එකට කැඳෙව්වා. ඔවුන් CID එකට කැඳවා එම විමර්ශන නැවත ආරම්භ කරන්න කියලා උපදෙස් දුන්නා. ඒ අනුව එම විමර්ශන නැවතත් ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය පියවර දැන් අපි අරගෙන තිබෙනවා.

ඒ වාගේම හන්සීර් අසාද් මවුලානා විසින් සිදු කළ හෙළිදරව්ව පිළිබඳව නීතිපතිවරයාගේ උපදෙස් ලබාගෙන දැනට පාස්කු ප්‍රහාරය පිළිබඳව විභාග වන නඩුවට බාධාවක්, අවහිරයක් නොවන ආකාරයට නව විමර්ශනයක් බී 35882/2024 යටතේ 2024.11.13වන දින කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව අපි එම විමර්ශන කටයුතු ආරම්භ කර තිබෙනවා, ගරු නීතිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ.

මෙතැන කාරණා කිහිපයක් මතු වුණා, නීතිපතිතුමා සම්බන්ධයෙන්. ඒ, පිල්ලෙයාන් මහතාට ඇප දෙන්න මැදිහත් වුණා කියලා. එහෙම කිසිදු මැදිහත් වීමක් සිද්ධ වෙලා නැහැ. ඒ කාරණාව අපි ප්‍රතික්ෂේප කරනවා. දැනට CID එකත්, පොලීසියත්, විශේෂයෙන් නීතිපතිතුමාගේ මැදිහත් වීම මත එම විමර්ශන ඉතාම සාර්ථකව ඉදිරියට කරගෙන යනවා.

මීට අමතරව පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව අවුරුදු තුනකට පසුව, 2025.04.20 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ගරු ජනාධිපතිතුමා විසින් මේ වනකොට ලබා දීලා තිබෙනවා. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ එම වාර්තාව ප්‍රසිද්ධියට පත් කළේ නැහැ. ඔහු එය සඟවාගෙන හිටියා. අපට අවශ්‍යයි, එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙරාතුව එහි තිබෙන සංවේදී කාරණා පිළිබඳව පරීක්ෂා කරලා සැබෑ විමර්ශනයක් කරන්න. සැබෑ අපරාධකරුවෝ නීතිය ඉදිරියට ගෙනෙන්න අපට අවශ්‍යයි. ඒ වෙනුවෙන් අපි විමර්ශනයක් ආරම්භ කරලා තිබෙන්නේ. අපි එම විමර්ශනය සාර්ථකව කරනවා කියලා නැවත නැවත මේ සමාජයටත්, කතෝලික ප්‍රජාවටත් කියනවා. අපි මේ විමර්ශනය සාර්ථකව අවසන් කරලා, මේකට වගකිව යුතු ඇත්ත පුද්ගලයෝ මොන තරාතිරමේ අය වුවත් ඔවුන් නීතියේ රැහැනට හසු කර ගන්න කටයුතු කරනවා කියන එක මේ අවස්ථාවේ ගරු සභාවට පොරොන්දු වනවා.

විශේෂයෙන් 2024.11.13වන දින කරන ලද අසාද් මවුලානාගේ හෙළිදරව්ව අනුව පාස්කු ප්‍රහාරය පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයේදී එහි කුමන්ත්‍රණයක් පැවැති බවද, පාස්කු ප්‍රහාරය සිදු කළ සහරාන් හෂීම් යන අයව මෙහෙයවීම සඳහා ඊට ඉහළින් යමෙක් සිටියාද, එම කණ්ඩායමට සහාය ලබා දුන් බාහිර පාර්ශ්ව කවුරුන්ද යන්න පිළිබඳව දැන් දීර්ඝ ලෙස විමර්ශනයක් සිදු කෙරෙමින් පවතිනවා. එම විමර්ශනයෙන් හෙළිවූ කරුණු පිළිබඳව තව ඉතාම කෙටි කාලයක් තුළ අධිකරණයට කරුණු වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු කරනවා. ඒ හරහා තව විශාල තොරතුරු ප්‍රමාණයක් හෙළිදරව් කර ගන්න හැකියාව ලැබෙනවා.

පාස්කු ප්‍රහාරයට පෙරාතුව, එනම් 2018.12.26 දින මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිමවලට පහරදී අලාභ හානි කිරීමේ සිද්ධිය හා සම්බන්ධ විමර්ශනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාර්ථකව විමර්ශනය කර සැකකරුවන්ට විරුද්ධව කෑගල්ල ත්‍රිපුද්ගල මහාධිකරණයේ TAB 4485/21 යටතේ අධි චෝදනා 21ක් මඟින් වූදිතයන් 16කින් 13දෙනෙකුට නඩු පවරා වරදකරුවන් කර සිරගත කර තිබෙනවා.

එලෙසම මේ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ තවත් සිදුවීමක් 2018.11.30වන දින සිදුව තිබෙනවා. මේ සිදුවීමත් ඉතා වැදගත් එකක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාස්කු ප්‍රහාරයට පෙරාතුව 2018.11.30වෙනි දා වවුනතිව් ප්‍රදේශයේ තිබෙන පොලිස් මුර පොළේ හිටපු නිලධාරින් දෙදෙනෙකු ඉලක්ක කරගෙන වෙඩි ප්‍රහාරයක් හා මුවහත් ආයුධවලින් ප්‍රහාරයක් සිදු කරලා ඔවුන් මරණයට පත් කිරීමේ සිද්ධියක් වුණා. මේ පොලිස් නිලධාරින් දෙදෙනාගේ ඝාතනය සම්බන්ධයෙන් කළ විමර්ශනයේදී හිටපු එල්ටීටීඊ සාමාජිකයෙකු වන අජන්තන් මීට වගකිව යුතුයි කියලා අත්අඩංගුවට ගන්නවා. ඊට සාක්ෂි ලෙස අජන්තන් පැළඳ සිටි යතුරුපැදි කබාය අපරාධ ස්ථානයට නුදුරෙන් බෝක්කුවක් යට තබා මෙම අපරාධය අජන්තන් නැමැති හිටපු එල්ටීටීඊ සාමාජිකයා විසින් සිදු කළා යැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ඒත්තු ගැනෙන පරිදි අසත්‍ය සාක්ෂියක් නිර්මාණය කර, විමර්ශන නොමඟ යැවීමට සිදු කළ උත්සාහය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ වනකොට කරුණු අනාවරණය කරගෙන තිබෙනවා. වවුනතිව් ප්‍රහාරය සම්බන්ධයෙන් එකල පැවැති, එකල සිදු කළ විමර්ශනය වැරදි විමර්ශනයක්, අසත්‍ය විමර්ශනයක්, පරීක්ෂණ කටයුතු නොමඟ යවන විමර්ශනයක් කියලා මේ වනකොට කරුණු පැහැදිලි කරගෙන තිබෙනවා. මේ සිද්ධිය සම්බන්ධයෙන් බුද්ධි අංශ නිලධාරියෙකු අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඉතිරි සැකකරුවන් නුදුරේදීම අත්අඩංගුවට ගන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ බුද්ධි සේවාවල දහස් ගණනක් නිලධාරින් ඉන්නවා. ඔවුන් මහත් කැපවීමෙන් හා මැදිහත් වීමෙන් යුතුව කටයුතු කරනවා. ගරු ජනාධිපතිතුමා නිතර ප්‍රකාශ කරනවා වාගේම රාජ්‍ය සේවයේත්, විවිධ තලවලත් ඉන්න සුළු පිරිසක් දේශපාලන වුවමනා වෙනුවෙන් කරන වැරදි ක්‍රියා නිසා යම් යම් අපකීර්තිමත් තත්ත්වයන් ඇති වෙනවා. රාජ්‍ය බුද්ධි සේවයේත්, හමුදා බුද්ධි සේවාවලත් විශාල පිරිසක් අතිමහත් කැපවීමෙන් හා මැදිහත්වීමෙන් යුතුව අවංකව කටයුතු කරන අතර, ඉතාම සුළු පිරිසක් දේශපාලන වුවමනා වෙනුවෙන් කටයුතු කළ අවස්ථා ඕනෑවටත් වඩා අනාවරණය වෙලා තිබෙනවා. මා මේ අවස්ථාවේ මේ සභාවට ඒ කාරණා පිළිබඳවත් මතු කරන්න කැමැතියි.

විශේෂයෙන් වවුනතිව් පොලිස් මුර පොළේ රාජකාරියේ නිරතව සිටි පොලිස් නිලධාරින් දෙදෙනා ඝාතනයට භාවිත කරන ලද ටී 56 ගිනි අවිය පිළිබඳව මෙතැනදි කරුණු ඉදිරිපත් වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have two more minutes only.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව සුළු වෙලාවක් ලබා දෙන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට මගේ කාලයෙන් කොටසක් ලබා දෙනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
එම ටී 56 වර්ගයේ ගිනි අවිය 2019.04.26වන දින සායින්දමරුදු-බොලිවේරියන් ගම්මානයේ බෝම්බ පුපුරවාගත් ස්ථානයේ වෙඩි වැදී මියගොස් සිටි මොහොමඩ් නියාස් නැමැත්තාගේ මළ සිරුර අසල තිබියදී හමු වූ ටී 56 ගිනි අවිය බවත්, ඊට වසර කිහිපයකට පෙර එරාවූර් පොලිස් ස්ථානයට අනුයුක්තව සිටි සිවිල් ආරක්ෂක භටයෙකු සතුව තිබීයදී අස්ථානගත වූ ටී 56 ගිනි අවිය බවත් රස පරීක්ෂක වාර්තාවෙන් තහවුරු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම වවුනතිව් පොලිස් මුර පොළේ සිටියදී ඝාතනය වූ පොලිස් නිලධාරින් දෙදෙනා සතුව තිබූ රිවෝල්වර ගිනි අවි දෙකෙන් එක් ගිනි අවියක් වනාතවිල්ලුව ලැක්ටෝ වත්තේ තිබී සොයා ගත් පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි අතර තිබී ඇති අතර, අනික් රිවෝල්වරය සහරාන්ගේ රියදුරු වන පාස්කු ප්‍රහාරයෙන් පසුව අත්අඩංගුවට ගත් ගපූර් මාමා නැමැත්තාගේ ප්‍රකාශය මත නින්දවූර් ප්‍රදේශයේ ආරක්ෂිත නිවාසයක දුම් කවුළුවක සඟවා තිබියදී මෑතකදී CID එක සොයාගෙන තිබෙනවා. මේකෙන් පැහැදිලි වෙනවා, වවුනතිව් ප්‍රහාරය සම්බන්ධ විමර්ශනය නොමඟ යවනසුලු විමර්ශනයක් බවට පරිවර්තනය වෙලා තිබුණා කියන කාරණය. එහි ඇත්ත විමර්ශනය දැන් CID එක විසින් කරමින් ඇත්ත සැකකරුවන් අත්අඩංගුවට අරන් තිබෙනවා, ඇත්ත වගකිව යුත්තන් අත්අඩංගුවට අරන් තිබෙනවා, ඒ ගිනි අවි සොයාගෙන තිබෙනවා. විශේෂයෙන් මේ වවුනතිව් පොලිස් මුර පොළේ පොලිස් නිලධාරින් ඝාතනය කිරීමට අදාළ සිද්ධිමය කරුණු අනාවරණය කර ගැනීමෙන් පසු ඊට අදාළ සැකකරුවන් වන සහරාන් හෂීම්ගේ සමීපතම අනුගාමිකයන් වන මිල්හාන්, ගපූර් මාමා ඇතුළු සැකකරුවන් සිව්දෙනෙක් අත්අඩංගුවට ගෙන මේ වෙනකොට අධිකරණයට ඉදිරිපත් කරලා, බන්ධනාගාරගත කරලා තිබෙනවා. ඔවුන්ට මේ වෙනකොටත් මඩකලපුව මහාධිකරණයේ අංක 3421/21 යටතේ අධිචෝදනා පත්‍ර ගොනු කරලා නඩුව විභාග කරමින් පවතිනවා.

දැන් මෙතැනදී කිව්වා, රජය මුකුත් කරලා නැහැ, ජනතාවට පොරොන්දු දුන්නා, ජාත්‍යන්තර පරීක්ෂණ ඕනෑ කියලා දැන් මේවා අත්හැර දාලා තිබෙනවාය කියලා. නැහැ, අපේ CID එක මේ වනකොට ඒ සියලු විමර්ශන ආරම්භ කරලා තිබෙනවා. ඔවුන් නීතියේ රැහැනට හසු කර ගනිමින් තිබෙනවා. මඩකලපුව මහාධිකරණය ඔවුන්ට විරුද්ධව නඩු විභාගය ආරම්භ කරලා තිබෙනවා.

සහරාන්ගේ කණ්ඩායමේ ප්‍රබල සාමාජිකාවක් වූ පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජස්මින් 2019.04.26වැනි දින සායින්දමරුදු ප්‍රදේශයේදී සිදු වූ ස්වයං ඝාතක බෝම්බ පිපිරීමෙන් මිය ගිය බවට කරුණු අනාවරණය වූ බැවින් අවස්ථා දෙකකදී ඒ සම්බන්ධයෙන් DNA වාර්තා කැඳවා තිබුණා. ඒ පිළිබඳවත් මෙතැනදී කරුණු මතු කළා. අවස්ථා දෙකකදී ඒ සම්බන්ධයෙන් DNA වාර්තා කැඳවා තිබුණා. එම DNA ඒ අවස්ථා දෙකේදීම සාරා ජස්මින්ගේ සමීප ඥාතීන්ගේ DNA සමඟ ගැළපුණේ නැහැ. ඊට පස්සේ තුන්වැනි අවස්ථාවේදී සාරා ජස්මින්ගේ මවගේ DNA සමඟ සැසඳී තිබෙනවා. ඒ වෙලාවේදී මහජන ආරක්ෂක ඇමති වශයෙන් කටයුතු කළේ සරත් වීරසේකර මහත්මයා. එම DNA වාර්තාව සඳහා ඉදිරිපත් කරන ලද සාම්පල ලබා ගත් ක්‍රියා කලාපය ගැන බරපතළ සැක කටයුතු තොරතුරු අනාවරණය වෙලා තිබෙනවා. තුන්වැනි වතාවේදී DNA වාර්තා ලබා ගැනීමේ කටයුත්ත සම්බන්ධයෙන් බරපතළ සැකයක් ඇතිවෙලා තිබෙනවා. අවස්ථා දෙකකදී එය ප්‍රතික්ෂේප වුණා. ඒ අවස්ථා දෙකේදීම DNA වාර්තා ගැළපුණේ නැහැ. හැබැයි, තුන්වැනි අවස්ථාවේදී DNA වාර්තා ගැළපිලා තිබෙනවා. එම ක්‍රියාදාමය පිළිබඳව මේ වනකොට බරපතළ සැකයක් මතුවෙලා තිබෙනවා. මේ කාරණය බරපතළ හා සංවේදී කාරණයක් වන බැවින් ඒ පිළිබඳව වැඩිදුරටත් මම මේ වෙලාවේදී මේ සභාවට කරුණු හෙළි කරන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් අවශ්‍ය අවස්ථාවලදී අධිකරණයට කරුණු වාර්තා කරන්න සූදානමින් ඉන්නවා.

පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජස්මින් 2019.04.26වැනි දින සායින්දමරුදු ප්‍රහාරයේදී මිය ගියාද, නැද්ද යන්න පිළිබඳව දැන් බරපතළ සැකයක් මතුවෙලා තිබෙනවා. ඒ අතර මේ වනකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව ගැඹුරු විමර්ශනයක් සිදු කරමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් සැකකටයුතු ස්ථානයක් පිළිබඳව මම මේ සභාවට හෙළි කරන්නට අවශ්‍යයි. ටාජ් සමුද්‍රා හෝටලය තුළ පුපුරවා ගැනීමට අසාර්ථක උත්සාහයක් දැරූ ස්වයං ඝාතක බෝම්බකරු වන අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් පාස්කු ඉරුදින ප්‍රහාරයට පෙර දින තමයි හෝටලයට එන්නේ. ඒ කියන්නේ, 2019.04.20වැනි දින තමයි ඔහු check in වෙන්නේ. 2019.04.21වැනි දින තමයි ප්‍රහාරය සිද්ධ වෙන්නේ. 2019.04.20වන දින පැය 16.52ට ඔහු කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයට ඇතුළු වී අමුත්තකු ලෙස හෝටලයේ ලියාපදිංචි වෙනවා. හෝටලයේ කළමනාකාරිත්වය විසින් එම හෝටලයේ නවාතැන් ගන්නා පුද්ගලයින් පිළිබඳ තොරතුරු ප්‍රහාරයට පෙර විද්‍යුත් පණිවුඩයක් මඟින් රාජ්‍ය බුද්ධි අංශ වෙත වාර්තා කරලා තිබෙනවා. 2019.04.20වැනි දා හෝටලයට පැමිණි බව ප්‍රහාරයට පෙර හෝටලයේ කළමනාකාරිත්වය විසින් රාජ්‍ය බුද්ධි අංශ දැනුවත් කර තිබෙනවා. එහෙම දැනුවත් කරන්න හේතුව වුණේ ඒ පුද්ගලයා 2017 අවුරුද්දේ ඉඳලා අන්තවාදී කටයුතුවලට සම්බන්ධයි කියලා රාජ්‍ය බුද්ධි සේවාව තුළත්, අනෙකුත් බුද්ධි අංශ තුළත්, පොලීසිය තුළත් විමර්ශනයක් සිද්ධ වෙමින් පැවැතීමයි. ඒ හින්දා ටාජ් සමුද්‍රා හෝටලය විසින් බුද්ධි අංශ වෙත මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් 20වැනි දා 16.52ට, නැත්නම් හවස 4.52ට සිද්ධ කරලා තිබෙනවා. ඒ වනවිටත් අන්තවාදී ක්‍රියාකරුවකු ලෙස බුද්ධි අංශ විසින් අධීක්ෂණයට ලක් කරමින් සිටි අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් නමැත්තා පිළිබඳව බුද්ධි අංශ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණේ නැහැ. ඒ පිළිබඳව ක්‍රියා කළේ

[ගරු ආනන්ද විජේපාල මහතා]

නම් මෙම ප්‍රහාරය වළක්වා ගන්න තිබුණා. මෙය බරපතළ තත්ත්වයක් බැවින්, ඒ පිළිබඳවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගැඹුරු විමර්ශනයක් සිදු කරනවා.

ඒ වාගේම නැඟෙනහිර පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍ය සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන්, 2025.04.08වැනි දින නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපති සුබ්‍රමනියම් රවීන්ද්‍රනාත් මහතා අතුරුදහන් කිරීම, මඩකලපුව පොලිස් නිලධාරින් ඝාතනය කිරීම, නීති විරෝධී ගිනි අවි භාවිත කිරීම යන වැරදි යටතේ අත්අඩංගුවට ගෙන දැනට රැඳවුම් නියෝග මත රඳවාගෙන වැඩිදුර පරීක්ෂණ සිදු කරගෙන යනවා. මෙතෙක් සිදු කළ විමර්ශනවලදී පිල්ලෙයාන් 2019.04.21වැනි දින වනවිට මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසිංහම් මහතාගේ ඝාතනය සම්බන්ධයෙන් මඩකලපුව බන්ධනාගාරයේ රඳවා සිටි අතර, පිල්ලෙයාන් පාස්කු ප්‍රහාරය සිදු වන අවස්ථාවේදී පාස්කු ප්‍රහාරය පිළිබඳව පූර්ව දැනුවත්භාවයකින් මඩකලපුව බන්ධනාගාරය තුළ සිටි බවට මේ වනකොට කරුණු අනාවරණය වෙලා තිබෙනවා. ඒ අනුව, සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන් පාස්කු ප්‍රහාරය සිදු වන අවස්ථාවේදී මඩකලපුව බන්ධනාගාරය තුළ පූර්ව දැනුවත්භාවයකින් හිටියාය කියන එක පිළිබඳව සාක්ෂි හා තොරතුරු විමර්ශන ආශ්‍රයෙන් මේ වනකොට කරුණු අනාවරණය වෙලා තිබෙනවා.

මෙම ඝාතනය සම්බන්ධයෙන් යුද හමුදා බුද්ධි සාමාජිකයෙකුද පිල්ලෙයාන් සමඟ බන්ධනාගාරගතව සිට ඇති බවත්, ඔහු පිල්ලෙයාන් සමඟින් ඉතා සමීපව කටයුතු කර ඇති බවටත් සාක්ෂි මඟින් අනාවරණය වෙලා තිබෙනවා.

අනාවරණය වී ඇති කරුණු අනුව පාස්කු ප්‍රහාරය පිළිබඳව පිල්ලෙයාන්ට පූර්ව දැනුවත්භාවයක් තිබූ බවට සාධාරණ සහ යුක්තිසහගත ප්‍රබල සැකයක් මේ වනකොට ඉස්මතු වෙලා තිබෙනවා. මේ පිළිබඳව විමර්ශනය කරගෙන යනවා. බොහෝ කරුණු මේ සභාවට මම මේ වෙලාවේදී ඉදිරිපත් කරන්න අදහස් කරන්නේ නැහැ.

විශේෂයෙන් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පත් කරන ලද කමිටු වාර්තාවේ කරුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයනය කළා. එම වාර්තාව පිටු 67,000කට අධිකයි. එම වාර්තාව අධ්‍යයනය කරලා, එහි සඳහන් නිර්දේශ 43ක් පොලිස් දෙපාර්තමේන්තුවෙන් බාහිර පාර්ශ්ව විසින් ක්‍රියාත්මක කළ යුතු බවට හඳුනාගෙන තිබෙනවා. පොලිස් දෙපාර්තමේන්තුවට පරිබාහිර ආයතන විසින් මේ කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ 43ක් ක්‍රියාත්මක කළ යුතුයි කියලා හඳුනාගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ananda Wijepala, you have exceeded your time and if you go on, you will be taking the time of the Hon. Harshana Nanayakkara and the Hon. (Dr.) Anil Jayantha.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

මට තව විනාඩි දෙකක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

එතුමාට මගේ වෙලාවෙන් විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

එම කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ 43ක් පොලිස් දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව ක්‍රියාත්මක කළ යුතුයි කියලා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත මේ වෙනකොටත් දැනුම් දීලා තිබෙනවා. එම නිර්දේශ මොනවාද කියලා මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. එම ලේඛනය ඇමුණුම 02 වශයෙන් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ නැවත විමර්ශනය ඉතා හොඳින් ඉදිරියට යමින් තිබෙනවා. මේ සභාව වෙත ඉදිරිපත් කළ නොහැකි සංවේදී හා බරපතළ කරුණු ගණනාවක් අනාවරණය වෙමින් තිබෙනවා. මේ පිළිබඳ කරුණු හොඳින් දන්නා සාක්ෂිකරුවෙකු වශයෙන් අසාද් මවුලානා හඳුනාගෙන ඇති අතර, ඔහු විසින් ලබා දී ඇති තොරතුරු ඔස්සේ විමර්ශන කණ්ඩායම් ගණනාවක් විසින් විමර්ශන සිදු කරමින් පවතිනවා. අසාද් මවුලානා ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අදාළ ක්‍රියාමාර්ග නීත්‍යනුකූලව හා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

බුද්ධි අංශයට සම්බන්ධ යම් කණ්ඩායමක් කිසියම් වූ දේශපාලන අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අන්තවාදී කණ්ඩායමට සහාය දීමක් හෝ නොකර හැරීමක් හෝ වංක සහායක් දී ඇත්දැයි අනාවරණය කර ගැනීම සඳහා අපරාධ විමර්ශනයක් ඉතා ගැඹුරින් සිදු කරමින් පවතිනවා.

පාස්කු ප්‍රහාරය පිළිබඳව පවරන ලද මූලික අයිතිවාසිකම් නඩුවල තීන්දු මත ශ්‍රී ලංකා පොලීසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ අනුව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රහාරය සම්බන්ධයෙන් මේ රටේ මහ ජනයාට පොරොන්දු වූ පරිදිම නීතියත්, යුක්තියත් ඉෂ්ට කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම, අපි මේ සභාවට අවධාරණය කරන්න කැමැතියි, අපි අන්තවාදයටත්, ජාතිවාදයටත් ඉඩ දෙන්නේ නැහැ කියලා ආරම්භයේ සිටම කිව්ව බව. අනාගතයේදීත් ඒක ඒ විධියයි. කිසි ලෙසකින්වත් මේ අන්තවාදී හෝ ජාතිවාදී කණ්ඩායම්වලට හිස එසවීමට අපි ඉඩ දෙන්නේ නැහැ. අපි එදා කිව්වා, නීති මදි නම් අලුතින් නීති ගෙනැවිත් හෝ අන්තවාදයත්, ජාතිවාදයත් පරාජය කරනවා කියලා. එය අපි මේ සභාවට පොරොන්දු වෙනවා.

මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Leader of the Opposition Sajith Premadasa. You have been allotted 11 minutes.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 1.27]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

පාස්කු ප්‍රහාරය පිළිබඳව මේ සභාවේ අපි අවස්ථා ගණනාවකදී පුළුල් ලෙස සාකච්ඡා කර තිබෙනවා වාගේම පුළුල් ලෙස කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මට මතක් වෙනවා, 2021දී, 2023දී, නැවත 2024දී වාද විවාද හරහා වාගේම ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ප්‍රශ්න තුළිනුත් මේ සම්බන්ධයෙන් කරුණු රාශියක් ඉදිරිපත් කර තිබෙන බව. අපි අවංකවම විශ්වාස කරනවා, පාස්කු ප්‍රහාරය පිළිබඳව සත්‍ය සොයා ගැනීම සඳහා, ඒ ප්‍රහාරය පිටුපස සිටින මහ මොළකරුවන් හෝ මහ මොළකරු සොයා ගන්නට නම් මීට වඩා වෙනස් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි කියලා. තොරතුරු, කරුණු කාරණා පිළිබඳව පුළුල් ලෙස කථා කර තිබෙනවා. නමුත්, මෙතැනදී වැදගත් වන්නේ සත්‍ය සොයා ගැනීමේ පැහැදිලි ක්‍රමවේදය, පැහැදිලි වැඩ පිළිවෙළ. මම මතක් කරන්න කැමැතියි, 2024 අප්‍රේල් මාසයේ මමත්, අප පක්ෂයේ නීති විද්වත් කණ්ඩායමත් අතිගරු කාදිනල් හිමිපාණන් හමුවෙලා පියවර 6ක් පිළිබඳව සාකච්ඡා කළ බව. සාකච්ඡා කළා පමණක් නොවෙයි, ඒ පියවර 6 පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැනුවත් කළා. අපි යෝජනා කළා, විශේෂ විමර්ශන කොමිෂන් සභාවක් නැවත වරක් ස්ථාපනය කළ යුතුයි කියා. 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2. (1) (ඇ) යටතේ කොමිෂන් සභාවක් අවශ්‍ය නම් 7දෙනෙකුගෙන්, 9දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කරන්න පුළුවන්. හැබැයි, ඒකට ඇතුළු වෙනවා, දේශීය විනිසුරුවන් වාගේම විදේශීය විනිසුරුවන්. එතකොට ඒක ජාත්‍යන්තර විශේෂඥවරුනුත් එකතු වන කොමිෂන් සභාවක්. ඒක තමයි පළමුවැනි පියවර.

ඊළඟට, අපි යෝජනා කළා, ස්ථිර විමර්ශන කාර්යාලයක්, මේ පරීක්ෂණ කොමිෂන් සභාවේ වැඩකටයුතු නිවැරදිව, නිර්ව්‍යාජව, සත්‍යවාදීව, යථාර්ථවාදීව ක්‍රියාත්මක කරන්න. මේ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ 3වන පියවර හැටියට අපි යෝජනා කළා. ඊළඟට, නීතිපතිවරයා විසින් අපරාධ නඩු පැවරීම 4වන පියවර හැටියට යෝජනා කළා. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ තුළ 5වන පියවර හැටියට විශේෂ අධිකරණයක් පිහිටුවීමත්, 6වන පියවර හැටියට රජයේ අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමත් යෝජනා කළා. මෙන්න මේ පියවර 6 අපි ඉදිරිපත් කළා, අතිඋතුම් කාදිනල් හිමිපාණන් වෙත. උන් වහන්සේ මේ වැඩ පිළිවෙළට සියයට 100ක් නොවෙයි, සියයට ලක්ෂ වාරයක් එකඟ වුණා. අපි මේ වැඩ පිළිවෙළ පාර්ලිමේන්තුවේ සභාගත කළා. නමුත් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට අපට වරම ලැබුණේ නැහැ. ජනවරම, ජනතා ආශීර්වාදය අපට ලැබුණේ නැහැ. ඒ නිසා මම නැවතත් යෝජනා කරන්න කැමැතියි, ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාට මේ යෝජනා 6; මේ පියවර 6 පිළිබඳව සොයා බලන්න කියලා. මොකද, මේ සම්පූර්ණ වැඩ පිළිවෙළ මේ මොහොත වෙනකොට අතිශය ලෙසින් දේශපාලනීකරණය වෙලා හමාරයි. අපිට අවශ්‍ය සත්‍යය. 2021දීත්, 2023දීත්, 2024දීත් අපි මේ පාර්ලිමේන්තුවේ සභාව කල්තැබීමේ යෝජනා යටතේ, ස්ථාවර නියෝග 27 (2) යටතේ අසනු ලබන ප්‍රශ්න හරහා මේ ගැන අහනකොට, ඒ හැම අවස්ථාවකදීම අපි එහෙම ඇහුවේ ඇත්ත සොයන්න, සත්‍යය සොයන්න. අද දවසේ අරමුණ වන්නේත් ඒකයි. ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි සමගි ජන බලවේගය හැටියට ඉදිරිපත් කරපු මේ පියවර 6හි වැඩසටහන මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. මෙය අනුගමනය කළොත්, ඇත්තවශයෙන්ම සත්‍යය සොයා ගන්නට පුළුවන්.

අපි හැමෝම දන්නවා, පසුගිය කාල වකවානු තුළ සත්‍ය සොයා ගැනීමේ වැඩ පිළිවෙළට බාධා රැසක් පැමිණි බව. නිලධාරීන් මාරු කර යැව්වා; පළිගැනීම්වලට ලක් වුණා; නිලධාරීන් සිරගත කළා; රිමාන්ඩ් කළා. ඒ හැම දෙයක්ම වුණේ පාස්කු ප්‍රහාරයට මුල් වුණු සත්‍යය සොයා ගැනීම අවහිර කරන්නයි. මම නැවත වරක් මේ රජයට කියන්න කැමැතියි, කරුණාකරලා දේශපාලනය පැත්තකට දමා, පළිගැනීම් පැත්තකට දමා බොහොම අවංකව, පිරිසිදුව, නිර්ව්‍යාජව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම මම තවත් යෝජනාවක් කරන්න කැමැතියි. මේ වැඩ පිළිවෙළ පිළිබඳව රටේ විශ්වසනීයත්වයක්, පිළිගැනීමක් තිබෙන්නට ඕනෑ. ඒ නිසායි මම යෝජනා කරන්නේ අර විශේෂ විමර්ශන කොමිෂන් සභාවට අපේ රටේ විනිසුරුවන් වාගේම විදේශීය විනිසුරුවරුත් සම්බන්ධ කරගන්නය කියන කාරණාව.

අපි එතැනින් නතර විය යුතු නැහැ. ස්ථිර විමර්ශන කාර්යාලය ක්‍රියාත්මක වෙනකොට අනිවාර්යයෙන්ම Scotland Yard, FBI වැනි ජාත්‍යන්තර ආරක්ෂක ආයතනවලත් සහයෝගය ලබා ගැනීම තුළින්, -තවත් සුදුසු ආයතන තිබෙනවා නම් ඒවායේත් සහයෝගය ලබා ගැනීමෙන්- සත්‍යය සොයා ගැනීමේ කර්තව්‍යය අපට සාර්ථක කරගන්නට පුළුවන්.

මම පළමුවැනි කාරණාව හැටියට මේ පියවර 6 ඉදිරිපත් කරනවා, අපේ ගරු විජේපාල ඇමතිතුමාට.

එය පරිශීලනය කරලා, කතෝලික ප්‍රජාවගේත්, රටේ ජනතාවගේත් විශ්වාසය දිනා ගන්නා ආකාරයට, හොඳ පිළිගැනීමකට ලක් වෙන ආකාරයට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්. විශේෂ විමර්ශන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම, ස්ථිර විමර්ශන කාර්යාලයක් පිහිටුවීම, කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, නීතිපතිවරයා විසින් අපරාධ නඩු පැවරීම, විශේෂ අධිකරණයක් පිහිටුවීම, රජයේ අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම කියන ඒ සය පියවර වැඩසටහන; අපි නිර්මාණය කරපු ඒ වැඩසටහන කිසි ප්‍රශ්නයක් නැතිව රජයට උපයෝගී කරගන්න පුළුවන්, සත්‍යය සෙවීම සඳහා. වෙන මොනවත් නිසා නොවෙයි, සත්‍යය සෙවීම සඳහා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. මේ විමර්ශන කටයුතු පිළිබඳව පැහැදිලි විසඳුමක් තවමත් නැත්තේ ඇයි කියන කාරණාව මත, මේ මහා ඛේදවාචකය තුළින් විපතට පත් වුණු ඒ වින්දිතයින්, කතෝලික ප්‍රජාව, සමස්ත ජනතාව මේ මොහොත වන විට ලොකු සැකයකින් ඉන්නේ. වැඩිදුර යන්නට අවශ්‍ය නැහැ, අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් විසින්ම කළ ප්‍රකාශ මා කියන්න කැමැතියි. උන්වහන්සේ කියනවා, "යුක්තිගරුක හා සාධාරණ සංඥාවක් රජයෙන් ලැබුණොත් අපි ඒක ගැන සතුටු වෙනවා. නැත්නම් අපට සිද්ධ වෙනවා නැවත වරක් පාරට බහින්න" යනුවෙන්. මම මේ කියන්නේ කාදිනල් හිමිපාණන් වහන්සේගේ වචන. ඒ වාගේම උන්වහන්සේ කියනවා, "අපි මේ රජය බලයට පත් කරන්න කටයුතු කළේ ක්‍රමවේදය වෙනස් කරන්න. ඒත් ඒ ක්‍රමවේදය වෙනස් වන්නේ නැත්නම් අපිට ආයෙත් සැරයක් හිතන්නට සිද්ධ වෙනවා" කියලා. මේ, මගේ වචන නොවෙයි, අතිඋතුම් කාදිනල් හිමිපාණන්ගේම වචන. "අපි බලය දුන්නා. රහසිගතව කටයුතු කරලා ඒවා සඟවා ගෙන ඉන්නේ නැතිව, එක එක්කෙනා එක්ක ඩීල් දාන්නේ නැතිව දැන් එම බලය පාවිච්චි කරලා සත්‍යය වෙනුවෙන් කටයුතු කරන්න කියලා අද රට පාලනය කරන අයගෙන් අපි ඉල්ලා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සිටින්න කැමැතියි" කියලා උන්වහන්සේ ප්‍රකාශ කරනවා. මම නොවෙයි මෙහෙම කියන්නේ. අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් වහන්සේ. "පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් අපි තවමත් ඉල්ලා සිටින්නේ එදා කටුවාපිටිය දේවස්ථානයේදී ජනාධිපතිතුමා විසින් දෙන ලද පොරොන්දුව හැකි ඉක්මනින් ඉෂ්ට කරන ලෙසයි" කියා උන්වහන්සේ ප්‍රකාශ කරනවා.

ඒ වාගේම, "පාස්කු ප්‍රහාරයේ හය වෙනි සංවත්සරයට පෙර, එනම් 2025 අප්‍රේල් 21 දිනට සාධාරණත්වයක් ඉටු නොවුණොත් විරෝධතා ව්‍යාපාරයක් දියත් කිරීමට සූදානම්" කියලා ප්‍රකාශ කරනවා. "තව  මාසයකින් පමණ පාස්කු ඉරු දින ප්‍රහාරයේ හයවන සංවත්සරය එළැඹෙනවා. මේ සංවත්සරයට කලින් අපිට මේ පිළිබඳව යුක්තිගරුක සහ සාධාරණ සංඥාවක් රජයෙන් ලැබුණොත් අපි ඒක ගැන සතුටු වෙනවා. නැත්නම් අපිට සිද්ධ වෙනවා නැවත වරක් පාරට බහින්න" කියලා උන්වහන්සේ ප්‍රකාශ කරනවා. මේ, අතිඋතුම් කාදිනල් හිමිපාණන්ගේම වචන.

විශේෂයෙන් මම ඉල්ලීමක් කරනවා, මේ ඉදිරිපත් කරපු ප්‍රධාන කරුණු කාරණා දෙක පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියලා. පළමු කාරණාව ලෙස අපි රජයට ඉදිරිපත් කළා, සත්‍යය සොයා ගැනීමේ හොඳ ක්‍රමවේදය, හොඳ ව්‍යූහය, හොඳ යන්ත්‍රණය පියවර හයකින් ක්‍රියාත්මක කරන වැඩසටහන. දෙවනුව, අපි ඉදිරිපත් කළා අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේම වචනයෙන් ඒ කියපු කරුණු කාරණා පරිශීලනය කරනකොට  අර සැකය, අවිශ්වාසය, ඒ බරපතළ හැඟීම - මොනවත් සිදු වෙන්නේ නැහැයි කියන හැඟීම- අදටත් උන්වහන්සේ සතුවත් තිබෙනවා, මේ සමාජයේත් තිබෙනවා කියන එක.

මම පැහැදිලිව එක දෙයක් කියන්න ඕනෑ. මටත් මගේ පියා අහිමි වුණේ ත්‍රස්ත ප්‍රහාරයක් හේතුවෙන්. කුමන හෝ කණ්ඩායමක් ත්‍රස්තවාදය ක්‍රියාත්මක කරනවා නම්, අපි ත්‍රස්තවාදයට අනිවාර්යයෙන්ම විරුද්ධයි. ඒ ත්‍රස්ත ප්‍රහාරය තුළින් ඒ මහා ඛේදවාචකයට මුල පුරපු සියලු දෙනා අපි නීතිය හමුවට ගෙන එන්නට ඕනෑ. විවිධ නිලධාරින් ඒ පිළිබඳ විමර්ශන ක්‍රියාත්මක කරන කොට, ඒ නිලධාරින්ට අඩන්තේට්ටම් එල්ල වන කොට, ඒ අය රිමාන්ඩ් කරන කොට; හිරේ දමන කොට සත්‍යය සොයා ගැනීමේ විමර්ශන වෙනුවෙන් අපි සියලුදෙනාම විපක්ෂයක් හැටියට මේ සභාව තුළ නඟන්න තිබෙන ලොකුම හඬ නැඟුවා. අපි සත්‍යය වෙනුවෙන් පෙනී සිටියා. අපි එදත් එහෙමයි; අදත් එහෙමයි; හෙට දවසේත් එහෙමයි. ඒ නිසා මම ප්‍රාර්ථනා කරනවා, සත්‍යය ජයග්‍රහණය කරවන්නට, නිවැරැදි ගමන යන්නට, නිවැරැදි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට රජයට ප්‍රඥාව පහළ වේවා කියලා.

විශේෂයෙන් අප ඉදිරිපත් කළ පියවර හයේ වැඩසටහන ගැන හොඳ අවබෝධයක් ලබාගෙන, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම, මේ ප්‍රහාරය තුළින් විපතට පත් වුණු පවුල්වලට ලබා දිය යුතු උපරිම ශක්තිය, උපරිම සහනය, උපරිම සුබසාධනය ලබා දෙන්නට රජය, සිවිල් සමාජය ඇතුළු අප සියලු දෙනාම අත් වැල් බැඳ ගනිමු. අපි සදාකාලිකව ත්‍රස්තවාදය පිටුදකිමු, ත්‍රස්තවාදීන් විනාශ කරමු කියන වචනවලින් මගේ කථාව අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Harshana Nanayakkara. You have 13 minutes.

[අ.භා. 1.42]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම ගැන.

අද කරන මේ විවාදය ඉතා වැදගත්, සංවේදී විවාදයක්; රටකට ඛේදවාචකයක් වෙච්ච තත්ත්වයක් ගැන කරන විවාදයක්. මේ විවාදය අහගෙන ඉන්නකොට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කියන කරුණු ඇහෙන කොට, ඔවුන්ගේ body language එක දකින කොට, tone එක ඇහෙන කොට අපට හිතෙනවා, මේ සිද්ධිය වුණේ ජාතික ජන බලවේගය ආණ්ඩුව පැවැති කාලයේද, පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ අනුර දිසානායකගේ වරදින්ද කියලා. ඒ වාගේ තමයි මෙතැන අපට,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, I wish to correct myself. You have eight minutes, not 13 minutes.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
I was very delighted when you said 13 minutes, Sir. Anyway, what to do?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We had to deduct a few minutes from your time for the Hon. Ananda Wijepala.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒ අනුව බලන කොට, එම සිදුවීම ගැන දැන් අපට හිතාගන්න බැරුවයි ඉන්නේ. මොකද, ඒක අපේ අතින් වුණා වැනි තත්ත්වයක් දැන් තිබෙන්නේ. එහෙම නොවෙයි ඒ සිද්ධිය වුණේ. ඒ සිද්ධිය වෙනකොට යහ පාලන ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරුන් වශයෙන් සිටි අයත් මේ ගරු සභාවේ ඉන්නවා.

මම පිළිගන්නවා, ගරු විපක්ෂ නායකතුමා ගොඩක් හොඳ උපදෙස් මාලාවක් අපට දුන්නු බව. අපට ඒවා අනුගමනය කරන්න කියලා එතුමා කිව්වා. ගරු විපක්ෂ නායකතුමනි, ඉතින් ඊට වඩා පහසුයි නේද, ඒ ආණ්ඩුව කාලයේම ඒවා කළා නම්? මොකද, ඔබතුමාත් ඒ ආණ්ඩුවේ ඇමතිවරයෙකු වෙලා සිටි කාලයේ තමයි පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ. ඔය යෝජනා ටික ඒ කාලයේ තමන්ගේම ආණ්ඩුවට කරගත්තා නම් ඒවා ඉක්මනට ක්‍රියාත්මක කරගන්න තිබුණා, ගරු විපක්ෂ නායකතුමනි. දැන් අපි නේ බලයේ ඉන්නේ. ඔබතුමන්ලා කිව්වත්, නොකිව්වත් අපි මේ

විමර්ශන කටයුත්ත සිදු කරනවා. මට විනාඩි 8ක් විතරක් තිබෙන නිසා සියලුම කරුණුවලට උත්තර දීගන්න බැරි වුණත්, මූලික කරුණු කිහිපයක් පැහැදිලි කරන්න මට අවශ්‍ය වෙනවා.

පළමු කරුණ මේකයි. 2019 අප්‍රේල් 21වන දින - පාස්කු ඉරු දින - උදෑසන සිදු වෙච්ච ප්‍රහාරයේදී පුද්ගලයන් සිය ගණනක් මිය ගියා; තුවාල වුණා. එහිදී දරුවන්ට තමන්ගේ දෙමව්පියන් අහිමි වුණා; දෙමව්පියන්ට තමන්ගේ දරුවන් අහිමි වුණා. එය සම්පූර්ණයෙන්ම ඛේදවාචකයක්. ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, ශාන්ත අන්තෝනි දේවස්ථානය, සියොන් දේවස්ථානය, ෂැන්ග්‍රි-ලා හෝටලය, කිංස්බරි හෝටලය -

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rauff Hakeem, he has only eight minutes. I had to cut short his delight also.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Just to make a clarification, Sir.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මගේ කථාවෙන් පසුව අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
If you do not mind, let us give him the full eight minutes. You are scheduled to speak today, Hon. Rauff Hakeem.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
I know, but I just want to - *[Interruption.]*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මේක මගේ කාලය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rauff Hakeem, he does not want to be interrupted. - *[Interruption.]* No, let him continue uninterrupted, please.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
I would like to continue my speech. Hon. Member. - *[Interruption.]*

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
සභානායකතුමාට බයද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
I decide how I speak, Sir. Thank you.

දැන් මට ඒ නැති වුණු විනාඩි දෙක දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙම තත්ත්වයේදී අපි පැහැදිලිව දන්නවා, වින්දිතයන් කවුද කියලා. කවුද ඒ වින්දිතයන්? එදා ඒ පල්ලිවල යාඥා කරන්න ගිය උදවිය, ඒගොල්ලන්ගේ දරුවෝ. තවත් වින්දිතයන් කොටසක් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තමයි මේ රටේ මුස්ලිම් ජනතාව. ඔවුනුත් ඒ සිද්ධියේදී වින්දිතයන් බවට පත් වුණා. කොහොමද ඒක වුණේ? ඒක වුණේ එවකට තිබුණු දේශපාලනය විසින් දියත් කරන ලද ජාතිවාදී ප්‍රවාහය නිසා. අපිත් එක්ක ආශ්‍රය කරපු දෙමළ, මුස්ලිම් යාළුවෝ පවා එළියට එන්න අකමැති වුණා. ඔවුන්ගේ ආගමික වතාවත් කරන්න, ඒ හිස්වැසුම් පළඳින්න ඔවුන් අකමැති වුණා. ඔවුන් ඇත් වුණා. 1983 ජූලි කලබල කාලයේ අපේ දෙමළ යාළුවන්ගේ හිත රිදිලා භය වෙලා තිබුණු මුහුණු ඒ විධියටම අපි දැක්කා, ඒ පාස්කු ප්‍රහාරය වෙලාවේදීත්. ඔවුනුත් වින්දිතයෝ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඉසිපතන විද්‍යාලයට ගියේ. එතැන අපේ මුස්ලිම් යාළුවෝ ගොඩක් ඉන්නවා. I think the Hon. Deputy Speaker is also from Isipathana College. We all had Muslim friends. We saw how fearful they were when we spoke to them, and that broke my heart. මම කියනවා ඒ කට්ටියත් වින්දිතයන් බව.

2019 කාලයේ ජාතික ජන බලවේගයේ අපි, අනුර දිසානායක සහෝදරයා -වර්තමාන ජනාධිපතිවරයා- ටවුමෙන් ටවුමට ගිහිල්ලා සම්මන්ත්‍රණ පවත්වමින් මුස්ලිම් අන්තවාදයට එරෙහි වන අතරේ සාමාන්‍ය මුස්ලිම් ජනතාවට හිරිහැර කරන එක වළක්වන ලෙසට කියා සිටියා. එහෙම කළේ ජාතික ජන බලවේගයේ අපි. එදා යහ පාලන ආණ්ඩුවේ කැබිනට් එකේ හිටියා මුස්ලිම් ඇමතිවරු දෙදෙනෙක්. මම අහනවා, ඔවුන් මොනවාද කළේ කියලා. ඉල්ලා අස් වුණාද, මුස්ලිම් මිනිසුන් වෙනුවෙන් වැඩ කළාද, ඔවුන්ට වන අසාධාරණකම් නවත්වන්න කථා කළාද? ඒවා වුණේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඉතිහාසය දන්නේ නැහැ, මෙතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් අපි ඒ දේ කළා.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

මට මේ සම්බන්ධයෙන් මූලිකවම කියන්න අවශ්‍ය වෙලා තිබෙන එක කරුණක් තිබෙනවා. The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam in his Motion states, I quote:

> "5. I propose to this House that a special prosecutor's office with international assistance be established to conduct these investigations independently, in order to ensure justice for all parties..."

මා හිතන්නේ ගරු විපක්ෂ නායකතුමාත් ඒ හා සමාන යෝජනාවක් තමයි අපට කළේ. විශේෂ සභා, විශේෂ කොමිෂන් සභා, ජනාධිපති කොමිෂන් සභා, විශේෂ විමර්ශන ආදි සියල්ලම ඉල්ලන්නේ ඇයි? ඒ සියල්ලම තිබුණොත් ප්‍රශ්න විසඳෙනවාද? නැහැ. මොකක්ද හේතුව?

Without the political will to catch the crooks or those who did wrong, no commission or investigation is going to work. That is why, under the NPP Government, this is going to work. We will catch the culprits; we will bring closure to this case and bring justice to the victims of the Easter Sunday attack. It will be done. In fact, Hon. Minister Ananda Wijepala explained very well, step by step, all the things we have done.

Sir, this proposal in the Motion of the Hon. Member has some legal obstacles because he is suggesting a special prosecutor's office with international assistance and that prosecutor is supposed to do the investigations independently. That is what the Motion states. Sir, we live in an adversarial system. In an inquisitorial system like in France and Germany, the investigator prosecutes. But, in an adversarial system, it is different - I am sure the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam would recognize that - where, basically, the judge is a neutral referee. The prosecution would produce the case; the defence would put forward their version and the final determination would be given. Therefore, the proposal in No. 5 of the Motion itself is highly flawed because you cannot do it, not in Sri Lanka, anyway.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ වෙතත් අභිචෝදක කාර්යාලය පිහිටුවීම සඳහා මේ වන විට කැබිනට් අනුමැතියෙන් කමිටුවක් පත් කරලා, ඒ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේම සඳහන් වුණු දෙයක්, because there is a perceived conflict of interest with regard to the Attorney-General's Department, as it serves as the adviser to the Government. But, it is only a perceived conflict; we are not saying there is a conflict. However, මේ තත්ත්වය මග හරවා ගැනීම සඳහා, ළබැඳියාවන් අතර ගැටුම් ඇති වීම වැළැක්වීම සඳහා අපි ඒ කටයුත්ත සිදු කරනවා. ඉතා ඉක්මනින් ඒ අභිචෝදක කාර්යාලය පිහිටුවීම අපි කරනවා, ස්වාධීන prosecutions සඳහා. අප මේ දේ කරන්නේ ගරු නීතිපතිවරයා අපට විශ්වාස නැති හින්දා නොවෙයි. අපට එතුමා විශ්වාසයි; එම ආයතනය විශ්වාසයි. නමුත් මම දන්නවා, ගොඩක් මාධ්‍යවලින් නීතිපතිවරයාව අධෛර්යයට පත් කරන්න නොයෙකුත් ආකාරයේ අවලාද නඟන බව.

විශේෂයෙන්ම මේ Motion එකේත් සඳහන් වෙනවා, පිල්ලෙයාන්ට ඇප ලබා දෙන්න හැදුවා කියලා. නමුත් එහෙම දෙයක් නීතිපතිවරයා කළේ නැහැ. අපි මේ අභිචෝදක කාර්යාලය හදන කටයුත්ත කරන්නේ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන නිසා මිස, කාගෙන්වත් බේරෙන්න ඕනෑ නිසා නොවෙයි. මේ Motion එකේ තිබෙන ආකාරයට මේ සඳහා විදේශ සහාය ගන්න අවශ්‍ය නම් ගන්න පුළුවන්. නමුත්, අපේ රටේ CID එකට මෙය විමර්ශනය කරන්න පුළුවන්. ඒකට විදේශයෙන් විනිසුරුවන් ඕනෑ නැහැ. අපේ රටේ නඩුකාරතුමන්ලාට මේක අහන්න පුළුවන්. පාස්කු ප්‍රහාරය මේ රටේ දේශපාලන පක්ෂවල බයිට් එකක් වෙන්න අපි තවදුරටත් ඉඩ දෙන්නේ නැහැ. මොකද, එයට අදාළ වැරදිකරුවන් අල්ලාගෙන ඔවුන්ට දඬුවම් දීමේ කටයුතු අධිකරණය හරහා කරන්න අපි අනිවාර්යයෙන්ම බලාපොරොත්තු වෙන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. අපට සාමය අවශ්‍යයි; we need peace.

Once and for all, we need closure to these cases. I know that not a single person would ever be able to forget their victimed loved ones. I know that, but peace is important. Sir, let me quote from Matthew 5:9.

> "Blessed are the peacemakers, for they will be called children of God."

Peace is what we want and if there is racist politics or politics with religious hatred taking place, we will never have peace. And, we are children of God, Sir.

Thank you.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, I want to clarify something.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Rasamanickam, you can clarify.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නම කියලා කියන ඒවාට කියන්න ඕනෑ. පොඩ්ඩක් අහගෙන ඉන්න. - *[බාධා කිරීමක්]* Of course.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Since you moved this Motion, Hon. Member, I believe your name would be mentioned. I will give you 30 seconds. - *[Interruption.]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, get your Ministers in order. - *[Interruption.]* What is this? What is this behavior? Is this the change that the NPP proposed? Listen to a Member when he has to say something!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I will give you 30 seconds. Would you please say what you want to say?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, you cannot give me just 30 seconds when the Minister mentioned my name three times and questioned the basis of the Motion I have moved. You have to give me more time. Otherwise, he would be misleading the public. So, you cannot give me just 30 seconds!

Sir, let me clarify this. Hon. Minister of Justice, within the law of Sri Lanka, there are ways to form a system for an international investigation to take place. If you read the OMP Act which was passed, you would see that it does not prohibit that and there is space to do that. At the same time, when the Hon. (Dr.) Wijeyadasa Rajapakshe was in the Opposition, he brought in a Private Members' Bill, which was never passed. But, it went before the Supreme Court. That Bill states that when a judge is removed, foreign observers or foreign judges must get involved to investigate, whether the judge who had been removed is correct or not. And, the Supreme Court had given a clear judgment, saying that it was not unconstitutional, that they could go ahead with it. So, maybe, your knowledge about the law, your field, is not enough. I think you should speak to a few President's Counsels and get some advice before you make such statements in this House. So, you are questioning the basis of my Motion without having correct information. There is enough room within the legal framework of Sri Lanka to have international participation. So, if you do not know facts, do not say that. Then, I have not confused myself over having an independent Public Prosecutor's Office.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Let us have the next speaker, please.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

I am talking about a Special Prosecutor's Office on human rights violations. You yourself have said that the Attorney-General's Department is overworked and that it is highly criticized.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, Hon. Member, you made your point clear.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

So, how can the State investigate the State when it is the State who has committed the crimes? Both of you, either the Minister of Public Security or the Minister of Justice, did not say anything about the Chemmani mass graves that I have mentioned in my Motion. So, both of you have run away from some parts of the Motion.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. R.M. Ranjith Madduma Bandara. You have nine minutes.

[අ.භා. 1.55]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ඉරුදින ප්‍රහාරය සිද්ධ වෙලා දැන් අවුරුදු 6ක් වෙනවා. ඒකේ වින්දිතයන්ට තවම සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් මේ රටේ කතෝලික ජනතාව තමයි වැඩියෙන්ම වින්දිතයන් වුණේ. ඒකෙන් 270ක් මැරුණා. 500ක් පමණ තුවාල වුණා. කතෝලික ජනතාවට වෙච්ච හානිය මැතිවරණ දෙකකට යොදා ගත්තා, ඡන්ද ගන්න. එදා කතෝලික ජනතාව ජීවිතවලින්, දේපළවලින් වන්දි ගෙවනකොට, මේ රටේ ඉස්ලාමීය මුස්ලිම් ජනතාව විත්තිකරුවන් බවට පත් වුණා. ඒ නිසා තමයි යහ පාලන ආණ්ඩුවේ අපේ කබීර් හෂීම් මැතිතුමා, රවුෆ් හකීම් මැතිතුමා, රිසාඩ් බදියුදීන් මැතිතුමා ඇතුළු නව දෙනෙක් එතුමන්ලාගේ තනතුරුවලින් ඉල්ලා අස් වුණේ. අපි කනගාටු වෙනවා, අධිකරණ ඇමතිතුමා ඒක දන්නේ නැතිකම ගැන. එහෙම වුණේ ඒ සිද්ධිය නිසායි. ඒ ආණ්ඩුව පක්ෂ දෙකක් එකතුව කටයුතු කළා. අපේ ආණ්ඩුවේ දින 52ක් බලහත්කාරයෙන් ගත්තා.

මහජන ආරක්ෂක ඇමතිතුමාගේ කථාව අපි ඇහුවා. එතුමා කිව්වා පරීක්ෂණ ගැන. ඒ ආණ්ඩුවේම පරීක්ෂණ කරපු නිලධාරින් තමයි අද තමුන්නාන්සේලාත් එක්කහු කරගෙන පරීක්ෂණ කරන්නේ. එතුමා කියපු කථා, එතුමා හෙළිදරව් කළ කාරණා - වවුනතිව් සිද්ධිය, වනාතවිල්ලුව සිද්ධිය, මාවනැල්ලේ සිද්ධිය, හෝටල්වල බෝම්බ පිපිරීම් - සියල්ල ඒ නිලධාරින් එදා අපට කිව්වා. ඒ සියල්ල, පරීක්ෂණ කරලා හඳුනා ගත්ත දේවල්. අපට ඕනෑ ඔබතුමන්ලා අලුතින් හොයා ගත්තේ මොනවද කියලා දැනගන්න. අපි සියලුදෙනාට පිළිගන්න වෙනවා, 2019 - 2024 වෙනකම් මේ සම්බන්ධව හරි පරීක්ෂණයක් කෙරුණේ නැහැ කියලා. විපක්ෂ නායකතුමාත්, අපිත් මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේදී නිතර නිතර කථා කළා. ඔය සිද්ධියට ඉස්සෙල්ලා මමත් ඒ ආණ්ඩුවේ හිටපු නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරයෙක්.

මට මතකයි, සහරාන් අත්අඩංගුවට ගන්න ඉස්සෙල්ලාම උසාවි නියෝගය ගත්තේ මම, එවකට නීතිය හා සාමය ඇමතිවරයා විධියට. අපි මේ සම්බන්ධව අධිකරණයට කරුණු දැක්වූවේ ඒ කාලයේ. මම හිතන විධියට, මේකෙන් විශාලම දේශපාලන අවාසිය සිදු වුණේ අපට. 2019දී ජාතික ආරක්ෂාව ගැන කියමින් මේ පාස්කු ඉරිදා සිද්ධිය යොදාගත්තා අප පරාජය කරන්න; සජිත් ප්‍රේමදාස මැතිතුමා පරාජය කරන්න. 2024දීත් මේ පාස්කු ඉරිදා සිද්ධියම තමුන්නාන්සේලාත් බලයට එන්න උපයෝගි කරගත්තා. ඒ නිසා මැරිච්ච 270දෙනාට සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා කතෝලික ප්‍රජාවගේ ඡන්දය ගත්තා. එදා තමුන්නාන්සේලාගේ ඇමතිවරු, තමුන්නාන්සේලාගේ නායකයා කියපු දේවල් මම මතක් කරනවා.

අද තමුන්නාන්සේලාගේ ප්‍රධාන සංවිධායක හැටියට ඉන්න නලින්ද ජයතිස්ස මහත්මයා මෙහෙම කියලා තිබෙනවා.

> "මම කියනවා, පාස්කු ප්‍රහාරයේ ඉඳලා ජනාධිපතිවරණය, වරාය විකිණීම, තෙල් ටැංකි ටික ඉන්දියාවට ස්ථාවරව පවරා ගැනීම, මත්තල ගුවන්තොටුපළේ කළමනාකාරිත්වය ඉන්දියාවට ගැනීම. මේ සියල්ල එක පෙළට තියලා බලන්න. කතන්දරය හොඳට පැහැදිලි වෙනවා. කටුවාපිටිය බෝම්බ පත්තු කළ බෝම්බකරුවාගේ බිරිඳ සාරා කාටත් හොරෙන් ඉන්දියාවට

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

පැන්නා. මේ ප්‍රහාරයේ වැදගත්ම සාක්කිකාරියක්. අඩු තරමේ ඉන්දීය විදේශීය ලේකම්වරයා ලංකාවට ආපු වෙලාවේවත් ජනාධිපතිවරයා ඉන්දියාවට ගිය වෙලාවේවත් මෙයා එවන්න කියලා කිව්වේ නැහැ."

මම අහනවා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඉන්දියාවත් එක්ක එකතු වෙලා මේකට ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා. මේ ඇමතිතුමා කියපු දේවල් නම් එහෙමයි. දැන් ඔයිල් ටැංකි ටිකක් දීලා තිබෙනවා, වරාය වෙනුවට Colombo Dockyard එක තුට්ටු දෙකට දීලා තිබෙනවා. රජයේ දේපළ විකුණද්දි අපි කථා කරන්න ඕනෑ. අපි අහනවා. සාරා ගෙන්වාගන්න මොනවාද තමුන්නාන්සේලා කළේ?

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ නායකයා "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ කියනවා, "පාස්කු ඉරුදින ප්‍රහාරය ඇතුළේ දේශපාලන බලය වෙනුවෙන් ජන කණ්ඩායම් ඉලක්ක කරගත්ත ඝාතකයන්ට අදාළ සියලු තොරතුරු හෙළි කරමින් අපරාධකරුවන්ට දඬුවම් පමුණුවනවා" කියලා. ඒක කියලා දැන් මාස 9ක් ගිහිල්ලා. කතෝලික ජනතාව බලාගෙන ඉන්නවා, මේකෙන් බලපෑම් එල්ල වුණු අනෙක් වින්දිතයෝ බලාගෙන ඉන්නවා ආණ්ඩුව මොකක්ද කරන්නේ කියලා. ආණ්ඩුව තවම ඉබි ගමනේ යන්නේ. ඒක නිසා අපි කියනවා මේක කඩිනම් කරන්න කියලා. ඒ සිද්ධිය ගැන පරීක්ෂණ කරපු නිලධාරින් තමුන්නාන්සේලා ආපහු බඳවාගත්තා. මට මතකයි, එතැනදි දප්පුල ද ලිවේරා හිටපු නීතිපතිතුමා කියනවා, "සහරාන්ට උඩින් මේකේ නායකයෙක් හිටියා" කියලා. තමුන්නාන්සේලාගේ යුතුකමක් තමයි සහරාන්ට උඩින් හිටපු නායකයා කවුද කියලා කියන එක. මොකද, මේ රටේ ජනතාව මේවා දිහා බලාගෙන ඉන්නවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිලධාරියෙක් ජනාධිපති කොමිසමට ගිහිල්ලා සාක්කි දුන්නා, මේකේ මහ මොළකරු කවුද කියලා. සාක්කි දුන්නේ නැහැ, කොළයක ලියලා දුන්නා. කරුණාකරලා මේවා හෙළිදරවු කරන්න. මේ සිද්ධිය වෙලා අවුරුදු 6ක් වෙනවා. තමුන්නාන්සේලා බලයට පත් වෙලා මාස 9ක් වෙනවා. මම දන්නේ නැහැ, තමුන්නාන්සේලා කොතැනද ඉන්නේ කියලා. මහජන ආරක්ෂක ඇමතිතුමා කියපු ඒ හොයාගත්ත ඔක්කෝම දේවල් මම හිතන හැටියට යහ පාලන ආණ්ඩුවෙන් ඒ කාල සීමාව තුළ හොයාගත්ත දේවල්. පිල්ලෙයාන් අත්අඩංගුවට ගත්ත එක විතරයි අලුත් දෙයක් විධියට මම දකින්නේ. එච්චරයි මම දකින්නේ.

ඒ විතරක් නොවෙයි, ජනාධිපතිතුමා කියපු තව දෙයක් මේකේ තිබෙනවා.

"පොඩි සහරාන්ගේ උපදේශකයා හෙළිවා නම් පාස්කු දා ප්‍රහාරයේ ඇත්ත එළිවෙනවා."

මේක එතුමා කියන්නේ විපක්ෂයේ ඉද්දි. දැන් එතුමා ජනාධිපති. FBI Report එකේ තිබෙනවා, කවුද පොඩි සහරාන්, කවුද එතැනට උඩින් ඉන්නේ, කාටද කථා කළේ කියන එක. මේවා එළි කරන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය ඇමති වටගල මහත්මයා කියනවා, "දළදා ප්‍රදර්ශනය නිසා පාස්කු මහ මොළකරු හෙළිදරවු කිරීම ටිකක් ප්‍රමාද වෙන්න පුළුවන්" කියලා. . *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මගෙන් පස්සේ කථා කරන්න. දැන් කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඉඩ දෙන්නේ නැහැ. පස්සේ කථා කරන්න. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේගේ කථාවක් මේ තිබෙන්නේ. මම පෙන්වන්නම් ඒක. *[බාධා කිරීමක්]* මම එවන්නම්. *[බාධා කිරීමක්]* මම එවන්නම්. *[බාධා කිරීමක්]* මම ඔබතුමාට එවන්නම් මේක. *[බාධා කිරීමක්]*

"අප්‍රේල් 21වැනි දාට පෙර පාස්කු දින ප්‍රහාරයේ රහස් හෙළි කරනවා" කියනවා. කවුද මේ කියන්නේ? ජනාධිපතිවරයා. කෝ, හෙළි කරලා තිබෙනවාද?

අද හෙළි කරලාත් නැහැ. තමුන්නාන්සේලා මේ රටේ කතෝලික ජනතාව රවට්ටලා තිබෙනවා. ඒක නිසා තමයි කාදිනල්තුමා කියන්නේ, "වත්මන් රජය තේරී පත්වීමට පල්ලියේ සහාය දුන්නේ අර්ථවත් වෙනසක් ඇති කර වින්දිතයන්ට යුක්තිය ඉටු කරනු ඇතැයි යන අපේක්ෂාවෙනි. නායකත්වයේ වෙනස වෙනුවෙන් පිටුපස අපි පෙනී සිටියේ මේ පද්ධතියේ ගැඹුරින් මුල් ඇද ගත් ගැටලු විසඳෙනු ඇතැයි විශ්වාස කරමිනි" කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ?

අපේ විපක්ෂ නායකතුමා කිව්වා වාගේ දැන් කාදිනල්තුමාම කියනවා, "අපි තවමත් රජයෙන් සාධාරණ සහ යුක්ති සහගත ප්‍රතිචාරයක් බලාපොරොත්තු වනවා" කියලා. මේ කියන්නේ, අප්‍රේල් 21 ප්‍රහාරය සිදු වෙලා වසර 6ක් ගතවීමට පෙර. "අපට ප්‍රතිචාරයක් නොලැබුණොත් නැවත වරක් වීදි බැසීම හැර වෙනත් විකල්පයක් අපට ඉතිරි නොවනු ඇත" මේ මොකක්ද කියන්නේ? මෙහෙම කියන්නේ ඇයි? කතෝලික ජනතාවට තමුන්නාන්සේලා කෙරෙහි තිබුණු විශ්වාසය නැති වෙලා තිබෙනවා, ආණ්ඩුව කෙරෙහි තිබුණු විශ්වාසය නැති වෙලා තිබෙනවා.

අපි අහනවා, ඇයි මේ ඉබි ගමනෙන් යන්නේ කියලා. ජනාධිපතිතුමා වරක් නොවෙයි, දෙවරක් නොවෙයි, කිහිප වරක් කියලා තිබෙනවා, අප්‍රේල් 21වන දාට පෙර හෙළි කරනවා කියලා. හෙළි කරන්නෙත් නැහැ, හෙළි කරන්න කටයුතු කරන්නෙත් නැහැ. තමුන්නාන්සේ දැන් කිව්වෙත් නැහැ. මොකද, දැන් මේකේ ප්‍රශ්නයකුත් නැහැ, පරණ කට්ටියම තමයි. තමුන්නාන්සේලා බලයට ආවේ මේක විකුණාගෙන. 2019දී බලයට ආවේත් මේක විකුණාගෙන. අර පැත්තෙන් ජීවිත පරිත්‍යාග කරද්දී - ඒ අවස්ථා දෙකේදීම පරාජයට පත් වුණේ, අසාධාරණයට ලක් වුණේ, දේශපාලන අවාසිය ආවේ සජිත් ප්‍රේමදාස මැතිතුමාට. 2019දී මේක තමයි ප්‍රධාන මාතෘකාව වුණේ. කතෝලික ජනතාවගේ ඡන්දවලින් සියයට 70ක්, සියයට 80ක් තමුන්නාන්සේලා ගත්තා. නමුත් තමුන්නාන්සේලා කතෝලික ජනතාවට කියපු දේවල් අද ඔප්පු කරලා නැහැ. මේ වූදිතයන් අල්ලන්න අපට පුළුවන් හැම සහයෝගයක්ම, පුළුවන් උදවුවක්ම, අත එසවීමක්ම කරනවා. කරුණාකරලා පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ වැරදිකරුවන් කවුද කියලා ඉතා ඉක්මනින් හෙළි කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. බොරු නොකර, වෙන තැන්වලට භය නොවී, ජාත්‍යන්තරයෙන් එන ප්‍රශ්නවලට භය නොවී මේ කටයුත්ත කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අපි දන්නවා, ලෝකයේ FBI එක, Scotland Yard එක, ජර්මනියේ රහස් ඔත්තු සේවය කියන සියල්ල මේ අවස්ථාවේ පැමිණි බව. ඒවායේ සහයෝගය අරගෙන මේ කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Deputy Minister? You can have a minute.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා දළදා ප්‍රදර්ශනයට සම්බන්ධ කරලා මා විසින් කරන ලද ප්‍රකාශයක් මේ ගරු සභාවේ කියෙව්වා. එය සමාජ මාධ්‍යවල පළ වූ අමු බොරු කථාවක්. මම එහෙම කථාවක් කියලා නැහැ. නමුත්, මෙතුමන්ලාට වගකීමක් තිබෙන්න ඕනෑ. පිට තිබෙන කුණු ටික ගෙනැල්ලා මෙතැනදී ශුද්ධ කරන්න නොවෙයි මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ. ඒ නිසා යම් වගකීමක් ඇතිව අදාළ ප්‍රකාශය කරන්න. ගරු මන්ත්‍රීතුමා, මම කරපු ප්‍රකාශයක් නොවෙයි, ඒක. Link එක දමන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නම කියපු නිසා මට අවස්ථාව දෙන්න. Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. R.M. Ranjith Madduma Bandara, you can have half a minute.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන එක අපි අහන්නම්. නමුත්, ඔබතුමා නියෝජ්‍ය ඇමති. සමාජ මාධ්‍ය මේ විධියට බොරු කියලා තිබෙනවා නම් ඔබතුමා පියවර ගන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් දමන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Hon. Major General (Rtd.) Aruna Jayasekera, you have 13 Minutes.

Order, please! Before he starts, the Hon. Deputy Chairperson of Committees will take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.06]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දින සාකච්ඡා කරන පාස්කු ඉරිදා ප්‍රහාරය නම් වූ මහා අවාසනාවන්ත සිද්ධිය වෙලා වසර ගණනාවක් ගෙවී ගිහින් තිබෙනවා. ප්‍රථමයෙන්ම, එම ප්‍රහාරයන්ට ලක් වූ වින්දිතයන් හා එම පවුල්වල සාමාජිකයන්හට අපගේ කනගාටුව පළ කර සිටිනවා. අපේ ගරු මහජන ආරක්ෂක ඇමතිතුමා, සිද්ධීන් 8ක් සම්බන්ධයෙන් ඇති වූ තත්ත්වය තුළ මිය ගිය සංඛ්‍යාව, තුවාල වූ සංඛ්‍යාව, ඒ සියලු දේවල් ගෙනහැර දැක්වූවා. නමුත්, අපි වග වන රජයක් වශයෙන් සත්‍යය සෙවීම සහ පිළිගැනීම පිළිබඳව සහ විනිවිදභාවය දකින, වග කියන රජයක් හැටියට ඒ සඳහා ප්‍රධාන තැනක් දෙනවා. අපි වග කියන ජනතාවාදී ආණ්ඩුවක් හැටියටත් ඒ සියල්ලම සැලකිල්ලට ගෙනයි මේ කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට විශාල ජන මතයක් ලැබුණා. ඒ ජන මතය තුළ තිබෙන්නේ විශාල බලාපොරොත්තු. මේ වින්දිතයන් තුළ තිබෙන්නේ විශාල බලාපොරොත්තු. අපේ වගකීම ඉෂ්ට කරනවා කියලා අපි පොරොන්දු වෙලා තිබෙනවා. අපි ඒ බලාපොරොත්තු සුන් වෙන්න දෙන්නේ නැහැ. අපි ඒවා ඉෂ්ට කරනවා. ඒ බලාපොරොත්තු, වගකීම් සියල්ලක්ම අප රජයේ - ආණ්ඩුවේ - උරහිස් මතයි තිබෙන්නේ.

අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලා තවම මාස කිහිපයයි. පසුගිය රජය කාලයේ පත් කරපු ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ජනාධිපතිතුමාට භාර දීලා තිබුණේ 2021 ජනවාරි 31වැනි දා. ඒක CID එකට භාර දීලා තිබුණේත් නැහැ. අපි බලයට ඇවිල්ලා 2025.04.20වැනි දාම ඒක CID එකට භාර දුන්නා. ඒක දැනට විශේෂ විමර්ශන කණ්ඩායමක් විසින් විමර්ශනය කරනවා. ඒ කටයුතු කඩිනම් කිරීම ගැන අපි විශේෂයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. අපි ස්වාධීනව කටයුතු කරනවා. ඒ වාගේම සභාවට ඉදිරිපත් කළ නොහැකි සංවේදී හා බරපතළ කරුණු ගණනාවක් අනාවරණය වෙමින් පවතිනවා. ඒවා මේ සභාවට ඉදිරිපත් කරන්න අමාරුයි.

Hon. Deputy Chairperson of Committees, the Motion that has been brought in by the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam at the time of the Adjournment states that the Government has failed to ensure justice for human rights violations, including by not revealing the truth about the Easter Sunday attack immediately. But, our Government is committed to revealing the truth and I must also mention here that, as a

[ගරු අරුණ ජයසේකර මහතා]

responsible Government, we always want to ensure justice for human rights violations, especially to immediately reveal the truth about the Easter Sunday attack. Also, I must tell this august House that our Government has never avoided responding to such issues although this has been brought in as an Adjournment Motion, because it is the responsibility of the Government. Therefore, we have taken the fullest responsibility to reveal the truth and to ensure justice for the people who had been victimized.

The Report of the Presidential Commission of Inquiry, which was appointed by the previous Government, had been handed over to the CID to expedite the process of an independent investigation. So, there is no influence or any interference, which had been a bad practice of the politicians of the previous regimes or governments, from the side of the current Government or the political authority. I must very clearly mention here that we have not failed in such matters or deliberately avoided such things. Now, see how the law is dealing with the previously responsible corrupt politicians and government officials and the mass scale corruptions that had taken place in the past, which led the country to collapse economically. So, the Government will definitely ensure that an independent legal process is brought about in this country for the people.

ඒ සම්බන්ධව අපි ඉතා වගකීමෙන් යුතුවයි කටයුතු කරන්නේ. මේ සිද්ධිය විතරක් නොවෙයි. පසුගිය වකවානුවල රට කඩා වැටෙන්න, බංකොලොත් වෙන්න, ආර්ථික අර්බුදය ඇති වෙන්න විශේෂ ප්‍රවේශයක් වෙච්ච අතළොස්සක් වූ ඒ දූෂිතයන්ට විරුද්ධව තරාතිරම නොබලා අපි කටයුතු කරනවා. ඒ, ජනතාවට වගකියන රජයක්, වගවන රජයක්, වගඋත්තර සැපයිය යුතු රජයක් හැටියටයි.

මේ අවස්ථාවේදී මම අහනවා, මීට පෙර විපක්ෂය විසින් ඉදිරිපත් කරන ලද ඒ පියවර හය ඔබතුමන්ලා ආණ්ඩු කරන කාලයේ ඇයි ඉදිරිපත් නොකළේ කියලා. ඒවා ඉදිරිපත් කළා නම්, මේ වන විට යම්කිසි දුරකට තොරතුරු රාශියක් එකතු කරගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න තිබුණා. නමුත් එහෙම කටයුතු කරලා නැහැ. ඇයි, ඒ කියපු පියවර හය ඔබතුමන්ලාට ක්‍රියාත්මක කරන්න බැරි වුණේ? ඒ වාගේම මෙම සිද්ධිය සම්බන්ධව අපට තවත් තොරතුරු රාශියක් ලැබිලා තිබෙනවා.

අපේ ඇමතිතුමා ගෙනහැර දැක්වූවා වාගේ, 2018.11.30වැනි දා වවුනතිව් පොලිස් මුර පොළේ සිටි පොලිස් නිලධාරින් ඝාතනය සඳහා සැකපිට එල්ටීටීඊ යැයි සැක කරන නායකයෙක් අත්අඩංගුවට ගැනීම සිදු වෙනවා. ඒ අනුව ඇතිවන විමර්ශන කටයුතු ඒ අවස්ථාවේදී දීර්ඝ වෙනවා, සංකීර්ණ වෙනවා, ප්‍රශ්න සහගත වෙනවා. ඒ වාගේම එහිදී වැදගත් විමර්ශන තොරතුරු මතු වෙනවා. ඒ අනුව අපි දැන් නඩු දාලා තිබෙනවා. අවාසනාවකට, විමර්ශනය කරන එම ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරින් එම කටයුතුවලින් ඉවත් කරලා තිබෙනවා. කාගේ හෝ අවශ්‍යතාවකට එම නිලධාරින් එහෙම කොහොමද ඉවත් කරන්නේ? අපි CID එකේ නිලධාරින් මාරු කළේ නැහැ. වගකියන, වැදගත්කමක් තිබෙන, බුද්ධියක් තිබෙන, දැනුමක් තිබෙන, ඒ සම්බන්ධව නිර්පාක්ෂිකව කටයුතු කරපු CID නිලධාරින් තමයි නැවත අපි ඒ සඳහා පත් කළේ. අපි රජයක් හැටියට ඔවුන් ඉවත් කළේ නැහැ. අපට එහෙම කරන්න අයිතියකුත් නැහැ. අපි විමර්ශන කණ්ඩායම් ශක්තිමත් කළා. ඒ විතරක් නොවෙයි. ප්‍රහාරයට අදාළ විමර්ශන තොරතුරු වෙනස් කරපු අය, සාක්ෂි වෙනස් කරපු අය හිටියා. සත්‍ය හෙළිදරවු කරන්නන්ගෙන් පළිගැනීම් කළා, දේශපාලනඥයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත්තා. නමුත් අපි එහෙම කළේ නැහැ. නවතා දමා තිබුණු විමර්ශන 2024 අප්‍රේල් 20වන දින නැවත අපි ආරම්භ කළා. ඒවා නැවත CID එකට භාර දුන්නා. ඉතාම ස්වාධීනව ඒ CID විමර්ශන ගෙන යන්න අවශ්‍ය අවකාශ අපි සලසා දුන්නා.

බුද්ධි අංශවල සුළු පිරිසක් මේ කටයුතු සඳහා යොදාගෙන තිබෙනවා කියලා තමයි අපට හැඟෙන්නේ; ඉතා ම සුළු පිරිසක්. ඒ වාගේම රජයේ නිලධාරින්ගෙනුත් සුළු පිරිසක් මේ සඳහා යොදාගෙන තිබෙනවා. සමස්ත බුද්ධි අංශ වෙත අපි මේක ගළපන්නේ නැහැ; ගළපන්නත් බැහැ. එහෙම ගැළපීමක් ඇති කරන්නත් එපා. මේ සම්බන්ධව අපි සාධාරණව සිතිය යුතුයි. බුද්ධි අංශයේ සුළු පිරිසක් යොදාගෙන තමයි ඔවුන්ගේ දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්න මේ කටයුතුවලට සම්බන්ධ කරලා තිබෙන්නේ. මෙය, ඒ ක්‍රියාදාමයන්ට විරුද්ධව කරන විමර්ශනයකුත් නොවෙයි.

බුද්ධි අංශයට සම්බන්ධ යැයි කණ්ඩායමක් කිසියම් දේශපාලන අරමුණක් සාක්ෂාත් කර ගැනීමට මෙම අන්තවාදී කණ්ඩායමට සහාය දීමක් හෝ නොකර හැරීමක් හෝ වංක සහායක් දී ඇතැයි අනාවරණය කර ගැනීම සඳහා අපරාධ විමර්ශනයක් ඉතා ගැඹුරින් සිදු කරනු ලබනවා. නමුත් ඒක සමස්ත බුද්ධි අංශයට විරුද්ධව කරන එකක් නොවෙයි. අපේ බුද්ධි අංශ ඉතාම බුද්ධිමත්, වෘත්තීයභාවයෙන් උසස්, හැකියාවෙන් සමන්විත, හොඳින් කටයුතු කරපු බුද්ධි අංශ. උදාහරණයක් ගත්තොත්, ජාතික ආරක්ෂාව කියන්නේ රටේ සෑම පද්ධතියක්ම ආරක්ෂා කිරීමයි. විශාල පරාසයක් තුළ ගැබ් වී ඇති ඉතා සංකීර්ණ කරුණු පටිපාටියක් එකතු වෙච්ච, කරුණු රාශියකින් හැදිච්ච පද්ධතියක් තමයි ජාතික ආරක්ෂාව කියන්නේ.

එම නිසා යමක් සිදු වෙන්න කලින්, ජාතික ආරක්ෂාවට ලොකු බලපෑමක් වෙන්න කලින්, ඒක පස්සේ වෙන කරුණු ගොනු කරගෙන දුවන එකවත්, මාධ්‍ය සාකච්ඡා තියාගන්න දුවන එකවත් නොවෙයි කළ යුත්තේ. එවැනි දෙයක් වුණා නම් ඉතාම පරිස්සමින්, ඥානාන්විතව, බුද්ධියෙන්, බුද්ධි අංශ කළමනාකරණයෙන්, අපේ රාජ්‍යකරණයේ කළමනාකරණයෙන්, නීති පද්ධතිවල නිවැරදි කළමනාකරණයෙන් යුතුව වෘත්තීයභාවයෙන් කටයුතු කරන්න ඕනෑ. සිද්ධ වෙන්න යන දෙයක් වළක්වා ගැනීම තමයි ජාතික ආරක්ෂාවේ මූලධර්මය. ඒක තමයි එම ක්‍රමවේදයේ ප්‍රධාන අවශ්‍යතාව වෙන්නේ. ඒක තමයි විය යුත්තේ. යමක් වුණාට පස්සේ එම සිද්ධිය පස්සේ දුවගෙන ආපු නිසා තමයි මෙච්චර දුරකට මේ කටයුතු ගෙන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ සිද්ධිය වෙන්න කලින් කොච්චර තොරතුරු ලැබුණා ද? බුද්ධි අංශවලට තොරතුරු ලැබිලා තිබෙනවා; රාජ්‍ය බුද්ධි සේවයට තොරතුරු ලැබිලා තිබෙනවා. නමුත් ජාතික ආරක්ෂක කවුන්සලයවත් කැඳවා තිබුණේ නැහැ. එතැනදීවත් මේ සම්බන්ධව කථා කරලා තිබුණේ නැහැ. විධායකය කියනවා, අගමැතිතුමාට දැන්වූයේ නැහැ කියලා. අගමැතිතුමා කියනවා, විධායකයෙන් කථා කළේ නැහැ කියලා. ජාතික ආරක්ෂක කවුන්සලය මාස 6ක් වැනි කාලයක් එකතු වෙලා තිබුණේ නැහැ.

අපි බලයට පත් වුණාට පස්සේ දවස් 14කට සැරයක් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ආරක්ෂක කවුන්සලය රැස්වෙලා සාකච්ඡා කරලා අපි ඒ තීන්දු ගන්නවා. වගකීමෙන් යුතුව ඒ දේවල් අපි කරනවා. ජනාධිපතිවරණය පසුගිය සැප්තැම්බර් මාසයේ පැවැත්වුණා. අපේ ජනාධිපතිතුමා බලයට

පත්වුණාට පස්සේ -පාර්ලිමේන්තු මැතිවරණයට කලින්- අරුගම්බේ ප්‍රදේශයේදී යම් සිද්ධියක් මතු වුණා. ඒක ඉතාම සංකීර්ණ සිද්ධියක්. ජනාධිපතිවරණයට පස්සේයි ඒ සිද්ධිය වුණේ. හිතාගන්න පුළුවන් ද, මේ සඳහා සම්බන්ධ වෙන්නේ අපේ ඒ ඉන්න පරිණත, බුද්ධිමත්, වෘත්තීයභාවය තිබෙන බුද්ධි අංශයේ නිලධාරින් කියලා? ඔවුන් තමයි ඒ විශිෂ්ට ක්‍රියාදාමය කළේ. ඔවුන් ඒ අවශ්‍ය තොරතුරු රැස් කළා. සැක කටයුතු පුද්ගලයන් අත්අඩංගුවට ගත්තා. එම නිලධාරින් හරි මහට යොදවා විමර්ශන කටයුතු කළා. එම තොරතුරු අරගෙන ඇවිත් ඒ තත්ත්වය සමථයකට පත් කළා. අපි කලබල වුණේ නැහැ. මාධ්‍ය සාකච්ඡා පැවැත්වුයේ නැහැ. අපි ඒ පස්සේ දිව්වේ නැහැ. අපි ඒ දේ කරන්න අවශ්‍ය ස්වාධීනත්වය ඔවුන්ට ලබා දුන්නා. මෙම සිද්ධිය ඇතිවීම වළක්වා ගැනීමට හැකියාව තිබියදී වළක්වා නොගත් නිලධාරින් කිහිපදෙනෙක් සම්බන්ධව ඉදිරියේදී අනාවරණය වන තොරතුරු අනුව අපරාධ නීතිය යටතේ අපි කටයුතු කරනවා.

අපරාධ නඩු විභාග කිරීමේදී ගත වන කාලය සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් විවාදාත්මක තත්ත්වයක් තිබෙන්නේ. ඒ සඳහා නඩු විභාග කඩිනම් කිරීම සඳහා රජය දැනටමත් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. එය වැදගත් අංගයක් බව රජය අවබෝධ කරගෙනත් තිබෙනවා.

Madam, if we take all the points I mentioned earlier, they are very strategic and nationally valued points. With a keen, independent and efficient investigation process reintroduced by the Government involving State investigation units and legal processes, there is no need to have a special prosecuting office established with international assistance to conduct these investigations independently. We have the fullest potential to handle this; our legal system has the fullest potential. Our intelligence community, services and contingent units have the fullest potential, capability, knowledge, intellectuality and capacity to handle this; we have all that. Therefore, there is no need to bring in or integrate international assistance into our legal system since all that is needed has been arranged by the Minister of Justice and National Integration.

ඒක නිසා සත්‍යය සොයා ගැනීම සඳහා අපි කවදත් කටයුතු කරනවා. මේ සම්බන්ධව අපි ඉදිරියටත් කටයුතු කරනවා. මේකට Scotland Yardවලින්වත්, වෙන කොහෙන්වත් කවුරුවත් ගේන්න අපට අවශ්‍යතාවක් නැහැ. අපට ඒ full potential එක තිබෙනවා. අපි මෙතැනින් ඈත් වෙන්නේ නැහැ, වග කියන ආණ්ඩුවක් හැටියට, රජයක් හැටියට. අපි මේ වෙනුවෙන් බැඳිලා ඉන්නවා. ඉදිරියේදී ඔබතුමන්ලාට දැකගන්න පුළුවන්, මේ සිද්ධිය විතරක් නොවෙයි, අනෙක් සිද්ධීන් සම්බන්ධවත් නීතිය ක්‍රියාත්මක වන ආකාරය. පසුගිය කාලයේ රටක් වැටෙන්න මූලික වෙච්ච ඒ දූෂිත දේශපාලනඥයන්ට විරුද්ධව දැන් අපි කටයුතු කරනවා. ඒ කිසිදේකට අපි අත ගහන්න යන්නේ නැහැ. ඒ සම්බන්ධව කොයි විධියට නීතිය ක්‍රියාත්මක වුණත්, ඒ දේවල් කවුරුවත් නවත්වන්න යන්නේත් නැහැ.

ඒ කරුණු සියල්ලක්ම සැලකිල්ලට ගෙන මේ වින්දිතයන්ට වෙච්ච අසාධාරණය සම්බන්ධයෙන් සොයා බලා අපි අවශ්‍ය කටයුතු කරනවා. මොකද, මේ නිසා අපි කොච්චර කනස්සල්ලට පත් වුණා ද? ඒ සම්බන්ධව අපේ රජය විසින් සාධාරණය ඉෂ්ට කරනවා කියන එකත් කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[2.19 p.m.]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, first of all, I must thank the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam for bringing in this Adjournment Motion. However, before starting my comments on this Motion, I must say something about the revised pension that the retired people are going to get on the $10^{th}$ of July.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2016 සිට 2019 දක්වා විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප 2025 ජුලි මාසයේ 10වැනි දා ඉඳලා වැඩි කරන්න අපේ ආණ්ඩුව කටයුතු කළා. පසුගිය 01වැනි දා එම චක්‍රලේඛය නිකුත් කළා. මේ වනකොට සමහරුන්ගේ විශ්‍රාම වැටුප වැඩි වෙලා තිබෙනවා. දැන් මට විවිධ messages එනවා, "මේ ආණ්ඩුව බොරු කළා" කියලා. ඒකට හේතුව මොකක්ද කියලා මම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන් විමසුවාම එතුමා කිව්වේ, "විශ්‍රාමිකයන්ගේ pension එක හදන්න වෙලාවක් තිබුණේ නැහැ. ඒ නිසා වැඩි හොඳට හැම විශ්‍රාමිකයෙකුටම රුපියල් 2,000ක්, රුපියල් 2,500ක් හෝ සමහර අයට රුපියල් 4,500 බැගින් ගිණුම්වලට දාලා තිබෙනවා. විශ්‍රාමික ප්‍රජාව එය වරදවා තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා එය නිවැරදි කරන්න ඕනෑ. ඔවුන්ගේ නිවැරදි විශ්‍රාම වැටුප ඉදිරියේදී හදනවා" කියායි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පැත්තෙන් අපට එහෙම තමයි අවධාරණය කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද විවාද කරන මාතෘකාව ගත්තොත්, පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ 2019 අප්‍රේල් 21වැනි දා කියන එක අපි දන්නවා. පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වෙලා මේ වනකොට මාස 63ක් ගත වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ මාස 63න්, මාස 9ක් තමයි අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට අයිති. මාස 54ක්ම මීට මොහොතකට පෙර කථා කරපු විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම වාගේම පොහොට්ටුවේ කණ්ඩායම - ඒ දෙගොල්ලන් - තමයි ආණ්ඩු කළේ. ඒකෙන් මාස 7ක් සජිත් ප්‍රේමදාස, රංජිත් මද්දුම බණ්ඩාර හා කවින්ද හේෂාන් ජයවර්ධනලා තමයි ආණ්ඩු පක්ෂයේ හිටියේ. මාස 7ක්! ඒ විතරක් නොවෙයි, ඉතුරු මාස ටිකේ බලයේ හිටියේ පොහොට්ටුවේ ආණ්ඩුව. හැබැයි, මේ මාස 9 තුළ අපි ගත්ත පියවර එකින් එක, එකින් එක අද අපේ මහජන ආරක්ෂක ඇමතිතුමාගේ පැත්තෙන් පැහැදිලි කළා. නමුත්, එම විමර්ශනවලදී හෙළි වූ කරුණුවලින් කියන්න පුළුවන් දේවල්, සංවේදී කරුණු වාගේම බරපතළ කරුණු තිබෙන බව අපි දන්නවා. ඒ සියල්ල ගරු සභාව තුළ හෙළිදරව් කරන්න බැහැ. ඒ වාගේම එම පරීක්ෂණ සියල්ල ගැන අපට ප්‍රසිද්ධියේ කියන්න බැහැ. එතකොට එතැනින් එහාට පරීක්ෂණයක් නැහැ. ඒ නිසා තමයි කියන්න පුළුවන් දේ කියමින් අපි ඉතුරු වැඩ ටික කරමින් යන්නේ.

අපි දැක්කා, මෙතුමන්ලා මැල්කම් රංජිත් කාදිනල්තුමාගේ යම් යම් ප්‍රකාශ අරගෙන කථා කරනවා. මෙතුමන්ලා තමන්ට ඕනෑ

[ගරු මහින්ද ජයසිංහ මහතා]

කෑල්ල විතරක් අරගෙන කථා කරනවා. අපි දන්නවා, උන්වහන්සේ ආණ්ඩුවට විවිධ අවස්ථාවල බලපෑම් සහගත ප්‍රකාශ කරන බව. ඒක හොඳයි. හැබැයි, කාදිනල්තුමාගේ ප්‍රකාශ අල්ලාගෙන එතුමන්ලා කාලකණ්ණි විදියට සතුටු වනවා. හැබැයි, උන්වහන්සේ මේ ආණ්ඩුවේ ගමන් මඟ ගැන, මේ ආණ්ඩුව පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාගේම ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග පිළිබඳව අවස්ථා කීයකදී ප්‍රශංසා කරලා තිබෙනවාද? නමුත්, ඒවා මොකක්වත් කියන්නේ නැහැ. අවශ්‍ය ටික විතරක්, අවශ්‍ය කෑල්ල විතරක් ගන්නවා. මම මීට කලිනුත් මේ ගැන කියලා තිබෙනවා. දැන් මෙතුමන්ලා තොරතුරු ගන්න එකම source එක social media. Social mediaවල පළ වුණු මොකක් හෝ පට්ටපල් බොරුවක් මෙතැනට අරගෙන ඇවිල්ලා, ඒක මෙතැන පෙන්වලා අපේ මන්ත්‍රීවරුන්ට එක එක ජාතියේ කථා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා හැටියට එතුමා බොහොම වගකීමෙන් මේ ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමා මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් මම එතුමාට අභියෝග කරන්නයි හිටියේ. මේ වෙලාවේ එතුමා සභාවේ නැති එක හොඳයි. "දේශපාලන පළිගැනීම් නතර කරන්න" කිව්වා. අපි කරපු එක දේශපාලන පළිගැනීමක් පුළුවන් නම් මේ සභාව ඇතුළට ඇවිල්ලා කියන්න. විපක්ෂ නායකතුමාට බැරි නම් විපක්ෂයේ ඉන්න කවුරු හෝ එතුමා වෙනුවෙන් ඉදිරිපත් වෙලා කියන්න, අපි කරපු එක දේශපාලන පළිගැනීමක්. මම අභියෝග කරනවා, අපි කරපු එක දේශපාලන පළිගැනීමක් කියන්න කියලා. එස්.එම්. රංජිත් සිරගත කරපු එක දේශපාලන පළිගැනීමක්ද? පිල්ලෙයාන් බන්ධනාගාරගත වෙලා ඉන්න එක දේශපාලන පළිගැනීමක්ද? එස්.එම්. චන්ද්‍රසේන පසුගිය දවස්වල සිරගත කළ එක දේශපාලන පළිගැනීමක්ද? මහින්දානන්ද සිරගත කරපු එක දේශපාලන පළිගැනීමක්ද? *[බාධා කිරීමක්]* ඔබතුමා සද්ද නැතුව ඉන්න. ආන් වූන් වෙලා. *[බාධා කිරීමක්]* ආන් වූන් වෙලා. ආන් වූන් වෙන්නේ නැතුව ඉන්න. මේවා දේශපාලන පළිගැනීම්ද? *[බාධා කිරීමක්]* ඔබතුමාගේ නමත් එළියේ වෙනස් කරලා තිබෙන්නේ, "ආන් වූන් වුණා" කියලා. ඒ නිසා වූන් වෙන්නේ නැතුව ඉන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉතා පැහැදිලිව අපි කියන්න ඕනෑ, මෙහිදී කිසිදු දේශපාලන පළිගැනීමක් වෙලා නැති බව. ඩී.වී. චානක මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ නායක නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. ඊයේ එතුමා ගරු සභාවේදී වෛද්‍ය මහේෂිගේ දුව ගැන කථා කරලා තිබුණා. ඒ වෙලාවේදී මම පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. එතුමියගේ දුවගේ කටින් වැරදිලා වචනයක් පිට වුණාය, ඒකට මේ ආණ්ඩුව පළිගනිපු එක ලජ්ජයි කියලා එතුමා කියා තිබුණා. ලජ්ජා වෙන්න ඕනෑ ඒගොල්ලන්. එතුමා දැන් ගරු සභාවේ නැතත් මම කියන දේ අහගෙන ඉඳලා පස්සේ දවසක හෝ එතුමාට උත්තර දෙන්න පුළුවන් නේ. තාජුඩීන් ඝාතනය කළේ වචනයක් පිට වුණු නිසා. ඒ වචනය මොකක්ද කියලා මම මේ ගරු සභාවේ කියන්නේ නැහැ. වචනය මොකක්ද කියලා ඒගොල්ලන් දන්නවා. ඒ වචනය පිට වුණු නිසා තමයි තාජුඩීන් ඝාතනය කළේ. ඒ වෙලාවේ තාජුඩීන්ගේ දරුවා ගැන කැක්කුමක් තිබුණේ නැහැ, ඒ මහත්වරුන්ට.

නාමල්ලාට, යෝෂිතලාට, රෝහිතලාට එදා තාජුඩීන්ගේ දරුවා ගැන කැක්කුමක් තිබුණේ නැහැ. හැබැයි, අර උගත් වෛද්‍යතුමියගේ,- මම හිතනවා, දුවත් උගත් වෙන්න ඇති කියලා. උගත්ද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. මා ළඟ ඡායාරූපයකුත් තිබෙනවා, මහින්ද රාජපක්ෂත් එක්ක ඔය කියන වෛද්‍යවරියගේ දුව එකට ඉඳගෙන ගහපු. ඇයගේ කටින් වැරදිලා වචනයක් පිටවුණා, ඒ වචනයට මේ ආණ්ඩුව පළිගන්නවාය කිව්වා. හැබැයි, තාජුඩීන්ගේ කටින් වචනයක් වැරදුණා කියලා -වරද්දලා නොවෙයි, ඇත්ත වචනයක් පිට වුණා කියලා- ඒකට මේ මහත්වරු ඔහුව අමු අමුවේ ඝාතනය කළා. ඒ අය තමයි අද මේ වෛද්‍යතුමියගේ දුව ගැන මහත් වේදනාවෙන් කථා කරන්නේ. මේගොල්ලන් කලබල වන එක ගැන අහන්න දෙයක් නැහැ. ඇයි, ඒ? දැන් බන්ධනාගාරය ටිකෙන් ටික එක එක දිස්ත්‍රික්ක අත්පත් කර ගනිමින් යනවා නේ. පසුගිය දවස්වල මහනුවර දිස්ත්‍රික්කය තමයි බන්ධනාගාරය අත්පත් කරගෙන හිටියේ. දැන් අනුරාධපුර දිස්ත්‍රික්කය බන්ධනාගාරයේ බලය අත්පත් කර ගනිමින් ඉන්නවා. අපි දන්නේ නැහැ, තවත් ටික දවසක් යනකොට හම්බන්තොට බලය අත්පත් කර ගනියිද කියලා. අපි ඒ ගැන දන්නේ නැහැ. ඒවා නීතියට භාරයි. මොකද, කැබිනට් මණ්ඩලය තීරණය කරලා තිබෙනවා මම දැක්කා, මධ්‍යම සංස්කෘතික අරමුදල ගැනත් විමර්ශනයක් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
එහෙම නම් හම්බන්තොට තමයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඊත් හම්බන්තොට නේ; ඒකත් හම්බන්තොට. ඒ නිසා ඊළඟ පෝලිම හම්බන්තොට වෙන්න පුළුවන්. ඒ නිසා භයට එක එක ජාතියේ ඒවා කියවනවා, මේ ගරු සභාවට ඇවිල්ලා. කියවලා දුවනවා. මේ ගරු සභාවේ ඉන්නේත් නැහැ. ඒ නිසා අපි මේ කාරණයත් කියන්න ඕනෑ. මට මතකයි, පාස්කු ප්‍රහාරය සිද්ධ වෙච්ච අප්‍රේල් 21වැනි දා රාත්‍රියේම මම මගේ දිස්ත්‍රික්කයේ තිබෙන කටුවාපිටිය පල්ලියට ගියා. හදවතක් තිබෙන කිසිවෙකුට ඒ දර්ශන බලන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ දර්ශන මතක් වෙනකොට අදත් අපේ හද කම්පාවට පත් වෙනවා. 2024 සැප්තැම්බර් 21වැනි දා පැවති ජනාධිපතිවරණයේදීත්, 2024 නොවැම්බර් 14වැනි දා පැවති මහ මැතිවරණයේදීත් අපි මේ රටේ ජනතාවගෙන් බලය ලබා ගත්තේ පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කරන්න වාගේම ප්‍රහාරකයන්ට නීතිය ක්‍රියාත්මක කරන්නයි. ඒ නිසා ඒක එක දශමයකින්වත් අපි පැහැර හරින්නේ නැහැ. ඔව්, සමහර අවස්ථාවලදී අපි කිව්වා, අප්‍රේල් 21වැනි දාට පෙර අපි මේ පරීක්ෂණ අවසන් කරන්න කටයුතු කරනවාය කියලා. ඒක අපේ target එක. ඕනෑම වැඩකදී අපි එහෙම තමයි. අපි ඉලක්ක කරනවා. ඒ වාගේ අපි ඉලක්ක කළා, අප්‍රේල් 21වැනි දාට කලින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් කරලා, වින්දිතයන්ට, අපේ මැල්කම් රංජිත් කාදිනල්තුමා ඇතුළු සමස්ත කතෝලික බැතිමතුන්ට, මේ පාර්ලිමේන්තු ගැලරියේ ඉන්න පිරිස ඇතුළු සමස්ත ලාංකීය ජනතාවට යුක්තිය ඉටු කරන්න පුළුවන් වෙයි කියලා. එහෙම ඉලක්ක තියා ගන්න එක වැරැද්දක් නොවෙයි. ඒ වෙනුවෙන් target එකක් තියාගෙන අපි වැඩ කරන එක වැරැද්දක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් කියන්න පුළුවන් කරුණු අපේ ආනන්ද විජේපාල ඇමතිතුමා කිව්වා. හැබැයි, විවිධ කරුණු මත ඒ කටයුතු ප්‍රමාද වෙලා තිබෙනවා. එහෙත්, අපි වගකීමෙන් මේ රටටත්, මේ රටේ ජනතාවටත් අවධාරණය කරමින් කියනවා වාගේම සහතික වෙනවා, පාස්කු ප්‍රහාරයට අදාළව සියලු විමර්ශන ඉදිරියට ගෙන යනවාය කියලා.

මම දැක්කා, රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කියනවා, එතුමන්ලාගේ නිලධාරීන්ගෙන් ලු, දැන් අපි පරීක්ෂණ කරන්නේ කියලා. ඒක මාර වැඩක් නේ. අපි දන්නේ නැහැ, පොලීසියේ, රාජ්‍ය සේවයේ සජබයේ නිලධාරීන් ඉන්නවාය කියලා. අද තමයි

ඒක දැන ගත්තේ. සජබයේ නිලධාරින්, මාලිමාවේ නිලධාරින්, පොහොට්ටුවේ නිලධාරින් කියලා ජාතියක් නැහැ. රටේ ඉන්නේ රජයේ නිලධාරින්, රජයේ පොලීසිය, රාජ්‍ය සේවකයෝ. මේගොල්ලන්ට අමතක වෙලා, මේගොල්ලන් ඒ කාලයේ කරපු කෙළි දැන් කියැවෙනවා; කටින් පනිනවා. ඇයි, ඒ? මේගොල්ලන්ගේ නිලධාරින් ද! රජයේ නිලධාරින් ඉන්නේ. අපි හොඳම විමර්ශන කණ්ඩායම්වලට මේ කටයුත්ත භාර දීලා තිබෙනවා. අපට මතක විධියට ගෝඨාභය රාජපක්ෂ 2019දී බලයට පත් වෙලා ඔක්කෝටම කලින් කරපු දේ තමයි පාස්කු ප්‍රහාරය පිළිබඳව විමර්ශනය කරපු විමර්ශන නිලධාරින් ටික එළියට දමපු එක. ඇත්ත නිලධාරින්, හරියට වැඩේ කරපු නිලධාරින් ටික එළියට දමපු එක තමයි එතුමා කරපු පළමුවැනි වැඩේ. ඒ නිසා අපි කියන්න ඕනෑ, අපේ නිලධාරින් කියලා කොටසක් නැහැ කියන එක. මේ රටේ යුක්තිය, සාධාරණත්වය බලාපොරොත්තු වන ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් අවංකව සේවය කිරීම තමයි පොලීසිය ඇතුළු රාජ්‍ය සේවකයාගේ කාර්යභාරය. ඉතින් ඔවුන් ඒක නිවැරදිව කරනකොට ඒගොල්ලන් සජබයේ කරගන්න හදනවා. අනේ, කවුරුවත් අපේ නම් කරන්න යන්න එපා. අපි කවුරුවත් රජයේ සේවකයන්, පොලීසිය අපේ මාලිමාවේ කරගන්න යන්නේ නැහැ. අපි එහෙම කරගන්න යන්නේ නැහැ. අපට ඕනෑකම තිබෙන්නේ, රට වෙනුවෙන් ඇත්ත සාධාරණත්වය, යුක්තිය ඉටු කරන්න; පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙනුත් ඇත්ත සාධාරණත්වය, යුක්තිය ඉටු කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඒ නිසා මට අවසන් වශයෙන් මේ කාරණය කියන්න ඕනෑකම තිබෙනවා. මම නැවතත් ස්තුතිවන්ත වෙනවා, මේ Motion එක ගෙනාපු ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමන්ලා හොඳයි. මෙහෙම pressure එකක් දෙන එක හොඳයි, නරක නැහැ. එහෙම කරන්න ඕනෑ. හැබැයි, ඒ අතරේ වැරදි මත හදන්නත් එපා. අපි ඒ ඉල්ලීමත් කරන්න ඕනෑ. වැරදි මත හදන්න එපා. මොකද, මේ ආණ්ඩුව ජනතාවට වග කියන ආණ්ඩුවක්. මේක ජනතාවාදී ආණ්ඩුවක්. මේක මහජන ආණ්ඩුවක්. මේක එක එක්කෙනාට අයිති ආණ්ඩුවක් නොවෙයි.

අපි දැක්කා අද පිල්ලෙයාන් ගැනත් කියනවා. පිල්ලෙයාන් එක්ක ඩීල් එකක් තිබෙනවා නම් එයාගේ අනික් එක්කෙනා අපි ගනිවියැ. ඔබතුමා ම කිව්ව ඉනියභාරතී අපි ගනිවියැ. අපට ඒ විධියට කාත් එක්කවත් ඩීල් නැහැ. අපට එකම ඩීල් එක තිබෙන්නේ මහජනතාවත් එක්ක. ඒ deal එක හරියට, නිතට, අකුරට ඉටු කරනවාය කියන සහතිකය දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.31]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කාරණා කිහිපයක් කිව්වා. එකක් තමයි, දේශපාලන පක්ෂවල රජයේ නිලධාරින් නැහැ කිව්වා. ඉතිහාසය ගැන බැලුවොත් නම් අපට ඒ කාරණයට එකඟ වෙන්න පුළුවන්. හැබැයි අද පොලීසිය භාර ලේකම්තුමා ඔබතුමන්ලාගේ පැලවත්ත කාර්යාලයේ press conferences තියපු කෙනෙක්. ඒ වාගේම CID එකේ අධ්‍යක්ෂකතුමා පැලවත්ත කාර්යාලයේ press conferences තියපු කෙනෙක්. ඊට පස්සේ ඔබතුමන්ලාගේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා පැලවත්ත කාර්ලයාලයේ press conferences තියපු කෙනෙක්. සාමාන්‍යයෙන් ඒ තනතුරුවලට ගන්නා ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේ තනතුරුවලට ගැනීමේදී exams තිබෙනවා. ඒ කිසිම දෙයක් නැතුව ඔබතුමන්ලාගේ කාර්යාලයට ඇවිල්ලා, ඔබතුමන්ලාගේ වේදිකාවට ඇවිල්ලා දේශපාලනය කළාම තනතුරු දෙනවා. ඒක දේශපාලනය තමයි. ඒ අයත් මාලිමාවේ තමයි. එතකොට, පොලීසිය භාර ලේකම් මාලිමාවේ තමයි; පක්ෂග්‍රාහී තමයි. එතකොට CID එකේ අධ්‍යක්ෂකත් පක්ෂග්‍රාහී තමයි. ඔබතුමන්ලා දිගින් දිගටම කථා වුණා, වගකීම පැහැර හැරියා කියලා. වගකීම පැහැර හරිනකොට CID එකේ අධ්‍යක්ෂක ලෙස හිටියේ කවුද? CID එකේ හිටපු DIG කවුද? අදටත් ඉන්නේ ඒගොල්ලන්ම නේ. බුද්ධි අංශ වාර්තා 90ක් තිබියදී, ඒ වාගේම මේ පිළිබඳ සිද්ධි 17ක් වාර්තා වෙලා තිබියදී,-

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා "මෙතුමා" කියලා කිව්වා නේ. "නියෝජ්‍ය ඇමති" කිව්වාම වෙන කවුරුත් නොවෙයි නේ. මම නේ ඔබතුමාට කලින් කථා කළේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
හැබැයි, මගේ කාලය අඩු කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම විනාඩියයි ගන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, එතකොට, එදා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් හිටියේ කවුද? SriLankan Airlines එකේ සභාපති විධියට හිටියේ කවුද? මේ වෙලාවේ ඒ ටිකත් කියාගෙන ගියා නම් හොඳයි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ කියන්නේ ඔබතුමන්ලා දැන් පසුගිය ආණ්ඩු ගිය පාරේද යන්නේ? නැත්නම්, පසුගිය ආණ්ඩු ගිය පාරේ ඊටත් වැඩිය හොඳට යනවාද? "ගිය ආණ්ඩුව එක්කෙනෙක් දැම්මා නම් අපි හතරදෙනෙක් දානවා" කියන එකද ඔබතුමන්ලා කියන්නේ? හැබැයි, ඔබතුමන්ලාගේ දැනට ඉන්න CID එකේ අධ්‍යක්ෂකතුමාගේ හොඳ voice-cuts තිබෙනවා. දැනට පොලීසිය භාර ලේකම්තුමාගේ voice-cuts තිබෙනවා. නමුත් පාර්ලිමේන්තු Standing Orders අනුව මෙතැන ඒවා දාන්න බැරි නින්දා මම දාන්නේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු අද උදේ දිගින් දිගටම ඒ පරීක්ෂණවල තත්ත්වය ගැන ඇහුවා. මේවා ඇමතිතුමාගෙන් අහන්න එපා. ඔබතුමන්ලා රන්ජන් රාමනායකට call කරන්න. රන්ජන් රාමනායක මහත්මයාට call එකක් දුන්නොත් කියයි, "මෙන්න මේක තමයි පරීක්ෂණයේ තත්ත්වය, මෙන්න මෙතැන තමයි දැන් පරීක්ෂණය තිබෙන්නේ, මම විවාදයකට යනවා, මට message කරලා කියන්න" කියලා. ඒක නිසා ඔබතුමන්ලා අපට පරීක්ෂණ ගැන කියන්න එපා. පොලීසිය භාර ලේකම්තුමා ම කියනවා, මේ ප්‍රහාරයට ISIS සල්ලි ආවේ නැහැ, accounts 42ක් seize කළා කියලා. ඒ accounts 42 මාලිමාවේ ජාතික ලැයිස්තු අපේක්ෂකයාගේ ළමයින් දෙදෙනාගේ. ඒ දෙදෙනා තමයි සල්ලි යෙදෙව්වේ, ඒ දෙදෙනා තමයි බෝම්බ පිපිරෙව්වේ. ඒ වාගේම අනුර කුමාර දිසානායක මහත්තයා ළඟ ඕනෑම කෙනෙකුගේ ෆයිල් තිබෙනවා නේ. මේ පාර්ලිමේන්තුවේ ඕනෑ කෙනෙක් නැඟිට්ටොත් එතුමා කියනවා, "ආ... ඔයාගේ මේ ෆයිල් එක තිබෙනවා, මෙයාගේ මේ ෆයිල් එක තිබෙනවා" කියලා. හැමෝගේම ඒවා තිබෙනවා කිව්වා. බිමල් රත්නායක ඇමතිතුමනි, එතුමා හැම කෙනා ගැනම කියනවා. හැබැයි, අඩුම ගණනේ ඡන්දයකටවත් රවුමක් යවන්නේ නැතුව තමන්ගේ ජාතික ලැයිස්තුවට ඇතුළත් කරලා,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු ඇමතිතුමා, මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

"මගේ ළඟ ෆයිල් තිබෙනවා" කියලා කිව්වේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නේ. අනුර දිසානායක ජනාධිපතිතුමා එහෙම කියලා නැහැ. හැම කෙනාගේම ෆයිල් තිබෙනවා කියලා කිව්වේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමා ගිය සැරේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඒ වෙලාවේ එතුමා මේ පැත්තේ ඉඳලා නැඟිටලා තමයි කිව්වේ. "ඔබතුමා නැඟිටින්න, ඔබතුමාගේ file එක මගේ ළඟ තිබෙනවා, ඔබතුමා නැඟිටින්න, ඔබතුමාගේ ෆයිල් එකත් මගේ ළඟ තිබෙනවා" කිව්වා. හැබැයි, එතුමා ළඟ ඊබ්‍රහීම්ගේ ෆයිල් එක තිබිලා නැහැ. ඊබ්‍රහීම් බෝම්බ පුපුරවනකොට ළමයින් ටික නම් සල්ලි යෙදෙව්වේ, ඒගොල්ලන් නම් ඒක කළේ, දැන් පොලීසිය භාර ලේකම්තුමා ම කියනවා නම්, සල්ලි දැම්මේත් ඊබ්‍රහීම් නම්, මේ පක්ෂය ඒකට සම්බන්ධ නැද්ද?

අද ජනාධිපති කොමිෂන් වාර්තාවල කියනවා. මේ ගැන පරීක්ෂණ දෙකක් වුණා. එකක් බෝම්බ පත්තු කරපු අයට. ඊළඟට, කුමන්ත්‍රණ කරපු අයට. තුන්වෙනියට වගකීම් පැහැර හැරපු අය. වගකීම් පැහැර හැරපු දෙන්නාට අපරාධ චෝදනා අනුව නඩු දාන්න කියලා ජනාධිපති කොමිෂන් වාර්තාවේ තිබෙනවා. මේ වාර්තාවල නඩු දාන්න කියලා තිබෙද්දී, ඔවුන්ට පරීක්ෂණය භාර දුන්නාම නඩු දායිද? වැඩිය ඕනෑ නැහැ, සිවිල් නඩුවක් තිබුණා පොලීසිය භාර ලේකම්තුමාට. මොකක්ද? මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා accident එකක් කරගෙන. මේක ගෙනියනවා උසාවියට. උසාවියට ගිහිල්ලා කියනවා, මේකේ,- *[බාධා කිරීමක්]* නැහැ, මත්පැන්. සමාවෙන්න, සමාවෙන්න, මත්පැන් පාවිච්චි කරලා. මේකේ චෝදනා තුනක් තිබෙනවා. අන්තිමට උසාවියට ගිහිල්ලා කියනවා, මේකේ චෝදනා දෙකක් අයින් කරන්න, බීලා හිටියා කියන එකත් අයින් කරන්න කියලා. හිතන්න, උසාවියට ගිහිල්ලා එහෙම කියද්දී, නඩුකාරතුමිය ඒක අයින් කර දමනවා. හැබැයි, එහෙම කෙනෙකුට චෝදනා එල්ල වෙද්දී, තමන්ට චෝදනා එල්ල වෙද්දී,- *[බාධා කිරීමක්]* මට තව විනාඩියයි තිබෙන්නේ. ඔබතුමා ඊට පස්සේ කියන්න.*[බාධා කිරීමක්]* හරි, වෙලාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා සමාව ගත්තේ මොකටද ආනන්ද විජේපාල ඇමතිතුමාගෙන්?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

එතුමාගෙන් මම මොකටද සමාව ගන්නේ? [බාධා කිරීමක්] මම කවදාවත් එතුමාගෙන්,-[බාධා කිරීමක්]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා දැන් කිව්වා නේද, "සමාවෙන්න" කියලා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මොකක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා දැන් කිව්වා නේ, ආනන්ද විජේපාල ඇමතිතුමාට, මොකක් හරි ඒ කියැවුණු දෙයකට "සමාවෙන්න" කියලා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

එහෙම කිසිම දෙයක් කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමාට මොකටද සමාවෙන්න ඕනෑ.*[බාධා කිරීමක්]* මොකක්ද? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මත්ද්‍රව්‍ය,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමාට මයික් එක දෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සමාව ගත්තේ මොකටද?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මම කිව්වේ, මත්ද්‍රව්‍ය නොවෙයි, මත්පැන් පානය කරලා කියලායි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ආ.. ඔව්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මත්පැන් පානය කරලා ගිහිල්ලා එතුමාට චෝදනා තුනක් තිබුණා. හැබැයි, පොලීසියෙන් ගිහිල්ලා අධිකරණයට කියනවා, දැන් චෝදනා දෙකක් අයින් කර ගන්න කියලා. මොකද, පොලීසිය භාර ලේකම් හින්දා. එතකොට වගකීම පැහැර හැරලා තියෙනවා කියලා ජනාධිපති කොමිෂන් වාර්තාවකින් කියන අය, මේ වින්දිතයන්ට සහනයක් අරගෙන දෙයිද? මේ ගොල්ලන් මේ පරීක්ෂණ කරයිද? මේ ගොල්ලන් පරීක්ෂණ කරනවා, ඒ අය නිදොස්කොට නිදහස් වෙන්න. ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවේ අපේක්ෂකතුමාට විරුද්ධව අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, ඔබතුමන්ලාගේ පරීක්ෂණයක්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
2010දී ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තු අපේක්ෂකයාගේ accountsවලින් තමයි සල්ලි ආවේ. එතුමා අත්අඩංගුවට ගන්න වෙලාවේ තර්ජනය කරනවා, පොලීසියට. හැබැයි, එහෙම කරද්දී, ඔබතුමන්ලා දැනගෙන හිටියේ නැද්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
නැත්නම් ඔබතුමන්ලා දැන දැන ද මේකට සහයෝගය ලබා දුන්නේ කියලා ඔබතුමන්ලා උත්තර දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු චානක මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපති කොමිෂන් වාර්තාවක් ගැන. මම දැන ගන්න කැමැතියි, ඒ මොන ජනාධිපතිතුමා දාපු කොමිෂන් වාර්තාවක්ද කියලා? මොන ජනාධිපතිතුමාගේද?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මම හිතන විදියට, ඒක රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කාලයේ වෙච්ච එකක්. ඕනෑ නම් මම නාම ලේඛනයත් කියන්නම්. ඒකේ හිටපු මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලා,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ, එහෙම නොවෙයි, මොන ජනාධිපතිතුමා පත් කරපු කොමිෂන් වාර්තාවක්ද?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඔබතුමා කියන්නේ මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලා දැම්මාම- *[බාධා කිරීමක්]* ඇයි, මොන ජනාධිපතිතුමා ද කියන එක ප්‍රශ්නයක්ද කියන්නකෝ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, මේක වැදගත් නේ. ඔබතුමා දැන් මේ ලේකම්ලා පිළිබඳ විවේචනය කරන්නේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවක ප්‍රතිඵලයක් ලෙස නේ. මම දැන ගන්න කැමැතියි, ඒ මොන ජනාධිපතිතුමා පත් කරපු කොමිෂන් සභා වාර්තාවද කියන එක ගැන. ඒක ඉතින් වැදගත් දෙයක් නේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
හරි, බිමල් රත්නායක ඇමතිතුමා. ඒක මම හිතන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයා පත් කරපු එකක්. හැබැයි, මම චෝදනා කරන්නේ ඒක ගැන විතරක් කියලා නොවෙයි. බුද්ධි අංශ වාර්තා 90ක් තිබෙද්දී, CID එකේ අධ්‍යක්ෂ, ඒ වාගේම DIG හිටියේ එතුමන්ලා නම්, ඒ වගකීමට ඕනෑද ජනාධිපති කොමිෂන් වාර්තා? ඒකට වෙන කිසි දෙයක් ඕනෑ නැහැ. ඒක රටේ ජනතාව දන්නවා. බුද්ධි අංශ වාර්තා තිබෙද්දී තමයි මේ ප්‍රහාරය වුණේ. ඒ වගකීම කඩ කරපු නිලධාරින්ට මේකෙන් අපරාධ චෝදනා යටතේ නඩු දාන්න කිව්වාම, ඒ අය ඔබතුමන්ලාගේ දේශපාලන වේදිකාවට ආවාම ඒ ගොල්ලන්ට තනතුරු දීලා කටයුතු,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Standing Order එකත් කියලාම කියන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට දැන ගන්න ඕනෑ, සභානායකතුමාට කැමැති කැමැති වෙලාවට නැගිටලා අදහස් ප්‍රකාශ කරන්න මොන ස්ථාවර නියෝග යටතේද ඔබතුමිය allow කරන්නේ කියලා. මොකද,

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

අපටත් ඒ ස්ථාවර නියෝගය පොඩ්ඩක් කියලා දෙන්න. මොකද, එතුමාගේ කථාව අතර සභානායකතුමා හතර පස් වතාවක් නැඟිටලා,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභානායකතුමාට හා විපක්ෂයේ සංවිධායකතුමාට අනිවාර්යයෙන් අවස්ථාව ලබාදිය යුතුයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නැහැ, නැහැ, ස්ථාවර නියෝග යටතේ එහෙම නම් අපටත් ඒ අවස්ථාව දෙන්න. මේක ඉතා අසාධාරණයි. සභානායකතුමාට විතරක් ඕනෑම අවස්ථාවක දෙනවා නම් අදහස් ප්‍රකාශ කරන්න, ඒක ඉතාම අසාධාරණයි නේ. අපටත් ඒ අවස්ථාව දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා සභානායකතුමා වුණා නම් ඒ අවස්ථාව ලැබෙයි. ඒක, එක. දෙක, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම හැම වෙලාවේම ගරු චානක මන්ත්‍රීතුමාගේ අවසරය මතයි නැඟිට්ටේ. කථිකයාගේ අවසරය මත එහෙම පොඩි engagementsවලට යන්න පුළුවන්. ඒ සභානායක ධුරය නිසා නොවෙයි. මම ප්‍රාර්ථනා කරනවා, රාසමාණික්කම් මන්ත්‍රීතුමාට සභානායක ධුරයට එන්න අවස්ථාව ලැබේවා කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මම සභාව දැනුවත් කරන්න කැමැතියි, සභානායකතුමාට, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ඒ අවස්ථාව හිමි වෙන බවට.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
එහෙම අවස්ථාව දෙන්නේ නැහැ නේ, විපක්ෂ නායකතුමාටවත්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් ඒ අවස්ථාව හිමි වෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
එතුමාටත් දෙන්නේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.40]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, චානක මන්ත්‍රීතුමා යන්න කලින් කාරණයක් කියන්න ඕනෑ. දැන් අර,- *[බාධා කිරීමක්]* ඒක නේ.

අර ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ගැන දැන දැන කිව්වේ වැරදි උත්තරයක් කියලා මම විශ්වාස කරනවා. කවුද ඒ ජනාධිපති කියලා තවමත් දන්නේ නැද්ද? මම කියන්නද? ඒ වාර්තාව දුන්නේ ගෝඨාභය රාජපක්ෂ, රනිල් වික්‍රමසිංහ නොවෙයි. තමුන්නාන්සේ ඒකවත් දන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි ඒ කොමිසම පත් කළේ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේයි වාර්තාව දුන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හරි, හරි. සුසංයෝගයි නේ ඒ කට්ටිය. *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ ගැන විවාදයකට නොයා සිටියොත් හොඳයි නේද?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ කොමිසම පත් කරලා තිබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ තමයි ඒ වාර්තාව ලැබුණේ. ඒ වාගේම, කාදිනල් උතුමාණන් කියනවා ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ වාර්තා විතරයි උන්වහන්සේ පිළිගන්නේ කියලා. ඒ නිසා ඔබතුමාත් එය පිළිගන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒවා තිබෙන්නේ ඉමාම් වාර්තාවේ ලු. ගරු අනුර කරුණාතිලක ඇමතිතුමායි ඒ බව කියන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මට විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. *[බාධා කිරීම්]* මේ තිබෙන ජනාධිපති කොමිෂන් සභා වාර්තාවල ඔය කියන නම් දෙක නැහැ, වානක මන්ත්‍රීතුමනි. ඔබතුමා ඔය කියන එක තිබෙන්නේ අර ඉමාම් කියන පුද්ගලයාගේ මූලිකත්වයෙන් දාපු කමිටුවේ වාර්තාවේ. ඒක ජනාධිපති කොමිසමක් නොවෙයි. ඔබතුමා අර කලින් වරද්දා ගත්තා වාගේ මේ සැරෙත් වරද්දා ගත්තා. ඒක, රනිල්ගේ කමිටුව. රනිල්ගේ ඒ කමිටුවේ වාර්තාවේ තමයි ඔය කියන කතන්දරය තිබෙන්නේ. ඇත්ත ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ ඔය කියන නිලධාරින් සම්බන්ධයෙන් කිසිම සඳහනක් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම මේ විවාදයට සම්බන්ධ වන මේ වෙලාවේ කියන්න ඕනෑ, ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද මේ යෝජනාවේ පොඩි වැරැද්දක් තිබෙන බව. ඒ වැරැද්ද මේකයි. මුලින් topic එකේ තිබෙනවා "Easter Sunday attack" කියලා. Easter Sunday attack කියන එක හරි. හැබැයි, ඊට පස්සේ ඒ Motion එකේම තිබෙනවා, "Easter attack" කියලා. ඒක නිවැරැදි විය යුතුයි. Easter attack කියලා එකක් නැහැ, Easter Sunday attack.

අද අපට කථා කරන්න නියමිතව තිබෙන්නේ පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන තවත් එක විවාදයකට සහභාගි වෙමින්, මේ සභාවේ මන්ත්‍රීවරුන් හැටියටයි. මම අද හිතුවේ පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කථා කරනවාටත් වඩා මේ විවාදය ගැනයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. පාස්කු ඉරුදින ප්‍රහාරය ගැනවත්, පාස්කු ඉරුදින ප්‍රහාරයේ වාර්තාව ගැනවත් කථා කරනවාට වඩා මේ විවාදය ගැන වචනයක් කථා කරන එක හොඳයි කියලා මට හිතෙනවා. මොකද, මේ විවාදයේ අරමුණු ගැන තිබෙන අපැහැදිලිකම නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒකේ අරමුණ වුණේ මොකක්ද කියන එක ගැන නොයෙක් අදහස්, මතවාද තිබෙනවා. ඒ සංකීර්ණ තත්ත්වය විසඳාගත යුතු එකම ක්‍රමය අධිකරණ ක්‍රියාවලියක් පමණයි. අධිකරණමය ක්‍රියාවලියට අදාළ කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ සමඟ බැඳී පවතිනවා. ඒ පරීක්ෂණ සියල්ල, මෙතෙක් ඉදිරිපත් වෙලා තිබෙන සාක්ෂි, තොරතුරු සහ වාර්තා සමඟ බැඳී තිබෙනවා. දැන් විෂය භාර ගරු අමාත්‍යතුමා කිව්වා, අලුතින් facts report කිරීමකුත් දැන් කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට කරලා තිබෙනවා කියලා. ඒ නිසා මේ කාරණයට අදාළ විධිමත් අධිකරණ ක්‍රියාවලියක් බලාපොරොත්තු වන රජයක් විධියට, ඒ අධිකරණ ක්‍රියාවලියට හානි වන කිසිවක් දේශපාලන වශයෙන් කොපමණ පාඩු සිද්ධ වුණත් අපි කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මේ විවාදයත්, මේ විවාදයට පදනම් වුණු සමාජ මතවාදයත්, මේ විවාදය මඟින් ගොඩ නඟන්නට අපේක්ෂා කරන සමාජ මතයත් යන මේ සියල්ල අපට රජයක් විධියට දේශපාලනිකව අවාසිසහගතයි. නමුත්, ඒ අවාසිය අප විඳ දරාගන්නේ ම පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණයක් ඉටු කිරීම වෙනුවෙන්. ඒ නිසා ඒ පරීක්ෂණවලට හානි වන, ඒ අධිකරණ ක්‍රියාවලියට හානි වන කිසිවක් අපි කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ අධිකරණ ක්‍රියාවලියට අපි කිසි ලෙසකින්වත් මැදිහත් වෙන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන් ගැන කථා කරන කොට, ඔවුන් සැබෑ වින්දිතයන් විධියට පාස්කු ඉරුදින ප්‍රහාරයට අදාළ ඔවුන්ගේ පැමිණිලි ගරු අධිකරණවලට ඉදිරිපත් කර තිබෙනවා.

මා දන්නා තරමින් ඔවුන්ගේ පැමිණිලි රාශියක් තිබෙනවා. විෂය භාර අමාත්‍යතුමා ඊට අදාළ නඩු පිළිබඳ සඳහන් ලේඛනය ඇමුණුම 1 ලෙස මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා, ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට නඩු ගණනාවක් ගිය බව. එහි ප්‍රතිඵලයක් ලෙස ඒ දේශපාලන අධිකාරියටත් -හිටපු ජනාධිපතිවරුන්ට, නිලධාරින්ට- මිලියන සිය ගණනින් ගෙවන්න සිද්ධ වුණා. ඒ නඩු යන අතරේ, ජාතික ජන බලවේගයේ මා ද ඇතුළු නීතිඥවරුන් සම්බන්ධ වූ නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එම නඩු වාර්තාව මම **සභාගත*** කරනවා.

ඒ තමයි, SCFR 191/19 කියන නඩුව. ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා සහ මා සම්බන්ධ වෙලා එය කළේ. ඒකේ ලේඛනගත නීතිඥවරිය විධියට අපේ පක්ෂයේ නීතිඥ සහෝදරියක් හිටියා. ඇය තමයි ශානිකා සිල්වා. ඇත්තවශයෙන්ම අපි ඒ පැමිණිල්ල මඟින් බලාපොරොත්තු වුණු තත්ත්වය ඕනෑම පැමිණිල්ලක ආයාචනයේ තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එම නඩු වාර්තාව සභාගත කරන ගමන්, ඒකේ ආයාචනයේ තිබෙන කාරණාවක් මම කියන්නම්. එහි දෙවැනි ආයාචනයේ ගැබ් වෙනවා, මේ සමස්තය; අද අප මේ බලාපොරොත්තු වන තත්ත්වය. ජන වරමේ අභිලාෂයත් ඒ ආයාචනයේ තිබෙනවා. මොකක්ද, ඒකේ කියන්නේ? I quote:

> "B) Direct one or more or all of the Respondents to submit to Your Lordships under confidential cover if necessary all details of information received to them from the international and domestic agencies in warning respect of the aforesaid terrorist attacks and the reports if any in respect of the implementation of securities measure as result of the said intelligence information which were put in place on or before the 21st of April 2019 in respect of the aforesaid terrorist attacks."

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

ශ්‍රේෂ්ඨාධිකරණය ඉස්සරහා වාද විවාද වෙච්ච ඒ නඩුව, අපිත් සම්බන්ධ වෙච්ච නඩුවක්. ශ්‍රේෂ්ඨාධිකරණයට අපි විතරක් නොවෙයි, පාර්ශ්ව රාශියක් ගියා. එසේ පාර්ශ්ව කීපයක්ම සම්බන්ධ වෙලා ගත්තු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි කැමැති නැහැ, මේවා කියන්න. මේ වාගේ Motion ඉදිරිපත් කළාට පසුව තමයි අපට මේවා කියන්න සිදු වෙන්නේ. රාජ්‍ය බලය ගන්නටත් කලින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඒ වින්දිතයන් වෙනුවෙන් පෙනී හිටපු මිනිස්සු, අපි. නමුත් ඒ මිනිස්සු මැරුණාට පසුව අපි ඒවා කියන්න හිතාගෙන හිටියේ නැහැ. හැබැයි, පෞද්ගලිකව මා ද සම්බන්ධ වුණු කාරණයක් බැවින් තමයි අද මේ ගරු සභාවේදී ඒ ගැන කිව්වේ. එහෙම නැතුව ඔය දේවල් කියලා අයුතු වාසි ප්‍රයෝජන ගන්න අවශ්‍යතාවක් අපට නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ වාගේම, මේ නඩුවල ආයාචනා සලකා බලද්දී, මෙම ආයාචනාවලින් "අයැද ඇති සහන" කියලා තිබෙන්නේ වින්දිතයන්ගේ අපේක්ෂා. ඒ කියන්නේ මොනවාද? පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන් ලබා ගැනීමට බලාපොරොත්තු වන සහනයන් යනු, තවත් විධියකට කියනවා නම්, පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන් වූ ජනතාවගේ අපේක්ෂා, "people's mandate". ඒවා තමයි ජනතාව ඉල්ලා සිටියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද මේ විවාදයට යොමු කර තිබෙන කරුණු මොනවාද? මේ Motion එකේ තිබෙන කරුණු ටික පොඩ්ඩක් බලමු. රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවේ අරමුණු විධියට මොනවාද සඳහන් කරලා තිබෙන්නේ? එතුමා ඒ තුළ අසා තිබෙනවා, කලින් කියපු විධියට මලල්ගොඩ වාර්තාව, ජනාධිපති කොමිෂන් සභා වාර්තාව සහ "Channel 4" වැඩසටහනේදී විකාශනය කළ වැඩසටහන පිළිබඳ විමර්ශන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළේ ඇයි කියලා. ඔන්න, එකක්. ඊළඟට අහනවා, පිල්ලෙයාන්ට ඇප ලබා දෙන්නද යන්නේ කියලා. ඔන්න, තවත් එකක්. ඊට පසුව කියනවා, සාරා ජස්මින්ගේ DNA වාර්තාවල විස්තරයක් දෙන්න කියලා. ඒ ගැන පරීක්ෂා කරන්න ජාත්‍යන්තර උදවු ගත්තොත් නරකද කියලා අහනවා. අන්තිමට අහනවා, ප්‍රහාරයට සම්බන්ධ ආයුධ අතුරුදහන් වෙලාද, ඒවා ගැන විස්තර මොනවාද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉතින් අපට පෙනෙනවා නේද මේ Motion එකයි, ඇත්ත අභිලාෂයයි අතර බරපතළ පරස්පරයක්? මම ඒක පෙන්වන්නම්.

පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන්ගේ අපේක්ෂා එකක්වත් එම ප්‍රහාරයට අදාළව විවාදයක් ඉල්ලන දේශපාලනඥයන්ගේ අපේක්ෂා බවට පත් වෙලා තිබෙනවාද? අවාසනාවන්ත පිළිතුර තමයි "නැත" කියන එක, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එහෙම නම් මේ දේශපාලන අපේක්ෂාව අපි හඳුනා ගන්න ඕනෑ නැද්ද? හඳුනා ගන්න ඕනෑ. මොකක්ද ඒකේ අභිලාෂය? මේ විවාදයේ අපේක්ෂාව "බුදු අම්මෝ! පිල්ලෙයාන්ට ඇප දෙන්න එපෝ!" කියන එකද? බුදු අම්මෝ! පිල්ලෙයාන්ට නම් ඇප දෙන්න එපා ලු.

ඇයි? ඇප දීලා එළියට ආවොත් එතුමාට ප්‍රශ්නයක්. ඒක තමයි මේ කියන්නේ. ඒකට වේදිකාවක් කර ගන්න මේ ගරු සභාවේ ඉඩ දෙන්න පුළුවන්ද? ඒක නම් අපේක්ෂාව, කරුණාකරලා අධිකරණයට යන්න. අපි අධිකරණ කටයුතුවලට මැදිහත් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ගරු මන්ත්‍රීතුමා දන්නවා නේ ඇප පනතේ ප්‍රතිපාදන, දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන ගැන. තවත් නීති ප්‍රතිපාදන තිබෙනවා නේ. ඒවා පාවිච්චි කරලා නිසි ඉල්ලීමක් නිසි අධිකරණයකින් කරන්න. ඒකට මේ ගරු සභාව පාවිච්චි කරන්න එපා. පාස්කු වින්දිතයන්ගේ කඳුළු මතින් යෑමේ යම් පටු වුවමනාවක් තිබෙනවා නම් ඒ පටු වුවමනාවයි මේ මුදුන් පමුණුවන්නේ. ඒක හරි කැතයි, තුච්ඡයි, නින්දිතයි කියලා මේ ගරු සභාව ඉස්සරහා මම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. පාස්කු ඉරිදා ප්‍රහාරය හා සම්බන්ධව වාර්තා එළියට ගන්න හදන්නේ මොනවාටද කියන කාරණය ගැන විවිධ හේතු ඔළුවට එනවා. නමුත්, කලිනුත් කියූ පරිදි අධිකරණ ක්‍රියාවලියට හානිවන කිසිවක් කරන්න රජයක් විධියට අපට හැකියාවක් නැහැ. තොරතුරු උඩ විසි කරන්න අපට හැකියාවක් නැහැ. ඒ මොකද දන්නවාද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? ඒවා ඇහිදගන්නේ කවුද කියලා අපට පාලනයක් නැති නිසා. අපි මේ සභාවලදී ඕනෑ ඕනෑ විධියට තොරතුරු විසි කළාම, ඒවා ඇහිඳ ගන්නාකෙනා අයුතු විධියට පාවිච්චි කරන්නයි බලාගෙන ඉන්නේ. වගකිවයුතු රජයක් විධියට අපි ඒකට ඉඩ තියන්නේ නැහැ. රජයක් විධියට අපේ අපේක්ෂාව වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට කිරීම නම්, මේ පවතින යාන්ත්‍රණය ඇතුළේ තමයි කටයුතු කරන්න වෙලා තිබෙන්නේ කියන කාරණය මම අවධාරණය කරන්න කැමතියි.

ඒ විතරක් නොවෙයි, දැන් Motion එකෙන් ඉල්ලනවා, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ඇමතිතුමා විනාඩි දෙකක් ලබා දෙනවා කියලා ප්‍රකාශ කළා. ඒ සඳහා එකඟතාවක් තිබෙනවා.

සාරා ජස්මින්ගේ DNA වාර්තාව වාගේම, ප්‍රහාරයට සම්බන්ධ ආයුධ සම්බන්ධ තත්ත්වයත් ඒකමයි. සරා ජස්මින්ගේ DNA වාර්තාව අරගෙන මේ පාර්ලිමේන්තුව මොනවාද කරන්නේ? අර ටිං ටිං කාටූන් එකේ ප්‍රොෆෙසර් කැල්කියුලස් වාගේ තනි කණ්ණාඩියක් දා ගෙන DNA පරීක්ෂා කරන්න බැහැ. ඒවා තාක්ෂණික කාරණා. ගරු මන්ත්‍රීතුමා, එක්කෝ ඇත්ත අවශ්‍යතාව කරුණාකරලා කියන්න. නැත්නම් අපට නොකිව්වත් කමක් නැහැ, අවශ්‍යතාවට ගැළපෙන නිසි තැනකට නිසි ඉල්ලීමක් කරන්න. ඒ සඳහා මේ ගරු සභාවේ කාලය විනාශ කරන්න එපා. පාස්කු ඉරිදා ප්‍රහාරයයි, වෙම්මනි සමූහ මිනී වළයි යන සිද්ධි දෙක එකට අරගෙන, දේශපාලන අරමුණු වෙනුවෙන් ඒ සිද්ධි දෙකටම අසාධාරණයක් කරන්න එපා. අපට තිබෙන විදේශ මැදිහත්වීම් මේ හොඳටම ඇති. තව තවත් රට පටලවන්න එපා. දේශපාලන සිහින වෙනුවෙන්, දේශපාලන අපේක්ෂා වෙනුවෙන් පාස්කු ඉරිදා ප්‍රහාරයේ දුක, කඳුළ කැත විධියට පාවිච්චි කරන්න එපා. ඒවා සහගහන අපරාධ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. බලන්න දැන් මේ Motion එකේ එක ඇත්තක් කියලා තිබෙනවා. මේ Motion එකේ එක තැනක තිබෙනවා, "The current Government received the people's mandate not merely to investigate corruption and fraud..." කියලා. එකක් පිළිගෙන තිබෙනවා. මේ corruption and fraud ගැන හොයන එක නියමෙට යනවා කියවා. ඇත්ත තමයි දැන් මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, "දැන් ඒක අපි හරි පීල්ලට අරගෙන ඇවිල්ලා තිබෙනවා" කියලා.

මහින්ද ජයසිංහ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ දැන් බන්ධනාගාර අත්පත් කර ගැනීමේ සටන දිස්ත්‍රික් මට්ටමින් යන්නේ. ඒක බදුල්ලෙන් පටන් ගත්තා. අනුරාධපුරයට ගියා, කුරුණෑගලට යනවා. දැන් එක එක දිස්ත්‍රික්කවල අය කලබල වෙලා, panic වෙලා දඟලනවා. මාර වැඩක්! ඇයි හේතුව?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම කාරණයක් කියන්නම්. මෙතෙක් ලංකා ඉතිහාසයේ දූෂණය - corruption - සම්බන්ධයෙන් විමර්ශනයක් කරලා අවසාන වෙනතුරු අත්අඩංගුවට ගත්තේ නැහැ. නමුත්, ඉතිහාසයේ ප්‍රථම වතාවට දැන් මේ තිබෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව corruption එකක් දැන ගත්ත ගමන්, ඒ corruption එකට අදාළ අත්අඩංගුවට ගැනීම් කරනවා. දැන් කට්ටිය භය වෙලා ඒකට. ඒක තමයි බන්ධනාගාර බුක් කිරීමේ සටන දැන් යන්නේ. ඒක නිසා හරි පැහැදිලියි ඔය කියන කථාව. Corruptionවලට අදාළ කට්ටිය දැන් බන්ධනාගාරගත වෙනවා. ඒක නිසා මේ Motion එකේ ඒ කියන කාරණාව හරිම ඇත්තක් කියලා පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මොකක්ද මේ කරන්නේ? අපි කරන්නේ මේකේ දඩයක්කරු හොයන එක. කවුද මේ දඩයක්කරු? දඩයක්කරු හොයන්න එපැයි. දඩයක්කරු හොයනකොට අපට කාරණයක් තිබුණා. ඒ මොකක්ද? දඩයම කරේ තියා ගෙන ගිය උදවිය. නේද? අපේ පක්ෂයේ නායකයා ඕනෑ තරම් මේ ගරු සභාවේදීත්, ඉන් පිටතදීත් ඒ උදාහරණය කිව්වා. කවුද දඩයම කරේ තියා ගෙන ගියේ? ඒ තමයි අර මට කලින් කථා කරපු මහත්තයාගේ කට්ටිය. හැබැයි, ඊට පස්සේ ජන වරමට - mandate එකට - මොකක්ද වුණේ? ඒ කරේ තියා ගෙන ගිය එකෙන් තමයි ජනාධිපතිවරණය ජයග්‍රහණය කළේ. අන්තිමට සුසංයෝගයක් ඇති වුණා. ඉතින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි අපට පුළුවන් ද මේ වාගේ සුසංයෝගයක් ඇතුළේ ඇත්ත දඩයක්කරුවා හොයන්න? ඇත්ත දඩයක්කරුවා ඒගොල්ලෝ අතරම හැංගිලා හිටියේ. ඇත්ත දඩයක්කරුවා ඒගොල්ලෝ අතරම සැරිසරනවා.

ඒ නිසා ජනතා අභිලාෂය අනුව, ජනතා mandate එක අනුව අපට පැවරිලා තිබෙනවා ඇත්ත දඩයක්කරු සෙවීම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්ත දඩයක්කරු සෙවීමේ සටන නිසා තමයි, එදා හංගාගෙන හිටපු ඒ වාර්තාව අද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දීලා තිබෙන්නේ. ගරු ඇමතිතුමා කිව්වා, දැන් ඇත්ත පරීක්ෂණ පටන් අරගෙන කරගෙන යනවා කියලා. ඒ නිසා කලබල වෙන්න එපා මහත්වරුනේ. අපේ අවසාන ඉලක්කය, ගරු කාදිනල් හිමිපාණන්ගේ අවසාන ඉලක්කය මොකක්ද? ඒ තමයි ඇත්ත දඩයක්කරු සොයා ගන්න එක. දඩයම කරේ තියාගෙන යනකොට ඒ පරීක්ෂණය ඇතුළේ දැන් ඇත්ත දඩයක්කරු හෙළි වෙනවා. ඒක නිසා තමයි පිල්ලෙයාන් අත් අඩංගුවට ගත්ත ගමන් අර වටේ හිටපු කට්ටිය කලබල වුණා. ගම්මන්පිල නීතිඥයෙක් බවට පත් වුණා. එයා කවදාවත් ගරු අධිකරණයක නීතිඥයකු විධියට පෙනී හිටලා නැහැ. හැබැයි, පිල්ලෙයාන්ට නීතිඥයෙක් වෙනවා. අන්න, වටේ හිටපු දඩයක්කරුවෝ කලබල වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒක තමයි ඇත්ත කථාව. රජයක් විධියට, ජනතාවගේ බලය ලැබිච්ච ආණ්ඩුවක් විධියට අපි ඇත්ත දඩයක්කරු සොයනවා. අනිවාර්යයෙන් අපි ඒක නවත්වන්නේ නැහැ. ජන වරම ඇතුළේ තිබෙන දේ අපි අනිවාර්යයෙන් ඉෂ්ට කරනවාය කියන කාරණය මම මේ ගරු සභාවට දැනුම් දෙනවා.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Point of Order එක මොකක්ද?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
අනුර කරුණාතිලක ඇමතිතුමා මගේ නම සඳහන් කරල කිව්වා, ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ එහෙම දෙයක් නැහැ කියලා. මම එතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා, පිටු අංක 117, 118, 119, 120, 145 කියවන්න කියලා. එකේ පැහැදිලිව තිබෙනවා, CID එකේ අධ්‍යක්ෂලා, DIGsලා අවුරුද්දකට කලින් තොරතුරු දීලා තිබියදීත් ඒවා ගැන පරීක්ෂණ කරන්නේ නැතිව වගකීම කඩවීම තුළින් මේ ප්‍රහාරය වුණා කියලා. මේ පිටු ටික කියවන්න. එතකොට බලාගන්න පුළුවන්.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඔබතුමාට මම නැවතත් කියනවා, ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නොවෙයි ඔබතුමා ඔය කියන සඳහන තිබෙන්නේ කියලා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඉමාම් කමිටු වාර්තාවේ තමයි ඔය කියන සඳහන තිබෙන්නේ. *[බාධා කිරීමක්]* මට කියන්න වෙළුම මොකක්ද කියලා? මොන වෙළුමේද තිබෙන්නේ කියන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේක ජනාධිපති කොමිෂන් සභා වාර්තාව. මම මේ වාර්තාවේ පිටු අංක117, 118, 119, 120, 145 සභාගත* කරනවා. ඒ ටික කියවන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම ඉදිරිපත් කළ යෝජනාව ගැන මම නැඟිටලා පිළිතුරු දෙන්න යන්නේ නැහැ. මම කරපු යෝජනාවල තිබෙන අන්තර්ගතය පිළිබඳ මෙතුමා කාරණයක් මතු කරනවා. ඒක නිසා මට සාධාරණ වෙලාවක් දෙන්න, මේ පැහැදිලි කිරීම කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩියක් දෙන්නම්.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමා කියපු දේ පැහැදිලි කිරීමට මට සාධාරණ වෙලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

කාලය කළමනාකරණය කර ගැනීමේ අපහසුතාවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. විනාඩියක කාලයක් දෙන්නම්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කරුණාකරලා මා අපහසුතාවට ලක් කරන්න එපා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒ Motion එක හරියට කියෙව්වා නම්, මම ඒකේ කියලා තිබෙන දේ තේරුම් ගන්න පුළුවන්. ඔබතුමා ඉතාම වැරදි ප්‍රකාශයක් කළා, පිල්ලේයාන් රිමාන්ඩ් කිරීම ගැන තමයි මේ Motion එකේ තිබෙන්නේ කියලා. ඒක ඉතාම වැරදියි. ඔබතුමා නියෝජ්‍ය ඇමතිවරයෙක්. ඔබතුමා මීට වැඩිය වගකීමෙන් මේ සභාව තුළ ප්‍රකාශ කරන්න ඕනෑ. මම මේ Motion එකේ ඉතාම පැහැදිලිව මෙහෙම කියලා තිබෙනවා. I quote:

> "The Government has failed to ensure justice for the massive human rights violations that occurred from the Easter Sunday attack to the recent mass murders revealed through Chemmani mass grave."

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

කෙටියෙන් කියලා අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ඔව්. කෙටියෙන් තමයි කියන්නේ. පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම ඉතා පැහැදිලිව කිව්වේ, Easter Sunday Attack එක ඇතුළුව මානව හිමිකම් උල්ලංඝනය වීමේ සියලු කාරණා පිළිබඳව රජය අරගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව සෑහීමකට පත් වෙන්න බැහැ කියලා. ඒ වාගේම ජනාධිපතිවරයා තමයි කිව්වේ පාස්කු ප්‍රහාරය පිළිබඳ කොමිෂන් සභා වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. ඒක මම කිව්වේ නැහැ. මේ සාක්ෂි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා එතුමා කියපු එක තමයි මම කිව්වේ.

ඊළඟ එක, ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍යයි කියන එක. ඒක අද ඊයේ කියන එකක් නොවෙයි. ආණ්ඩුවක් ආණ්ඩුවක, ඒ කියන්නේ deep state එකේ, ආණ්ඩුවේ වැරදි ආණ්ඩුවටම පරීක්ෂාවට ලක් කරන්න අමාරුයි.

මම ඊට අමතරව කිව්වා, Chemmani mass graves පිළිබඳව. සාරාගේ DNA එක ගැන ඇහුවේ, ඒකට අවශ්‍ය technical knowledge එක ලංකාවේ තිබෙනවාද කියලායි. ඉතින් කරුණාකරලා ඔබතුමා නියෝජ්‍ය අමාත්‍යවරයකු විධියට මේ සභාව නොමඟ යවන්න එපා. පිල්ලෙයාන්ට ඇප දෙනවා කියලා අපට ආරංචියක් තිබුණා. ඒක ඇත්තද, නැත්තද කියලා ඇහුවා. ආනන්ද විජේපාල ඇමතිතුමා කිව්වා, "ඒක බොරු. එහෙම එකක් නැහැ" කියලා. ඒක පිළිගන්නවා. මන්ත්‍රීවරු වශයෙන් අපට අයිතියක් තිබෙනවා, මේවා පැහැදිලි කරගන්න. ඒ නිසා කරුණාකරලා ඔබතුමා නිකම් සභාව නොමඟ යවන විධියේ ප්‍රකාශ කරන්න එපා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් පිළිබඳව ඉදිරිපත් වී තිබෙන කල් තැබීමේ විවාදයේදී ඉතාම කෙටියෙන් කරුණු කිහිපයක් කියන්න මම හිතුවා. මොකද මෙක ජාතික වැදගත්කමක් තිබෙන ප්‍රශ්නයක්. ලංකාවේ හෘදය සාක්ෂියේ සිදුරක් මේක. ඒ නිසා මේ සිදුර, මේ තුවාලය අපි සුව කළ යුතුයි. ඒ තුවාල සුව කරන්න පුළුවන් සම්පූර්ණ විධියක් නැති වෙයි. නමුත් එක විධියක් තමයි, අවම වශයෙන් මේ මහා ඝාතනයේ සැබෑ සැලසුම්කරුවන්, සැබෑ මෙහෙයුම්කරුවන් කවුද කියන එක අධිකරණමය ක්‍රියාමාර්ග හරහා ඔප්පු කරන එක. දේශපාලන වශයෙන්, සමාජයීය වශයෙන් මේ අපරාධයේ මෙහෙයුම්කරුවන් කවුද කියන එක ගැන සැකයක් නැහැ. ඒ අපරාධකරුවන් ඒ පිළිබඳව කථා කරනකොට, ඒකට මේ සභාවේදී අත්පුඩි ගහන විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු දකිනකොට අපි කනගාටු වෙනවා. අද ඒ අය විපක්ෂයේ සිටියාට ඒ අය ආණ්ඩුවේ සිටිද්දී ඒ අයගේ කාලයේ සිද්ධ වෙච්ච බරපතළ අපරාධයක් මේක. ඒ අපරාධය කරපු අයත් එක්ක එකතු වෙලා අද ජාතික ජන බලවේග ආණ්ඩුවට පහර ගැසීමට උත්සාහ කිරීම ගැන අපි ඇත්තටම ලජ්ජා වෙනවා. දේශපාලනයේ මෙච්චර පහළට යන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාස්කු ප්‍රහාරය හුදකලාව ගන්න බැහැ කියලා මම හිතනවා. 2015දී රාජපක්ෂලා පැරදුනාට පස්සේ, රාජපක්ෂලාට නැවත බලයට ඒම සඳහා රටේ තත්ත්වයක් නිර්මාණය කර ගත යුතුව තිබුණා. ඒ සඳහා ඔවුන් එක පැත්තකින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත්, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාත් අතර දේශපාලන ප්‍රතිවිරෝධයක් නිර්මාණය කිරීමට උත්සාහ කළා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා දෙවෙනි වතාවට ජනාධිපතිවරණයට ඉල්ලන්න දරපු උත්සාහයත් ඒකට උදවු වුණා. ඒ එක්කම, තමන්ගේ දේශපාලන බලය වෙනුවෙන් ඕනෑම දෙයක් කරන රනිල් වික්‍රමසිංහ කියන ඒ තුච්ඡ දේශපාලනඥයා විසිනුත් ඒ තත්ත්වය ඇති කරලා, එක පැත්තකින් ඒ ආණ්ඩුව දුර්වල කළා. හැබැයි, එය ප්‍රමාණවත් වුණේ නැහැ. මොකද 2015දී ලැබුණු mandate එක ලොකුයි. ඒ mandate එකෙන් 2015දී ගෙනාපු දේශපාලනඥයෝ අන්තිම දුර්වල, දූෂිත, බොරුකාරයෝ ටිකක් වුණාට, 2015 ජන වරම හරි ප්‍රබලයි. 2024දී අපි ලබපු ජන වරම තරමම ඒක ප්‍රබලයි, ඒ අභිලාෂ ප්‍රබලයි. නැත්නම් මෛත්‍රීපාලට කොහොමටවත් දිනන්න බැහැ. ඒ ජන වරමේ ප්‍රබලත්වය නිසා රාජපක්ෂලාට නැවත සැලකිය යුතු ප්‍රමාණයක දේශපාලන වේදිකාවක් ඉතුරු වුණේ නැහැ. ඒ නිසා රාජපක්ෂලා මොකක්ද කළේ? විෂය මූලික තත්ත්වයක් - objective situation එකක් - නිර්මාණය කරන්න කල්පනා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔවුන් ඒක 2013 ඉඳලා පටන් අරගෙන තිබුණා, ජාතිවාදී සිංහල සහ ජාතිවාදී මුස්ලිම් කියලා කියන්න පුළුවන් කණ්ඩායම් වෙනම බුද්ධි අංශ

මාර්ගයෙන් හදලා පවත්වාගෙන යෑම හරහා. මට ඒවා කියන්න මේ අවස්ථාවේ වෙලාව නැහැ. ඒකේ කූටප්‍රාප්තිය හැටියට 2015න් පස්සේ රාජපක්ෂලා බැලුවා, බලයට එන්න තත්ත්වයක් නිර්මාණය කරගන්නේ කොහොමද කියලා.

ඔබතුමන්ලා කියෙව්වොත් තේරෙනවා, Cambridge Analytica යටතේ පොත් ඕනෑ තරම් publish වෙලා තිබෙනවා. ඒ Cambridge Analytica සමාගම සම්බන්ධ සිද්ධියෙන් පෙන්වනවා ඇමෙරිකාවේ election එකේදී දිනන්න ඕනෑ කරන ජනාධිපතිවරයාට දිනන්න ඕනෑ කරන තත්ත්වය create කරන ආකාරය, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. බිලියන ගණන් වියදම් කරලා සිද්ධි හදලා, samples check කරනවා. මම මේ මැති ඇමතිවරුන්ට කියනවා, Cambridge Analytica සම්බන්ධ පොත් කියවන්න කියලා. එහි "Mindf*ck" කියලා පොතක් තිබෙනවා, publish කරපු. මට මේ වෙලාවේ එහි සම්පූර්ණ වචන ටික කියන්න මතක නැහැ. ඒවායින් ඔප්පු කරලා තිබෙනවා, බලයට එන්න පුළුවන් තත්ත්වයක් අවුරුදු දෙක තුනක් තිස්සේ නිර්මාණය කරන්නේ කොහොමද කියලා. ඒක අන්තිම මාස දෙකේ ඡන්ද campaign එකේ propaganda එකක් නොවෙයි. එහිදී සම්පූර්ණ situation එකක් create කරනවා. ඒ අනුව මුස්ලිම් විරෝධය ගොඩනැඟුවා. මුස්ලිම් මිනිහෙකුට ලංකාවේ ඉපදුණු එක පාපයක්, ශාපයක් කියලා හිතන විධියේ මානසිකත්වයක් ඔය Easter Sunday attack එකට කලින් තිබුණා. ඒක තමයි ඇත්ත. ඒ දේශපාලන අපරාධකරුවන් එක්ක අත්පුඩි ගහනවා දැක්කාම තමයි මගේ හෘදය සාක්ෂිය පත්තු වුණේ. මම දැන් ඒක දැක්කා. ඒ දේශපාලන අපතයෝ, ඒගොල්ලන් එක්ක එකතු වෙලා අද ජාතික ජන බලවේගයට ගහන්න හදනවා. ඔබතුමන්ලා ගහන මොකුත් අපට වදින්නේ නැහැ .

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම තමයි 2015, 2016, 2017 සහ 2018දී කටයුතු කළේ. ඒ ඔය විදුලි පුටුව විතරක් නොවෙයි. එහෙම තමයි ඒක හැදුවේ. මම හිතන විධියට සාධාරණ මුස්ලිම් ළමයි ලංකාවේ ජීවත් වෙලා වැඩක් නැහැ කියන තත්ත්වයට පත් වුණාට පස්සේ, ඒ ළමයි එක එක තැන්වලට තල්ලු වෙනවා.

ඒ අය බිලී බාගන්න වෙනත් වෙනත් සංවිධාන තිබෙන බවත් ඇත්ත. එහෙම නැතත්, මිනිස්සු extreme situationsවලට යනවා. Noam Chomsky කිව්වා, ඉරාකයට විරුද්ධව කරපු US Hammer strike එකෙන් තමයි ISIS හැදුණේ කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩි 2ක් ලබාගන්න වෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

එහෙම තමයි මේක නිර්මාණය වුණේ. ඒ අය නිකම් පුපුරවා ගත්තේ නැහැ. ඒවායේ බුද්ධිමය තොරතුරු පිළිබඳව මම දන්නේ නැහැ. අන්න ඒ මුස්ලිම් ජනතාවට එරෙහිව දේශපාලන බලය ගන්න, - මොකද, නඩු පටන් ගත්ත නිසා බය වෙලා හිටියා. අපි මේ ඉදිරිපත් කරපු නඩුවලින් අතිවිශාල ප්‍රමාණයක් 2015දී පටන් ගත්ත ඒවා. රනිල්, සජිත්, මෛත්‍රීපාල ඒවා පාවා දුන්නා. ඒ පාවා දුන් නඩු තමයි අපි නැවත අධිකරණ මාර්ගයට ගෙනැල්ලා තිබෙන්නේ. තව අලුත් ඒවාත් අපි පටන් අරගෙන තිබෙනවා. ඒ තත්ත්වය තුළ - රාජපක්ෂලාට බලයට ඒම සඳහා නිර්මාණය කරපු ඒ objective situation එක තුළ - තමයි මේක සිද්ධ වුණේ. ඒත් ඒක වළක්වා ගන්න තිබුණා. ඕනෑ තරම් සමාජයීය තත්ත්ව නිර්මාණය කරන්න පුළුවන්. හැබැයි බුද්ධි අංශ, ආරක්ෂක අංශ, පොලීසිය, හමුදාව ශක්තිමත් නම්, vigilant නම් ඒවා වළක්වන්න පුළුවන්. ඒ නිසා සජිත් ප්‍රේමදාස රනිල් වික්‍රමසිංහ කරපු ලොකුම අපරාධය මොකක්ද? මෙවැනි ප්‍රහාරයක් පිළිබඳව CID evidence reports, බුද්ධි තොරතුරු වාර්තා ලැබී තිබුණා. ඒ හරිම ගණන මට මතක නැහැ. මම හිතන විධියට අනූ ගණනකට වැඩියි. මේ ප්‍රහාරය පිළිබඳව උලමා සංවිධානය ඇතුළු ඉස්ලාමීය සංවිධාන දිගින් දිගට කියලා තිබුණා. රවුෆ් හකීම් මැතිතුමා වාගේ අය කිව්වාද මම දන්නේ නැහැ. සමහර විට එතුමන්ලාත් කියන්න ඇති. නමුත් ඒ එකක්වත් ගණන් ගත්තේ නැහැ. ජාතික ආරක්ෂාව බින්දුවට දාපු නායකයෝ තමයි රනිල්ලා, සජිත්ලා කියන්නේ.

අද මේ මාතෘ භූමිය විඳින ආර්ථික අර්බුදය සම්පූර්ණයෙන්ම පටන් ගත්තේ කොහෙන්ද? ඒ පිළිබඳව අනිල් ජයන්ත ඇමතිතුමාත් කථා කරයි. මේ ආර්ථිකය, tourism සම්පූර්ණයෙන්ම වැටුණේ කොතැනින්ද? රට පරිස්සම් කරන්න බැරිවෙච්ච මේ නායකයන් තමයි අද අපෙන් ඇවිල්ලා පාස්කු ප්‍රහාරය ගැන අහන්නේ. පාස්කු ප්‍රහාරය සිද්ධ වෙලා අවුරුදු එකහමාරක්, දෙකක් පමණ කාලයක් රනිල්-සජිත් ආණ්ඩුව තිබුණා. පාස්කු ප්‍රහාරයෙන් පසුව මේගොල්ලන්ගේ ආණ්ඩුව අවුරුදු එකහමාරක් තිබුණා. මොනවද කරපු පරීක්ෂණ? තමන්ගේ ආණ්ඩුවෙන් ජාතික ආරක්ෂාව බිඳ වැටුණාට පසුව කොච්චර වගකීමක් තිබෙනවද? තමන්ගෙන් වෙච්ච වැරැද්ද හදාගන්න තමන්ට කොච්චර වගකීමක් තිබෙනවාද?

මගේත් ඥාතීන් ඇතුළුව කටුවාපිටියේ ක්‍රිස්තියානි ජනතාව 300ක් පමණ මිය ගියා. මේ රටේ මුස්ලිම් ජනතාව සදහටම වේදනා විඳිනවා. මම හිතන විධියට තවම ඒ වේදනාවෙන් මිදිලා නැහැ. මුස්ලිම් ජනතාව රටක් ඉස්සරහ වැරදිකරුවන් බවට පත් වුණා. රටේ ආර්ථිකය වැට්ටුවා. ඉතින්, මේ අයට ආයෙත් ආණ්ඩුවක් දෙන්න පුළුවන්ද? ඔබතුමන්ලා කණ්ඩායම කිසිසේත්ම සුදුසු නැහැ රට භාරගන්න. ඇයි ඒ? ජාතික ආරක්ෂාව අන්තෙටම බංකොලොත්භාවයට පත් කරපු, බිඳ වට්ටපු අසමත් පිරිසක් තමයි තමුන්නාන්සේලා. ඒකේ ප්‍රතිඵලය හැටියට තමයි තොරතුරු තිබෙද්දීත් ඒ ප්‍රහාරය සිද්ධ වුණේ. ඒ නිසා අංක එක, ජාතික ආරක්ෂාව. කිසිම රටකට ජාතික ආරක්ෂාව නැත්නම් stability එකක් එන්නේ නැහැ. ස්ථාවරභාවය -stability- නැත්නම් ආර්ථික සංවර්ධනයක් වෙන්නේ නැහැ. ඒ නිසා මෙය සරල දෙයක් නොවෙයි. මිනීමරුවන් හතරක් පහක් ගැන හොයන ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. රට විනාශ කරපු, ජාතික ආරක්ෂාව බින්දුවට බස්සපු අසමත් කණ්ඩායමක් පිළිබඳ ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ. ඒ සිද්ධියෙන් පස්සෙත් යම් කාලයක් තමුන්නාන්සේලා බලයේ හිටියා. ඒත් කිසිම පරීක්ෂණයක් කළේ නැහැ. අඩු ගණනේ තමන්ගෙන් වැරැද්දක් වුණාම, ඒ ගැන හොයන්න වගකීමක් තිබෙනවා. ඔබතුමන්ලාත් දන්නවා, පාස්කු ප්‍රහාරයෙන් පසුව පරීක්ෂණවලට හිටියේ කවුද කියලා. මේගොල්ලන් එක කට්ටියක්. ඊට පස්සේ හිටියේ ගෝඨාභය. ඊට පස්සේ හිටියේ රාජපක්ෂලාගේ ඉත්තෙක්, පියන් කෙනෙක් ලෙස ආපු රනිල් වික්‍රමසිංහ. ඒ මුළු මහත් පරීක්ෂණ කාලය තුළම - ඔබතුමන්ලාත් ඇතුළුව - මොකක්ද වුණේ? ඒ පරීක්ෂණ හරියට සිද්ධ වුණේ නැහැ. ඒ පරීක්ෂණ කරපු සාධාරණ නිලධාරින්ට මොකද වුණේ? ශානි අබේසේකර කියන්නේ, පාස්කු ප්‍රහාරයේ victim කෙනෙක්; තාජුදීන් ඝාතනයේ victim කෙනෙක්. රවී සෙනෙවිරත්න කියන්නේ, මේ ඝාතකයන්ට විරුද්ධව පරීක්ෂණ කරන්න කියලා victimsලා වෙච්ච මිනිස්සු. ශානි අබේසේකර අපේ කාර්යාලයට නිකම් ඇවිදගෙන ආවේ නැහැ නේ. ශානි අබේසේකරලා එළෙව්වා, ඇත්ත පරීක්ෂණවලට

[ගරු බිමල් රත්නායක මහතා]

එපා කියලා. කවුද ශානි අබේසේකර නැවතත් ඒ තැනට දාන්න කියන්නේ. එහෙම කියන්නේ ක්‍රිස්තියානි ජනතාවගේ ප්‍රධාන ආගමික නායකයා වෙච්ච කාදිනල්තුමා ඇතුළු නායකයන්. රවී සෙනෙවිරත්න මැතිතුමා දමන්න කියන එකත් කතෝලික - ක්‍රිස්තියානි - ප්‍රජාවේ එක ඉල්ලීමක්.

මොකක්ද කළේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ජනාධිපතිතුමා ඒක හරියට කිව්වා. මොකක්ද? අපරාධ කරලා පරීක්ෂණයත්, අපරාධකරුත් අතට ගත්ත යුගයක් තිබුණේ. එහෙම අවුරුදු 7ක් තමයි ගතවෙලා තිබුණේ. ඒ අවුරුදු 7න් පස්සේ අපි දැන් පරීක්ෂණ පටන් අරගෙන තිබෙනවා. ඒ evidence මකලා තිබුණා, ඒ නිලධාරින් දඩයම් කරලා එළවා තිබුණා. මට මතක විධියට CID එකේ හත්සිය ගණනක් පමණ මාරු කළා. එහෙම නේද ආනන්ද විජේපාල ඇමතිතුමනි? ගෝඨාභය දිනලා ඉස්සෙල්ලාම මොකක්ද කළේ? මේ පරීක්ෂණ කරපු හත්සිය ගණනක් මාරු කළා. නමුත් අද මෙතැනට ඇවිල්ලා පරීක්ෂණ වාර්තා ගැන කථා කරනවා. ඒ පරීක්ෂණ වාර්තා ඔක්කෝම මැදමුලනේ තියලා cook කරපුවා, ලියපුවා. ඒවාට තමයි මේගොල්ලන් අත්පුඩි ගහන්නේ. මිනීමරුවන් එක්ක, ඒ අපරාධකරුවන් එක්ක වාද කරන එක මට ප්‍රශ්නයක් නැහැ. මට දුක හිතෙන දේ තමයි, මෙච්චර පහළට වැටෙන්න පුළුවන්ද කියන එක. බලය ගන්න මේ මාතෘ භූමිය විනාශ කරපු මිනිස්සුත් එක්ක මේ දේශපාලන අපරාධකරුවන් එකට ඉඳගෙන අත්පුඩි ගහන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම අවසාන වශයෙන් වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. මෙකේ victimsලා විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් ක්‍රිස්තියානි ජනතාව වාගේම මුස්ලිම් ජනතාව වෙන්න පුළුවන්. නමුත් ඒ සියලුදෙනා ශ්‍රී ලාංකිකයන්. මේ සිද්ධිය නිසා අපේ දරුවන්ට අනාගතයක් නැති වුණා. පරීක්ෂණ යට ගහලා තිබුණු රටක, පරීක්ෂකයන් එළවා දමපු රටක, පරීක්ෂණ නිලධාරින් මාරු කරලා වැඩ තහනම් කරපු රටක, අපි පරීක්ෂණ පටන් අරගෙන තිබෙනවා. අපේ ආණ්ඩුව ඇවිල්ලා හරියටම මාස 7යි. අපි ඉතාම සද්භාවයෙන් අනිවාර්යයෙන් මේ පරීක්ෂණය කරනවා. අපට මොකක්ද තිබෙන ප්‍රශ්නය? අපේ හෘදය සාක්ෂියේ සිදුරක් තිබෙනවා, මාතෘ භූමිය පිළිබඳ. අපි මේ සිදුර උපරිම වශයෙන් පුරවලා මේ රටේ ක්‍රිස්තියානි, ඉස්ලාමීය ජනතාව -පොදු ජනතාව- අතර සමගිය, සංහිඳියාව ගොඩනඟනවා. ඔබතුමන්ලා අත්පුඩි ගහන දේශපාලනඥයන්ගේ සැබෑ godfathersලා වැරදිකරුවන් කරලා අනිවාර්යයෙන්ම අපි සිර ගෙට ගෙනියනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මීට පෙර කථා කළ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා මා නම් හඳුන්වන්නේ, කොළඹ මහ නගර සභාවේ රහස් ඡන්දයේ මහ මොළකරු හැටියටයි. රහස් ඡන්දයේ මහ මොළකරු කථා කරද්දී කිව්වා, සාරා ජස්මින් ගැන. සාරා ජස්මින්ගේ ජාන පිළිබඳව හොයන්න ඉස්සෙල්ලා, ඉෂාරා සෙව්වන්දි හොයලා දෙන්න. ඉෂාරා සෙව්වන්දි කියන අය එක්ක ආ වෙඩික්කරුවා උසාවියට රිංගලා වෙඩි තියලා ගියා. නියෝජ්‍ය ඇමතිතුමා කලබල වෙලා රියදුරුට පරුෂ වචනයෙන් බැණ වැදුණු එක අපි ඔක්කෝම දැක්කා. ඒ කලබල තවම ඉවර වෙලා නැහැ. කොහොම හරි ඉෂාරා සෙව්වන්දි හොයා ගන්න, සාරා ජස්මින්ගේ ජාන හොයන්න කලින්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ සභානායකතුමා මේ විවාදය ගැන හොඳ ප්‍රවේශයක් ගත්තා. මේ අවස්ථාවේ එතුමා ගරු සභාවේ හිටියා නම් හොඳයි කියලා මම හිතනවා. මොකද, අපි ඔක්කෝම කම්පනයට පාත්‍රවන සිද්ධියක් වර්තමානයේ සිදු වනවා. එනම්, චෙම්මනි ප්‍රදේශයේ මිනී වළවල් හාරන ප්‍රශ්නය. දවසින් දවස මිනී මතු වෙනවා. කුඩා දරුවන්, කිරි දරුවන් ඔවුන්ගේ සෙල්ලම් බඩු එක්ක වළ දමපු කුරිරු සිද්ධියක් පිළිබඳව දිනෙන් දින පත්තරවල ශීර්ෂ පාඨ පළ වෙනවා. විශේෂයෙන්ම ද්‍රවිඩ භාෂා පත්තරවල. නමුත්, දකුණේ අනෙක් පත්තරවල එතරම් දුරට ඒ සම්බන්ධ ප්‍රසිද්ධියක් නැහැ. ඒවායේ කොහේ හරි කොනක මොකක් හරි සඳහනක් තිබෙනවා මිසක් වෙන සඳහනක් නැහැ.

ප්‍රසිද්ධ යූටියුබ් නාළිකාවක් කරන තරිඳු ජයවර්ධන සහ තරිඳු උඩවරගෙදර යන දෙදෙනාම මේ පිළිබඳව programme එකක් කරලා තිබෙනවා. මම ඒක දැක්කා. ඒගොල්ලන් ඒකෙදි ප්‍රශ්න කරනවා. ඔවුන් මේ චෙම්මනි ප්‍රදේශයට ගිහිල්ලා වින්දිතයන්ගේ ගෙවල්වලට යනවා. ක්‍රිෂාන්ති කුමාරස්වාමිගේ ගෙදරට ගිහිල්ලා බලනවා. ඒ වින්දිතයන් මොකක්ද කියන්නේ?

ඒ ප්‍රදේශයේ මිනී වළවල් හාරන වැඩේ අපේ රාජ් සෝමදේව මහාචාර්යතුමා ඇතුළු කණ්ඩායම සිදු කරනවා. ඒගොල්ලන් කියනවා, තවමත් රජය පාර්ශ්වයෙන් කවුරුවත් එතැනට පා තබලාවත් නැහැ නැහැ කියලා. රජයේ වගකීම කුමක්ද? විශේෂයෙන්ම මම මේ කාරණය පෙන්වා දෙන්න කැමැතියි. අපේ තරිඳු උඩුවරගෙදර සහ තරිඳු ජයවර්ධන කියන අයගේ යූටියුබ් නාළිකාවෙන් පෙන්වා දී තිබුණා, Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Act එකේ තිබෙන සමහර වගන්ති පිළිබඳවත් රජය කටයුතු කරලා නැහැ කියලා. අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කථා කරලා ගියා. එහි 12 වන වගන්තියේ - "Powers of Investigation" යටතේ - මෙහෙම තිබෙනවා. I quote:

> "(d) to apply to the appropriate Magistrate's Court having territorial jurisdiction, for an order of Court to carry out an excavation and/or exhumation of suspected grave sites, and to act as an observer at such excavation or exhumation…"\

කෝ, OMP එකේ අය එතැනට ගියාද? ඔවුන් කොළඹ මර නින්දේ. OMP එක තවම පත් කරලාවත් නැහැ. මම හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට කියන්නේ, කරුණාකරලා මේ කටයුතු කරන්න කියලායි. OMP Act එක යටතේ ඔබතුමාට බලතල තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා එදා මේ සභාවේ හිටියේ නැහැ. මම චෙම්මනි සමූහ මිනීවල ගැන පාර්ලිමේන්තු ප්‍රශ්නවලදී සම්පූර්ණයෙන් පිළිතුරු දුන්නා. මේ වන විට, the Office on Missing Persons, as an observer, is providing all the assistance necessary, including monetary assistance. කිසිදු බාධාවකින් තොරව අධිකරණයේ නියෝග අනුව එතැන කැණීම් කටයුතු සිදු කරනවා. ඒ කටයුතු ආරම්භ කරන්නේ 26වැනි දා. ඒ වැඩවලට කිසිදු බාධාවක් වෙලා නැහැ. ඒ ස්ථානයේ ආරක්ෂාවට අපි පුද්ගල ආරක්ෂාවත් යොදවා තිබෙනවා. දැන් ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ඔබතුමා දැන් කියන කාරණාව ඇත්ත වෙන්න පුළුවන්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඇත්ත වෙන්න පුළුවන් නොවෙයි, ඇත්ත. ඒක ඇත්ත.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ඔබතුමා statement එකක් නිකුත් කළා වෙන්න ඇති. නමුත්, කවුරුවත් ඒ පැත්ත පළාතට ගිහිල්ලා නැහැ. අහන්න කෝ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Office on Missing Persons එකෙන් ගියේ නැත්නම් කොහොමද අපි මේවා ගැන දන්නේ?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ඒ අය එතැනට ගිහිල්ලා නැහැ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මම Chemmani mass grave එක ගැන තොරතුරු අධිකරණයට දුන්නා. ඒ කටයුතු අපි කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Under Section 11(e) of the Act, the OMP has powers, I quote:

> "(e) to establish from time to time, and in addition to those Units and Divisions specifically mentioned in this Act, such Committees and/or Divisions and/or Units as are required for the effective administration and functioning of the OMP, and shall also have the power to delegate such powers and functions as are necessary to such Committees, Divisions and Units."

Please get these committees appointed. Particularly, this is an international issue today.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

No. It is going on very well. If there is any need to appoint committees, we will do so. Now, we are providing all the assistance necessary.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

හරි. මේ බලන්නකෝ. ඔබතුමන්ලාගේ අලුත් සමාජයක් ගැන සිහින දැකපු, අයුක්තිය සහ අසාධාරණයට විරුද්ධව පෙනී හිටපු තරුණ පිරිස් දහස් ගණන් ඝාතනය වුණා. ඒ, ඔබතුමන්ලාගේ සංවිධානයේ; ජේවීපී සංවිධානයේ. ඒ පිළිබඳව කොමිෂන් සභා වාර්තා කිහිපයක් තිබෙනවා. හෝකන්දර සමූහ මිනීවල, ඒ අසළ තිබුණු වධකාගාර, ගම්පහ එස්සැල්ල පාසල් සමූහ මිනීවල, ගම්පහ වවුල්කැලේ සමූහ මිනීවල, වල්පිට රජයේ ගොවිපළ සමූහ මිනීවල, අඹගහහේන කන්ද සමූහ මිනීවල, බෙම්මුල්ල සමූහ මිනීවල, කොට්ටවකැලේ-යක්කමුල්ල සමූහ මිනීවල, අකුරැස්සේ විල්පිට සමූහ මිනීවල, අංකුඹුර සමූහ මිනීවල, මාතලේ සමූහ මිනීවල, සූරියකන්ද සමූහ මිනීවල පිළිබඳව කුමක්ද කරන්නේ? ඔබතුමන්ලාගේ සාමාජිකයන් මරා දාපු මිනීවළවල්වත් තවම හාරලා නැහැ. ඒවාත් හාරන්නකෝ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

This is practically your own graveyard inquiry.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Even with regard to Muslims. In Kurukkalmadam, the LTTE killed more than 150 Hajj pilgrims with their families while they were returning from Hajj pilgrimage. To date, there is a case with regard to that in the Magistrate's Court of Batticaloa and we had asked for the area to be excavated. But, no orders were given and the case has been laid by. We are asking you to take action now. Take action on those matters also because that is what the OMP and your Ministry have to do.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

The OMP is looking at that again very carefully. The OMP is there, but as an observer. When there is a complaint - *[Interruption]*

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

මෙහෙම කරබාගෙන බලාගෙන ඉන්නද, OMP එක දාගෙන ඉන්නේ?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

There is a procedure to be followed.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඒක හරි. ජාත්‍යන්තරය ඉදිරියේ අපේ කීර්තිනාමයට කැලලක් වෙනකොට කරබාගෙන ගිහිල්ලා observer කෙනෙකු හැටියට බලාගෙන ඉන්නද OMP එක හැදුවේ? නැහැ, ඒකට නොවෙයි. මේ, මහා ඛේදවාචකයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇමතිවරයාගේ බලය පාවිච්චි කරන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
බලය පාවිච්චි කරන්නේ නැහැ, භයයි. මේ ඊනියා දේශ ප්‍රේමීන්ට භයයි. *[බාධා කිරීම්]* ඊනියා දේශ ප්‍රේමීන්ට භයයි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Madam, I rise to a point of Order.

ගෝධාභයට භයේ වලිගය පිටිපස්සේ ගහගෙන හිටපු කට්ටිය දැන් අපට මෙතැනදී දේශන දෙන්න එනවා. මම එකක් කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, මම මෙච්චර වෙලාවක් ඔබතුමාට ගෞරවයෙන් කථා කළා. තවදුරටත් එහෙම කථා කරන්න මගේ බලාපොරොත්තුවක් නැහැ. ඒ කාලයේ මොකුත් කියන්නේ නැතිව ඉඳලා දැන් අපට දේශන දෙන්න එපා. අපේ වැඩේ අපි කරන්නම්. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මේ පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරුවන් හොයනවා නම්, ඔන්න ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ ඉතාම පැහැදිලිව අබු හින්ද් ගැන කියා තිබෙනවා. අබු හින්ද් එක්ක සම්බන්ධ වූ තව අබු කෙනෙක් හිටියා. ඒ තමයි, පක්කම් අබු. කවුද ඒ පක්කම් අබු? ඔහු ඊශ්‍රායල ජාතිකයෙක්. ඊශ්‍රායලයේ ඉඳලා පක්කම් අබු කියන කෙනා තමයි මේ අබු හින්ද්ට උපදෙස් දුන්නේ. ඔන්න, ඒ ගැන ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ තිබෙනවා. ඒ ගැන සහරාන්ගේ බිරිඳ වන හාදියාගෙන් දැනගන්න පුළුවන්. ඇය 15 හැවිරිදි වියේදී තමයි කසාද බැඳගෙන තිබෙන්නේ. ඒ තැනැත්තියගෙන් විමසුවා නම් ඒ ගැන දැනගන්න පුළුවන්. ඒ තැනැත්තියට විරුද්ධවත් තවමත් චෝදනාවක් දමාගෙන නේ ඉන්නේ. ඇයගෙන් හරියට කරුණු විමසුවා නම් ඇය හොඳටම පෙන්වා දෙයි, කවුරු කවුරුද ආවේ, කොයි නිලධාරීන් ද ඇවිල්ලා හමු වුණේ කියන එක. නමුත්, ඒ තැනැත්තියටත් දැන් චෝදනා කරලා, භය කරලා තිබෙනවා මේ පිළිබඳව කරුණු කියන්න එපා කියලා. ඒ විතරක් නොවෙයි. ජනක් ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වපු ජනාධිපති කොමිසම ඉදිරියේ මේ තැනැත්තියගේ සාක්ෂි කැඳවීමට ඉල්ලීමක් කරද්දී ඒකට නීතිපති දෙපාර්තමේන්තුව විරුද්ධ වුණා. බලන්න, ඒ වාර්තාව තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව ඊට විරුද්ධ වුණා. ඒ තැනැත්තියගෙන් ප්‍රසිද්ධියේ ඒ කාරණා පිළිබඳව විමසන්නේ නැතුව, අන්තිමට කොමිසම තීරණය කළේ අපි ඒ තැනැත්තිය විභාග කළ යුතුයි කියායි. විභාග කළාට පස්සේ නොයෙකුත් දේවල් මතු වුණා. ඇය කියපු දේවල් පිළිබඳව කියන්න මට දැන් වෙලාවක් නැහැ.

නමුත්, මම කෙටියෙන් හෝ මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ ජනාධිපතිතුමා කථාවක් කර තිබෙනවා. එතුමාගේ ඒ කථාව ගැන මේ වනවිට මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කිව්වා. එතුමාගේ කථාවේ සඳහන්ව තිබෙනවා, "කාලයේ වැලි තලාවෙන් යට වෙන්න ඉඩ නොදී වින්දිතයන්ට සාධාරණය ඉටු කරනවා" කියලා. එතුමා මේක දෙවැනි වතාවට කියන්නේ. ඊට කලින් කටුවාපිටියටත් ගිහිල්ලා එතුමා ඒකම කිව්වා. ඊට පස්සේ එතුමා තව අලුත් කාරණාවක් කියලා තිබෙනවා, "එය අභියෝගාත්මක වෙන්න පුළුවන්. රජය, රජයෙන් පරිබාහිරවත්, රජය, රජය පිළිබඳවත් විමර්ශනය මේ සඳහා යොමු කර තිබෙනවා. අද රජය විසින් රජයේ ඇතුළාන්තය පිළිබඳව විමර්ශනයක් සිදු කරනවා" කියලා. මොකක්ද මේ කියන්නේ? පාර රාජ්‍යය පිළිබඳව මේ කියන්නේ. පාර රාජ්‍යය කියන එක තමයි අපට තිබෙන ලොකුම ප්‍රශ්නය. කවුද මේ පාර රාජ්‍යයේ තැනැත්තෝ? ඒ ගැන හොයන්න. ඒ ගැන රටට හෙළිදරව් කරන්න. ඒක නොකියා නිකම් හැංගි, හැංගී, ඉඳලා හරියන්නේ නැහැ.

අපේ අමාත්‍යතුමා අද නඩුවක් ගැන සඳහන් කළා. "B" වාර්තාව 35882/24. මේක "Channel 4" නාළිකාව පිළිබඳ ප්‍රශ්නයක් අහද්දී ඔබතුමා දුන් පිළිතුර. අදත් ඔබතුමා මේ නඩුව ගැන සඳහන් කළා. මේ නඩුවේ පෙනී සිටින නීතිඥ මහත්මයෙක් මා ළඟ මේ අවස්ථාවේ ඉන්නවා. නඩුවට මොකක්ද වුණේ? කාට විරුද්ධව ද නඩුව දැම්මේ? නිලධාරීන් තුන්දෙනෙක් ගියා, අර ජැකට් එක ගන්න. තුන්දෙනාගෙන් පරිවර්තකයා හැටියට ගියපු කෙනාට විරුද්ධව නඩුව දාලා, ඔහුට විරුද්ධව DO දාලා තිබෙනවා. නමුත්, අනෙක් නිලධාරීන් දෙදෙනාටම මොකුත් නැහැ. මොකක්ද මේ විමර්ශනය? කුමක්ද මේ කරන්නේ? මේක හැංගි හොරා කරන්න එපා, උගුරට හොරා බෙහෙත් බොන්න යන්න එපා කියන එකයි අපි කියන්නේ. උගුරට හොරා බෙහෙත් බොන රජයක් හැටියට මේ රජය පවතිනවාද, නැත්නම් ඇත්ත, ඇත්ත වශයෙන්ම යථාර්ථවාදීව හෙළිදරව් කරනවා ද කියන එකයි අපේ ප්‍රශ්නය.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
Madam, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, මම මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. චවුනතිව් ප්‍රහාරය සම්බන්ධයෙන් මඩකලපුව මහාධිකරණයේ මේ වෙනකොට නඩු පවරලා තිබෙනවා.

ඔය තුන්ගොල්ලන්ම හිටපු ආණ්ඩු කිහිපයක් තමයි පසුගිය කාලයේ තිබුණේ. ඒ කාලයේ නොමඟ යවපු විමර්ශන දැන් සැබෑ ලෙසම නිවැරැදි දිශාවට යොමු කරලා තිබෙනවා. චවුනතිව් පොලිස් මුර පොළේදී සිදු වූ ඝාතනය එදා නිවැරැදි ලෙස හඳුනා ගත්තා නම් පාස්කු ඉරුදින ප්‍රහාරය සිද්ධ වෙන්නේ නැහැ. නමුත්, ඒක අපි නිවැරදිව හඳුනාගෙන ඒ වෙනුවෙන් මඩකලපුව මහාධිකරණයේ නඩු පවරා මේ වනකොට ඒ නඩු විභාග වෙමින් පවතිනවා. ඒක රවුෆ් හකීම් මන්ත්‍රීතුමා දන්නේ නැතුව ඇති.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.25]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2009 වර්ෂයේ එල්ටීටීඊ ත්‍රස්තවාදය අවසන් වූ බව අපි හැම කෙනාම දන්නවා. අවුරුදු 30ක පමණ කාලයක් පැවැති ඒ යුද්ධය නිසා මේ රටේ සියලු ජාතීන්ගේ සිත් තුවාල වෙච්ච බවත් අපි හැම කෙනාම දන්නවා. යුද්ධය ජයග්‍රහණය කළාම පවතින රජයට තිබෙන වගකීම තමයි, ජනතාවගේ තුවාල වෙච්ච සිත් සුවපත් වන විධියේ වැඩසටහන් ඉදිරිපත් කරලා, නැවතත් මේ රට යුද්ධයකට තල්ලු නොවී, රටේ සාමය ගොඩනඟන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන එක. එදා පැවැති රජයන්ට එම වගකීම් පැවරී තිබුණා. හැබැයි, 2009දී යුද්ධය අවසන් වීමෙන් පසුව පත් වෙච්ච රජය මේ රට තුළ සාමය ස්ථාපිත කරනවා වෙනුවට දිගින් දිගටම කළේ රටේ විවිධ ජාතීන් අතර තිබුණු සහෝදරත්වය, මිත්‍රත්වය හා එකමුතු බව විනාශ කරමින් එකිනෙකා සැක කරන තත්ත්වයට පත් කිරීමයි. අද මහ ලොකුවට ඇවිල්ලා මෙතැන කෑ ගහලා ගිය සමහර ජාතික නායකයෝ ඒ වෛරය වපුරවපු ආණ්ඩුවල කැබිනට් ඇමතිකම් දරපු අය. ඒගොල්ලන් නොයෙක් වරප්‍රසාද භුක්ති විඳිමින්, ඇති තරම් දේවල් හොයා ගත්තා. එලෙස කටයුතු කරපු ඒ ආණ්ඩුවල හිටපු ඇමතිවරු තමයි අද ඇවිල්ලා මහ ලොකුවට කථා කරලා යන්නේ.

දර්ගා නගර ප්‍රහාරය පිළිබඳව අපි හැමකෙනාම දන්නවා. එම ප්‍රහාරය එල්ල වනකොට ඔය ජාතික නායකයෝ කියන අය එදා කැබිනට් ඇමතිකම් දැරුවා. ඒගොල්ලන් ඒ වෙලාවේ කටයුතු කළේ කොහොමද කියලා මතක් කරලා බැලීම ඉතා වටිනවා. ගරු සභානායකතුමා සඳහන් කළා වාගේම, 2015 අවුරුද්ද වනකොට රාජපක්ෂ කඳවුරෙන් බලය ගිලිහෙනකොට නැවත බලය ලබා ගන්න ඔවුන් දර්ගා නගරය තුළ ආරම්භ කරපු ඒ ජාතිවාදී තත්ත්වය දිගින් දිගටම පවත්වාගෙන ගියා. ඒ තත්ත්වය පවතිද්දීත් එම ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ ඔය ජාතික නායකයෝ කියන හතරදෙනෙක් හිටියා. විශේෂයෙන්ම අම්පාරේ සහ දිගන ප්‍රදේශයේ වාගේම ගිංතොට සිදු වූ සිද්ධියටත් ජාතිවාදය ඉතාම තදින් බලපෑ බව අපි හැම කෙනාම දන්නවා. පාස්කු ප්‍රහාරය සැලසුම් කරපු, එම ප්‍රහාරය සිදු කිරීමට කටයුතු කරපු සියලුදෙනාටම අනිවාර්යයෙන්ම දඬුවම් ලැබිය යුතුයි කියනවා නම්, මේ රටේ ජන සමාජය තුළ, ජාතීන් අතර වෛරය ඇති කරන්න නිතැතින්ම සහයෝගය දීපු, ඒවා පෝෂණය කරපු සමහර මාධ්‍ය නාළිකාවලටත් එරෙහිව අනිවාර්යයෙන්ම ක්‍රියාමාර්ග ගත යුතුයි කියාත් අපි හිතනවා. ඔබ දන්නවා, වඳ කොත්තු, වඳ යට ඇඳුම්, වඳ සැත්කම් අපේ රටේ සමාජගත වෙලා තිබුණු බව. හැබැයි, අපි හැම කෙනාම දන්නවා, පාස්කු ප්‍රහාරයෙන් පසුව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බවට පත් වුණාම ඔය කිසිම දෙයක් තිබුණේ නැති බව.

එක පිහානේ එකට බෙදාගෙන කාපු මිනිසුන් අතරත් එකිනෙකා සැක කරන තත්ත්වයක් පාස්කු ප්‍රහාරයෙන් පසුව ඇති වුණා. පාස්කු ප්‍රහාරය පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයේදී අද උදේ වරුවේ අදහස් දක්වනකොට මුස්ලිම් සමාජය නියෝජනය කරපු කැබිනට් ඇමතිවරු හතරදෙනෙකුගේ ඉල්ලා අස්වීම් පිළිබඳව සිහිපත් කරනවා මම දැක්කා. ඒ ඉල්ලා අස්වීම් පසුපස තිබුණු හේතුව මොකක්ද කියන එක මේ රටේ ජනතාව ඉතා හොඳින්ම දන්නවා. ඒ සඳහා පසුබිම් වූ කාරණාව මොකක්ද කියා සාමාන්‍ය බුද්ධියක් තිබෙන, ඒ ගැන අවබෝධයක් තිබෙන හැම කෙනාම දන්නවා. ඒ වාගේම අපි දන්නවා, පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වුණාට සමස්ත මුස්ලිම් සමාජයට මේ රට තුළ බෝම්බ පුපුරවා, මිනිසුන් මරාගෙන දිනා ගන්න තරම් දෙයක් තිබුණේ නැති බව. අපි හැමකෙනාම මේකෙන් කලකිරීමකට පත් වුණා. අපි හැමකෙනාටම තිබුණේ, ඇයි මෙහෙම දෙයක් සිද්ධ වුණේ කියන ප්‍රශ්නය.

මම විශේෂයෙන් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන්ට. උන්වහන්සේ තේරුම් ගත්තා ඒ වෙලාවේ ඇති වෙන්න ගිය තත්ත්වය. උන්වහන්සේ ඒ වෙලාවේ ඥානාන්විත ලෙස මැදිහත් වෙලා විශාල බේදවාචකයක් බවට පත් වෙන්න තිබුණු අවස්ථාව මඟ හරවා ගත්තා. හැබැයි, නායකත්වය ඒ සඳහා මැදිහත් වුණත් අපි හැමකෙනාම දන්නවා, ඒ මොහොතේ දේශපාලන වාසි ලබා ගැනීම වෙනුවෙන් සමහර අය මිනුවන්ගොඩ නගරය ගිනි තැබූ බව. ඒ වාගේම කුලියාපිටිය ඇතුළු රටේ ප්‍රදේශ කිහිපයක් ගිනි තියන තත්ත්වයට පත් කළා. අපි දන්නවා, ඒ වෙලාවේ මාධ්‍ය කොහොමද හැසිරුණේ කියලා. මම ඉන්න තිහාරිය ප්‍රදේශයේ, නුවර පාර ළඟ ගෙදරක තිබුණු මොනවා හරි දෙයක් අල්ලා ගත්තාම, තිහාරියේ තිබෙන ප්‍රධාන පල්ලිය ඒකට එකතු කරලා තමයි මාධ්‍ය වාර්තාකරණය කළේ. ඒ නිසා මම හිතනවා, පාස්කු ප්‍රහාරයේ කුමන්ත්‍රණකරුවන් සොයන ගමන් අපි නැවතත් මේ රට තුළ එවැනි දේ සිදු නොවීමටත් වගබලා ගත යුතුයි කියා. ඒ වාගේම ඒවා සඳහා අවකාශය සලසන මාධ්‍ය ආයතන පිළිබඳවත් අවධානයෙන් කටයුතු කළ යුතුයි; ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආචාර්ය අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.32]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම සම්බන්ධයෙනුත් අද දින සභාව කල් තබන අවස්ථාවේ විවාදයේදී අපි කථා කරනවා. ඇත්තවශයෙන්ම එම සිදුවීමේ ස්වරූපය, සිදු වූ ආකාරය, ඒ වාගේම එහි ගැඹුර ගත්තාම අපට පෙනෙනවා, එය ලංකා ඉතිහාසයේ සිද්ධ වෙච්ච මිලේච්ඡතම ප්‍රහාරයක් බව; මනුෂ්‍යත්වයට කිසිම ආකාරයකට ගැළපෙන්නේ නැති ප්‍රහාරයක් බව. ඒ වින්දිතයන්ටත්, ඒ වාගේම මේ සමාජයේ ජීවත් වන මිනිසුන්ටත් සාධාරණයක් ඉෂ්ට කරන්න, බලපෑම් ආවත් නාවත් සිදු කළ යුතු නිවැරදි කාරණා ඉටු කිරීම වෙනුවෙන් අනිවාර්යයෙන්ම අපේ ආණ්ඩුව මැදිහත් වන බව සඳහන් කරමින්, විශේෂ කරුණු කාරණා කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කරන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පළමුවැනි කාරණය මෙකයි. අපේ රටේ ආණ්ඩුකරණය ගැන අපට අතීත අත්දැකීම් තිබෙනවා. එහිදී මම දේශපාලනයේ අනෙකුත් කාරණාවලට

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

යන්නේ නැහැ. නමුත් ඉතිහාසයේ, විශේෂයෙන් නිදහසෙන් පසු ඉතිහාසයේ විවිධ ආණ්ඩු පාලන කාලවලදී සිදු වූ අපරාධ, වංචා පිළිබඳව මහජනතාව තුළ යම් මතයක් හැදිලා තිබෙනවා; ඒවා ආයතනගත වෙලා තිබෙනවා.

අපේ ආණ්ඩුව බලයට පත් වෙන්න කලින්, අනෙක් සෑම ආණ්ඩුවක්ම ආණ්ඩු කරපු කාලයේ සිදු වෙච්ච දේවල්, විශේෂයෙන් අපරාධ, ඒවා අධිකරණයට ගියේ කොහොමද, ඒවාට ක්‍රියාමාර්ග ගත්තේ කොහොමද, අවසානයේදී ඇත්තටම අපරාධකරුවන්ට දඬුවම් ලැබුණාද, නැද්ද කියන ඒවා සම්බන්ධයෙන් දශක ගණනාවක් තිස්සේ මහජනතාව තුළ යම් මතයක් පැලපදියම් වෙලා තිබෙනවා, ආයතනගත -institutionalize - වෙලා තිබෙනවා.

මොකක්ද, ඒ ආයතනගත වෙලා තිබෙන්නේ? ආණ්ඩුව කවදාවත් මේවාට යුක්තිය ඉෂ්ට කරන්නේ නැහැ, ආණ්ඩුවත් මේවාට සම්බන්ධතා පවත්වනවා, ආණ්ඩුව සම්බන්ධතා පවත්වනවා නම් නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ, ඒ නිසා ඔවුන්ගේ දේශපාලන වාසියට මේවා භාවිත කරනවා කියලා ජනතාව විශ්වාස කරනවා. ඒක නිකම් හිතලුවක් නොවෙයි. ඇත්තවශයෙන්ම ඒක සමාජගත වෙලා තිබෙන බව අපි ප්‍රායෝගිකවත් දැක්කා.

ඒ නිසාම අද විපක්ෂයට ගිහින් තිබෙන කණ්ඩායම් වෙනත් උත්සාහයක් දරනවාද කියන සැකය අපට මතු වෙනවා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවත් ඒ වාගේම තවත් ආණ්ඩුවක්, මේවා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න එකක් නැහැ, ඒ අයත් මේකට සම්බන්ධ ඇති, වූදිතයන්ට දඬුවම් පමුණුවන්නේ නැහැ කියලා සමාජය තුළ, මහජනතාව අතර වැරදි චිත්‍රයක් මවන්න කරන උත්සාහයක් මේ යෝජනාව ඇතුළේ තිබෙනවාද කියන සැකය අපට මතු වෙන බව විශේෂයෙන්ම මම කියන්න ඕනෑ.

මොකද, අපට දුන්න මේ විශේෂ ජන වරම තුළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කරා මේ රට ගෙන යන ගමනේදී අපට කරන්න රාජකාරි ගොඩක් තිබෙනවා. ඒ අතරේ තිබෙන ඉතාම වැදගත් වන කාරණයක් තමයි මහජනතාවත්, ආණ්ඩුවත් අතර තිබෙන විශ්වාසය, සම්බන්ධය පවත්වාගෙන යෑම. ඒ නිසා බලය අහිමි වෙච්ච කණ්ඩායම් දූකට හෝ ඒ විශ්වාසය පලුදු කරන්න හෝ වක්‍රාකාරයෙන් හෝ එවැනි ක්‍රියාවකට සම්බන්ධ වෙනවාද කියන සැකය අපට තිබෙනවා. මොකද, මේ ඇති වූ සිද්ධියේ ස්වරූපය අරගෙන බැලුවාමත් අපට පෙනෙනවා, ඒක සරල සිදුවීමක් නොවෙයි කියන එක.

එදා බෝම්බ හත අටක් පිපිරුණා. ඒක හුදෙකලාව සිද්ධ වෙච්ච අපරාධයක් නොවෙයි, සංවිධානාත්මකව සිද්ධ වෙච්ච එකක්. මේක ජාලගත ආකාරයට සිද්ධ වෙච්ච එකක්. ඒ නිසා අපේ ජනාධිපතිතුමා කිව්වා වාගේම කිසිම ආකාරයකට මේක කාලයේ වැලිතලාවට යට වෙන්න නම් දෙන්නේ නැහැ.

ඇත්තටම කවුද මේ ප්‍රහාරය කළේ? මේ වාද විවාද, පුවත් පත්, පිටරටවල යන වාර්තා ගත්තාම, මේ අපරාධය කළේ යම් කණ්ඩායමක්, පුද්ගලයෙක්, දෙන්නෙක්, තුන්දෙනෙක් යන විධියට හුදෙකලා කරලා තමයි සාකච්ඡාව යන්නේ. මෙහි සංකීර්ණත්වය, මෙහි සංයුතිය එකට අරගෙන කරන සාකච්ඡාව හරි අඩුයි. ඒ නිසා තමයි අන්තවාදී සංවිධානවලට, ඒක ජාතික වශයෙන්, ජාත්‍යන්තර වශයෙන්, ISIS වැනි සංවිධානත් මෙතැනට සම්බන්ධ කර ගන්නේ. ඒ වාගේම දේශීය වශයෙන් ඉන්න තවත් විවිධ වූ අන්තවාදී කණ්ඩායම් මේකට සම්බන්ධ කර ගන්නවා. ඒකෙන් මෙහි සැබෑ වගඋත්තරකරුවන්, අපරාධකරුවන් අල්ලා ගන්න තිබෙන ඉඩකඩ අහිමි වෙනවා. මේවා කෙටි කරලා, කුඩු කරලා ඉවර වෙලා තනි තනි පුද්ගලයා පස්සේ යනවා.

නමුත් අපේ උත්සාහ ඒක නොවෙයි. ආණ්ඩුවක් විධියට මේ සැබෑ සමස්තය අල්ලා ගැනීම සඳහා ආණ්ඩුව විසින් පහසුකම් සැපයීමයි. ඒ නිසා තමයි මේකට යම් වැඩිපුර කාලයක් ගත වෙන්නේ. එකවර පුංචි සිද්ධියක් කියියම් තැනක සිද්ධ වුණා නම්, ඒකට ක්‍රියාමාර්ග අරගන්න තිබුණා. ඒ වාගේම ආණ්ඩුවේ යම් ක්‍රියාමාර්ග ගන්නකොට අපට ඒවා ක්ෂණිකව සිද්ධ කරන්න පුළුවන්. අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා, පාරක් හදනවා. ඒ වාගේ මොනවා හරි ක්‍රියාකාරකමක් නම් එකවර පෙන්වන්න පුළුවන්. නමුත් මෙහි ඉතාම සංකීර්ණතාවක් තිබෙනවා. ඒ වාගේම එහි චූදිතයන් වෙලා තිබෙන්නේ අපි නොවෙයි, අපට කලින් හිටපු ආණ්ඩුව. ඒ නිසා අවධාරණය කරන්න ඕනෑ, මේ ප්‍රහාරයේ සැබෑ ලෙසම සිටින්නේ තනි තනි පුද්ගලයන් නොවෙයි, කණ්ඩායමක් කියන එක. මෙය සංවිධානගතයි; ජාලගතයි. ඒක තේරුම් ගන්නට ඕනෑ.

ඊළඟ කාරණය තමයි, මෙය සිදු කිරීමේ අරමුණ කුමක්ද කියන එක. මේක තමයි ලිහා ගන්නට ඕනෑ ඉතාම වැදගත් කාරණය. මේ අරමුණේදීත් සමාජයට මතු කරන්න උත්සාහ කරනවා, මෙන්න මේ ජාතිවාදී වීම, කණ්ඩායම්වල හැඟීම් ඒ වාගේ විවිධ වූ හුදෙකලා වෙච්ච අරමුණු. අපට පෙනෙනවා, මේ අරමුණුවලින් එහා ගිය හුදෙක්ම බලය, දේශපාලන බලය ඉලක්ක කරගත්ත අරමුණක් මේක තුළ තිබෙනවා කියලා.

ඒක තේරුම් ගැනීම සඳහා මම එක්තරා term එකක් පාවිච්චි කරනවා. ඒක තමයි "fear politics", එහෙම නැත්නම් "බිය පිළිබඳ දේශපාලනය" කියන එක. "Fear politics" පිළිබඳව මෙන්න මෙහෙමයි නිර්වචනය කරන්නේ. මොකද, මේ නිර්වචනය හරියටම ගැළපෙනවා, මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන්. What is fear politics? It refers to strategic use - මට මතකයි, සමහර අවස්ථාවල "උපායමාර්ගික" කියන වචනත් භාවිත කළා. උපායමාර්ගික කියනවා. එය තැනින් තැනට වෙනස් වෙනවා - උපායමාර්ගික භාවිතය, of fear - බිය භාවිත කිරීම - by political actors, දේශපාලන නළුවන් විසින්. To do what? To control, manipulate or mobilize people - මහජනතාව පාලනය කිරීම සඳහා - by portraying certain groups.

මේක අස්සේ certain groups ඉන්නවා. ඒක ආගමික වශයෙන්, ජාතික වශයෙන්, මුස්ලිම් වෙන්න පුළුවන්, සිංහල වෙන්න පුළුවන්, බෞද්ධ වෙන්න පුළුවන්. මේ certain groups, විවිධ අයුරින් මේකේ portray වෙලා තිබෙනවා. ඒක තමයි අපට පෙනෙන්නේ. ඒ නිසා මේක, by portraying certain groups. "Fear politics" තමයි මේ තිබෙන්නේ. ඊළඟට, events - සිද්ධීන් - portray වෙලා තිබෙනවා. නිකම්ම එකක් නොවෙයි. මොනවාද, events? ගොඩක් සම්බන්ධ කළා; බුදු පිළිම කැඩීම වාගේ විවිධ ආකාරයට මේ සමාජය ඇතුළේ වූ විවිධ සිද්ධීන් මතු කර ගත්තා. එහෙම නැත්නම් portraying outcomes. මොකක්ද, outcome එක? ඒක, බලය ලබා ගැනීම ද කියන සැකය අපට තිබෙනවා.

ඒ සඳහා මේ ප්‍රහාරයෙන් පසුව වැඩකටයුතු කළ කණ්ඩායම්වල හැසිරීම බැලුවාම අපට පෙනෙනවා, ඉතාම ගැටලු සහගත තත්ත්වයක්. ඒ වාගේම අන්තර්ජාලයට ගිහිල්ලා බලන්න, මේ fear politics පිළිබඳ උදාහරණ ගන්නකොට ලංකාවත් මේක ඇතුළේ තිබෙනවා. ලෝකයේ යම් යම් තැන්වල සිද්ධි සිද්ධ වුණාම, fear politicsවලට ලංකාවේ උදාහරණයක් තිබෙනවා. එහි ඉතා වැදගත් කාරණයක් තිබෙනවා. අනික් හැම උදාහරණයකම නැති එක කාරණයක් තිබෙනවා, මේකේ. මේ fear politics

ලංකාවේ පාවිච්චි වෙලා තිබෙනකොට rhetoric politics, අලංකාරක භාවිත කරගෙන තිබෙනවා. ලංකාවේ ජාතිවාදය, ආගම්වාදය, රට අනතුරේ, රටේ ආරක්ෂාව කියන rhetorics මේක ඇතුළේ භාවිත වෙලා තිබෙනවා. ඒ නිසා ඉතා ගැඹුරින් මේක අධ්‍යයනය කළ යුතු කාරණයක් කියලා මම සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම අවසානයේදී මෙහි ප්‍රතිවිපාක හැම පැත්තකටම විසිරිලා තිබෙනවා. මෙහි ප්‍රතිවිපාක හැටියට ආර්ථික වශයෙන් සිද්ධ කරපු හානිය විශාලයි. හැබැයි, අපට ඒක ආවරණය කර ගන්න පුළුවන්. සංචාරක කර්මාන්තය බිඳ වැටීම, රැකියා අහිමිවීම, විදේශ විනිමය අහිමිවීම, දළ දේශීය නිෂ්පාදිතය කඩා වැටීම යනාදී දේවල් සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම 2019 වසරේ දෙවැනි කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය කඩා වැටුණා. ඒ විතරක් නොවෙයි, 2019 වර්ෂය අවසානයේදී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සෘණ අගයක් බවටත් පත් වුණා.

ඒ වනකොට COVID-19 ඇවිල්ලා තිබුණේ නැහැ. එම නිසා එමඟින් පෙනෙනවා ඒ ම්ලේච්ඡ ප්‍රහාරයේ විශාල ආර්ථිකමය හානියක් තිබෙනවා කියලා. ඒ ප්‍රහාරයට සම්බන්ධ අය ඒකට වගකිව යුතුයි. නමුත්, අපට එය මොන විධියකින් හෝ ආවරණය කර ගන්න පුළුවන්. හැබැයි, ඒ තුළ අපට ආවරණය කර ගන්න බැරි ප්‍රතිවිපාකයක් තිබෙනවා. ඒ තමයි එහි වින්දිතයන්ට වූ සෘජු බලපෑම. ජීවිත අහිමි වීම, ඒ මිනිසුන්ගේ සම්බන්ධතා බිඳ වැටීම, සමාජය තුළ සැකය නිර්මාණය වීම, ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීම වැනි විශාල කාරණා ගණනාවක් තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් අප හැල්ලුවට ලක් වීමත් සිදු වී තිබෙනවා. මෙසේ සමාජයීය සහ ජාත්‍යන්තර වශයෙන් අපට සිද්ධ වුණු විශාල හානියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම සඳහන් කරන්න කැමැතියි, ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග කිසි ලෙසකවත් සරලව ගන්නේ නැති බව. එම පරීක්ෂණ සඳහා රජයට ලබා දෙන්න පුළුවන් උපරිම සහාය අපි ලබා දෙනවා. රජය එම පරීක්ෂණ සාර්ථකව කරගෙන යන්න ඉඩ සලසනවා. මොකද, කරන ලද බොහෝ පරීක්ෂණවලදී මතු වුණු සමහර ගැටලු හා සිද්ධීන් පෙළ ගැසුණු හැටියට අපට දැනුණා, පෙනෙන පුද්ගලයන් හා නොපෙනෙන පුද්ගලයන් මේ network එක තුළ ඉන්නවාද කියන කාරණය. හිටපු ජනාධිපතිවරයාට සම්බන්ධ ලේකම්වරයෙකුත් අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. මේ පරීක්ෂණ ඉදිරියට ගෙන යන්න විපක්ෂයට සැබෑ ලෙසම වුවමනාවක් තිබෙනවා නම්, රාජ්‍ය අංශයට, පරීක්ෂණ කරන කණ්ඩායම්වලට ඔබගේ සහයෝගය ඇත්තටම ලබා දෙන්න. ඒ මිස, ඒ අතරමැදට පැනලා තොරතුරු ඉදිරිපත් කරමින් සැබෑ ඝාතකයන්, අපරාධකරුවන් ආරක්ෂා කරන්න මැදිහත් වෙන්න එපා කියලා අපි ඉල්ලා සිටිනවා. මොකද, එම ප්‍රහාරය මනුෂ්‍යත්වයට එරෙහිව ඉතිහාසයේ කරපු සැබෑ අපරාධයක්. වග කිව යුත්තන්ට නිසි දඬුවම් ලබා දීමට අපි උපරිම වශයෙන් මැදිහත් වෙනවා.

මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.42]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය එල්ල වෙලා වසර 6ක වාගේ කාලයක් ගත වෙනවා. ඒ සම්බන්ධයෙන් යුක්තිය ඉෂ්ට කිරීමේ අදහසින් අද ගෙනැවිත් තිබෙන යෝජනාව හා සම්බන්ධ විවාදයේදී කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සිද්ධ වුණු ගමන්ම පත් කරපු මලල්ගොඩ කමිටුවේ වාර්තාවත්, "Channel 4" නාළිකාවෙහි විකාශය වූ වැඩසටහන සම්බන්ධයෙන් විමර්ශනය කරන්න පත් කරපු විනිසුරු ඉමාම් මැතිතුමා ප්‍රමුඛ කමිටුවේ වාර්තාවත්, DMI එකේ හිටපු ප්‍රධානී චූලා කොඩිතුවක්කු මහතා ජනාධිපති කොමිෂන් සභාවේදී ලබා දුන් කට උත්තරයත් එම පරීක්ෂණ නිලධාරින්ගේ ප්‍රයෝජනය සඳහා මම **සභාගත*** කරනවා.

විශේෂයෙන් මලල්ගොඩ වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට බොහෝ සෙයින් වැදගත් වන වාර්තාවක්. මොකද, මෙම වාර්තාවේ හුඟක් කරුණු තිබෙනවා. ඉමාම් වාර්තාවත් පරීක්ෂණවලට ඉවහල් වන කරුණු තිබෙන වාර්තාවක්. චූලා කොඩිතුවක්කු මහතා ලබා දුන් කටඋත්තරය තුළත් මේ සම්බන්ධ පරීක්ෂණ කටයුතු කරන නිලධාරින්ට වැදගත් වන බොහෝ කරුණු තිබෙනවා කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අප සියලුදෙනාටම වුවමනා වෙලා තිබෙනවා, පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ මහ මොළකරු අල්ලන්න. මෙතැන කථා කරපු හුඟක් කථික මහත්වරු ඉතිහාසයේ වෙච්ච සිදුවීම්වලට අදාළ කරුණු ගැන කථා කළා. පාස්කු ඉරුදින සිදු වූ බෝම්බ ප්‍රහාරය ගැන සොයන්න ඕනෑ, ඒක කුමන්ත්‍රණයක් කියන මතය සම්බන්ධයෙන් අප දෙගොල්ලන්ම අතරේ වෙනසක් නැහැ. එහිදී අපි දෙගොල්ලෝම ඒ එකම මතයේ තමයි ඉන්නේ.

අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විපක්ෂයේ ඉන්න කොට මේ පාර්ලිමේන්තුවේදී පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය ගැන නොයෙකුත් කථා කිව්වා. එතුමා ඒ හැම කථාවකදීම පෙන්නුවා, මේක දේශපාලන හස්තයක් විසින් මෙහෙයවපු එකක්, ඒ වාගේම පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ සහරාන්ලාගේ කණ්ඩායම රජයේ යම් කොටසක් -යම් පිරිසක්- මෙහෙයවූවා කියන එක. ඒ ගැන අපි කවුරුවත් ප්‍රතිවිරුද්ධ අදහස්වල නැහැ. ඔබතුමන්ලාත්, අපිත් දෙගොල්ලෝම ඉන්නේ එකම අදහසේ තමයි. අපි කියන්නේත් ඒක කුමන්ත්‍රණයක් බවයි. ඒක පිටුපස රජයේ යම් කොටසක් ඉන්නවා. ඒ කොටස අල්ලා ගන්නා බවට ජනාධිපතිවරණයේදී තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ වාගේම අපිත් ඒ පොරොන්දුව දුන්නා. දෙගොල්ලෝම එකම පොරොන්දුව දුන්නා. ඒ තමයි, එම ප්‍රහාරයේ මහ මොළකරු සොයා ගන්නවා කියන එක. ඒ පොරොන්දු දෙකම එකක් වුණාට, මේ රටේ ජනතාව අප කියපු දේවලට වඩා තමුන්නාන්සේලා කියපු දේවල් විශ්වාස කළා. තමුන්නාන්සේලා කියපු දේවල් විශ්වාස කරපු හින්දා තමයි පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ මහ මොළකරු අල්ලන්න

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ජනතාව තමුන්නාන්සේලාට බලය දුන්නේ. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඒ බව සඳහන් කළා. ඒ වාගේම, ජනාධිපතිතුමාගේ මැතිවරණ ක්‍රියාදාමය තුළ, මැතිවරණ වේදිකාවල ඒ බව නැවත නැවත කිව්වා.

ඒ පිළිබඳව අහපු ගමන් ඒ මහ මොළකරුවන් හෙළිදරව් කරන්න පුළුවන්, ඒ මහ මොළකරුවන් කවුද කියන එක හඳුනාගෙන තිබෙනවා කියලා කිව්වා. ඒ සඳහා තමුන්නාන්සේලාට කණ්ඩායමක් ඉන්නවා කියන එකත් ප්‍රකාශ කළා. මහ මැතිවරණ වේදිකාවේත් ඒ ගැන කිව්වා. පළාත් පාලන මැතිවරණ කාල සීමාවේදීත් කිව්වා, අප්‍රේල් මාසයේ 21වන දාට මේ ගැන හෙළිදරව් කරනවා කියලා. දිනත් එක්ක කිව්වා; දින වකවානු කිව්වා. ඒ දින වකවානු කියපු ජනාධිපතිතුමා කාදිනල්තුමාගේ පනස් වසරක පූජක දිවියට වසර 50ක් පිරීම වෙනුවෙන් පෙරේදා පැවැති උත්සවයේදී කිව්වා, මෙහෙම කථාවක්. ඒ තමයි, "රජය විසින් රජය පරීක්ෂාවට ලක් විය යුතුව තිබෙනවා" කියන එක. "රජය විසින් රජය පරීක්ෂාවට ලක් කිරීමේ දුෂ්කර අභියෝගයට මුහුණ දීමට සිදු වී ඇතැයි අනුර කුමාර දිසානායක කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන්ගේ අඩ සියවසක සේවය ඇගයීමේ උත්සවය අමතා කියා සිටියේ ය" යනුවෙන් සඳහන් වෙනවා. ඒ කියන්නේ, දුෂ්කර අභියෝගයකට මුහුණ දීලා තිබෙනවා කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රජය මිනීමැරුම්වලට සම්බන්ධ වෙලා තිබෙනවා නම්, රජය ඒකට වග කියන්න ඕනෑ. රජය පරීක්ෂාවකට ලක් වෙන්න ඕනෑ. ඒකෙන් ගැලවෙන්න බැහැ. ඒ වාගේම තමයි, රජය මේකට සම්බන්ධයි කියන එක මැතිවරණයට කලින් අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා දන්නවා. ඒක දැනගෙන තමයි ජනාධිපතිකම භාරගත්තේ. ඒ මහ මොළකරු අල්ලනවා කියලා තමයි එතුමා එදා වේදිකාවල බෙරිහන් දුන්නේ. එතුමා දන්නේ නැතිව නොවෙයි එහෙම කිව්වේ. රජය ඒකට සම්බන්ධයි කියලා අපි ඔක්කොම දන්නවා.

දැන් මොකක්ද එතුමා කියන්නේ? පරීක්ෂාවට ලක් වෙන්න ඕනෑ කියලායි කියන්නේ. "පරීක්ෂාවට ලක් වෙන්න ඕනෑ" නොවෙයි, පරීක්ෂණ කරන්න. පරීක්ෂණ කරලා වග කිව යුත්තන් අල්ලන්න. ඇඟ බේරාගන්න හදන්න එපා, ජනාධිපතිතුමනි. දැන් මේ යන්නේ වෙන track එකකට. දැන් මේක වෙන track එකකට ගෙනි යන්න හදනවා. ඔබතුමා විපක්ෂයේ ඉන්න කොට, නම් ගම් පවා කිව්වා. නම් සඳහන් කළා, අරයා සම්බන්ධයි, මෙයා සම්බන්ධයි කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අපි ඔක්කොම දන්නවා, රජයේ කොටසක් ඒ පිටුපස ඉන්නවා කියලා. සහරාන්ට උදවු කළේ කවුද, සහරාන්ට වෙඩි උණ්ඩ දුන්නේ කවුද, සහරාන්ට දේශපාලන ආවරණය දුන්නේ කවුද, සහරාන්ගේ වෙඩි උණ්ඩ පානදුරට ගෙන ගියේ කොහොමද කියන ඔක්කොම අපි දන්නවා; තමුන්නාන්සේලාත් දන්නවා; ජනාධිපතිතුමාත් දන්නවා. එහෙම දැනගෙන තමයි බලය ගත්තේ.

නමුත්, පසුගිය ආණ්ඩු ඒ ප්‍රහාරයේ මහ මොළකරු ඇල්ලීම කළේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත් බලයට ආවේ මහ මොළකාරයා අල්ලනවා කියලා. මහ මොළකාරයා අල්ලනවා වෙනුවට ගෝඨාභය මහත්මයා කළේ, තමුන්නාන්සේලා කිව්වා වාගේම එදා ඒ පරීක්ෂණවල යෙදී සිටි නිලධාරින් හත්සිය ගණනක් මාරු කරපු එක. ශානි අබේසේකරව අල්ලලා හිරේ දැම්මා. රවී සෙනෙවිරත්න ගෙදර යැව්වා. ඒක තමයි ගෝඨාභය කළේ. ඒ පරීක්ෂණ නිලධාරින් අල්ලලා වෙන වෙන තැන්වලට දැම්මා. දාලා බොරු නඩු දැම්මා. හිජාස් හිස්බුල්ලාට නඩු දැම්මා. රිසාඩ් බදියුදීන්ට නඩු දැම්මා. ඒ වාගේ බොරු නඩු දැම්මා. ඒවා ඔක්කොම අපි දන්නවා. ජනතාවත් ඒක දැනගත්තා. ඒ හින්දා තමයි ජනතාව ඒ ආණ්ඩුව පරාජය කළේ. ඒ හින්දා තමයි මේ රටේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය ගැන උනන්දුවක් තිබෙන, එහි වින්දිතයන් බවට පත් වෙච්ච ජනතාව එදා පැවැති ආණ්ඩුව වෙනස් කරලා තමුන්නාන්සේලා ගැන විශ්වාසය තැබුවේ.

මමත් ඒ ප්‍රහාරයේ වින්දිතයෙක්. අපට ඒ කාලයේ පහර ගැහුවා, අපිත් මේවාට සම්බන්ධයි, අරවා මේවා කියලා. අන්තිමට අපේ ළමයි ඉස්කෝලේ යන්නත් බැහැ කියලා කිව්වා. මම ළමයාගේ ඉස්කෝලෙත් මාරු කළා, ඒකේ වින්දිතයෙක් වෙලා. අපි එහෙම අසරණ වුණා. ඒ නිසා ජනාධිපතිතුමාට දැන් කියන්න බැහැ, රජය ඇතුළේ අයත් ඒකේ කොටස්කාරයෝ වෙලා ඉන්නවා කියලා. එතුමා ඒක දැනගෙන තමයි ජනාධිපති වුණේ. අපි ඔක්කොම ඒක දැනගෙන හිටියා. ඒ හින්දා මම ජනාධිපතිතුමාගෙන් අහන්න කැමැතියි, රජය ඇතුළේත් ඒකේ කොටස්කාරයෝ ඉන්නවා කියන එක ජනාධිපතිතුමාට දැන්ද තේරුණේ කියලා. ජනාධිපතිකමට පත් වෙන කොට, බලය ගන්න කොට ජනාධිපතිතුමා මේක දැනගෙන හිටියේ නැද්ද? ඒ හින්දා අපි ජනාධිපතිතුමාට කියනවා, භාරගත්තු වැඩේ කරන්න, කෙඳිරිගාන්න එපා කියලා. කෙඳිරිගාන්න එපා, කාදිනල්තුමා ඉස්සරහට ගිහිල්ලා. භාරගත්තු වැඩේ කරන්න. අපට කියන්කෝ, කවුද වගකිව යුත්තන් කියලා. මේකේ ගෝඨාභය රාජපක්ෂ නැද්ද, සුරේෂ් සලේ නැද්ද?

වත්මන් ජනාධිපතිතුමා ඉස්සර කිව්වා නේ, මේකේ පිටුපස ඉන්නේ ගෝඨාභය රාජපක්ෂලා, රාජපක්ෂලා, සුරේෂ් සලේලා කියලා. නැත්නම් නැහැ කියන්න. ඇයි දැන් මේක හංගන්නේ? අර මොකක්ද එකක් හංගාගෙන ගහන්න හදනවා වාගේයි මේකත්. ඇයි දැන් මේක හංගන්නේ? දැන් ඒ තොරතුරු එළියට ගෙනෙන්න. කවුද මේක පිටුපස ඉන්න මහ මොළකරු?

දැන් තමුන්නාන්සේලාත් එක්ක මේජර් ජෙනරාල්ලා ඉන්නවා; මේජර්ලා ඉන්නවා; ෂර්ලොක් හෝම්ස්ලා ඉන්නවා; ජෝන් වොට්සන්ලා ඉන්නවා. දැන් සැකකරුවන් අල්ලන්න පුළුවන් නේ. මේ ගැන හොඳටම පරීක්ෂා කරපු දෙන්නා තමයි රවී සෙනෙවිරත්නයි, ශානි අබේසේකරයි. රාජපක්ෂලාගේ ආණ්ඩුව කාලයේ ඒගොල්ලන්ට හිරිහැර කරනකොට ඒගොල්ලන් ගැන අපට වඩා වෙන කවුරුවත් මේ පාර්ලිමේන්තුවේදී කථා කරලා තිබෙනවාය කියලා මම හිතන්නේ නැහැ. හැම දාම ශානි ගැනයි, රවී ගැනයි කථා කළේ සමගි ජන බලවේගයේ අය තමයි. ඒක ශානිත් දන්නවා, රවීත් දන්නවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ඉන්නවා නේ ඒ දෙන්නා. තමුන්නාන්සේලා ශානි ගත්තේ පාස්කු බෝම්බ ප්‍රහාරයට වගකිව යුත්තන් අල්ලන්න නේ. ශානියි, රවීයි වේදිකාවට ගෙනැල්ලා පෙන්නලා නේ ඡන්ද ටික ගත්තේ. පාස්කු බෝම්බ ප්‍රහාරයට වගකිව යුත්තන් අල්ලන්න පුළුවන් මිනිස්සු අපිත් එක්ක තමයි ඉන්නේ කියලා නේ තමුන්නාන්සේලා එදා ජනතාවට කිව්වේ. එහෙම කියලා දැන් කියනවා, "රජය ඇතුළේත් ඉන්නවා. හොයන්න වෙනවා" කියලා. කවුද රජය ඇතුළේ ඉන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සහරාන්ගේ බිරිඳ, හාදියා ඉන්නවා නේ. සහරාන්ගේ පවුලේ අය සයින්දමරුදුවලදී 2019 අප්‍රේල් මාසයේ 26වැනි දා මරා ගෙන මැරෙන බෝම්බයක් පුපුරුවාගෙන මැරෙනවා. ඒකෙන් ඔහුගේ පවුලේ 14දෙනෙක් මැරුණා. ඒ 14දෙනාගෙන් එක්කෙනෙක් එළියේදී මැරුණා. ඒ තමයි සහරාන්ගේ සහෝදරයෙක් වෙන ශයිනි කියන කෙනා. ශයිනි කියන කෙනා ඒ බෝම්බයෙන් මැරෙන්නේ නැහැ. සහරාන්ගේ බිරිඳ පාස්කු බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බැලූ කොමිෂන් සභාවට කට උත්තර දෙමින් කියලා තිබෙනවා,"මම බෝම්බ ප්‍රහාරයට හසු වී සිහිය නැතුව ඉඳලා නැඟිටිනකොට, ගෙදරින් එළියේ ඉඳිමින් ශයිනි මට කථා කරලා,

එළියට එන්න කියලා අඬ ගැසුවා" කියලා. "නෑනා එළියට එන්න" කියලා අඬ ගැසුවා කියලා ඇය කියා තිබෙනවා. ඊට පසුව ඇය කියා තිබෙනවා, ටික වෙලාවක් ගියාට පසුව එළියෙන් වෙඩි සද්දයක් ඇහුණා කියලා. එතකොට, ඒ ශයිනි කියන එක්කෙනා මරන්නේ වෙඩි තියලා. ඔහු බෝම්බ ප්‍රහාරයෙන් මැරුණේ නැහැ. ඔහු මැරෙන්නේ වෙඩි තැබීමකින්. එතකොට කවුද ඔහුට වෙඩි තිබ්බේ?

ඊළඟට, සාරා ජීවතුන් අතර ඉන්නවා. සාරා අරගෙන යනවා. හාදියා කටඋත්තරයේ කියා තිබෙනවා, "මට එක්කෙනෙක් දෙමළෙන් කථා කළා. මම අහලා පුරුදු කට හඬක්" කියලා. එතකොට ඒ සිටි විනිශ්චයකාරවරුන් අහනවා කවුද ඒ කියලා. "මම හිතනවා ඒ සාරාගේ කටහඬ කියලා, සාරා අරගෙන යනවා මම දැක්කා" කියලා හාදියා කියා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කවුද සාරා අරගෙන ගියේ? එදා, අප්‍රේල් මාසයේ 26වැනි දා බෝම්බය පිපිරෙනකොට සාරා අරගෙන ගියේ කොහේටද කියලා මේජර් සුබසිංහගෙන් අහන්න. එතකොට කවුද හිටියේ නැඟෙනහිර ආඥාපති විධියට? නැඟෙනහිර අණදෙන නිලධාරියා විධියට හිටියේ තමුන්නාන්සේලාගේ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා වන අරුණ ජයසේකර මැතිතුමා. නැඟෙනහිර පළාතේ, සයින්දමරුදුවල ඒ බෝම්බ පිපිරීම් වෙනකොට නැඟෙනහිර පළාතේ ආඥාපති විධියට කටයුතු කළේ මේජර් ජෙනරාල් අරුණ ජයසේකර. කවුද සාරා අරගෙන ගියේ? මේජර් සුබසිංහ. අහන්න, කොහේටද ගෙනිච්චේ කියලා? දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නේ තිබෙන්නේ; ෂර්ලොක් හෝම්ස්ලා ඉන්නවා නේ. අහන්න සාරා කෝ කියලා. සාරා මැරුණේ නැහැ. සාරා ඉන්නවා. අපි දන්නවා, ගිය ආණ්ඩුවට ඕනෑකමක් තිබුණා, සාරා මැරුණා කියලා තහවුරු කරන්න. එයාගේ තුන්වන DNA වාර්තාවත් ගත්තා. තුන්වෙනි DNA වාර්තාවත් අරගෙන සාරා මැරුණා කියලා බොරුවට කිව්වා. කවුද ගියේ තුන්වෙනි DNA report එක ගන්න? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සාරා මැරුණා කියලා report එක ගන්න ගියේ කවුද දන්නවාද? පොලිස්පති, වික්‍රමරත්න. වික්‍රමරත්නත් එක්ක කවුද ගියේ? වික්‍රමරත්නගෙන් අහන්න. සාරාගේ බොරු DNA report එක ගන්න වික්‍රමරත්නත් එක්ක කවුද ගියේ? ඒවා දැන ගන්න. ඒ කියන්නේ ඔයගොල්ලන්ගේ ආණ්ඩුව ඇතුළේත් මේකට සම්බන්ධ උදවියගේ network එක තවම වැඩ කරනවා. තවම වැඩ කරනවා, ඒ network එක.

මම තව දෙයක් කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඊයේ පෙරේදා බම්බලපිටියේ බෝරා ප්‍රජාවගේ ආගමික උත්සවයක් තිබුණා.

එක්කෙනෙක් එතැනට ගිහිල්ලා photos ගත්තා. ඔහු බම්බලපිටිය පොලීසියෙන් අත්අඩංගුවට ගත්තා. අත්අඩංගුවට අරගෙන ඔහු බම්බලපිටිය පොලීසියට ගෙනිච්චා. ගෙනිහින් ඔහු පරීක්ෂා කරනකොට, පොලීසිය ඔහු හඳුනා ගන්නවා. අප්‍රේල් මාසයේ බෝම්බ සිද්ධියට සම්බන්ධ සහරාන්ගේ කණ්ඩායමේ හිටියා පොඩි සහරාන් කියලා කෙනෙක්. ඔහු තමයි ISIS එකත් එක්ක, සොනික් සොනික් එක්ක වැඩ කළේ. සොනික් සොනික් එක්ක වැඩ කරලා, මේක පිළිගන්න කියලා ISIS එකට emails ගැහුවේ ඔහු තමයි. බම්බලපිටියේදී ඔහු කොටු වෙනවා. මොකටද කොටු වෙන්නේ? බෝරා උත්සවයේ photos ගන්න ගිහිල්ලා. ඔහු අත්අඩංගුවට ගන්නවා, ගිය මාසයේ 28වැනි දා. 28වැනි දා අත්අඩංගුවට අරගෙන ජූලි මාසයේ පළමුවැනි දා ඔහු නිදහස් වෙනවා. එහෙම කොහොමද වෙන්නේ? එයා පාස්කු බෝම්බය සම්බන්ධයෙන් 2019-2023 වෙනකම් හිරේ හිටපු කෙනෙක්. එයා ඇප පිට නිදහස් වෙන්නේ. එහෙම නිදහස් වෙලා ඒ මනුස්සයා බය නැතිව නැවත වතාවක් යනවා බෝරා ජාතිකයන්ගේ ආගමික උත්සවයේ photos ගහන්න. කොහොම හයියක්ද එයාට තිබෙන්නේ?

ඊශ්‍රායලයට විරුද්ධ වීඩියෝ එකක් phone එකේ තිබුණා කියලා මාවනැල්ලේ වයස අවුරුදු 21ක් වන සුහෙයිල් කියන තරුණයෙක් PTA එක යටතේ මාස නවයක් රිමාන්ඩ් කරලා තියාගෙන ඉන්නවා. මේ කබීර් හෂීම් මැතිතුමාත් ඒ ගැන කථා කරන්න හිටියේ. දැනට මාස නවයයි. ඒ ළමයාගේ වයස අවුරුදු 21යි. එයා Cabin crew course එකක් කළේ. ජනවාරි මාසයේ ඒ graduation එක තිබුණා. ඔහුට graduation එකට යන්න ලැබුණේ නැහැ. ඒ ළමයාගේ ජීවිතේ ඉවරයි. ඒ ළමයා රිමාන්ඩ් කරලා ඉන්නේ. මම එයා බලන්න ගියා. ඒ ළමයා දාලා තිබෙන්නේ කා එක්කද? අයිස්වලට සම්බන්ධ වෙච්ච අයත් එක්ක, කුඩුවලට සම්බන්ධ වෙච්ච අයත් එක්ක, අපරාධකරුවන් එක්ක ඒ තරුණ ළමයා රිමාන්ඩ් කරලා තිබෙන්නේ. ඒ ළමයාගේ තරුණ කාලය ඉවරයි. එයාගේ graduation එකට යන්න බැරි වුණා. එයා දුප්පත් පවුලක ළමයෙක්. ඒ ළමයා බලන්න ගෙදරින් එන්නේ මාසයකට එක වතාවයි. තාත්තාට එන්න සල්ලි නැහැ. මාවනැල්ලේ කුලී වැඩ කරන්නේ. ඒ තරුණ ළමයාට ඉගෙන ගන්න තව සහෝදරයන් දෙන්නෙක් ඉන්නවා. ඒ ළමයා cabin crew course එක කරන්න දෙහිවලට ගියා, නවතින්න කාමරයක් සොයාගෙන. ගිය ගමන් පොලීසියෙන් ඇල්ලුවා. Identity Card එක නැහැ කියලා කිව්වා. උසාවි දැම්මා. උසාවියෙන් නිදහස් කළා. එදා රෑ දෙහිවල පොලීසියෙන් මාවනැල්ලට ගිහින් ආයෙත් අල්ලාගෙන ආවා. ඒ මොකටද? මේ ළමයාගේ phone එකේ ඊශ්‍රායලයට විරුද්ධව වීඩියෝ එකක් තිබුණා කියලා. මම අහන්න කැමතියි, මේ Mossad එකද කියලා. මේ අපේ ලංකාවේ පොලීසියද? නැත්නම් ඊශ්‍රායලය වෙනුවෙන් වැඩ කරන පොලීසියක්ද? පොඩි සහරාන්ට කිසිම ප්‍රශ්නයක් නැහැ. පොඩි සහරාන් නිදහස් කරනවා. ඒක දවස් දෙකෙන් ඉවරයි. මේ කොල්ලා PTA එක යටතේ මාස නවයක් තියාගෙන ඉන්නවා. මේ මොන අපරාධයක්ද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එහෙම නම් පොඩි සහරාන් නිදහස් කළේ ඇයි? පොඩි සහරාන් නිදහස් කිරීම තුළ පේනවා, පාස්කු බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච අය තවමත් පොඩි සහරාන් එක්ක ගනුදෙනු කරනවා කියලා. ඒ link එක පේනවා නේ. ඒ හින්දා නේ ඔහු අහු වෙච්ච ගමන් එළියට දමන්නේ. එයාට press conferences නැහැ; උද්ඝෝෂණ නැහැ. ඒ මොකුත් නැහැ. උඩින් උපදෙස් ආවා, එළියට දැම්මා. මේ network එක වැඩ කරනවා. මේ network එක ආණ්ඩුව ඇතුළේ තිබෙනවා. ඇයි අල්ලන්නේ නැත්තේ මේ network එක?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

හරි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඊළඟට අපට තිබෙන ප්‍රශ්නය මේකයි. සාරා මැරිලා කියලා DNA වාර්තා ගන්නවා. සාරාගේ නමට මොබිටෙල් නම්බර් එකක් අරගෙන තිබෙනවා, 2020.04.01වැනි දා. සාරා මැරුණා කියලා DNA පරීක්ෂණ කරනවා. නමුත් ඇයගේ නමට දුරකථන අංකයක් නිකුත් කරගෙන තිබෙනවා. මම ඒ වාර්තාව **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රවී සෙනෙවිරත්න මැතිතුමා දැන් නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම්තුමා. එතුමා කොමිෂන් සභාවට කියනවා, සහරාන්ට උඩින් කෙනෙක් හිටියා කියලා. කවුද ඒ උඩින් හිටිය කෙනා? ඒක එතුමා කොමිෂන් සභාවට ලියලා දෙනවා. දැන් පුළුවන් නේ ඒක හෙළිදරව් කරන්න. කවුද සහරාන්ට උඩින් හිටියේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අබු හින්ද් කවුද කියලාත් දන්නවා. කවුද අබු හින්ද් කියන්නේ? ඉන්දියාවේ RAW එක ලංකාවට ඇවිත් training එකක් කළා, ලංකාවේ බුද්ධි අංශයත් එක්ක. ඒ training එක කරනකොට ඉන්දියාවේ RAW එක ලංකාවේ බුද්ධි අංශයේ නිලධාරියෙක් හැඳින්වුවේ අබු හින්ද් කියලා. කවුද ඒ අබු හින්ද්?

සොයා ගන්න. දැන් තමුන්නාන්සේලා පත් කරලා තිබෙන, අපිත් එක්ක වැඩ කරපු, ඒ ආණ්ඩු කාලයේ හුඟාක් පරීක්ෂණ කළ නිලධාරින් දන්නවා. නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් කිව්වා සාරා ඉන්නේ ඉන්දියාවේ කියලා. අපි කන්ටේනර් ගැන කිව්ව ගමන් අපිව අල්ලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මාවනැල්ලේ තස්ලිම් කියන කෙනා සහරාන් ගැන, වනාතවිල්ලුව ගැන ඔත්තුව දුන්නා කියලා ඔළුවට වෙඩි තිබ්බා. තවම ඔහු ආබාධිත තත්ත්වයේ ඉන්නේ. ඒ ආබාධිත තත්ත්වයේ ඉන්න මනුස්සයාට තව වෙනකම් වන්දි ගෙව්වේ නැහැ. කබීර් හෂීම් මැතිතුමාත් මේ ගැන කථා කරන්න හිටියේ, නමුත් එතුමා හදිසියකට එළියට ගියා. සාමාන්‍යයෙන් ඔබතුමන්ලා ඔත්තුකරුවෙකුට අඩුම ගාණේ ලක්ෂ 50ක වන්දියක් ගෙවනවා. අපි ආණ්ඩුවට යෝජනා කරනවා, තස්ලිම්ට වහාම ඒ වන්දිය ගෙවන්න කියලා. එයාගේ ඔත්තුවෙන් තමයි වනාතවිල්ලුවේ වෙඩි ගබඩාව, ඒ බෝම්බ ගබඩාව සොයා ගන්න පුළුවන්කම ලැබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තව එක කාරණයක් කියලා කථාව අවසන් කරන්න මට ඉඩ දෙන්න.

இது மிக முக்கியமானதொரு விடயம்! மொஹமட் யாசீர் என்ற இலங்கையைச் சேர்ந்த மௌலவி, 2021ஆம் ஆண்டு டிசம்பர் மாதம் தன்னுடைய மனைவிக்கு சிகிச்சை பெறுவதற்காக அவருடன் இந்தியாவுக்குச் சென்றிருந்தார். அவர் 2021.12.27ஆம் திகதி சந்தேகத்தின்பேரில் இந்திய இராணுவத்தால் கைதுசெய்யப்பட்டு இருக்கிறார். இலங்கையில் இருக்கும்போது எந்தவித பயங்கரவாதச் செயற்பாட்டுடனும் சம்பந்தப்படாத அவர், இப்போது இந்தியாவில் பல வருட காலமாகச் சிறையில் இருக்கிறார். எனவே, அவரை விடுதலை செய்வதற்கு அரசாங்கம் முன்வர வேண்டுமெனக் கேட்டு, என்னுடைய பேச்சை முடிக்கின்றேன்.

நன்றி!

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමා මගේ නම කිව්වා. ඔව්, ගරු මන්ත්‍රීතුමා කිව්වා හරි. මම නැඟෙනහිර ආඥාපති හැටියට තමයි ඒ සිද්ධිදාමය වෙනකොට හිටියේ. මම වගකීමෙන් කියන්නේ. ඇත්තටම මගේ කථාවේදීත් මම මේක කිව්වා. බුද්ධි අංශයට සම්බන්ධ යම් කණ්ඩායමක් කිසියම් දේශපාලන අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා එම අන්තවාදී කණ්ඩායමට සහාය දීමක් කළා; බුද්ධි අංශයේ ඉතා සුළු කොටසක්, සමස්ත බුද්ධි අංශයම නොවෙයි. මම කිව්වා, that our intelligence units and the Criminal Investigation Department's units and its elements are highly professional. That is how when the Arugam Bay incident surfaced, they brought it under control and brought in peace.

ඒ නිසා තමයි මම කිව්වේ, ඒවා අනාවරණය කර ගැනීම සඳහා අපරාධ විමර්ශනයක් ඉතා ගැඹුරින් සිදු කරගෙන යනවා කියලා. ඔය කියන අය නියෝජනය කළ, ඔබතුමා නියෝජනය කරමින් සිටි ආණ්ඩුව තුළ වෙච්ච සිද්ධීන් ගැන, හොරකම් ගැන, ඒ අපරාධ ගැන සාක්ෂි දෙන්න CID එකට කැඳෙව්වාමම භයේ ගියේ නැහැ. නමුත් වග කියන රජයක් හැටියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට, නියෝජ්‍ය ආරක්ෂක ඇමති හැටියට මම බැඳිලා සිටිනවා, CID එකට එන්න කිව්වාම යන්න. මට CID එකට එන්න කිව්වා. මට හරියට දිනය මතක නැහැ, මීට මාස දෙකහමාරකට විතර පෙර, අපි බලයට ආවාට පස්සේ. මම ගිහින් පැය 6ක් ඒ ප්‍රශ්නවලට මුහුණ දීලා, ප්‍රශ්න ටිකට උත්තර සපයලා, ඒ සම්බන්ධයෙන් සහයෝගය දීලා පැමිණියා. මම නැඟෙනහිර ආඥාපති හැටියට කළ වැඩ කටයුතු ගැන මම කටඋත්තර දුන්නා. මුළු රටක ඇස් වහලා ඒ බුද්ධි අංශ සුළු පිරිස කටයුතු කරලා තිබෙනවා. මගේ ප්‍රකාශය මෙතැනින් අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 4.04]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் இந்தச் சபையில் 2019ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 21ஆம் திகதி இடம்பெற்ற உயிர்த்த ஞாயிறு தாக்குதல் தொடர்பாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம். இந்த நாட்டில் ஆட்சி அதிகாரத்தைக் கைப்பற்றுவதற்காக மேற்கொள்ளப்பட்ட மிக மோசமான, மிலேச்சத்தனமான ஒரு தாக்குதலாகத்தான் நாங்கள் இந்தத் தாக்குதலைக் கருதவேண்டி இருக்கின்றது. இந்த நாட்டு மக்கள் இன ஐக்கியத்தோடும் சமாதானத்தோடும் வாழவேண்டிய காலப்பகுதியில் இப்படிப் பட்ட மிலேச்சத்தனமான ஒரு தாக்குதல் நடவடிக்கையை மேற்கொண்டிருந்தார்கள். இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம் மக்களுக்கும் சிங்கள மக்களுக்கும் இடையில் அல்லது முஸ்லிம்களுக்கும் கிறிஸ்தவர்களுக்கும் இடையில் முரண் பாட்டை உருவாக்குவதற்காகத்தான் கடந்த கால ஆட்சியாளர்கள் இந்தத் தாக்குதலை வழிநடாத்தியிருந்தார்கள்.

இந்த நாடு 30 வருடங்கள் யுத்தத்துக்கு முகங்கொடுத்த தென்பது உங்களுக்குத் தெரியும்! அதன் காரணமாக நாடு பொருளாதார நெருக்கடிக்கு உள்ளானது. தனிப்பட்ட அரசியல் தேவைகளுக்காக அல்லது ஆட்சி அதிகாரத்தைக் கைப்பற்று வதற்காக அக்காலப்பகுதியில் இருந்த அரசியல்வாதிகள் செயற்பட்டார்கள். தமிழ், சிங்கள மக்களுக்கு இடையில் முரண்பாட்டைத் தோற்றுவிக்கின்ற ஒரு செயற்பாடாகவே அது அமைந்திருந்தது. ஆசியாவில் பெரிய நூலகமாக இருந்த யாழ். நூலகம்கூட எரிக்கப்பட்டது. இப்படியான பல சம்பவங்களினூடாக இந்த நாட்டில் இன ஐக்கியம் சீர்குலைந்தது. யுத்தம் நிறைவடைந்ததன் பின்னர், நாட்டில் நடந்த இன்னுமோர் இனவாத செயற்பாடாகத்தான் இந்த உயிர்த்த ஞாயிறு தாக்குதல் அமைந்திருந்தது.

மட்டக்களப்பு மாவட்டத்தில் சியோன் தேவாலயத்திலும் இந்தத் தாக்குதல் இடம்பெற்றிருந்தது. அதில் 31 பேர் இறந்தார்கள்; 67 பேர் அங்கவீனம் அடைந்தார்கள். பாதிக்கப் பட்டவர்களில் கூடுதலானவர்கள் சிறுவர்கள். அன்றையதினம் ஞாயிறு பாடசாலைக்காகச் சென்றிருந்த பிள்ளைகள் சந்தோஷமாக விளையாடிக்கொண்டு இருந்தபோதுதான் இத்தாக்குதல் இடம்பெற்றது. இந்த நாட்டை மோசமான நிலைக்குத் தள்ளுகின்ற ஒரு செயற்பாடாகத்தான் இது அமைந்திருந்தது. மேலும், இது இன ஐக்கியத்தைக் குழப்புகின்ற ஒரு செயற்பாடாகவும் அமைந்திருந்தது. அதுமாத்திரமல்ல, எமது நாடு பொருளாதார ரீதியாக வங்குரோத்து நிலையை அடைவதற்குத் தொடக்கப் புள்ளியாகவும் இத்தாக்குதல் அமைந்திருந்தது.

இத்தாக்குதலுக்குப் பின்னர், எமது நாட்டுக்கு வருவாயை ஈட்டித்தருகின்ற துறைகளில் ஒன்றான சுற்றுலாத்துறையில் பாரிய பின்னடைவு ஏற்பட்டது உங்களுக்குத் தெரியும்! குறிப்பாக, 2018ஆம் ஆண்டு சுற்றுலாத்துறை மூலம் எமது நாடு 4.38 பில்லியன் அமெரிக்க டொலர்களை உழைத்தது. 2019ஆம் ஆண்டு நடைபெற்ற 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் காரணமாக அது 3.6 பில்லியன் அமெரிக்க டொலர்களாகக் குறைவடைந்தது. கிட்டத்தட்ட 17.7 சதவீதத்தால் சுற்றுலாத்துறை மூலமான வருமானம் குறைவடைந்ததை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருந்தது. மேலும், இத்தாக்குதலில் வெளிநாட்டவர்கள் பலரும் உயிரிழந்தார்கள். அதன் காரணமாகவும் சுற்றுலாப் பயணிகளின் வருகை மிக மோசமாகக் குறைவடைந்தது. அது கிட்டத்தட்ட 18 சதவீதமாகக் குறைவடைந்ததை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருந்தது. அதுமாத்திரமன்றி, சுற்றுலாத்துறையில் நேரடியாகவும் மறைமுகமாகவும் ஈடுபட்ட ஐந்து இலட்சம் பேர் தமது தொழில்களை இழந்தார்கள். இந்தத் தாக்குதல் நடவடிக்கைகள் ஹோட்டல் துறையிலும் பாரிய வீழ்ச்சியை ஏற்படுத்தியது. ஏனெனில், ஹோட்டல்களிலும் தாக்குதல்கள் இடம்பெற்றன. இதன் காரணமாக 20 சதவீதமான ஹோட்டல்களை நிரந்தமாக மூடவேண்டிய ஒரு நிலைமை ஏற்பட்டது.

இந்தத் தாக்குதலால் மொத்த உள்நாட்டு உற்பத்தியில் - GDPஇல் - பாரிய வீழ்ச்சி ஏற்பட்டிருந்தது. 2018ஆம் ஆண்டு GDPஇன் வளர்ச்சி 3.3 சதவீதமாக இருந்தது. அது 2019ஆம் ஆண்டில் 2.3 சதவீதமாகக் குறைவடைந்தது. இதன் காரணமாக இந்த நாட்டின் தொழிற்றுறையில் பாரிய வீழ்ச்சியை நாங்கள் எதிர்நோக்கவேண்டி ஏற்பட்டது. மத்திய அரசாங்கத்தின் வருமானத்தை எடுத்துக்கொண்டால், வரி வருமானம் மூலமாகவும் வணிக வருவாய் மூலமாகவும் 26-50 பில்லியன் ரூபாயை இழக்கவேண்டி ஏற்பட்டது. அதுமாத்திரமல்ல, இந்த நாட்டை நம்பி இந்த நாட்டில் முதலீடுகளை மேற்கொண்டிருந்தவர்கள் இந்த நாட்டைவிட்டுச் செல்லும் நிலைமையும் ஏற்பட்டது. அத்துடன், வெளிநாட்டு முதலீட்டாளர்கள் எமது நாட்டின்மீது வைத்திருந்த நம்பிக்கையும் இழக்கப்பட்டது. பங்குச் சந்தையில் 3.6 சதவீத வீழ்ச்சி ஏற்பட்டிருந்ததையும் நாங்கள் காணக்கூடியதாக இருந்தது. அதுமாத்திரமல்ல, நேரடி வெளிநாட்டு முதலீடுகளும் குறைவடைந்தது.

அடுத்து, இங்கு பிள்ளையான் அவர்களின் கைது தொடர்பாகப் பேசப்பட்டது. உண்மையிலேயே பிள்ளையான் அவர்கள் இந்தக் குண்டுத் தாக்குதலுடன் தொடர்புபட்டு இருந்தால், அவருக்கு எதிராக தொடர்ச்சியாக சட்ட நடவடிக்கைகளை அரசாங்கம் என்ற ரீதியில் நாங்கள் முன்னெடுப்போம். அதில் எந்தவொரு தடையும் ஏற்படாது என்பதை அரச தரப்பைச் சேர்ந்தவன் என்ற ரீதியில் இந்த நேரத்தில் நான் தெரிவித்துக் கொள்கின்றேன். வாகரை பிரதேச சபையில் ஆட்சியமைப்பதற்கு நாங்கள் ஆதரவளித்ததாக இங்கு கௌரவ உறுப்பினர் ஒருவர் குறிப்பிட்டிருந்தார். அது முற்றிலும் பிழையானதொரு தகவலாகும். நாங்கள் எந்தவொரு கட்சியுடனும் deal பேசவில்லை. அந்தப் பிரதேச சபையில் சிறந்தவர்களைத் தெரிவுசெய்ய வேண்டும் என்பதற்காகத்தான் நாங்கள் ஒருசில வாக்குகளை வழங்கியிருந்தோம். எங்கள்மீது குற்றச் சாட்டுகளை முன்வைப்பவர்கள் களுவாஞ்சிக்குடி பிரதேச சபையில் TMVP உறுப்பினர் ஒருவரை விலைகொடுத்து வாங்கி ஆட்சி அதிகாரத்தைப் பெற்றிருக்கிறார்கள் என்ற விடயத்தை நான் இந்த நேரத்தில் குறிப்பிட விரும்புகின்றேன். இன ஐக்கியத்தைக் குழப்புகின்ற இவ்வாறான செயற்பாடுகள் இனியும் இந்த நாட்டில் இடம்பெறக்கூடாது என்பதைக் கூறிக்கொண்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.11]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019.04.21වන දින සිදු වූ පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව පැවැත්වෙන කල් තැබීමේ විවාදය සම්බන්ධයෙන් මේ වෙලාවේ අදහස් දක්වන්න මා බලාපොරොත්තු වනවා. ස්ථාන 8කට එල්ල වූ මේ ප්‍රහාරය නිසා පුද්ගලයන් 274ක් මිය ගිහිල්ලා, 592ක් බරපතළ තුවාල ලැබුවා. එම ප්‍රහාරය සිදු වෙලා මේ වන විට අවුරුදු 6ක් ගත වෙලා තිබෙනවා. මේ අපරාධය, ඒ වාගේම මේ අපරාධයට පසුව ඇති වෙච්ච ආර්ථික පරිහානිය යන ඒ තත්ත්වයන් දෙකටම එහා ගිහිල්ලා සමාජයක් හැටියට කොයි තරම් ලොකු ඛේදවාචකයකට අපි මුහුණ දුන්නාද, මිනිසුන් අතර අවිශ්වාසය හා ගැටුම කොයි විදියට වර්ධනය වුණාද කියන එකත් ඒ අවුරුදු 6ක සම්පූර්ණ ක්‍රියාවලියට එකතු කරලාම කථා කරන්න ඕනෑය කියා මා හිතනවා.

2019 අප්‍රේල් මාසයේ 21වැනි දා වනකොට මම ගුරුවරියක හැටියට සේවය කරමින් හිටියේ. ඒ කාලයේ මම අමතර පාඨමාලාවක් සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට ආවා. එදා ඉරිදා දවසේ උදේ තමයි මේ බෝම්බ පිපිරීම සිද්ධ වුණේ. ඒ ඇති වෙච්ච කලබලකාරී තත්ත්වය නිසා හිටිහැටියේම එක සැරේ විශ්වවිද්‍යාල අධ්‍යාපන ආයතන සියල්ල වහලා, රටේ ඇඳිරි නීතිය පවා පැනවුවා. මාත් එක්කම ඒ පාඨමාලාව හදාරමින් හිටපු මගේ මුස්ලිම් යෙහෙළියක් එදාත් මා සමඟ හිටියා. ඒ ඇති වෙලා තිබුණු තත්ත්වය එක්ක ඇයත්, මමත් බස් එකේ කොළඹ ඉඳලා මාතරට යනකල් ගියේ තැති ගැන්මෙන්. එවන් අත්දැකීමකට පූර්ව කාලයේදීත් මුහුණ දීලා තිබෙන නිසා ඒ පිළිබඳව මා හොඳින් දන්නවා.

1983දී මා පාසල් දැරියක්. පාසල් දැරියක හැටියට ඉන්න කොට 83 කලබල කාලයේදී යුද පීඩාව සමාජයීය වශයෙන් බලපාන්නේ කොහොමද කියන එක අපි අත්දැකලා තිබුණා. කුඩා දැරියක හැටියට එදා මා මුහුණ දුන් අත්දැකීම් මට මතකයි. මගේ අම්මා මා වාගේ සිංහල කථා කරන්න පුළුවන් කෙනෙකු නොවෙයි. හැබැයි, සමාජයක් ඇතුළේ කැඩි කැඩී සිංහලෙන් කථා කරන කෙනෙකු දිහා බලන බැල්මෙන් ඇති වන වෙනස, එහෙම නැත්නම් ඒ කථාව කෙරෙහි අනෙකාගේ සිතෙහි ඇති වන අවිශ්වාසය කොයි තරම් පීඩාකාරීද කියන එක වැඩුණු පුරවැසියෙකු හැටියටත්, ගුරුවරියක හැටියට පත් වුණාට පසුවත්, මගේ යාළුවාගේ අතින් අල්ලාගෙන යනකොට ඇයට මුහුණ දෙන්න වුණු ඒ සිදුවීමෙනුත් මම දැක්කා. මොකද, අපි හැමෝටම ආවේණික ඇඳුමක් තිබෙනවා. විශේෂයෙන්ම ඉස්ලාම් ආගමේ අපේ මුස්ලිම් සහෝදරියෝ අඳින ඇඳුම ගැන සැකයක් නිර්මාණය වුණේ මේ සිදුවීමෙන් පසුවයි. විශේෂයෙන් ඒ ඇඳුම -තමන්ගේ හිජාබ් එක- ඇඳගෙන පාරේ යනකොට නිර්මාණය කරපු භයානකකම ඇතුළේ අපේ මුස්ලිම් සහෝදරියන් කොයි තරම් පීඩා වින්දාද කියන එක මම දැක්කා. එතකොට අද මේ කථා කරන කිසි කෙනෙකු එදා ඒ ගැන කථා කළේ නැහැ. හැබැයි, අපි ඒ ගැන කථා කළා.

ඒ වාගේම තමයි පාසල්වල බෝම්බ පුපුරාවි, අවිනිශ්චිත තත්ත්වයක් ඇති වේවි කියලා හැම පාසලක්ම මුර කරන්න උදේට අම්මලා තාත්තලා ගියා. ඒ වෙලාවේ දකුණේ පාසලක උගන්වපු ගුරුවරියක හැටියට මටත්, ඇත්තටම උදේට පාසල මුර කරන්න එන දරුවන්ගේ අම්මලාටත්, අනෙකුත් සෙසු සියලුදෙනාටත්, ඒ වෙලාවේ පාසල මුර කරන්නවත් මුස්ලිම් සහෝදරියන්ව ගෙන්වා ගැනීම පිළිබඳ භයක් ඒ ජන සමාජය ඇතුළේ නිර්මාණය වෙලා තිබුණා. එහෙම තමයි මේ සමාජය ඇතුළේ ජනතාව අතර විරසකය ඇති කළේ, ජනතාව තුළ භය ඇති කළේ. ඒ වෙලාවේ මේ ත්‍රස්තවාදය නිසා කිසිම දවසක අහිංසක ජනතාව පීඩා විඳිය යුතු නැහැ කියන එක පන්ති කාමරවල ඉන්න හැම දරුවෙකුටම උගන්වපු ගුරුවරුන් අපි. හැබැයි, එහෙම උගන්වපු අපි තමයි අද ජාතිවාදීන් වෙලා ඉන්නේ. ඒ වෙලාවේ කට වහගෙන හිටපු, ඒ වෙලාවේ තමන්ගේ ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙනී ඉන්න ධෛර්යයක් නොතිබුණු මිනිස්සු අද වීරයෝ වෙලා අපව ප්‍රශ්න කරන තැනට පත්ව තිබෙනවා. ඒ නිසාම මේ වෙලාවේ මා කියන්න ඕනෑ තව කථාවක් තිබෙනවා.

ලෝකයේ බල අරගළවල ගොදුරු බවට හැම දාම පත් වුණේ අහිංසක ජනතාව. විශේෂයෙන්ම පසුගිය කාල පරාසය ගත්තොත්, බල අරගළය කියන එක තමන්ට හෝ ඉතාම සීමිත පිරිසකට -ඒක දේශපාලන පක්ෂයක් වෙන්න පුළුවන්, දේශපාලන කඳවුරක් වෙන්න පුළුවන්, මතවාදයක් වෙන්න පුළුවන්- ලෝකයේ බලය අල්ලා ගැනීමේ බල අරගළය වෙනුවෙන් ඇත්තටම මේ අහිංසක ජනතාව ගොදුරු කර ගත්තා. පසුගිය කාල පරාසය ගත්තත්, අපි නිශ්චිතව කියන මේ සිදුවීම හේතුවෙන් මිය ගිය ජනතාව, විශේෂයෙන්ම ලංකාවේ කිතුනු -කතෝලික- ජනතාව කියන්නේ අනාදිමත් කාලයක ඉඳලා කිසිම ගැටුමකට සම්බන්ධ වුණු ජනතාවක් නොවෙයි කියන එක මුලින්ම මම කියන්න ඕනෑ. ඒ වාගේම මම උගන්වපු පාසල කතෝලික පාසලක්. ඒ පාසලේ හිටියේ ඉතා ම සීමිත කතෝලික දරුවන් පිරිසක්. ඊළඟ කාරණාවට එන්න කලින් මේ ගැනත් මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

ඒ වාගේම බෞද්ධ ජනතාව බහුලව ජීවත් වන ප්‍රදේශයක තිබුණු ඒ පාසල තුළ බහුලවම හිටියේ බෞද්ධ ශිෂ්‍යාවන්. මුස්ලිම් දරුවනුත් යම් ප්‍රමාණයක් හිටියා. කතෝලික පාසලක් වුණත්, ඒ පාසලේ කතෝලික දරුවන් හිටියේ ඊට වඩා අඩුවෙන්. ඒ හැම කෙනෙකුටම උදේට ආගම ඇදහීමේ අයිතිය ඒ පාසල තුළ තිබුණා. ඒ පාසල තුළ සිටි දෙමළ භාෂාව කථා කරන එකම ගුරුවරිය මා වුණත්, වෙනසක් නැතුව ඒ දරු පැටවුන්ගේ අහිංසක ආදරය හොඳින් අත්විඳිමින් මම ජීවත් වුණා. ඒ සහජීවනය කොයි වාගේද කියන එක අපි දරුවන්ට උගන්වමිනුයි හිටියේ. හැබැයි ඒ සමාජය තුළ එකට කෑම එක කාපු දරුවන්ට වෙනස්ව හිතන්න පුරුදු කළේ, මෙන්න මේ බල අරගළය වෙනුවෙන් අහිංසක මිනිස්සුන්ගේ ජීවිතත් එක්ක සූදු කෙළපු දේශපාලකයෝ. අපි ඒකට විරුද්ධයි. ඒ නිසා ඒ අහිංසක ජනතාවට එකට ඉන්න තිබුණු අයිතිය නැති කරලා, ඒ අහිංසක ජීවිතත් එක්ක සෙල්ලම් කරලා තමන්ට බලය ඇති කරගන්න, තමන්ගේ බලය සනාථ -සහතික- කරගන්න කටයුතු කරපු ඒ දේශපාලනය අවසන් කිරීම සමාජ යුක්තිය ඉටු කිරීම වෙනුවෙන් බලයට පත් වෙච්ච අප වැනි දේශපාලන ව්‍යාපාරයක අනිවාර්ය අංගයක්. ඒ නිසාම අපි කියනවා, පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම වාගේම එහි අපරාධකරුවන්ට දඬුවම් ලබා දීමේ වගකීම ද අපි භාර ගන්නවා කියලා. මේක නිකම් ප්‍රකාශයක් නොවෙයි. ලෝකය පුරාම බල අරගළ වෙනුවෙන් ජීවිත පූජා කරපු මිනිස්සුන්ගේ සංඛ්‍යාව අතිවිශාලයි. ඒ විතරක් නොවෙයි. සමාජයක් හැටියට අපි කොයිතරම් ඉදිරියට යනවාද, දියුණුවට පත් වෙනවාද කියන එකට විරුද්ධව කකුලෙන් අදින, එහෙම නැත්නම් පරම්පරා ගණනාවක් ආපස්සට අදින ක්‍රියාවක් හැටියට තමයි අපි යුද්ධය දකින්නේ. විශේෂයෙන්ම තිස් අවුරුදු යුද්ධය තුළ මේ රටට නැති වෙච්ච බුද්ධිමය සම්පත අපට මුදලින් මනින්න බැහැ. ලංකාව අතහැර ගිය ඒ මිනිස්සුන්ගේ වටිනාකම, දැනුම නැවත අපට මේ රටට ගන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
තව පොඩි වෙලාවක් මම ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය කාලය ගත්තොත්, වියට්නාම යුද්ධයේදී සිවිල් වැසියන් මිලියන 2ක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි ඇෆ්ගනිස්තාන යුද්ධයේදී 1978-1987 කාලය තුළ අස්වාභාවික මරණ 876,000ක් වාර්තා වෙලා තිබෙනවා. ඉරාන-ඉරාක යුද්ධයේදී 1980-1988 කාලයේදී මිය ගිය සංඛ්‍යාව ලක්ෂ 5යි. ගල්ෆ් යුද්ධයේදී 1990-1991 කාලයට -එක අවුරුද්දකට විතරක්- ඉරාක මරණ 20,000-35,000 අතර වන බව ගණනය කර තිබෙනවා. රුවන්ඩාවේ පැවති ටුට්සි-හුටු ජනවාර්ගික අර්බුදය නිසා රුවන්ඩා ජාතිකයන් ලක්ෂ 8ක් ඝාතනය වෙලා තිබෙනවා. බොස්නියානු යුද්ධයේ ජාතිවාදී අරගළය නිසා ලක්ෂයකට වඩා මිය ගිහිල්ලා තිබෙනවා. දෙවන කොංගෝ යුද්ධයේදී වාර්තා වී ඇති මරණ සංඛ්‍යාව මිලියන 3.8යි. මේ වනකොට ඊශ්‍රායල-පලස්තීන යුද්ධයෙන් මිය ගිය සංඛ්‍යාව 186,000ක් කියලා ගණනය කර තිබෙනවා. ඒ වාගේම එහිදී තුවාල ලැබූ පිරිස 127,000ක් බවත්, 55,0000කට ආසන්න පලස්තීනුවන් පිරිසක් මිය ගිහින් තිබෙන බවත් කියනවා. සිරියානු සිවිල් යුද්ධය නිසා මිලියන 6.5ක් අවතැන් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි වැඩිම සරණාගතයින් ප්‍රමාණය නිර්මාණය වෙලා තිබෙන්නේත් එතැනදී. යේමන් සිවිල් යුද්ධයේදී මිලියන 4.5ක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒකෙන් සියයට 80ක් කාන්තාවන් කියලාත් ගණනය කර තිබෙනවා. ඒ නිසා මේ අවතැන් වුණු, ඒ වාගේම ජීවිත නැති වුණු අහිංසක ජනතාව වෙනුවෙන් අපි සමාජයට දෙන වගකීම මොකක්ද? මෙන්න මේ බල අරගළය වෙනුවෙන් -දේශපාලනය තුළ බලය ලබා ගැනීම වෙනුවෙන්- අහිංසක ජනතාව තවදුරටත් වින්දිතයන් වන ක්‍රමය අපි වළක්වන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට ලැබී තිබෙන කාලය අවසානයි.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා තමයි අපි -පෞද්ගලිකව ගත්තොත් මම- සියලුම දේවල් අපේ දැස් ඉදිරිපිට ගිනි ගනිද්දිත් ජාතිවාදී නොවුණේ. ඒ වාගේ දේශපාලන ව්‍යාපාරයක තමයි අපි අද නිරත වෙලා ඉන්නේ. මගේ දැස් පනාපිට අපේ සියලු දේවල් ගිනි ගත්තත් අපි අදටත් අන්තවාදී වෙලා නැහැ. අපි අදටත් කථා කරන්නේ අපේ ආගම වෙනුවෙන්, ජාතිය වෙනුවෙන්, එහෙම නැත්නම් භාෂාව වෙනුවෙන් කියන තනි කෙනෙකුගේ අයිතිය ගැන නොවෙයි. මොකද, සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජාතීන්ට සමානව ජීවත් වෙන්න පුළුවන් රටක් අපට ඕනෑ කරනවා.

මගේ ගුරුවරයා වූ මහාචාර්ය යෝගරාජා මහත්මයාගේ ප්‍රකාශයකින් කථාව අවසන් කරන්න මම කැමැතියි. ලංකාවේ ජීවත් වන ජනතාව අතරින්, දෙමළ ජනයා වඩාත්ම සංවේදී වෙන්නේ භාෂාවට; සිංහල ජනයා වඩාත්ම සංවේදී වෙන්නේ ජාතියට; මුස්ලිම් ජනතාව වඩාත්ම සංවේදී වෙන්නේ ආගමට කියලා එතුමා කියා තිබෙනවා. ඒ නිසා අපේ දේශපාලනඥයෝ හොඳින් දැනගෙන හිටියා, දෙමළ මිනිහාට රිද්දන්න නම් භාෂාවට ගහන්න ඕනෑ; සිංහල මිනිහාට රිද්දන්න නම් ජාතියට ගහන්න ඕනෑ; මුස්ලිම් මිනිහාට රිද්දන්න නම් ආගමට ගහන්න ඕනෑය කියලා.

ඒක අපේ දේශපාලනඥයෝ හොඳින් දැනගෙන එය හොඳට පාවිච්චි කළා. හැබැයි, අහිංසක ජනතාව වෙච්ච අපි මේක දැනගෙන හිටියේ නැහැ. අපේ ආගමට රිද්දනකොට අපි වෙන් වෙලා අපේ ආගම බේරා ගන්න සටන් කළා. බෝර්ඩ් එකේ අකුරු වරද්දලා දාලා තිබෙනකොට අපි හිතුවා, ඒක අත්වැරදීමක් කියලා. නැහැ, ඕනෑකමිනුයි ඒ අකුරු වරද්දලා දාලා තිබුණේ. ඒ වාගේම අපි දන්නවා, භාෂාවට ඒ ප්‍රමුඛතාව නොදී තියෙද්දි අපේ භාෂාව බේරා ගන්න අප සටන් කළ බව. සිංහල ජනතාව තමන්ගේ ජාතිය බේරා ගැනීම සඳහා සටන් කළා. එහෙම සටන් කරලා ආගම්, භාෂා සහ ජාතීන් අතර භේදයක් ඇති කළා. අපි ඉතාම වගකීමෙන් කියනවා, ඇත්තටම යුක්තිය කියන එක ඕනෑ තනි පුද්ගලයෙකුට විතරක් නොවෙයි, සමස්ත සමාජයටම කියන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමියනි.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මම තව විනාඩියක් තුළ මේ කාරණයත් කියා කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යුක්තිය කියන එක සමස්ත සමාජයටම ඕනෑ. අන්න ඒ සමාජය වෙනුවෙන් යුක්තිය ඉටු කරදීමේ වගකීම ජාතික ජන බලවේගයේ රජයකින් අපි අනිවාර්යයෙන් ඉෂ්ට කරනවා. පාස්කු ප්‍රහාරය වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන්න අවශ්‍ය වන්නේ අන්න ඒ නිසායි.

අවසාන වශයෙන් මම කියනවා, සිංහල, දෙමළ, මුස්ලිම් කියන අපි හැමෝම එකම රටක මිනිස්සු බව. අපි හැම කෙනාටම අත්වෙලා තිබෙන මේ ඛේදවාචකය, මේ නරක ඉරණම මෙතැනින් අවසන් කරමු. හැම දරුවෙකුටම ශ්‍රී ලාංකිකයෙක් හැටියට හිතන්න පුළුවන් රටක් නිර්මාණය කිරීම වෙනුවෙන් අනිවාර්යයෙන් ඉදිරියේදී පාස්කු ප්‍රහාරයේ අපරාධකරුවන්ට දඬුවම් ලබා දෙනවා වාගේම වින්දිතයන්ට යුක්තිය හා සාධාරණත්වය ලබා දෙනවා කියාත් අපි පොරොන්දු වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[4.23 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, there is a very important maxim in the legal jurisprudence which says that justice must not only be done, but it must be seen to be done. That maxim, I wish to start my speech with because when

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

the Hon. Leader of the House Bimal Rathnayake was speaking, he explained the backdrop to the Easter Sunday attacks, the political motivations behind the Easter Sunday attacks, as quite simply a setup, an incident orchestrated by the Rajapaksas, who had had lost the elections, through their agents within the Government, using the influence they had in order to create a fear psychosis within the country and to show that there is a huge vacuum when it comes to security and that it is only the Rajapaksas and in particular, someone like Gotabaya Rajapaksa who can, in fact, ensure that security and that that was the plan which was orchestrated and culminated in the Easter Sunday attacks. That is correct; I agree. So, he inadvertently accepts that the political influence of a Government that had been defeated in 2015 was still sufficiently influential within the State structure even four years after their defeat to create an incident such as this to come back to power.

Now, I am asking, Hon. Presiding Member, whether any reasonable person who genuinely wants justice not only be done, but wants it seen to be done could think that a State structure which has been so influenced by the power of 20 years - not just for the 10 years that the Rajapaksas were in power starting from 2006, but they were in very high office even for another ten years before that since 1994 - could be got rid of within just six or seven months since your coming to power? Is that possible? Who are you fooling? So, the reality, Sir, is this. Under these circumstances, when the State itself is the accused party to a particular crime and when segments of the State were so corrupted and so influenced politically, the accusation that you all are making with regard to the Easter Sunday attacks is that the Rajapaksas are the accused party. But for 76 years since 1948, we all know that there has been political influence in this country. The institutions of governance have never been independent; there has always been political influence. The politicians controlled the State. That is why we are a failed State today; that is why we are looked upon as a pariah State. Even the people have begun to realize that and they wanted a change because they hit rock bottom with the economic crisis. So, that is the reality that we are dealing with, Sir. If that is the reality and if this Government thinks that by keeping the same basic State structure, they could find justice, they are in a dreaming world. That State structure would never allow the actual culprits behind this heinous crime to be brought to justice. So, justice would not be done, Sir; forget about justice being seen to be done, it would not be done. You all would ultimately, if at all, catch the small fries, the guinea pigs.

Sir, this, I am saying because I agree that on a crime where the State structure is an accused party, where the State is seen as an accomplice or its complicity is the biggest accusation that is being made, the State cannot investigate itself through an internal investigation. It goes against the very nature, the very core principle of natural justice. How can an accused party investigate itself?

That is why, Sir, whilst the fifth point of the Motion talks of an independent Prosecutor's Office that has international assistance, I have disagreed with that. My view is that on a crime such as the Easter Sunday attack, where the State is an accused party, the investigation must be international in character. You do not have power over that State structure. The Minister of Justice and National Integration, because his name was registered in Parliament as "Dr.", that he had got a PhD, had to go to the CID to make a complaint because he suspected that there was sabotage. That is how deep the political influence has been. We all know that. So, under those circumstances, Sir, mark my words, if you all want genuine justice, you would never get it. You would never get it because you do not have the control of the State in an independent manner. That is the truth.

Then, look at the circumstances of the Chemmani mass graves; look at the position of the Tamils. You all supported the war being party to the Chandrika Kumaratunga Government, which is the accused party to the Chemmani mass graves. The Chemmani mass graves came out for the first time sometime in 1996 or 1997. Then, the investigations brought out only 15 bodies. Despite the fact that an accused person in the Krishanthi Kumaraswamy case - I know this because my father was the lawyer who looked after the interests of the Kumaraswamy family - saying in his dock statement that there were over 500 to 600 bodies buried in mass graves in the Chemmani area, only 15 were discovered! And, the Chemmani mass graves that are being currently discovered are just a few metres from the original site. But, the then Government or the State, the accused party, did not even bother, despite the fact that there is an accused person who gave details of those sites, to look at just about 100 yards away from the origianal site, which is where the present mass graves have been discovered. So, that is what happens when the State itself is the accused party. This is not a Tamil, Sinhala or a Muslim matter. The question is whether you want legitimacy to crimes that had happened and legitimacy with regard investigations to ensure that the victims feel that they have got justice.

So, Sir, an international investigation would be needed into crimes where the accused party is the State itself that even you all have no control over, even if you are genuine like in the case of the Easter Sunday attacks. I can tell you definitely or most certainly that you all are not genuine with regard to the Chemmani mass graves because you all were accomplices; you all wanted the war and supported the war. Your President has said that there would never be a prosecution with regard to those war crimes, only merely a Truth Commission. So, if you want to put right this State, which is broken, then you must do it in a proper way that the victims feel certain that they, at least, have a Government which is listening to them for once and is on their side.

Sir, I just want to say one more thing since the Hon. Minister is here.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I will take only one minute, Sir.

On the 23rd of October, 2024, one Mohamed Suhail Mohamed Rifai was arrested - now it has been nine months - and he is still in detention under the PTA. This Mohamed Suhail Mohamed Rifai is from Mawanella and he was a student who was undergoing an airline cabin crew course in Colombo. He was arrested by the Dehiwala Police when he had gone to rent a room, where they had asked for his NIC and he did not have it with him. He was produced in court on the 25th of October, 2024. Then, his father produced his National Identity Card and he was released. When he was released, he immediately went to Mawanella. Then, in the night, the Dehiwala Police had gone to Mawanella and arrested him again.

This time, they have made charges saying that in his phone, there was some post supportive of the Palestinians and against the Israelis. That post, Sir, is now before court; it is in the B Report. And, what is it? It is an emoji; it is an emoji of an Israeli flag and a person with a sword pointing at the flag or let us say, pricking the flag. How can that be a reason to be arrested under the PTA and being kept for nine months, Hon. Minister? Nine months! Is that reasonable? It is ridiculous!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Okay, Sir.

Number one, that is free speech. How can that be an offence under the PTA, for God's sake? I am telling you, these are the things that make people, the ordinary, innocent people, express so distastefully and be so prejudiced against the State structure when it comes to their civic rights because this is how they are treated. Sir, I totally agree that the Ministry should not get involved in cases, but this is absurd! Your reason for allowing the police to continue to use the PTA is that they would use it properly. On what grounds can you say that the PTA is used properly? For God's sake, intervene and get these people released! It is completely unacceptable!

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.35]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මා මෙය අවස්ථාවක් කර ගන්නවා, අපේ අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන්ට ස්තුතිය පුද කරන්න. මොකද, රටේ පුරවැසියෙක් හැටියට එදා ඒ සිදුවීම වුණු වෙලාවේ, සාධාරණයක් ඉෂ්ට කළේ අතිඋතුම් මැල්කම් කාදිනල් හිමිපාණන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විවාදයට ප්‍රවිශ්ට වීමට පෙර කාරණා කිහිපයක් කියන්න කැමැතියි. මම දැක්කා, සමහර කාරණා ගැන සමහර මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ කථා කරපු විලාසය. විශේෂයෙන් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කළා; පසුගිය දවස් ටිකේ කෑ ගැහුවා, වරායෙන් නිදහස් කරපු බහලුම් ගැන. හැබැයි මම අහන්න කැමැතියි, එදා මහ බැංකුව කොල්ලකනකොට එතුමා කොහේද හිටියේ කියලා. ඒ වාගේම පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කථා කළා. පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු කළේ අපියි, මහ මොළකරු අපියි කියලා හිතෙන විධියට කථා කළා. මම අහන්න කැමැතියි, එදා ඒ සිදුවීම වෙනකොට එතුමා කොතැනද හිටියේ කියලා. දිගන ගහන කොට, පාස්කු ඉරුදින ප්‍රහාරය වෙලා දවස් ගණනාවක් ගිහිල්ලාත් එතුමාගේ රජය මොකක්ද කළේ? පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වුණේ, අප්‍රේල් 21වන දා. මැයි 13වන දා හෙට්ටිපොල ගහනවා. එතුමන්ලා ඒවා සාධාරණීකරණය කරනවාද? ලංකාවේ කුමන ආණ්ඩුවක් තිබුණත් සමහර මන්ත්‍රීවරු හැම දාම ඇමතිවරු. ඒ ඇමතිවරු ඉන්නකොට තමයි ඒ දේවල් වුණේ. අද ඒ මොනවත් ගැන කථා කරන්නේ නැහැ, මේ ආණ්ඩුව තමයි මේ ඔක්කෝම සිදුවීම්වලට වගකියන්න ඕනෑ විධියට කථා කරනවා.

අපි කනගාටු වෙනවා, ක්‍රිස්තියානි ජනතාවට ඒ සිදු වෙච්ච අසාධාරණය ගැන. අනිවාර්යයෙන් ඒ ජනතාවට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. ඒ හා සමානවම සමස්ත රට පුරා ජීවත් වෙන මුස්ලිම් සමාජය අදටත් පීඩා විඳිනවා. දහස් ගණන් අත්අඩංගුවට ගත්තා. එක වාර්තාවක තිබුණා, 747දෙනෙක් arrest කළා කියලා. PTA එකට අමතරව තව නඩු රාශියක් එකතු කරලා තිබුණා, ඒ මුස්ලිම් ජනතාවට එරෙහිව, කිසිම වරදක් කරන්නේ නැතුව. සාක්ෂි තිබෙනවා නම්, අනිවාර්යයෙන් ඒ අයට දඬුවම් ලැබිය යුතුයි. අපි ඉන්න තැන රකින්න නොවෙයි කථා කරන්න ඕනෑ. අපි කථා කරන්න ඕනෑ සාධාරණය වෙනුවෙන්. එදා එතුමන්ලා ඒ ප්‍රහාරය සිදු වෙනකල් බලාගෙන හිටියා. ඒ ප්‍රහාරය සිදු වෙනවා කියලා තොරතුරු ඇති තරම් ලැබුණා. නමුත් එතුමන්ලාගේ ආණ්ඩුව බලාගෙන හිටියා. ජනාධිපතිතුමා එක පැත්තක, අගමැතිතුමා තව පැත්තක. ආරක්ෂක කවුන්සලය කියන්නේ මොන තරම් වැදගත් ස්ථානයක්ද?

අද වෙනකොට විමර්ශනවලට කොච්චර සාධාරණයක් අපි ඉෂ්ට කරලා තිබෙනවාද? මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමා එදා හිටියේ නිල් බලකායත් එක්ක. අද? එතුමාට කොහොමද මේක සම්බන්ධ වෙන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. අයිතිය තිබෙනවා. පිල්ලෙයාන් එළියට එයි කියන භයේද දන්නේ නැහැ කියන පොදු සැකයක් මතු වෙනවා. අපි ඒ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. 1983දී නාවික හමුදා නිලධාරින් 13දෙනෙක් ඝාතනය දෙමළ-සිංහල ජාතිවාදී ප්‍රශ්නයකට හැරෙව්වා. ඒ හා සමානව පාස්කු ඉරු දින ප්‍රහාරයත් මුස්ලිම්-සිංහල ජනතාව අතර ප්‍රශ්නයක් ඇති කරන්න හැරෙව්වා. අපි මෙතැනින් මේ රට බේරා ගන්න ඕනෑ. මේ විවාදය අත්‍යවශ්‍ය විවාදයක්. අපේ ආණ්ඩුව යටතේ මේ කාරණය විවාදයට ලක් වෙන පළමු අවස්ථාව, මේක. මට මතක හැටියට මේ පාර්ලිමේන්තුවේ මීට කලින් 11 වතාවක්

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

මේ කාරණාව ගැන විවාද සිදු වෙලා තිබෙනවා. නමුත් අද අපි අවස්ථාවක් කර ගනිමු; ඇත්ත විමර්ශනය මෙතැනින් පටන් ගනිමු. මේ රට ආරක්ෂා කරන්න, මේ රට බේරා ගන්න සහයෝගය දෙමු. සමහර නායකයෝ කියන අය ඒ ආණ්ඩුවල ඉඳගෙන හැම දාම ජාතිවාදයට උදවු කළා. හැබැයි එතුමන්ලා විපක්ෂයට යනකොට ඒ විරුද්ධවාදීන් හැටියට හිටපු අය අන්න හොඳ වෙනවා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது பள்ளிவாசல்கள் நாய்களால் நிரப்பப்பட்டன. பாதணிகளை அணிந்தவாறு பள்ளிவாசல்களுக்குள் சென்று பாதுகாப்புத் தரப்பினர் சோதனை இட்டனர். ஆயிரக்கணக்கான எம்மக்கள் சிறையில் அடைக்கப்பட்டார்கள். அவ்வாறு சிறையில் அடைக்கப்பட்ட அவர்கள் சொல்லொணாத் துயரங்களை அனுபவித்தார்கள். பாடசாலைகளில், வியாபாரம் செய்யும் இடங்களில், தொழில் புரியும் இடங்களில் அவர்கள் நிறைய கஷ்ட துன்பங்களுக்கு ஆளானார்கள். ஈஸ்டர் தாக்குதலின் பின்னர்தான் அந்த நிலைமை உருவானது.

அத்தகைய நிலை உருவானபோது எமது தேசியத் தலைமைகள் அன்றைய அரசாங்கத்தோடுதான் இருந்தன. அன்று கௌரவ ரஊப் ஹகீம் மற்றும் கௌரவ றிஸாட் பதியுதீன் ஆகியோர் தமது அமைச்சுப் பதவிகளில் இருந்து தற்காலிகமாக நீங்கி, மீண்டும் மிக வேகமாகப் பதவியைத் தேடிச் சென்றார்கள். இவர்கள் ஒருபோதும் இந்த நாட்டைப் பாதுகாக்கவும் இல்லை; இந்த நாட்டு முஸ்லிம்களைப் பாதுகாக்கும் தலைமைகளும் அல்லர். நாங்கள் அனைவரும் தேசிய மக்கள் சக்தியோடு இணைந்து இந்த நாட்டில் பாதுகாப்பான சூழலை உருவாக்கியுள்ளோம். மேலும், அதை உறுதிப்படுத்த நாங்கள் பாடுபடுவோம். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.41]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கடந்த காலத்தில் இந்த நாட்டில் இடம்பெற்ற உயிர்த்த ஞாயிறு குண்டுத் தாக்குதல் சம்பந்தமான விவாதம் இன்று இடம்பெறுகின்றது. முதலில் நான் ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். அதாவது, கர்தினால் மெல்கம் ரஞ்சித் ஆண்டகை அவர்களுக்கு எனது சார்பாக நன்றியைச் சொல்லியாக வேண்டும். விசேடமாக, இந்தக் குண்டுத் தாக்குதல் நடைபெற்று நாடு அமைதி இழந்திருந்தபோது, நாட்டில் ஒரு வன்முறை வெடித்துவிடுமோ என்கின்ற ஒரு நிலைமை ஏற்பட்டபொழுது, அந்தக் கொலைகளுக்கு எதிராகப் பழிவாங்கும் படலம் தொடர்ந்து மீண்டும் ஓர் இரத்தக்களரி உருவாக்கிவிடுமோ என்கின்ற ஒரு நிலைமை இருந்தபோது, அத்தகைய நிலைமைகளில் இருந்து நாட்டை மீட்டெடுத்த, நாட்டு மக்களைச் சாந்தப்படுத்திய, நாட்டில் அமைதியை நிலைநாட்டிய ஒரு பிரதான மதத் தலைவர்தான் கர்தினால் அவர்கள்.

இது யூலை மாதம். உண்மையில் யூலை மாதமானது, இலங்கைச் சரித்திரத்தில் இடம்பிடித்த மாதமென்றால் அது மிகையாகாது. 1953ஆம் ஆண்டு யூலை மாதத்தை எடுத்துக்கொண்டாலும் சரி, 1963ஆம் ஆண்டு யூலை மாதத்தை எடுத்துக்கொண்டாலும் சரி, 1970ஆம் ஆண்டு யூலை மாதத்தை எடுத்துக்கொண்டாலும் சரி, 1981ஆம் ஆண்டு யூலை மாதத்தை எடுத்துக்கொண்டாலும் சரி, 1983ஆம் ஆண்டு யூலை மாதத்தை எடுத்துக்கொண்டாலும் சரி, 1987ஆம் ஆண்டு யூலை மாதத்தை எடுத்துக்கொண்டாலும் சரி, இந்த ஒவ்வொரு யூலை மாதத்திலும் எமது நாட்டில் விசேடமாக, தமிழ் மக்களுக்கு எதிராக இனவாதத்தைத் தூண்டிவிட்டு, அதன்மூலம் தங்களின் இருப்பைத் தக்கவைத்துக்கொண்டார்கள் அல்லது இனவாதத்தின் ஊடாக தங்களின் இருப்பைத் தக்கவைத்துக்கொள்வதற்கான சதித் திட்டங்களைத் தீட்டினார்கள். 1981ஆம் ஆண்டு யூன் மாதம் யாழ். நூலகம் எரித்து சாம்பலாக்கப்பட்டது. அதன் பிறகு, எமது நாட்டுக்கு கரும்புள்ளியை ஏற்படுத்திய சம்பவமென்றால், அது 1983ஆம் ஆண்டு இடம்பெற்ற யூலை இனக்கலவரமாகும். இன்னும் நாங்கள் அதிலிருந்து மீளாத மக்களாகவே இருக்கிறோம். அந்தப் பழி எங்கள் நாட்டின்மீது சுமத்தப்பட்டுக்கொண்டே இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2019ஆம் ஆண்டு நடைபெற்ற உயிர்த்த ஞாயிறு தாக்குதல் சம்பவத்தை எங்களுடைய இதயத்தில் துளையிடப்பட்ட ஒன்றாகவே பார்க்கக்கூடியதாக இருக்கின்றது. நான் இங்கே ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். மட்டக்களப்பு சீயோன் தேவாலயத்தில் இடம்பெற்ற தாக்குதலின்போது என்னுடைய மகளின் பிள்ளையும் இறந்தார். அதேபோன்று, கொச்சிக்கடை புனித அந்தோனியார் தேவாலயத்தில் நடைபெற்ற தாக்குதலில் எனது உறவினரின் குடும்பத்தில் ஒருவரைத் தவிர ஏனையவர்கள் இறந்து போனார்கள். அவர் தற்போது லண்டனில் வாழ்ந்துவருகின்றார். அந்த வகையில், குறித்த தாக்குதலின்போது நானும் நேரடியாகப் பாதிக்கப்பட்டிருக்கிறேன். அந்தச் சம்பவம் இடம்பெற்ற வேளையில் நான் யாழ்ப்பாணத்தில் இருந்தேன். அப்போது யாழ்ப்பாண முஸ்லிம்கள் எவ்வாறான நிலைமையை எதிர்கொண்டார்கள் என்பது எனக்கு நன்றாகத் தெரியும். அவர்கள் அபாயகரமான, கவலைக்கிடமான ஒரு நிலையை எதிர்கொண்டார்கள். அந்த வேளையில், அங்கிருந்த முஸ்லிம் மக்களை என்னால் இயன்றவரை பாதுகாப்பதற்கு நடவடிக்கை எடுத்தேன். அதையிட்டு எனக்கு சந்தோஷமாக இருக்கின்றது என்பதையும் கூறிக்கொள்கின்றேன்.

எமது நாட்டில் இனவாதத்தால் 76 வருடங்களாக இரத்தம் பெருக்கெடுத்தோடியது உங்கள் எல்லோருக்கும் தெரியும். இனவாத வெறியாட்டத்தினூடாக இந்த நாட்டில் மனிதப் புதைகுழிகள் நிறைந்து காணப்படுகின்றன. இன்றைக்கு 200 வருடங்களுக்கு முன்னர் இந்தியாவிலிருந்து எமது பரம்பரையினர் இலங்கைக்கு படகுகளில் வந்தார்கள். அவர்கள் தலைமன்னாரில் இறக்கிவிடப்பட்டார்கள். அதன்பின்னர் மத்திய மலைநாட்டுக்கு கால்நடையாக வருகின்ற வழியில் நூற்றுக்கணக்கானோர் பசியாலும், நோயாலும் செத்து மடிந்தார்கள். இந்த நாட்டுக்கு அந்நியச் செலாவணியைப் பெற்றுக்கொடுக்கின்ற எங்கள் மலையகத் தொழிலாளர்களுடைய உடல்கள் சிதைக்கப்பட்டிருக்கின்றன. 1971ஆம் ஆண்டு போராட்டத்தை எடுத்துக்கொண்டாலும் சரி, 1989ஆம் ஆண்டு போராட்டத்தை எடுத்துக்கொண்டாலும் சரி, 1817-1818ஆம் ஆண்டுகால ஊவா - வெல்லஸ்ஸ போராட்டத்தை எடுத்துக்கொண்டாலும் சரி, 30 வருடகாலமாக நடைபெற்ற போராட்டத்தை எடுத்துக்கொண்டாலும் சரி,

அவற்றின் காரணமாக எலும்புக்கூடுகள் நிறைந்ததாகத்தான் நாடு இருக்கின்றது. அதனால் நாங்கள் சொல்கின்றோம், எலும்புக்கூடுகள் நிறைந்து காணப்படுகின்ற நாட்டினை நல்லதொரு நாடாக மாற்ற வேண்டுமென்று. எனவே, மீண்டும் அவ்வாறான சூழ்நிலை நாட்டில் உருவாகக் கூடாது. எங்களுக்கு இல்லாவிட்டாலும் பரவாயில்லை, எங்களுடைய பிள்ளைகளுக்கு அரசாங்கம் நல்லதொரு நாட்டை உருவாக்கிக் கொடுக்கும் என்று கூறி விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.47]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலேயே 'ஈஸ்டர்' தாக்குதல்மூலம் பாதிக்கப்பட்ட சமூகம் என்றால், அது முஸ்லிம் சமூகம்தான். இன்று வரை அதன் பாதிப்பு இருந்துகொண்டுதான் இருக்கின்றது. இந்த மிருகத்தனமான தாக்குதலை மேற்கொள்வதற்கு உடந்தையாக இருந்த கூலிப்படையினரான சஹ்ரான் அணியினர் உண்மையிலேயே தண்டிக்கப்பட வேண்டியவர்கள். இவ்வாறானவர்கள் இந்த உலகத்தில் வாழ்வதற்குத் தகுதியில்லாதவர்கள். அந்த அப்படையில், இந்தத் தாக்குதலிலும் சரி, அதற்குப் பிறகும் சரி, இதற்கு உதவியாக இருந்த பலர் மரணமடைந்து விட்டார்கள். மனிதநேயத்துக்கு விரோதமான இவ்வாறான செயற்பாடுகளை எந்த வகையிலும் அங்கீகரிக்க முடியாது. துரதிருஷ்டம் என்னவென்றால், இதன் பிரதான சூத்திரதாரி யார் என்பதை இன்னும் வெளிப்படுத்தவில்லை என்பதுதான்.

இதன் பிரதான சூத்திரதாரி யார் என்பதை அறிவதற்கு நாங்களும் ஆவலுடன் இருக்கின்றோம். இன்னும் அது வெளிப்படுத்தப்படாமல் இருக்கின்றது. எனவே, இது தொடர்பான விசாரணைகளைத் துரிதமாக நடத்தி, உண்மையான குற்றவாளிகள் யார் என்பதை விரைவாக வெளிப்படுத்த வேண்டும். ஏனென்றால், இந்தத் சம்பவம் நடைபெற்று பல வருடங்களாகின்றன. 2019இல் இந்தச் சம்பவம் நடைபெற்றது. தற்பொழுது, நாங்கள் இருப்பது 2025ஆம் ஆண்டில் ஆகும். இன்று என்ன நடக்கிறது? ஒருவர்மீது இன்னொருவர் குற்றஞ்சாட்டுவதை விடுத்து, இதன் சூத்திரதாரி யார் என்பதை நாட்டுக்கு வெளிப்படுத்த வேண்டும்.

இந்த நாட்டில் அன்னியோன்னியமாக வாழ்ந்த சமூகங்களுக்கு இடையில் இத்தாக்குதல் முரண்பாடுகளைத் தோற்றுவித்தது. தமிழ் மக்களாக இருக்கலாம், சிங்கள மக்களாக இருக்கலாம், முஸ்லிம் மக்களாக இருக்கலாம், எமது பகுதியில் அனைத்து இன மக்களும் ஒற்றுமையாக இருந்தார்கள். வட மாகாணத்தில் இதன் தாக்கம் பெரிதாக இல்லாவிட்டாலும், தென்பகுதியில் அதிகமாக இருந்தது. அங்கு வாழ்கின்ற முஸ்லிம்கள் தங்களது உயிரைக் கையில் பிடித்துக்கொண்டு பயத்துடன் வாழ்ந்தனர். இந்தத் தாக்குதலை முஸ்லிம் பெயரில் இருந்த ஒருசிலர் செய்ததால் முழு சமூகமும் பயத்தில் வாழவேண்டிய நிலைமை ஏற்பட்டது. அவ்வாறானதொரு நிலைமையை சில அரசியல்வாதிகள் உருவாக்கினார்கள். அவர்களுக்கு விடிவு உண்டா? எவ்வளவு ஒற்றுமையாக, அன்னியோன்னியமாக இருந்த சமூகம் இந்தத் தாக்குதலால் எவ்வாறு பாதிக்கப்பட்டது என்பதைப் பாருங்கள்! அன்றிலிருந்து இன்றுவரைக்கும் இதன் பாதிப்பு இருந்துகொண்டுதான் இருக்கின்றது.

சவூதி அரேபியாவில் இருந்து கொண்டுவரப்பட்ட 20,000 அல்-குர்ஆன் பிரதிகளை Sri Lanka Customsஇல் இருந்து வெளியே கொண்டுவருவதில் பாரிய பிரச்சினை காணப்படுகின்றது. அந்த அல்-குர்ஆன் பிரதிகளின் மொழிபெயர்ப்பில் ஏதோ பிரச்சினை இருப்பதாகச் சொல்கின்றார்கள். மொழிபெயர்ப்பில் என்ன பிரச்சினை? இணையத்தளத்தில் பல மொழிகளிலும் அல்-குர்ஆன் பிரதிகள் இருப்பது உங்களுக்குத் தெரியும்! அதுமாத்திரமல்ல, smartphoneஇல் இருக்கின்ற Play Storeஇலும் அல்-குர்ஆன் மொழிபெயர்ப்பு இருக்கின்றது. அதை நீங்கள் பாருங்கள்! அல்-குர்ஆன் என்பது முஸ்லிம்களின் வழிகாட்டியாக இருக்கின்றது. அல்-குர்ஆன் பிரதிகளை இலங்கைக்குக் கொண்டுவருவது என்றால், அதில் மாற்றங்களைச் செய்ய வேண்டும் என்று யாருக்குச் சொல்ல முடியும்? யார் இதனைத் தடுக்கின்றார்கள்? இவையெல்லாம் இந்தத் தாக்குதலுக்குப் பிறகு ஏற்பட்ட பிரச்சினைகள்! அதுமாத்திரமன்றி, அன்று சில புத்தகங்களில் அரபு மொழியில் ஏதாவது எழுத்து இருந்தால், அதனை வைத்திருந்தவர்கள் கைது செய்யப்பட்டார்கள். மேலும், முஸ்லிம் ஒருவர் கத்தியொன்றை வைத்திருந்தால்கூட அவரும் கைதுசெய்யப்பட்டார். இந்நிலைமைக்குக் காரணமாக இருந்தது இந்த மிருகத்தனமாக தாக்குதல்தான்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
எனக்கு ஆறு நிமிடங்கள் ஒதுக்கப்பட்டு இருந்தது. அது தற்பொழுது நான்கு நிமிடங்களாகக் குறைக்கப்பட்டு இருக்கின்றது. தயவுசெய்து, எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

இந்தத் தாக்குதல் நடைபெற்ற காலகட்டத்தில் பேராயர் அவர்கள் மிகவும் பக்குவமாக பாதிக்கப்பட்ட சமூகத்தினரை அமைதிப்படுத்தி, நாட்டில் ஏற்படவிருந்த பெரியதொரு கலவரத்தைத் தடுத்தார்கள். இலங்கையில் இந்தத் தாக்குதல் மாத்திரமல்ல, மனித நேயத்துக்கு முரணான பல செயற்பாடுகள் இடம்பெற்றுள்ளன. உதாரணத்துக்கு செம்மணி புதைகுழி விவகாரத்தைச் சொல்லலாம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

அதேபோல்தான் குருக்கள்மடம் புதைகுழி விவகாரமும். புனித ஹஜ் யாத்திரைக்குச் சென்று வந்த 150 பேர் கொலை செய்யப்பட்டார்கள். இவற்றால் பாதிக்கப்பட்டவர்களுக்கு உங்களுடைய அரசாங்கத்தில் நீதி கிடைக்கும் என்ற அடிப்படையில்தான் மக்கள் உங்களுக்கு வாக்களித்து இருக்கிறார்கள். பொருளாதாரத் தாக்கத்தை மாத்திரம் கருத்திற்கொண்டு அவர்கள் உங்களுக்கு வாக்களிக்கவில்லை. சுஹைல் என்ற சாதாரண ஓர் இளைஞனை பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்து, கிட்டத்தட்ட 9 மாதங்கள் தடுத்து வைத்திருந்தார்கள். PTA - பயங்கரவாதத் தடைச் சட்டத்தை - இல்லாது ஒழிப்பதாகக் கூறி ஆட்சிக்கு வந்த நீங்கள், இவ்வாறு செய்வது உண்மையிலேயே மனவருத்தத்தை அளிக்கின்றது. கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் விட்ட பிழைகளை விடாமல், நீங்கள் சரியான வழியில் செயற்படுவீர்கள் என்ற நம்பிக்கையில்தான் மக்கள் உங்களுக்கு வாக்களித்தார்கள். அந்த நம்பிக்கையுடன்தான் மக்கள் இருக்கிறார்கள். அந்த நம்பிக்கையை நீங்கள் காப்பாற்ற வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.53]

**ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඛේදවාචකයක් ලෙස සනිටුහන් වුණු පාස්කු ප්‍රහාරයට වසර 6ක් ගත වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේ පාස්කු ප්‍රහාරය පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ විවාදයක් දහතුන්වැනි වතාවට තමයි අද මේ පැවැත්වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔබතුමා දන්නවා අද ජූලි මාසයේ 9වැනි දා කියලා. ඒ කියන්නේ අපේ රටේ ජනතාවාදී අරගළය සිදු වෙලා, තීරණාත්මක මොහොතක ඒ ජයග්‍රහණය සටහන් කරලා අදට වසර තුනක් ගත වෙනවා. විශේෂයෙන්ම අපේ රටේ දේශපාලන ඉතිහාසය, සාම්ප්‍රදායික දේශපාලන කලාව, ජාතිවාදය ඇතුළු සියල්ල උඩුයටිකුරු කරපු දේශපාලන ඉතිහාසයක් තමයි මීට වසර තුනකට පෙර අපේ රටේ ජනතාවාදී අරගළය, ජනතාවගේ නැඟිටීම තුළ සනිටුහන් වුණේ. ඒක ඇතුළේ තමයි වසර ගණනාවක් තිස්සේ තිබුණු ජාතිවාදයට තිත තැබුවේ, සාම්ප්‍රදායික දේශපාලන කලාවට තිත තැබුවේ. අද ඒ අරගළය සිදු වෙලා වසර තුනක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අරගළයේ මූලික අභිලාෂය වෙලා තිබුණේ අපේ රටේ පැවති පවුල් පාලනය අවසන් කරන එක.

අද අපි කවුරුත් විවාදයකින් තොරව පිළිගන්නවා අද එය අවසන් වෙමින් තිබෙන බව. ඒ විතරක් නොවෙයි, එහි මූලික අරමුණක් වෙලා තිබුණා ජාතිවාදය අවසන් කරන්න. අද අපි කවුරුත් විවාදයකින් තොරව පිළිගන්නවා අපේ රටේ ජාතිවාදය මත පදනම් කර ගත්ත කිසිදු ක්‍රියාමාර්ගයකට මේ තිබෙන ජනතාවාදී ආණ්ඩුව ඉඩ දෙන්නේ නැහැ කියන එක.

තුන්වැනි කරුණ තමයි, විශේෂයෙන්ම අපේ රටේ දූෂිතයන්ට දඬුවම් ලබා දීම. ඒ ක්‍රියාවලිය ඇතුළේ තමයි මේ පාස්කු ප්‍රහාරය කියන එකත් නැවත සනිටුහන් වෙමින් තිබෙන්නේ. මීට පෙර විපක්ෂයේ සමහර කණ්ඩායම්, ඒ වාගේම සමහර හොරු කලබල වෙමින් පසුගිය කාලයේ සංවාදයක් ගෙනියමින් තිබුණා, "කෝ, හොරුන්ට දඬුවම් දෙනවා ද, දඬුවම් දෙනවා ද?" කියලා. හැබැයි, අද ඒ සාකච්ඡා එකක්වත් එන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට හරියටම තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් ඒ කෙඳිරිලි එන්නේ නැහැ. ඒ වාගේම තමයි, මේ ජනතාවාදී ආණ්ඩුවේ අපට පාස්කු ප්‍රහාරය පිළිබඳව සොයා බැලීමට ඉතා මැනවින් වුවමනාවක් තිබෙනවා. ඒ වුවමනාව තමයි ජනාධිපතිතුමාත්, අපේ ඇමතිවරුත්, නියෝජ්‍ය ඇමතිවරුත්, සමස්ත ආණ්ඩුවත්, ආරක්ෂක අංශත් පියවරින් පියවර, පියවරින්, පියවර මේ හෙළිදරව් කරගෙන යමින් තිබෙන්නේ. එය මීට වසර 3කට පෙර වෙච්ච ජනතාවාදී අරගළයේ අභිලාෂයක්. අනිවාර්යයෙන්ම අපි ජනතාවාදී රජයක් ලෙස ඒ වගකීම ඉෂ්ට කිරීම වෙනුවෙන් මැදිහත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. වසර 3ක් ගත වෙලා තිබෙන ජනතාවාදී අරගළය නිසා එයින් පීඩාවට පත් වෙච්ච සැලකිය යුතු පිරිසක් ඉන්නවා. ඒ අරගළය ජනතාවාදී අරගළයක්. රට පුරාම එක්දහස් ගණනකට වැඩි නඩු ප්‍රමාණයක් ඒ සම්බන්ධයෙන් තිබෙනවා. 3,000කට වඩා වැඩි ප්‍රමාණයක් එහි වූදිතයක් බවට පත්වෙලා තිබෙනවා. පටු දේශපාලන අරමුණු වෙනුවෙන් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකුත් එකතු වෙලා පසුගිය කාලයේ ඒ වෙනුවෙන් නඩු පිට නඩු දැම්මා. මම ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, වර්තමාන ආණ්ඩුව විශේෂයෙන්ම මෙම නඩු සියල්ල සමාලෝචනය කරමින් ඉන්න බව. ඒ පිළිබඳව නැවත හැරී බැලීමක් කරන්න, නීත්‍යනුකූලව ආපසු හැරී බැලීමක් කරන්න මේ රජයේ සූදානමක් තිබෙනවා. ඒක නිසා අරගළය වෙලා වසර 3ක් ඇතුළත, විශේෂයෙන්ම ඒ ජනතාවාදී අරගළයේ මූලික අභිලාෂ ජනතාවත් සමඟ එකතු වෙමින් එය මේ රට තුළ යථාර්ථයක් බවට පත් කර ගැනීමේ අරමුණේ, ඒ සාමූහික ක්‍රියාවලියේ ඉදිරියට යන බව කියමින්, මේ කාලය ලබාදීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.56]

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ප්‍රහාරය කියන්නේ ඇත්තටම අපේ රටේ කතෝලික ජනතාව වාගේම, මුස්ලිම් ජනතාවත් පීඩාවට පත් වෙච්ච ප්‍රහාරයක්. ඇත්තටම මෙතෙක් පැවති ආණ්ඩු අරගෙන ගියේ ජාතිවාදී වැඩ පිළිවෙළක්. ඒ

ආණ්ඩුවලට හැමදාම අවශ්‍යතාවක් තිබුණා ජාතීන් අතර වෛරය, ජාතීන් අතර අසමගිය ඇති කරලා මේ රට වෙනත් පැත්තකට අරගෙන යන්න. ඒක තමයි ඔවුන් මෙච්චර කාලයක් අරගෙන ගිය දේශපාලන ක්‍රමය. හැබැයි, ඒ ක්‍රමය වෙනස් කරලා අපි ජාතික ජන බලවේගය හැටියට අලුත් ආණ්ඩුවක් පවත්වාගෙන යන්නේ ජාතික සමගියත් එක්ක.

පාස්කු ප්‍රහාරය නිසා 274දෙනෙක් මිය ගියා. ඒ වාගේම, 600කට පමණ තුවාල සිදු වුණා. විශේෂයෙන්ම මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ තිබෙන කටුවාපිටිය දේවස්ථානයට එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් 115දෙනෙක් මිය ගියා. ඒ වාගේම, 300ක පමණ පිරිසක් තුවාල ලබා තිබුණා. මම පෞද්ගලිකව එම ස්ථානයට ගියා. මම එම ස්ථානයට යද්දී ඇත්තටම ඒ පල්ලිය ලේ විලක් වෙලා තිබුණේ. හැබැයි, ඒ ලේ විල ඇතුළේත් ජාතිවාදී ප්‍රශ්න ඇති කරන්න වෙනත් කණ්ඩායම් දැඟලුවා. ඒ කණ්ඩායම් මුස්ලිම් ගෙවල්වලට පහර දෙන්න ලෑස්ති වෙලා හිටියා. හැබැයි, කතෝලික නායකයකු හැටියට අපේ කාදිනල්තුමාත්, ඒ වාගේම ඒ කතෝලික පල්ලිවල හිටපු පූජකතුමන්ලාත් ලොකු පරිශ්‍රමයක් දැරුවා, ඒ ඇති වෙන තත්ත්වය නවත්වන්න. ඇත්තටම කතෝලික ජනතාව දරපු ඒ සාමකාමී ක්‍රියාවලිය හින්දා තමයි අපේ රට මේ තත්ත්වයෙන් නතර වුණේ. එහෙම වුණේ නැත්නම් එම සිද්ධිය නිසා අදටත් අපේ රටේ මුස්ලිම්- සිංහල අය අතර ලොකු ප්‍රශ්නයක් ඇති වෙන්න තිබුණා. එම නිසා ඒ ක්‍රියාවලිය නතර කිරීමේ ගෞරවය මම අපේ කාදිනල්තුමාට දෙනවා.

මේ රටේ ආර්ථික කඩා වැටීම මුලින්ම පටන් ගත්තේ පාස්කු ප්‍රහාරයෙන් පසුවයි. රටේ ආර්ථිකය කඩා වැටීමත් එක්ක පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් වශයෙන් හිටපු අයගේ ආණ්ඩුවත් පාස්කු ප්‍රහාරයත් සමඟ කඩා වැටෙන්න පටන් ගත්තා. පාස්කු ප්‍රහාරය සිදු වීම ගැන කණ්ඩායම් දෙකක් වග කියන්න ඕනෑ. එකක්, එවකට පැවැති රජය. රනිල් වික්‍රමසිංහ, මෛත්‍රීපාල සිරිසේන හා සජිත් ප්‍රේමදාස කියන මහත්වරුන්ගේ ආණ්ඩුවක් තමයි එවකට තිබුණේ. බුද්ධි අංශවලින් වාර්තා කරලා තිබුණා, මෙවැනි ප්‍රහාරයක් සිද්ධ වනවා කියලා. නමුත්, ඒ ප්‍රහාරය ගැන සහ අබමල් රේණුවකවත් ආරක්ෂාවක් සැපයීම ගැන හිතුවේ නැහැ. අපට මතකයි, තාත්තා කිව්වා පුතාට පල්ලි යන්න එපා කියලා. ඒ කිව්වේ මොකද? එයාලාගේ ආරක්ෂාව සඳහා. ඒ අනුව එයාලාගේ ආරක්ෂාව සපයා ගත්තා. නමුත්, ජනතාවගේ ආරක්ෂාව ගැන හිතුවේ නැහැ. ඒ අතර තමයි පාස්කු ඉරු දින ප්‍රහාරය සිද්ධ වුණේ. එම ප්‍රහාරයෙන් පසුව මුස්ලිම් ජනතාව සැහෙන්න අපහසුතාවකට පත් වුණා. මම දන්න මුස්ලිම් අයත් ඉන්නවා. ඒ මුස්ලිම් අයත් හැංගිලා ජීවත් වුණේ. මීගමුව ප්‍රදේශයේ මුස්ලිම් අයට තමන් කරපු ව්‍යාපාර දාලා යන්න සිද්ධ වුණා. එසේ සිද්ධ වෙන්න හේතුව තමයි පාස්කු ප්‍රහාරය.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව හැටියට අපි කියන්නේ මෙයයි. පාස්කු ප්‍රහාරයට, සිදු වූ අපරාධවලට නිසි දඬුවම් දෙන්න ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ක්‍රියා කරනවා. ඇත්තටම එය ලෝකයම කම්පාවට පත් වුණු ප්‍රහාරයක්. එම ප්‍රහාරයෙන් විදේශිකයෝ ගොඩක් නැති වුණා. ඊළඟට, අපේ සංචාරක ව්‍යාපාරය කඩාගෙන වැටුණා. රටේ අනෙකුත් ව්‍යාපාර කඩා වැටුණා. ඒ සියලු සිදුවීම් පිළිබඳ පරීක්ෂණයක් කරලා, වරදකරුවන් සියලුදෙනාට දඬුවම් දෙන්න ආණ්ඩුව හැටියට අපි කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.01]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

පාස්කු ඉරිදා දිනක ඒ මහා ම්ලේච්ඡ ප්‍රහාරය සිදු වී දැන් අවුරුදු 6ක් ගත වෙලා තිබෙනවා. ජනතා සංහාරයක් සිද්ධ කරපු ඒ කාරණාව සම්බන්ධව නැවත කවදාකවත් කථා කරන්න අවස්ථාවක් නොලැබේවා කියා මා පළමුව ප්‍රාර්ථනා කරනවා. මොකද, පාස්කු ප්‍රහාරය පිළිබඳව පාර්ලිමේන්තුවේ දහතුන් වතාවක් විවාද කරලා තිබෙනවා කියලා ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා. විශේෂයෙන්ම තෝලික මන්ත්‍රීවරයකු හැටියට මම ඒ හැම විවාදයකදීම කථා කළා. එම ප්‍රහාරයෙන් පසුව මමත්, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාත් ඒ දවස්වල ගොඩක් තැන්වලදී බරපතළ විධියට අසරණ වුණා. අපට සමහර තැන්වලට මුහුණ දෙන්න බැරිව ගිය අවස්ථා තිබෙනවා. සමහර තැන්වලදී අපිත් වින්දිතයන් බවට පත් වුණා. එම නිසා ඒ ප්‍රහාරය ගැන නැවත වතාවක් කථා කරන්න ලැබෙන්න එපා කියන ඒ පරමාර්ථයත් හිතේ තියාගෙන තමයි අද මේ කථා කරන්නේ.

මම ඉස්සරහින් ඉන්නේ ආණ්ඩුව. ආණ්ඩු පක්ෂයෙන් අද දවසේ කළේත් මැතිවරණයට පෙර මෙගොල්ලෝ කරපු කථා ටිකම තමයි. අලුත් කථාවක් නැහැ. ආණ්ඩුවට මාස නවයක්. ජනාධිපතිතුමා පත් වුණේ ඊටත් පෙර. හැබැයි, මේ අය ආණ්ඩුව ගන්න පෙර දිගින් දිගටම මේවා කථා කළා. පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ට සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ කිව්වා. මහ මොළකරු අල්ලනවාය කිව්වා. සමහර අය මහ මොළකරු නම් කළා. දැනුත් මහ මොළකරු ගැන කථා කළා මම දැක්කා. මහ මොළකරු සිටින කණ්ඩායම් කියලා කථා කළා. හැබැයි, මහ මොළකරු අල්ලන්නේ නැහැ. නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ඒක හොඳ-හොඳා මඩේ දමනවා. එහෙම නැත්නම් කථාවට විතරක් සූදානම් වෙලා තිබෙනවා. අපි දැක්කා මෙතැන ප්‍රධානම ප්‍රශ්නය. එම ප්‍රහාරය සම්බන්ධව විමර්ශනය කරන්න කොමිෂන් සභා පත් කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂ කාරක සභා පත් කරලා තිබෙනවා. විශේෂ කමිටු පත් කරලා තිබෙනවා. ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තා ටික සාක්ෂිත් එක්ක පාර්ලිමේන්තුවේ තිබෙනවා, cupboards දෙකක් පුරවලා. කවුද ඒ වාර්තා කියවලා තිබෙන්නේ? කවුරු හෝ කියවලා තිබෙනවාද, ඒවා? නිවැරැදිව සාක්ෂිත් එක්ක කියවලා නීති අංශයට භාර දීලා තිබෙනවාද, නඩු දමන්න? ඒ සාක්ෂි හරිද, පරස්පරද, කොහොමද වෙලා තිබෙන්නේ කියලා හරියට කියවලා තිබෙනවාද? මම යෝජනාවක් කරනවා. තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම පොලීසියේ වෙනම කණ්ඩායමක් පත් කරන්න. අනෙක් ඒවා හොයනවා වාගේම, එක එක මඩ ගහනවා වාගේම ඒ ගැන හොයන්න, ඒ සියලු දේ හරියට කියවන්න කණ්ඩායමක් පත් කරන්න.

කාටවත් ඒක කියවන්න බැහැ. පාර්ලිමේන්තුව ඇතුළේ ඒක තිබෙනවා, එළියට යන්නේත් නැහැ. ඇතුළේ කාටවත් ඒක කියවා ගන්නත් බැහැ. මම හිතන විධියට ඒක කියවන්නත් අවුරුදු ගණනක් යයි. එතකොට ඒ කොමිසම හදපු මේ වාර්තාව මොකටද? පුස්තකාලයක් වාගේ තැනක තියාගෙන ඉන්නද? ලස්සනට තියාගෙන ඉන්නද? ඒ නිසා මේ ගැන තමුන්නාන්සේලා පරීක්ෂණයක් කරන්න.

ඊළඟට, ජනාධිපතිතුමාම කියනවා රජයේ ඇතුළාන්ත පරීක්ෂණයක් කරන්න තිබෙනවාය කියලා. මොකක්ද ඒ කියන

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

කථාවේ තේරුම? ඒ කියන්නේ එතුමා කියනවා, රජය ඇතුළේ මේකට සම්බන්ධ කවුරු හරි ඉන්නවාය කියලා. දැන් ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන කිව්වා, බුද්ධි අංශයේ කණ්ඩායමක් මේකට සම්බන්ධතාවක් තිබෙනවා කියලා දන්නවාය කියලා. ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා, ඒක දැන් කියන්න කියලා. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී ඒක කියන්න. ඔබතුමාට කියන්න පුළුවන් වෙන්න ඕනෑ. කවුද, ඒ බුද්ධි අංශයේ ඉන්න කණ්ඩායම? ඔබතුමා නොකිව්වොත්, ඒක සමස්ත බුද්ධි අංශයටම කරන නිග්‍රහයක්. ඒක ප්‍රශ්නයක්. මොකද, දක්ෂ, රටට ආදරය කරන, රට වෙනුවෙන් කැප වෙච්ච මිනිස්සු ටිකක් බුද්ධි අංශයේ ඉන්නවා. ඒක නොකියනවා කියන්නේ, ඒ අයට කරන අපහාසයක්. තමුන්නාන්සේලා මේවා දන්නවා. දැනගෙනයි මේවා එළියට දමන්නේ නැත්තේ. ඒ නිසා කවුරු මොනවා කිව්වත් මතක තියා ගන්න, රජයට රජයේ ඇතුළාන්තයේ පරීක්ෂණයක් කරන්න තිබෙනවා කියන්නේ, එහෙම නම් ඒ ඇතුළේ පරීක්ෂණය කරලා මහ මොළකරු හොයා ගන්න පුළුවන් කියන එක.

ඊළඟට, තමුන්නාන්සේලා අනෙක් ආණ්ඩුවලට ඇඟිල්ල දිගු කළා. ඊබ්‍රහිම් කියන්නේ කවුද? තමුන්නාන්සේලාගේ ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට දමන්න ගිය මන්ත්‍රීවරයා. එයාගේ පුත්තු දෙදෙනා තමයි බෝම්බ පුපුරවාගෙන මැරුණේ. සල්ලි දැම්මේ ඒගොල්ලන්ගේ කණ්ඩායම. එහෙම නම් ඊබ්‍රහිම්ගෙන් පටන් ගන්නකෝ ඉස්සර වෙලා. ඔන්න, මහ මොළකරු හොයන්න පටන් ගන්න ඊබ්‍රහිම්ගෙන්. පළමුවෙන්ම එතැනින් පටන් ගන්න. ඊළඟට, ඔබතුමන්ලා දන්නවා යයි කියපු, රජය ඇතුළේ ඉන්න; එහෙම නැත්නම් බුද්ධි අංශයේ සිටින එම කණ්ඩායමෙන් පටන් ගන්න. එහෙම නැත්නම් ඊළඟට තමුන්නාන්සේලා පටන් ගන්න, රජය ඇතුළාන්තයේ සිටින කණ්ඩායමෙන්. ඒ සියලු දේ එකතු කර ගන්න. මේක කරන්න මාස නවයක් තිස්සේම ඔබතුමන්ලා කෙඳිරි ගෑවේ ඇයි? මේක තියාගෙන ඇද්දේ ඇයි? මේකද, දුන්න පොරොන්දුව? ගිය පාර මැතිවරණයට පෙර මොකක්ද, ඔබතුමන්ලා කළේ? ඔබතුමන්ලා වෙනම සංගමයක් හදාගෙන, සමහර පියතුමන්ලා එක්ක සම්බන්ධ වෙලා සංගමයක් හදාගෙන වෙනම පත්‍රිකාවක් ගහගෙන ගිහිල්ලා, කතෝලික පල්ලිවල තිබුණු මංගල්‍යවලට ගිහිල්ලා ඒවා බෙදුවා. කතෝලික පල්ලිවල ඉරිදා දිනයේ තිබෙන පූජාව වෙලාවට ගිහිල්ලා ඒවා බෙදුවා. බෙදලා මොනවාද කිව්වේ? සම්පූර්ණ කතෝලික ජනතාවට කිව්වා, මේක හොයන්න ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න අපි විතරයි ඉන්නේ කියලා. හැබැයි, තමුන්නාන්සේලා ජනතාවට සාධාරණය ඉෂ්ට කළාද? ජනතාවට සාධාරණය ඉෂ්ට කළේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මම මීට වඩා මේ ගැන කථා කරන්න යන්නේ නැහැ. මොකද, මේ ගැන කථා කරලා වැඩක් නැහැ. මේකට ඕනෑ විසඳුම. කරුණාකරලා මේකට විසඳුම දෙන්න. මොකද, මේ වෙලාවේ තමුන්නාන්සේලා වෙන ගේම් ගොඩක් ගහනවා. දැන් මේක ඇති. මම හිතනවා, දැන් මේ ගැන කථා කළා ඇති කියලා. තමුන්නාන්සේලාගෙන් විසඳුමක් බලාපොරොත්තු වෙනවා. ඒ වින්දිතයන්ට සාධාරණයක් ඉෂ්ට විය යුතුයි කියන පණිවුඩය අපි ලබා දෙනවා.

ඊළඟට, විශේෂයෙන්ම තමුන්නාන්සේලා විපක්ෂයේ ඉඳගෙන කැසිනෝ ගැන මොනවාද කථා කළේ,? කැසිනෝ මේ රටේ තිබෙන්න බැහැ කියලා තමුන්නාන්සේලා කථා කළා; විපක්ෂයේ සිටියදී කැසිනෝවලට විරුද්ධව කථා කළා. හැබැයි අද මොකද වෙලා තිබෙන්නේ? කැසිනෝ එකක් විවෘත කරන්න international කණ්ඩායමක් ගෙන්වනවා; කැසිනෝ එකක් විවෘත කරන්න තමුන්නාන්සේලා ෂාරුක් ඛාන්ව ලංකාවට ගෙන්වනවා. ෂාරුක් ඛාන්ව ගෙන්වලා තමයි ඒක විවෘත කරන්න යන්නේ. එතකොට ෂාරුක් ඛාන්ට ගෙවන මුදල? ඒකට ඩොලර් යන්නේ කොහෙන්ද දන්නේ නැහැ; සංචිතවලින්ද, මොකෙන්ද ගෙවන්නේ කියලා දන්නේ නැහැ. අන්න ඒක රටට කියන්න. තමුන්නාන්සේලා දැන් කැසිනෝවලට කැමතිද? ෂාරුක් ඛාන් වාගේ නළුවෙක් ලංකාවට එන එකට අපි එකඟයි. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඔහු එන්නේ කැසිනෝ එකක් විවෘත කරන්න නම්? තමුන්නාන්සේලා එදා කිව්වේ, කැසිනෝ ගැන වෙන කථාවක්. මතක තියා ගන්න, කැසිනෝවලින් ගන්න සල්ලි ටිකත් යන්නේ පිට රටට. මේ රටේ සදාචාරය ගැන කථා කරපු තමුන්නාන්සේලා තමයි ඕනෑ විධියකින් සල්ලි හම්බ කරන්න ඕනෑ නිසා කැසිනෝ ව්‍යාපාරය මේ රටේ වැඩිම වශයෙන් ව්‍යාප්ත කරන්න යන්නේ. අර කැසිනෝ යන්ත්‍රත් මෙහාට ගෙනැල්ලා ව්‍යාප්ත කරන්න යන්නේ තමුන්නාන්සේලා. එහෙම නම් මතක තියා ගන්න, තමුන්නාන්සේලා කියපු දේවල් කරන අය නොවෙයි. වෙනම දෙයක් කරන්නේ. ඒ වාගේම තමයි පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධ කාරණයත්. තමුන්නාන්සේලා කියපු දේ නොවෙයි කරන්නේ. ඒ නිසා කරුණාකරලා එදා කියපු දේවල් ටික කරන්න. තමුන්නාන්සේලා දීපු පොරොන්දු ටික ඉෂ්ට කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අද වෙනකොට සමස්ත ජනතාවම තමුන්නාන්සේලා කෙරෙහි බරපතළ විධියට කලකිරිලා ඉන්නවා. ආයතන ටිකත් කලකිරිලා තිබෙන්නේ. කොට්ඨාසයෙන් කොට්ඨාසයට අරගෙන බැලුවාම, ජනතාව කලකිරිලා ඉන්නේ.

ඇයි, තමුන්නාන්සේලා කියපු දේවල් නොකරපු කණ්ඩායමක් නිසා. මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධව තමුන්නාන්සේලා එදා ගත්ත තීන්දු, එදා කරපු කථාවලදී කියපු දේවල් කරුණාකරලා අද ඉෂ්ට කරන්න කියලා විශේෂයෙන් අවසාන වශයෙන් මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.09]

**ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Dr.) Chrishantha Abeysena - Minister of Science and Technology)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, මේ කාරණය සම්බන්ධව විවාදයක් පැවැත්වීමට ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ගැන.

මොකද, මේක කාලීන අවශ්‍යතාවක් කියා මාත් හිතනවා. හැබැයි, එම යෝජනාව ඇතුළාන්තයේ තිබෙන හැමදේම මම පිළිගන්නේ නැහැ. නමුත්, එතුමාගේ ඒ උත්සාහයට මා ගරු කරනවා. ඒ වාගේම මම කියන්න ඕනෑ, අපි මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධව කථා කරන්නේ දේශපාලනඥයෝ හැටියට නොවෙයි කියන එක. දැන් කථා කරන්නේ දේශපාලනඥයන් හැටියට වුණත්, එදා ඉඳන් මේ සම්බන්ධව කථා කළේ දේශපාලනඥයන් හැටියට නොවෙයි. පාස්කු ප්‍රහාරයෙන් පසුව අපි මීගමුවේ කටුවාපිටියට ගිහිල්ලා ඒ වින්දිතයන් එක්ක වැඩ කළා. ඒ අයගේ අවශ්‍යතා ගැන බැලුවා. ඒ වාගේම අපි හැම අවුරුද්දේම අප්‍රේල් 21වෙනි දා මේ ප්‍රහාරය සම්බන්ධව විරෝධතා දැක්වුවා. මොකද, මෙච්චර කාලයක් ඒකට සාධාරණත්වයක් ඉටු වුණේ නැති නිසා. ඒ නිසා අපට මේක අලුත් දෙයක් නොවෙයි. අපි කරන්නේ මේ පාස්කු ප්‍රහාරය දේශපාලනීකරණයට ලක් කිරීමක් නොවෙයි. ඒ වාගේම මේ යෝජනාවේ තිබෙන්නේ අවුරුදු 6ක් තිස්සේ මේ සම්බන්ධව මොකුත් කළේ නැහැ කියලායි. හැබැයි, ඒ අවුරුදු 6 තුළ බලයේ හිටියේ අපි නොවෙයි. අපි බලයට පත්වෙලා තවම මාස හතයි. එතකොට කවුද, මේ අවුරුදු 6 හිටියේ? අපි හොඳින්ම දන්නවා, පාස්කු ප්‍රහාරය වුණේ යහ පාලන ආණ්ඩුව කාලයේදී බව. යහ පාලන ආණ්ඩුව කාලයේ හිටපු අය, ඒ මුළු රජයම ඒකට වග කියන්න ඕනෑ.

ඒ පිළිබඳව අපේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ තිබෙනවා. මම බොහොම කෙටියෙන් කථා කරන්නම්, වෙලාව නැති නිසා. එම වාර්තාවේ සඳහන් වනවා, "තර්ජනයේ විශාලත්වය නිසි ලෙස වටහා ගැනීමට රජය අපොහොසත් විය" යනුවෙන්. ඒක අකාර්යක්ෂම රජයක් බව කියා තිබෙනවා, මේ පාස්කු ප්‍රහාරය සම්බන්ධ කොමිෂන් සභා වාර්තාවේ. මේ ඛේදවාචකයට ජනාධිපති, ඒ කියන්නේ සිරිසේන මහත්මයා, ඒ වාගේම අග්‍රාමාත්‍යවරයා ඇතුළු එවක පැවති රජය වගකිව යුතුයි. ඉතින් ඒ රජයේ හිටපු ඇමතිවරුන් තමයි මෙතැන ඉස්සරහ ඉන්නේ. ඒකේ හිටපු මන්ත්‍රීවරුන් තමයි අද පාස්කු ප්‍රහාරය ගැන කථා කරන්නේ. ඒ නිසා ඒ විධියට දේශපාලනීකරණයට ලක් කරලා මේ පාස්කු ප්‍රහාරය ගැන කථා කිරීම පිළිබඳව අපට තිබෙන්නේ ලජ්ජාවක්, හිරිකිතයක්.

අපි දන්නවා, පාස්කු ප්‍රහාරය කියන්නේ පැටලිච්ච නූල් බෝලයක්, ඒ නිසා මේකේ සුල මුල හොයන එක අමාරු බව. අපි දන්නවා, සාරා ජස්මින් ගැන. ඒ වාගේම DNA පරීක්ෂණ ගැනත් අද කථා කරනවා. නමුත්, ඒවා සොයන එක ලෙහෙසි නැහැ. ඒ වාගේම "සොනික් සොනික්" කියලා කථා කළා. මේ "සොනික්" කියන්නේ සලේද? ඒ ගැන හොයන්න ඕනෑ. ජමීල් ගැන හොයන්න ඕනෑ. ඊබ්‍රහිම් ගැන හොයන්න ඕනෑ. මේවා ලෙහෙසි වැඩ නොවෙයි. ඉතින් මේවා තමයි අපි දැන් කරමින් ඉන්නේ. එතකොට මහ මොළකරුවෝ කවුද? සලේ ද, රාජපක්ෂද, එහෙම නැත්නම් නිලන්ත ජයවර්ධනද, නැත්නම් මේ ඔක්කෝම ද? මොකද, අපි මහ මොළකරුවෙක් කියන්නේ නැහැ, මහ මොළකරුවෝ. එතකොට මේකට ඒ දේශපාලනය සහ නිලධාරින් සම්බන්ධද? ඒ වාගේම මේකට සම්බන්ධ තව පිරිසක් ඉන්නවා. ඒ නිසා මෙතැන පැහැදිලිකමක් නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය ගැන ඉක්මනට හොයා ගන්න අමාරුයි.

ඒ වාගේම අද ජනාධිපතිතුමා ගැනත් සඳහන් කරමින් කථා කළා. රජය විසින් රජය තමයි මේ පරීක්ෂණයට ලක් කරන්නේ කියලා කිව්වා. ඉතින් ඒක ඇත්ත නේ. මෙතැනදී මන්ත්‍රීවරුනුත් ඒක කිව්වා නේ. මේකට පොලීසියේ සමහර නිලධාරින්ගේ සම්බන්ධයක් තිබෙනවා, හමුදාවේ බුද්ධි අංශවල සමහර නිලධාරින්ගේ සම්බන්ධයක් තිබෙනවා. මෙතැනදීත් ඒවා ගැන කියවුණා. ඒ සම්බන්ධය නිකම් සම්බන්ධයක් නොවෙයි, ඒක දේශපාලනික සම්බන්ධයක්. මේ, දේශපාලනිකව සම්බන්ධ වෙච්ච අය. ඒ අයට සම්බන්ධ තවත් අය ඇතුළේ ඉන්නවා. ඒ ගැන අපි දන්නවා වෙන්න පුළුවන්, නොදන්නවා වෙන්න පුළුවන්. අපි කොහොමද දන්නේ ඇතුළේ සම්බන්ධතා ගැන? අපේ ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව සඳහන් කළා. ඒක ලෙහෙසි නැහැ. සලේව ගෙනැල්ලා ප්‍රශ්න කරන්නේ කවුද? එම නිලධාරියා යටතේ හිටපු අයට තමයි සලේගෙන් ප්‍රශ්න අහන්න වෙන්නේ.

ඒක ලෙහෙසිද? උත්තර ගන්න පුළුවන් වේවිද? ඒක අමාරු වැඩක්. ඒ වාගේම දැන් අපෙන් අහනවා නේ, ඇයි මේ විමර්ශන කටයුතු ඉක්මන් නොකරන්නේ කියලා. මේ කටයුතු අපි ඉක්මනින් කරනවා. අපි බලයට පත්වෙලා තවම ගතවෙලා තිබෙන්නේ මාස 7යි. අපි දැන් එම පරීක්ෂණ ඔක්කෝම කරගෙන යනවා. පොලීසියෙන් පරීක්ෂණ කරනවා, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඊට අදාළ වැඩ කරමින් යනවා. අපි ඒ වාගේ දේවල් කරගෙන යනවා. මේ සම්බන්ධව වෙනම අධිකරණ දාලා ඉක්මනින් තීන්දුවක් නොදෙන්නේ ඇයි කියලා දැන් අපෙන් අහන්නේ මොකටද? අපි දැන් අධිකරණයට ගියොත් හරියට සාක්ෂි නැහැ, භාගෙට තමයි සාක්ෂි තිබෙන්නේ, එතකොට චූදිතයින් නිදොස් කොට නිදහස් වෙනවා. මේ චූදිතයින්ව නිදොස් කොට නිදහස් කරන්නද මේ කටයුතු ඉක්මන් කරන්න කියන්නේ? මේ කටයුත්ත එහෙම ඉක්මනට කරන්න බැහැ.

අනික් කරුණ මෙයයි. අපි මේ හා සම්බන්ධ කොමිෂන් සභා වාර්තාව පිළිබඳව කථා කළා නේ. කොමිෂන් සභා වාර්තාවෙන් උපුටා ගත් කොටසක් තමයි මම දැන් කිව්වේ. ඒ, පරණ අය ගැන. ඒ වාගේම මේ කොමිෂන් සභා වාර්තාවේ තිබෙනවා, අපේ රටේ පවතින පාසල්වල වෙනසක් වෙන්න ඕනෑය කියන කාරණය. ජාතිවාදී නොවන විධියට මේ පාසල් වෙනස් වෙන්න ඕනෑය කියනවා. දැන් අපි ඒ දේවල් ක්‍රියාත්මක කරමින් යනවා. අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ ඒ කරුණු තිබෙනවා. අපි ඒවා ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරගෙන යනවා.

ඒ වාගේම පොලීසියේ සංස්කෘතිය වෙනස් වෙන්න ඕනෑය කියලා තිබෙනවා. දැන් අපි පොලීසියේ සංස්කෘතිය වෙනස් කරමිනුයි ඉන්නේ. අපි පොලීසියට කිසිම දේශපාලන බලපෑමක් කරන්නේ නැහැ නේ. අපි ඔවුන්ට කියලා තිබෙනවානේ, නීතිය අකුරටම ක්‍රියාත්මක කරන්න කියලා. ඒ කොමිෂන් සභාවේ නිගමන තමයි අපි දැන් ක්‍රියාත්මක කරමින් ඉන්නේ.

ඒ වාගේම ජාතික ආරක්ෂාව තිබෙන්න ඕනෑ බවත් කියා තිබෙනවා. යහ පාලන ආණ්ඩුව කාලයේ තමයි ජාතික ආරක්ෂාව තිබුණේම නැත්තේ. ඒ පිළිබඳව කථා කළොත්, දැන් අපට ජාතික ආරක්ෂාව පැත්තෙන් ප්‍රශ්නයක් නැහැ. අද රටේ ජාතික ආරක්ෂාව තිබෙනවා. අද මිනිහෙකුට නිදහසේ පාරේ බැහැලා යන්න පුළුවන්. උතුරේත් එහෙමයි, දකුණේත් එහෙමයි. එවැනි තත්ත්වයක් තමයි අද තිබෙන්නේ.

ඒ වාගේම පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සම්බන්ධ කොමිෂන් සභා වාර්තාවෙන් මම තව දෙයක් කියන්නම්. "රට තුළ පවතින ඉස්ලාමීය අන්තවාදයේ හරය තව්හිද් මතවාදයයි. මුල් අවධියේදී කළමනාකරණය කිරීම නොකරන ලද බහුතන්ත්‍රවාදය විසින් මෙය තවදුරටත් පැසවීමකට ලක් කරන ලදී" යනුවෙන් එම වාර්තාවේ සඳහන් වනවා. අද ලංකාවේ ඉස්ලාම් අන්තවාදයක් තිබෙනවාද? බෞද්ධ අන්තවාදයක් තිබෙනවාද? එහෙම දෙයක් නැහැ. අද එවැනි අය ඉන්නවා නම් ඉන්නේ, ඔවුන්ගේ කාමර ඇතුළේ. ඔවුන් අද එළියේ නැහැ. ඒක තමයි වෙනස. මොකද, අපි ඒවා ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

ඒ වාගේම සුබසාධනය පිළිබඳවත් මෙම වාර්තාවේ සඳහන් වනවා. වින්දිතයින්ට සුබසාධනය සලසන්න ඕනෑය කියන කාරණයත් මෙහි තිබෙනවා. මෙච්චර කාලයක් අපි ඒවා කරලා

[ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

තිබෙනවා. මේ report එකෙන් මම තව දෙයක් කියන්නම්. "විපතට පත්වූවන් සඳහා සුබසාධන ව්‍යාපෘතියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර, භාණ්ඩාගාරයෙන් කලින් කල වාර්ෂික පදනමක් මත අරමුදල් වෙන් කිරීමෙන් වසර 5ක කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය." යනුවෙනුත් එහි සඳහන් වනවා. දැන් අවුරුදු 5ක් ඉවරයි. මේ අය බලයේ හිටපු කාලයේ මොනවාද කළේ?

අපි තීරණයක් අරගෙන තිබෙනවා, මීගමුව කටුවාපිටියේ වෙනම clinic එකක් පටන් ගන්න. අපි දැන් ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටිනවා. අනිවාර්යයෙන්ම තව මාස දෙකක් ඇතුළත -අගෝස්තු හෝ සැප්තැම්බර් වන විට - අපි ඒක open කරනවා. ඒක සියලුම පහසුකම් තිබෙන clinic එකක්. ඒ තැන පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට ඉන්න පුළුවන් තැනක්. ඒ වින්දිතයන්ව ගෙදරටම ගිහිල්ලා බලන්න අපි nursesලා පත් කරනවා. අපි ඒ පහසුකමත් සපයනවා.

ඒ වාගේම "එක රටක්-එක නීතියක්" තිබෙන්න ඕනෑය කිව්වා. අපි දැන් ඒක කරලා තිබෙන්නේ. නීතිය කාටවත් වෙනසක් නැහැ. අධිකරණ පද්ධතිය ස්වාධීනයි. නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන කරලා තිබෙන්නේ. මේ ස්වාධීන කිරීමෙන් අපි අදහස් කරන්නේ නැහැ, හරියට වැඩ වෙනවා කියලා. නීතිපති දෙපාර්තමේන්තුවේ හොඳ නිලධාරින් ඉන්නවා. නමුත්, අඩුපාඩුත් තිබෙනවා. කාර්යක්ෂමව වැඩ කළ යුතුයි කියන කාරණයත් අපි ඔවුන්ට මතක් කරනවා. නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන කළාට, අපෙන් දේශපාලන influence තිබෙනවා කියලා ඒකෙන් අදහස් වෙන්නේ නැහැ. හරියට වැඩේ කරන එක ඔවුන්ගේ වගකීමක්. මම ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Dr.) Chrishantha Abeysena)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි UNP එක ගැන කථා කරනවා. සජබයයි, UNP එකයි කියන්නේ කවුද? දෙකම එකයි. ඒ අයගේ වෙනසක් නැහැ.

මැතිවරණ කාලවලදීත් රනිල් වික්‍රමසිංහ තේ මේ අයව පාලනය කළේ. එතකොට රනිල් එක්ක මේ අය කොච්චර ඩීල් දැම්මාද? එහෙම තමයි මේ අය කටයුතු කළේ. අද කථා කරනවා, ඔවුන් මේ රට පාලනය කළේ නැහැ වාගේ. බැරි වෙලා හෝ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් පත් වුණේ නැත්නම් මොකක්ද වෙන්නේ? අද මෙතැන මේ වාගේ දෙයක් කථා කරන්න පුළුවන්ද? එහෙම නම් මේ පාර්ලිමේන්තුවත් වැහිලා ගිහින් ඉවරයි. ඒ නිසා නැවතත් කියනවා, අපි අනිවාර්යයෙන්ම මේ පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ සත්‍යය සොයා ගන්නවාමයි කියලා. අපි දැන් ඒක හොඳින්, පිළිවෙළකට කරගෙන යනවා. ඒක අපේ වගකීමක්. දේශපාලනඥයන් හැටියට නොවෙයි, ඒක අපේ පෞද්ගලික වගකීමක්. අනිවාර්යයෙන්ම ඒ දේ ඉටු කර තමයි අපි මේ ආණ්ඩුව අවසන් කරන්නේ කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
උදේ මට විනාඩි 6ක් වෙන් කර තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔව්, මට තිබෙන කාලය සාමාන්‍යයෙන් අඩු වෙනවා. ඒක මම දන්නවා. මම මගේ කථාව කෙටියෙන් අවසන් කරන්නම්.

[பி.ப. 5.20]

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! எங்களுடைய நாட்டில் நடந்த 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் தொடர்பாக மக்களுடைய மனங்களில் மாற்றங்கள் வந்திருக்கின்றதோ இல்லையோ, அதற்குக் காரணமாக இருந்தவர்களுடைய நண்பர்களின் மனங்களில் மாற்றம் வந்திருக்கின்றது. ஒரு காலத்தில் எங்களுடைய சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் பிள்ளையானுடைய உற்ற நண்பராக இருந்தார். இப்போது அவர் நீதிக்காகப் போராடுகின்ற இலங்கை தமிழரசுக் கட்சியின் ஓர் உறுப்பினராக இருக்கின்றார். அவர்கள் தங்களுக்குள் ஏற்பட்ட பிரச்சினை காரணமாக ஒருவரையொருவர் காட்டிக் கொடுக்கிறார்கள். நாங்கள் தமிழினம் தானே! அந்த வகையில், காட்டிக்கொடுப்பது என்பது எட்டப்பன் காலத்தில் இருந்து இன்றுவரை சாதாரணமான ஒன்று!

ஐக்கிய நாடுகள் மனித உரிமைகள் உயர் ஸ்தானிகர் வோல்கர் டேர்க் அவர்கள் வரும்பொழுது, இந்தப் பாராளுமன்றத்தில் எப்படி deal அடிக்கப்பட்டது என்பது உங்களுக்கு நன்றாகவே தெரியும்! அன்றைய தினம் கௌரவ சிறீதரன் அவர்களுக்கு 6 வசனங்களுக்கு உட்பட்ட ஆங்கிலக் கடிதம் ஒன்றை எழுதி வாசிக்கக் கொடுத்த அதே NPP அரசாங்கம் என்னைக் கதைக்கவிடாமல் தடுத்தது. கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் என்னைக் கதைக்க வேண்டாம் என்று சொன்னபோது, 'இல்லை!' நானும் ஒரு சுயேச்சைக் குழுவின் தலைவன் என்ற அடிப்படையில் இரண்டு நிமிடங்கள் கதைக்கப் போகிறேன் என்று செம்மணி மனிதப் புதைகுழி தொடர்பில் சர்வதேச விசாரணை வேண்டுமெனக் கேட்டவன் நான்! அந்த videoஐ வெளியிடுமாறு கௌரவ சபாநாயகர் அவர்களிடம் நான் கடிதமொன்றைக் கொடுத்தேன். கௌரவ சபாநாயகர் அவர்கள் நடுநிலையாகச் செயற்பட வேண்டும். ஆனால், அவர் அந்த videoஐ வெளியிட முடியாதென என்னுடைய கடிதத்துக்குப் பதில் அனுப்பியிருக்கிறார். மறுபடியும் Right to Information Actஇன்கீழ் அதனை வெளியிடுமாறு கோரியிருந்தேன். அந்த videoஐ வெளியிட முடியாதென இன்றைக்கு அதற்குப் பதில் வந்திருக்கிறது.

அரசியல் என்பது ஒரு சிறந்த நாடக மேடை! அதில் கொலையாளிகளின் நண்பனாக இருந்தவர்கள் எல்லாம் காலம்

மாறும்போது மக்களுக்குச் சார்பாக ஒத்திவைப்புப் பிரேரணைகளைக் கொண்டுவருவார்கள். இப்போது பிள்ளையான் சிறையில் இருக்கிறார். அவருக்காக நான் உண்மையிலேயே கவலைப்படுகின்றேன். அவரின் உற்ற நண்பனால்தான் இந்த ஒத்திவைப்புப் பிரேரணை கொண்டுவரப்பட்டு இருக்கின்றது. இலங்கை தமிழரசுக் கட்சியானது, JVPஉடன் அடிக்கின்ற கீழ்த்தரமான dealஆல் பாதிக்கப்படுவது, எங்களுடைய தேசியத் தலைவன் பிரபாகரினதும் அவருக்காக உயிர்நீத்த 44,000 போராளிகளினதும் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி! நீங்கள் எப்படியும் என்னுடைய நேரத்தைக் குறைப்பீர்கள் என்று எனக்குத் தெரியும். பரவாயில்லை!

கண் இல்லாத, கால் இல்லாத, காது இல்லாத போராளிகளுக்கு, இப்போது இறந்தும் இறக்காமல் இருப்பவர்களுக்கு நாங்கள் செம்மணி போன்ற மனிதப் புதைகுழிகளைத் தோண்டிக்கொண்டு இருக்கின்றோம். அதுதான் இங்கு நடக்கிறது. இது ஒரு சிறந்த அரசியல் நாடக மேடை! என்னுடைய வாழ்க்கையில் நான் இதுவரை பார்த்திராத சிறந்த அரசியல் நாடக மேடை என்றால், அது இந்தப் பாராளுமன்றம்தான். நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் கதைக்கும் ஒவ்வொரு விடயத்தையும் நம்புகின்ற எங்களுடைய தமிழினம் இருக்கும் வரைக்கும், கிழக்கு மாகாண மக்கள் வாக்குப்போடும் வரைக்கும் எங்களுடைய தமிழினம் காலங்காலமாக இவர்களால் கொலை செய்யப்படும்; அழிக்கப்படும். அதுமாத்திரமன்றி, செம்மணி போன்ற மனிதப் புதைகுழிகள் தோண்டப்படும்; மூடப்படும் என்பதில் எந்தச் சந்தேகமும் இல்லை.

கௌரவ அமைச்சர் ஹர்ஷன நாணாயக்கார அவர்களும் பொலிஸுக்குப் பொறுப்பான அமைச்சர் அவர்களும் இன்றைய தினம் சொல்லி இருக்கிறார்கள், இந்த விடயங்கள் தொடர்பாக நாங்கள் பாராளுமன்றத்தில் கதைத்தால் CIDக்கு அழைக்க முடியுமென்று. அவர்களுக்கு Parliament (Powers and Privileges) Act பற்றி தெரியும். கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்கள் ஒரு சட்டத்தரணி! அவர் சொல்லியிருக்கிறார், எங்களுடைய செம்மணி மனிதப் புதைகுழி என்பது செவிவழி வந்த - hearsay - ஒரு விடயம் என்று. அப்படியென்றால், NPP ஆடுகிறது; இலங்கை தமிழரசுக் கட்சி சேர்ந்து ஆடுகின்றது; சங்கையும் ஊதுகிறது. சங்கும் இப்போது இல்லை! ஆனால், நான் தனியொருவனாக இந்தப் பாராளுமன்றத்தில் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව තත්පර 20ක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

எனக்கு ஆறு நிமிடங்கள் ஒதுக்கப்பட்டு இருந்தது. இப்போது அது மூன்று நிமிடங்களாகக் குறைக்கப்பட்டு இருக்கிறது. அரசாங்கத்துக்குப் பயம், அர்ச்சுனா ஏதாவது கதைத்துவிடுவான் என்று.

Thank you so much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑත ඉතිහාසයේ අපේ රටේ මනුෂ්‍යත්වයට එරෙහිව සිදු වෙච්ච නින්දා සහගත, අමානුෂික ප්‍රහාරයක් පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සිදු කරන සංවාදයට සහභාගි වන්නට ලැබීම සම්බන්ධයෙන් ඇත්තටම අපි කනගාටු වෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නින්දා සහගත ප්‍රහාරයෙන් ජීවිතය අහිමි කර ගත් ඒ වින්දිතයන්ගේ මළ සිරුරු දකින්නට, ඔවුන්ගේ ඥාතීන්ගේ, හිතවතුන්ගේ ශෝකාලාපයන් දකින්නට, අසන්නට ලැබීම පිළිබඳවත් ඇත්තටම මනුෂ්‍යයන් හැටියට අපි ලජ්ජා වෙන්න ඕනෑ. නමුත්, අපි දන්නවා මේ ප්‍රහාරය කියන්නේ හුදු අන්ධ විශ්වාසයෙන් මෝහනයට පත් වෙච්ච පුද්ගලයන් කණ්ඩායමකගේ මිලේච්ඡ ක්‍රියාවක් විතරක් නොවෙයි කියන එක. ඒ තත්ත්වයට මේක ලඝු කරන්න බැහැ. බිමල් රත්නායක ඇමතිතුමාත් කිව්වා වාගේ අපට මතකයි, 2015 අවුරුද්දේ මෑත ඉතිහාසයේ දූෂිතම, බල ලෝභිත්වයේ හිණිපෙත්තට නැඟුණු උද්ධච්ච පවුල් පාලනයක් ප්‍රජාතන්ත්‍රවාදය තුළින් පලවා හරින්නට මේ රටේ ජනතාව කටයුතු කළ බව. එමඟින් බලයට පත් වුණේ සම්ප්‍රදායික දේශපාලන නායකයින් වුණත්, ඒ පලවා හැරීම පිටුපස ස්වයංව ගොඩනැඟුණු මහජන ක්‍රියාකාරිත්වයක් තිබුණා. ඒ මහජන ක්‍රියාකාරිත්වය ගොඩනැඟුණේ පවුල් පාලනය පිළිබඳව තිබුණු පිළිකුල නිසා මිසක්, බලයට පත් වුණු කණ්ඩායම පිළිබඳව පැවැති විශ්වාසය නිසා නොවෙයි.

අපි දන්නවා, අන්න ඒ විධියට බලය අහිමි වෙච්ච, මහ ජනතාව ප්‍රතික්ෂේප කළ පවුලක් වටා ගොඩනැඟුණු ඒ කණ්ඩායම නැවත වරක් බලය අත්පත් කර ගැනීම සඳහා මාවතක් හොයමින් හිටපු බව. ඉතිහාසයේ කවදත් මේ කණ්ඩායම් බලය ලබා ගැනීමටත්, බලය පවත්වා ගැනීමටත් පාවිච්චි කළේ ජාතිවාදයයි. ඒ වාගේම, ජාතික ආරක්ෂාව අනතුරේ, ඒක රැකගන්න ඕනෑ චරිතයක් ගොඩනහන්න ඕනෑය කියන සටන් පාඨය තුළ තමයි මේ කට්ටිය කටයුතු කළේ. එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගනිමින්, එකිනෙකා මත යැපෙමින්, මර්දනය වර්ධනය වීමට උත්සාහ කරන සිංහල-දෙමළ ජාතික අන්තවාදය මේ සඳහා සරු පසක් මේ කල්ලියට ඇති කළා. බලය අත්පත් කර ගැනීමේ තක්කඩි, නින්දා සහගත කුමන්ත්‍රණයේ ජවනිකා එකින් එක සැලසුම් කළා. එහි ප්‍රතිඵල අපි දැක්කා. ඔවුන් මුලින්ම උත්සාහ කළේ එල්ටීටීඊය නැවත වරක් නැඟිටින්න උත්සාහ කරනවාය කියන මතවාදය සමාජගත කරලා, ජාතික ආරක්ෂාව වෙනුවෙන් ඉදිරියට ඇවිල්ලා ඒ හරහා බලය අත්පත් කරගන්නයි. ඒ නිසා තමයි වවුනතිව්හි පොලිස් නිලධාරින් දෙදෙනෙකු ඝාතනය වුණු අවස්ථාවේදී ඒක එල්ටීටීඊ සංවිධානයෙන් කළා කියන හැඟීම වර්ධනය කරන්න, ඒ අදහස සමාජය තුළ පතුරුවන්න බොරු සාක්ෂි නිර්මාණය කරමින් කටයුතු කළේ. ඇත්තටම

[ගරු අනුර කරුණාතිලක මහතා]

කනගාටුදායක තත්ත්වය තමයි, බුද්ධි අංශයේ කිහිපදෙනෙකුත් මේ සඳහා උදවු කර තිබීම. ඒ නිසා තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යුද හමුදා බුද්ධි අංශය විසින් වාර්තා 4කින් මේක එල්ටීටීඊ සංවිධානය විසින් කළා කියන බුද්ධි වාර්තා ඉදිරිපත් කළේ. නමුත්, අද වෙනකොට හෙළිදරව් වෙලා තිබෙනවා, සහරාන්ගේ කණ්ඩායමේ ගපූර් කියන තැනැත්තා තමයි ඒ වෙඩි තැබීම කළේ කියලා. මේ සැලසුම් සහගත දේශපාලනය තුළ අන්තවාදය වාගේම එවකට පැවැති රජයේ සමහර බුද්ධි කණ්ඩායම් පවා සිටි බවට මේක හොඳ සාක්ෂියක්. ඒ වාගේම අපි දන්නවා, මේ තත්ත්වය ඇති වෙන්න එවකට පැවැති මෛත්‍රීපාල-රනිල් ආණ්ඩුවත් වගකිව යුතු වෙනවාය කියන එක.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාත්, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාත් බලය පිළිබඳ සීතල යුද්ධයක හිටියා. ඒ වාගේම එකිනෙකා දුර්වල කර ගැනීම සඳහා තමන්ගේ හිතවාදීන් මෙහෙයවමින් හිටියා. මේ නිසා රාජ්‍යය දුර්වල වුණා; නිලධාරින් අකර්මණ්‍ය වුණා; ජාතික ආරක්ෂාව පිළිබඳ වගකීම් සහගතව කටයුතු කරපු අය ඒ පිළිබඳව අමතක කරලා වෙනත් න්‍යාය පත්‍රයකට අනුව කටයුතු කරමින් හිටියා. ඒ ප්‍රහාරය සැලසුම් වෙනකොට, ඒ ම්ලේච්ඡ ප්‍රහාරය සිද්ධ වෙනකොට, ඒ තුළින් ජාතික ආරක්ෂාව බිඳ වැටෙනකොට ඊට වගකිව යුතු අය විශාල පිරිසක් මේ සභාවේ විරුද්ධ පක්ෂය පැත්තේ හිටියා. හැබැයි, දැන් ඒ අය අපට පෙනෙන්න නැහැ. අපි දන්නවා, ඒ ප්‍රහාරය සිද්ධ වෙනකොට, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ ඇමතිවරයා, කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිවරයා, ජාතික ඒකාබද්ධතා ඇමතිවරයා, විශේෂයෙන්ම ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ ඇමතිවරයා වාගේම නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු ඇමතිවරයා -අද විපක්ෂ නායකවරයා- ජාතික ආරක්ෂාව පිළිබඳ වගකීම පැහැර හැරපු ඒ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ හිටපු බව. අද වෙනකොට උදේ පාන්දර පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජාතික ආරක්ෂාව අනතුරේ කියලා කෑ ගහන මේ අය, එදා ඒ විධියට ජාතික ආරක්ෂාව අනතුරකට ලක් වෙන මොහොතේදී සද්ද නැතුව පූසෝ වාගේ පාර්ලිමේන්තුවට වෙලා හිටියා; කැබිනට් මණ්ඩලයේදී කට අරින්නේ නැතුව, සද්ද නැතුව හිටියා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අද අපට එම ම්ලේච්ඡ ප්‍රහාරය ගැන කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඔවුන්ගෙන් සමහර අයට අද වාගේම එදාත් යටි අරමුණු තිබුණා. එදා අගමැති-ජනාධිපති සීතල යුද්ධයක යෙදී සිටියදී තම නායකයා දුර්වල වෙනකොට, නායකත්වය ඩැහැ ගැනීමේ වුවමනාවෙන් කටයුතු කරපු පිරිස් අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ඒ පාස්කු ප්‍රහාරයට අදාළ විවාදයට සහභාගි වෙනවා.

ඒක ඇත්තටම කනගාටුදායක කරුණක්. මේ කාරණය පිළිබඳව දැනගෙන හිටියේ මේ ප්‍රහාරය සැලසුම් කළ, එය ක්‍රියාත්මක කළ පාර්ශ්ව විතරක් නොවෙයි. අපි දන්නවා, තාත්තා කියපු නිසා පල්ලියට ගියේ නැහැ කියා ප්‍රසිද්ධියේ කියපු කැබිනට් ඇමතිවරුන් සිටි බව. ඒ විතරක් නොවෙයි, සාමාන්‍යයෙන් හැම දාම කොටහේනේ පල්ලියට ගිය ආර්යාව -දැන් නම් භාර්යාව- එදා පල්ලියට ගියේ නැහැ. ඇයි, ඒ? ඒ අය කලින් දැනගෙන හිටියා, මේ වාගේ ප්‍රහාරයක් සිද්ධ වෙනවාය කියලා. තමන්ගේ විශ්වාසය, ඇදහිල්ල වෙනුවෙන් පල්ලියට ගිය අහිංසක භක්තිකයන් මෙවැනි ප්‍රහාරයක් සිද්ධ වෙනවා කියන එක දැනගෙන හිටියේ නැති වුණාට, මෙය සැලසුම් කළ පිරිස් වාගේම උදවු කරපු පිරිස් මේ පිළිබඳව දැනගෙන හිටියා. ඒක තමයි කනගාටුදායක කරුණ. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, විරුද්ධ පක්ෂයේ ඇතැම් පාර්ශ්ව,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වෙනකොට සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්, එහෙම නැත්නම් පිල්ලෙයාන් ජෝසප් පරරාජසිංහම් ඝාතනය සම්බන්ධයෙන් මඩකලපුව බන්ධනාගාරයේ තමයි හිටියේ. එදා උදෑසන 9.05ට මඩකලපුවේ සියොන් දේවස්ථානයේ බෝම්බ පුපුරනකොට චන්ද්‍රකාන්තන්, එහෙම නැත්නම් පිල්ලෙයාන් තමන්ගේ සගයාට කියා තිබෙනවා, "අන්න බෝම්බ පුපුරනවා, ඒ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක්" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, අපි සභාවේ කටයුතු පස්වරු 5.30ට අවසන් කළ යුතුයි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

ඒ විතරක් නොවෙයි, සහරාන්ගේ එක්කෙනාට කියා තිබෙනවා, ඔයගොල්ලන්ගේ නායකයෝ අද කොළඹ හෝටල්වල පිච්චි පිච්චි ඉන්නවා කියලා. ඒ කියන්නේ පිල්ලෙයාන් දැනගෙන හිටියා, මේ ප්‍රහාරය සිද්ධ වෙන විධිය. අපි මේ රටේ ජනතාවට - විශේෂයෙන්ම කිතුනු ජනතාවට- කිව්වා, මේ ප්‍රහාරය පිළිබඳ සැබෑව සමාජයට ඉදිරිපත් කරනවාය කියලා. අපි ඒක කරමින් ඉන්නවා. අපි බලයට ඇවිත් තවම මාස 6ක-7ක කාලයක් වෙන්නේ. නමුත් ඒ කාලය තුළ අපි ඒක කළා. අපි වගකීමක් භාර ගත්තා. අපි පොරොන්දු දුන්නා. අපි දැන් ඒ පොරොන්දු එකින් එක ඉටු කරමින් ඉන්නවා. දැන් අපිට පෙනෙනවා, මේ අතරතුර තිබෙන බැඳීම් මොනවාද, ඒ බැඳීම් පිටුපස සිටින කණ්ඩායම් කවුද, ඒ අය අතර තිබෙන සම්බන්ධතා මොනවාද කියලා. අපිට පෙනෙනවා, සලේ ඉන්නේ කොහේද කියලා. සලේ කියන්නේ කවුද කියා අපට පෙනෙනවා. සලේට පිටුපසින් ඉන්නේ කවුද කියන එකත් අපට පෙනී යමින් පවතිනවා.

තව එක කාරණයක් කියා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රහාරයෙන් පසුව ආණ්ඩු 3ක් රට පාලනය කළා. හැබැයි, අපි ඊළඟ ආණ්ඩුවට මේ පිළිබඳව සෙවීමේ වගකීම භාර දෙන්නේ නැතුව ජාතික ජන බලවේගයේ පළමුවෙනි ආණ්ඩු කාලය තුළම මේ ප්‍රශ්නය නිරාකරණය කරලා, ඒ වින්දිතයන්ට; එම කිතුනු ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.30 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2025 ජූලි 11 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2025 யூலை 11, வெள்ளிக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 11th July, 2025 pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.